# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

නවවැනි කලාපය - 2018 දෙසැම්බර්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

## නවවැනි කලාපය - 2018 දෙසැම්බර්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

නවවැනි කලාපය 2018 දෙසැම්බර්

ISSN 1800-1459

eISSN 2673-1177

**සංස්කාරක** : ආචාර්ය ආර්.ජී.ඩී. ප්‍රියංකා වීරසේකර

**සියලු ම විමසීම්**

සංස්කාරක

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තැ.පෙ. 02

බෙලිහුල්ඔය

දුරකථන/ෆැක්ස් - 045 22 80013

විද්‍යුත් තැපැල - sjseditor@crkd.sab.ac.lk

පරිගණක පිටු සැකසුම - කථිකාචාර්ය සධීර බණ්ඩාර

පිටකවරය අලංකරණය - අනිල් ජේ. රණසිංහ

සම්බන්ධීකරණය - ඩබ්.ජී.කේ.අමිතා

අජින්දිනී අමරසිංහම්

ප්‍රකාශනය : ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බෙලිහුල්ඔය

## සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මඬුල්ලකට යොමු කෙරෙන අතර ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්ගේ ලිපි සංස්කාරක මණ්ඩලයේ විමර්ශනයට පමණක් යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

## සංස්කාරක මණ්ඩලය

මහාචාර්ය ආර්.එම්.ඩබ්ලිව්. රාජපක්ෂ

ආචාර්ය මනෝජ් ආරියරත්න

ආචාර්ය කේ.වී. දීපානි එදිරිසූරිය මැණිකේ

ආචාර්ය ඒ සරත් ආනන්ද

ආචාර්ය ආර්.ඒ.ඩී. ප්‍රියංකා වීරසේකර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී.කේ.චම්පා එස් ද සිල්වා

සම්බන්ධීකරණ සංස්කාරක : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්.සී.පල්ලියගුරුගේ

ඉංග්‍රීසි භාෂා සංස්කාරක : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහේෂ් හපුගොඩ

# සංස්කාරක සටහන

සිංහල භාෂා මාධ්‍යයෙන් පළ කරන විමර්ශිත සඟරා විරල යුගයක එම රික්තකය පුරවන්නට දායක වෙමින් සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි නවවැනි කලාපය මෙසේ සමර්පණය කිරීමට ලැබීම ඉමහත් සතුටකි. අවිච්ඡින්න ව වාර්ෂික ව පළ කෙරුණු සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සඟරාව පසුගිය වසර පහක පමණ කාලයක් තුළ ප්‍රකාශයට පත් කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් අප වෙත ශාස්ත්‍රීය ලිපි යොමු කරන ලද පර්යේෂක භවතුන්ට පළමු ව අපගේ කනගාටුව ප්‍රකාශ කරන අතර එම ලිපි ක්‍රමවත් ව විමර්ශනයට බඳුන් කොට ඒ අතරින් නිර්දේශිත ලිපි මෙම කලාපයේ පළ කරන ලද බව දැනුම් දෙමි. සිංහල බසින් පළ වන ශාස්ත්‍රීය සඟරා අතර සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයට ශාස්ත්‍රලෝලීන් අතර ඇති ප්‍රසාදය නිසා ම මෙවර සඟරාවට ද සැලකිය යුතු ශාස්ත්‍රිය ලිපි ප්‍රමාණයක් ලැබුණු බව සඳහන කරන්නේ සතුටිනි. ශාස්ත්‍රීය ලිපි සම්පාදනය කරමින් මෙවර සඟරාව විවිධ ක්ෂේත්‍රයන්ගෙන් පැතිරුණු දැනුමින් පෝෂණය කරන්නට දායක වුණු සියලු ම පර්යේෂක භවතුන්ට අපගේ ස්තුතිය පුද කෙරේ. එමෙන් ම සිය වටිනා කාලය ශාස්ත්‍රෝන්නතියට නිර්ලෝභි ව කැප කරමින් මෙහි අන්තර්ගත ලිපි ප්‍රාමාණික විමර්ශනයට ලක් කොට සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය හැකිතාක් දුරට තත්කාලීන විමර්ශිත සඟරාවක ප්‍රමිතියට ගෙන ඒමට දායක වුණු විද්වත් විමර්ශක මඩුල්ලට අපගේ ගෞරව ප්‍රණාමය පළ කෙරේ.

දීර්ඝ කාලයක් අවිච්ඡින්න පළ වූ සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රිය සංග්‍රහය වසර කිහිපයක නිහැඬියාව බිඳිමින් නැවත සක්‍රීය ව පණ ගන්වන්නට අප ලද වෑයම සුළුපටු නොවන බව මෙහිදී සඳහන් කළ යුතු ම ය. මේ සඳහා අපට වැය කරන්නට වූ කාලය හා ශ්‍රමය ගිණිය නොහැකි ය. සරසවියක නිෂ්පාදනය වන දැනුම සමාජගත කරන්නට දොර විවර කරන මාවත සලසන ශාස්ත්‍රීය සඟරාවක අගය මැනවින් වටහා ගනිමින්, එම භාරදූර වගකීම විශ්වාසයෙකින් යුතු ව අප වෙත පවරා ඒ සඳහා අවශ්‍ය සියලු ප්‍රතිපාදන සපයා දුන් උපකුලපති මහාචාර්ය එම්. සුනිල් ශාන්ත මැතිතුමාට අපගේ ගෞරවනීය ස්තුතිය පුද කෙරේ. සිංහල බසින් ඥාන සම්පාදානය කරන සඟරාවක් එළි දැක්වීම වූ කලි මහත් අභියෝග රැසකට මුහුණ පාන දුෂ්කර කාර්යයකි. සියලු අභියෝග ඉතා පහසුවෙන් ජය ගැනීමට හැකි වන්නේ මෙමෙ කාර්යයයෙහි සියලු වගකීම් නොපැකිල ව දරමින් සබරගමුව විශ්වවිද්‍යාලයීය පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ ඒකකයේ අධ්‍යක්ෂ මහාචාර්ය නිර්මලී වික්‍රමරත්න මැතිනියගේ සුභවාදී දක්මෙන් යුතු ශාස්ත්‍රීය මැදිහත් වීම නිසා ය.

මෙවර සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි අන්තර්ගතය පමණක් නොව ආකෘතිය ද යාවත්කාලීන ව ඉහළ තලයකට ගෙන ඒමට හැකි වූ බව ප්‍රකාශ කරන්නේ අභිමානයෙනි. මේ සඳහා පූර්ණ දායකත්වය ලබා දෙමින් තම වටිනා කාලය නොමසුරු ව කැපකොට සඟරාවෙහි සියලු ලිපි ප්‍රමිතිගත නැවුම් ආකෘතියකින් යුතු ව සකසා දුන් කථිකාචාර්ය සධීර බණ්ඩාර මහතාට අපගේ විශේෂ ස්තුතිය පිරිනැමිය යුතු ය. එමෙන් ම මෙම සඟරාවට අදාළ සියලු අන්තර්ජාල වෙබ් පිටු නිර්මාණය කොට සකස් කර දුන් ආචාර්ය ආර්.එල්. දංගල්ල මහතාටත්, සඟරාවෙහි ලිපිවල අන්තර්ගත ඉංග්‍රීසි බස සංස්කරණය කොට දුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහේෂ් හපුගොඩ මහතාට අපගේ ස්තුති හිමි වෙයි. එමෙන් ම මෙම සඟරාවෙහි පිට කවරය නිර්මාණය කර දුන් අනිල් ජේ. රණසිංහ මහතාටත් සංස්කරණ සම්බන්ධීකරණ සහය ලබා දුන් ඩබ්ලිව්.ඒ.කේ. අමිතා සහ අජින්දිනී අමරසිංහම් මෙනෙවියට ද අපගේ ප්‍රශංසාව හිමි වෙයි. වසර ගණනාවක් තුළ වැළලී තිබුණු සඟරාවෙහි යටගියාව මතු කර දෙමින් සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි ගමන් මග නැවත සක්‍රීය කරන්නට දායක වුණු සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ පීඨාධිපති ආචාර්ය මනෝජ් ආරියරත්න මහතාට සහ සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි සම්බන්ධීකරණ සංස්කාරක ධුරය දරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්.සී. පල්ලියගුරුගේ මහත්වරුන්ගෙන් ලද අනගි සහය ස්මරණය කළ යුතු ම ය.

සිංහල බසින් දැනුම සම්පාදනය කරන ශාස්ත්‍රීය සඟරා අතර සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සඟරාව ප්‍රශස්ත ඥාන ගවේෂණයක යෙදෙන සක්‍රීය විද්වත් මණ්ඩපයක් බවට පත් කිරීම අපගේ අභිලාෂය යි. ඒ සඳහා විද්වත් ශාස්ත්‍රලෝලී ඔබ සැමගේ පූර්ණ දායකත්වය අපේක්ෂා කර සිටිමු.

ආචාර්ය ආර්.ඒ.ඩී. ප්‍රියංකා වීරසේකර
සංස්කාරක

# ලිපි සම්පාදකයෝ

**රාජකීය පණ්ඩිත මැටිබැඹියේ ධම්මසිරි හිමි**
ආචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර**
ආචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**චම්පා එස් ද සිල්වා**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**ඉරංගා සමින්දනී වීරක්කොඩි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංගීත විද්‍යා අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

**එන්. එස්. වයි. දසනායක**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**එම්. එස්. එම්. එල්. කරුණාරත්න**
කථිකාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

**බී. එම්. එම්. එච් හේමචන්ද්‍ර**
කථිකාචාර්ය, භූගෝලවිද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සබරගමුව විශ්වවිද්‍නලය

**එල්. ජී. ඩී.එස්. යාපා**
කථිකාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර**
කථිකාචාර්ය (බාහිර) , කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රීපාලි මණ්ඩපය

# පටුන


| පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|
| 1 | ස්වභාව සෞන්දර්ය පිළිබඳ ආදී බෞද්ධ ප්‍රතිපදාව<br>**රාජකීය පණ්ඩිත මැටිබැඹියේ ධම්මසිරි හිමි** | 01 |
| 2 | ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ගී පද රචනාවලින් මතු වන ශබ්ද'ර්ථ රස නිෂ්පත්තිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් : තෝරා ගත් ගීත නිර්මාණ කිහිපයක් ඇසුරින්<br>**ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර** | 10 |
| 3 | මාතෘකාවක් සොයන වචන අනුතුන්දාහක් : ජාතිකවාදී ගැටලුව දෙස යථාර්ථවාදි ව ප්‍රවේශ වීම - ආරියවංශ අබේසේකර<br>**චම්පා එස් ද සිල්වා** | 17 |
| 4 | ශ්‍රී ලංකේය ජන ගායන ක්ෂේත්‍රයෙහි ඇතුළත් නෙළුම් ගායන ශෛලිය පිළිබඳ මානව වංශ සංගීත විද්‍යාත්මක විමර්ශනයක්<br>**ඉරංගා සමින්දනී වීරක්කොඩි** | 23 |
| 5 | බටහිර තරණය කෘතිය තුළින් චීන සාම්ප්‍රදායික දර්ශනවාද නිරූපණය කෙරෙන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්<br>**එන්. එස්. වයි. දසනායක** | 32 |
| 6 | පහතරට තෙත් කලාපය ඇසුරෙන් සාම්ප්‍රදායික දැනුම පදනම් ව ශ්‍රී ලංකාවේ ශාකාවරණය හඳුනා ගැනීම සහ වර්ගීකරණය<br>**එම්. එස් .එම්. එල්. කරුණාරත්න** | 37 |
| 7 | ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ග්‍රාමීය - නාගරික සබඳතාවන්ගේ බලපෑම දඹුල්ල නගරය සහ එහි තදාසන්න ප්‍රදේශය ඇසුරින්<br>**බී.එම්.එම්.එච් හේමචන්ද්‍ර සහ එල්.ජී.ඩී.එස් යාපා** | 49 |
| 8 | දෘශ්‍ය සන්නිවේදනයේ පාරභෞතිකභාවය හැදෑරීමට හෙජමොනිය හා දෘෂ්ටිවාදය ඇසුරින් විශ්ලේෂණාත්මක සංකල්පීය ප්‍රවේශයක්<br>**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර** | 60 |

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
නවවැනි කලාපය; 2018 දෙසැම්බර්, පිටු 1-9
ISSN 1800-1459 eISSN 2673-1177

© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ස්වභාව සෞන්දර්ය පිළිබඳ ආදී බෞද්ධ ප්‍රතිපදාව

## (The Ancient Buddhist Policy on Natural Beauty)

රාජකීය පණ්ඩිත මැටිබැඹියේ ධම්මසිරි හිමි[1*]

[1]පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
*dhammasiri85@gmail.com

**සාරසංක්ෂේපය**

බුදුදහම වූ කලී පරිසරයෙන් බිහි වී පරිසරය ජයගත් දහමකි. පරිසරය පිළිබඳ සංවේදී ව තේරුම්ගෙන ස්වභාව සෞන්දර්යයේ වටිනාකම මනාව වටහාගෙන ඇත. ඒ මගින් විශ්වයේ ජීවත්වන සමස්ත ප්‍රජාව තුළ පරිසර සංරක්ෂණය උදෙසා අවශ්‍යය කරන ගුණධර්ම පෝෂණය කිරීමට උත්සාහගෙන තිබේ. ඒ අනුව ස්වභාව සෞන්දර්යයේ අගය සූත්‍ර දේශනාවල පෙන්වා දී ඇති අයුරු අධ්‍යයනය කිරීම මෙහි මූලික අපේක්ෂාව වේ.සොභාව සෞන්දර්යයේ අගය පිළිබඳ බෞද්ධ සූත්‍ර දේශනා තුළින් ඉතා මණරම් අයුරින් දේශනා කර ඇත. ඒ අතර බුද්ධ දේශනා මෙන් ම ශ්‍රාවක දේශනා ද ඇතුළත් වේ. පුහුදුන් මනසට දැනෙන සොභාව සෞන්දර්යට වඩා ආධ්‍යාත්මික මනසට දැනෙන සෞන්දර්යයේ අගය මේ තුළින් අධ්‍යයනය කළ හැකි ය. තව ද බුදුරජාණන් වහන්සේ පරිසරයේ අගය මෙන් ම පරිසරය විනාශ කිරීමෙන් ඇතිවන හානිදායක තත්ත්වයන් මෙන් ම පරිසරයේ ඇති සොභාව සෞන්දර්ය, ජලය, වායුව ආදිය ආරක්ෂා කිරීමට අවශ්‍ය වූ ක්‍රියා මාර්ග සූත්‍ර දේශනා තුළින් පෙන්වා දී ඇත. පෘථිවියේ වාසය කරන සියලු ජීවීන්ට මෙන් ම මිනිසාගේ පැවැත්මට සොභාව සෞන්දර්ය ප්‍රබල ව උපකාරී වේ. ඒ අනුව අතීතයේ සිට සියලු සත්ත්වයන් හා පරිසරය අන්‍යෝන්‍ය වශයෙන් එකට බැඳී පැවතුනි. අන්‍යෝන්‍ය සුහදත්වය වර්තමානයේ දී නොයෙක් විපර්යාස තුළින් පළුදු වී ඇත. නොයෙක් දෙනාගේ නොමනා ක්‍රියාවන් ඒ සඳහා හෙතු වී ඇත. බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ වැඩි කොටසක් සොභාව සෞන්දර්ය ඇසුරු කරමින් ම ගත කළ බව පැහැදිලි ය. ලුම්බිණි සල් උයනේ දී සිදුහත් කුමරුගේ ඉපදීම, ඇසතු වෘක්ෂය පාමුල දී බෝසතාණන් වහන්සේගේ බුද්ධත්වය, මල්ල රජදරුවන්ගේ උපවත්තන නම් සාල වනෝද්‍යානයේ උන්වහන්සේගේ පරිනිර්වාණයත් පරිසරය උපයෝගි කරගෙන සිදු වූ බව පැහැදිලි ය. තව ද ප්‍රථම ධර්ම දේශනාව පවත්වන්නේ ද පරිසරය ඇසුරු කර ගනිමින් බරණැස ඉසිපතන මිගදයේ දී ය. ඒ අනුව බුද්ධ දේශනාවට අනුව දේශිත පරිසරයේ අගය මෙමගින් අධ්‍යයනය කිරීමටත් යහපත් ස්වභාව සෞන්දර්යයෙන් පිරි වට පිටාවක් ගොඩ නගා ගැනීමටත් මග පෙන්වා දීම සිදු කර ඇති බව පැහැදිලි ය.

කේන්ද්‍රීය වචනඃ බුදුදහම, ආකල්පය, සෞන්දර්ය, පරිසරය, සංවේදී

The origin of Buddhism is based on the appreciation of environment which is full of sensitivities of the living beings of the environment. Hence it can be said that the Buddhist view comprehends the beauty of aesthetic. The teaching of Buddha is basically structured focusing on how to conserve the environment by developing peoples. thoughts. The aim of this research is study how to describe the values of environment aesthetic as mentioned in Suttha Deshana. Modern man in his search for pleasure and affluence has exploited nature without any moral restraint to such an extent that nature has been rendered almost incapable of sustaining healthy life. Invaluable gifts of nature, such as air and water, have been polluted with severely disastrous consequences. Man is now searching for ways and means of overcoming the pollution as his health too is alarmingly threatened by it. He also feels that it is irresponsible and morally wrong on his part to commit such destruction to the future generations who are forced to live in a polluted planet. If man is to act with a sense of responsibility to the natural world, to his fellow human beings and to the unborn future generations, he has to find an appropriate environmental ethic today to prevent further aggravation of the present pollution problem. Buddhism offers man a simple moderate lifestyle eschewing both extremes of self-deprivation and self-indulgence. Satisfaction of basic human necessities, reduction of wants to a minimum, frugality, and contentment are its important characteristics. Each man has to order his life on normal principles, exercise self-control in the enjoyment of the senses, discharge his duties in his various social roles, and conduct himself with wisdom and self-awareness in all activities. It is only when each man adopts a simple moderate lifestyle that mankind as a whole will stop polluting the environment. This seems to be the only way of overcoming the present ecocrisis and the problem of alienation. With such a lifestyle, man will adopt a non-exploitative, non-aggressive, gentle attitude towards nature. He can then live in harmony with nature utilizing its resources for the satisfaction of his basic needs. The Buddhist admonition is to utilize nature in the same way as a bee collects pollen from the flower, neither polluting its beauty nor depleting its fragrance. Just as the bee manufactures honey out of pollen, so man should be able to find happiness and fulfillment in life without harming the natural world in which he lives.

Keywords: Buddhist, Attitude, Aesthetic, Environment, Sensitive

## හැඳින්වීම

"**සුන්දරස්‍ය භාවඃ සෞන්දර්යං**" සෞන්දර්ය යන්නෙන් අදහස් කරන්නේ සුන්දරත්වය යි. යම් දෙයක සිත් ඇදබැඳ ගන්නා ස්වභාවයක් වන්නේ ද ඒ සෞන්දර්ය යි. සෞන්දර්ය යන්නට සංගීතය, නෘත්‍යය, වාදනය, ගායනය, සාහිත්‍යය ආදී විවිධ කලා මාධ්‍යයන් ද අන්තර්ගත ය. වර්තමානයේ සෞන්දර්ය යන්නෙන් අදහස් කරනු ලබන්නේ ලෞකිකත්වය යි. ලෞකික ජීවිතයේ දී විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ පංච ඉන්ද්‍රියන් ප්‍රකෝපනයට පත්කරවන රසාස්වාදයකි. බෞද්ධ සෞන්දර්ය සංකල්පයට අනුව එවැන්නක් අර්ථවත් නොවේ.

සෞන්දර්ය යන්න ඉංග්‍රීසි භාෂාවෙන් Aesthetic, යනුවෙන් හඳුන්වයි. Aesthetic, යන්නට ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂයේ දී ලබාදෙන අර්ථයන් වන්නේ සෞන්දර්ය පිළිබඳ වූ, සුන්දර, සෞන්දර්යාත්මක, රසික, සෞන්දර්ය යන්න යි. එමෙන් ම සෞන්දර්ය යන්න කෝෂ ග්‍රන්ථ කිහිපයක අර්ථ විවරණය කර ඇත්තේ මේ අයුරිනි.

"**සෞන්දර්‍ය** - අලංකාර, සුන්දර, ලක්‍ෂණ, ලාවණ්‍ය ද" (සිංහල ශබ්දකෝෂය 1992: 1216).
"**සෞන්දර්‍ය** - සුන්දරත්වය, සොඳුරු බව" (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය 1999: 1133).
"**සෞන්දර්‍ය** - මනහර, සොඳුරු, උසස්, යහපත්, හොඳ හොඳ" (නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය 2003: 1150).
"**සෞන්දර්‍ය** - සුන්දරත්වය, මනහර බව, සිත් ඇදෙන ගතිය, ලාවණ්‍යය, ලාලිත්‍යය" (අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය 2004: 901).
"**සෞන්දර්‍ය** - සුන්දර භාවය, සුන්දර, ලලිත, මනහර, සොඳුරු, ශෝභන, යහපත්" (මහා සිංහල ශබ්දකෝෂය 2008: 1908).

සංස්කෘත සාහිත්‍යයේ ද නොයෙක් සෞන්දර්ය වර්ණනා දැකගත හැකි ය. සංස්කෘත සාහිත්‍යයේ වීර කාව්‍යවල නොයෙක් සෞන්දර්ය වර්ණනා බහුල වශයෙන් අන්තර්ගත ය. ඒ අතුරින් රාමායණයෙහි සුන්දර කාණ්ඩය අලංකාරවත් සෞන්දර්ය වර්ණනාවන්ගෙන් අනූන ය. එහි සඳහන් ශබ්දාර්ථයන්ගෙන් මනාව සංකලනය වූ සෞන්දර්යාත්මක වර්ණනාත් මේ අයුරින් දැකගත හැකි ය.

"ගායන්ති කේචිත් ප්‍රහසන්ති කේචිත්
නෘත්‍යන්ති කේචිත් ප්‍රණමන්ති කේචිත්
පතන්ති කේචිත් ප්‍රචරන්ති කේචිත්
ප්ලවන්ති කේචිත් ප්‍රලපන්ති කේචිත්"
(රාමායනය 1959: 105).

ඇතැම් වානරයෝ ගී ගයති. ඇතැමෙක් සිනහසෙති. තවකෙක් නටති. ඇතැමෙක් තැනින් තැනට පනිති. තවකෙක් බිම වැටෙති. ඇතැමෙක් උඩ පනිති. තවකෙක් කතා කරති. මේ අයුරින් රාමායණ සුන්දර කාණ්ඩයේ අන්තර්ගත වන්නේ ස්වාභාවික පරිසරයෙහි වානරයන්ගේ කෙළි ලීලාවන් මහත් සෞන්දර්යයෙන් වර්ණනා කොට ඇති ආකාරය යි. තවද බුදුදහම පරිසරය පිළිබඳ සංවේදීව තේරුම්ගෙන ස්වභාව සෞන්දර්යයේ වටිනාකම මනාව වටහාගෙන ඇත. ඒ මගින් විශ්වයේ ජීවත්වන සමස්ත ප්‍රජාව තුළ පරිසර සංරක්ෂණය උදෙසා අවශ්‍යය කරන ගුණධර්ම පෝෂණය කිරීමට උත්සාහගෙන තිබේ. ඒ අනුව ස්වභාව සෞන්දර්යයේ අගය සූත්‍ර දේශනාවල පෙන්වා දී ඇති අයුරු අධ්‍යයනය කිරීම මෙහි මූලික අපේක්ෂාව වේ.

## සාහිත්‍ය විමර්ශනය

ස්වභාව සෞන්දර්ය පිළිබඳ ආදී බෞද්ධ ප්‍රතිපදාව පිළිබඳ අධ්‍යයනයක් යන මාතෘකාවට අදාළව බොහෝ මූලාශ්‍රවල සඳහන් වුව ද ඒ පිළිබඳ ඍජු පර්යේෂණයක් සිදු කර නොමැත. පෙර අපරදිග විද්වතුන් මෙම පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි ප්‍රකාශයට පත්කර ඇතත් ඒවා තත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් පර්යේෂණ වශයෙන් සැළකීමට අපහසු ය. පෙර අපරදිග පර්යේෂණ ක්ෂේත්‍රයන්හිදී සෞන්දර්ය යන්න පිළිබඳ විද්වතුන් බොහෝ පර්යේෂණ සිදුකර තිබේ. සෞන්දර්ය යනු පුද්ගල ආකල්පයන් උද්දීපනය කරන සංකල්පයකි. අධ්‍යාත්මික ජීවිතයේ දී අධ්‍යාත්මික සෞන්දර්ය අගය කරන අතර ලෞකිත ජීවිතයේදී ලෞකික සෞන්දර්ය කෙරෙහි සාකච්ඡා කරයි. ඒ අනුව සෞන්දර්ය පිළිබඳ උපයෝගී කරගත හැකි ප්‍රථමික හා වෙනත් ග්‍රන්ථ පිළිබඳ විමර්ශනයක යෙදීම මෙම සාහිත්‍ය විමර්ශනය තුළින් අපේක්ෂා කරනු ලබයි.

වැගම පියරතන හිමි විසින් රචිත සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය ග්‍රන්ථය තුළින් සෞන්දර්ය යන්න හා සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය කෙබඳු ද යන්න අවබෝධ කරගැනීමට හැකි විය. එය මෙම පර්යේෂණ කාර්යේ දී ඉතා වැදගත් ග්‍රන්ථයක් වශයෙන් පෙන්වා දිය හැකිය. තලංගල්ලේ සුධම්ම හිමි විසින් රචිත පරිසර ගැටලුව හා පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ආකල්පය යන ග්‍රන්ථය තුළින් පරිසරයෙහි අසිරිය, ස්වභාව සෞන්දර්ය කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇත. එමෙන් ම පරිසරය විනාශ කිරීමේ ක්‍රමවේදයන් මෙන් ම එමගින් අත්විඳින පාරිසරික ගැටලු මෙන් ම සෞන්දර්යවත් පරිසරයක් නිර්මාණය කරගැනීමට පරිසරය ආරක්ෂා කරගත යුතු අන්දම මෙමගින් විස්තර වේ. ඒ අනුව මෙම ග්‍රන්ථය මෙම පර්යේෂණයේ දී ඉතා වැදගත් විය.

පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් විසින් රචිත පාලි සාහිත්‍යය නමැති ග්‍රන්ථය තුළින් පාලි ත්‍රිපිටක දේශනාවන්ගේ ඇතුලත් ථෙරවරු විසින් දේශිත ස්වභාවික පරිසරය පිළිබඳ ආකල්පයන් අධ්‍යයනය කළ හැකි විය. ඒ අනුව මෙම ග්‍රන්ථය ද පර්යේෂණ කාර්යේ දී මහෝපකාරී වූ බව පෙන්වා දිය හැකි ය. තව ද මෙම පර්යේෂණයේ දී අවශ්‍යය වචනයන්හි නිරුක්ති අදිය දැනගැනීම සඳහා අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය, නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය, ශ්‍රී සුමංගල ශබ්දකෝෂය ආදී ශබ්දකෝෂද උපයෝගි කරගන්නා ලදී.

උක්ත විවිධ සාහිත්‍ය ග්‍රන්ථයන්හි අන්තර්ගතය කරුණු මෙන්


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ම පාලි ත්‍රිපිටකාගත තොරතුරු ද මෙම පර්යේෂණයට අදාළ කර කරගන්නා ලදී. මෙම පර්යේෂණයේ පාලි සූත්‍ර දේශනාවන් බහුලව යොදා ගත් නිසා ද්විතීයික මූලාශ්‍රය යොදා ගන්නා ලද්දේ ස්වල්පයක් පමණි. කෙසේ වෙතත් මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වූ ක්ෂේත්‍රය පිළිබඳ ව මීට ඉහත පර්යේෂණයක් සිදු කර නොමැත. ඒ අනුව මාගේ පර්යේෂණ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා මෙම සාහිත්‍යය ග්‍රන්ථ මහෝපකාරී වූ බව කිව යුතුය.

## පර්යේෂණ ගැටලුව

ස්වභාව සෞන්දර්යය පිළිබඳ බෞද්ධ ආකල්පය කුමක් ද?

## පර්යේෂණ අරමුණු

බුදුන් වහන්සේ සෞන්දර්ය විරෝධියෙකු බව ආනන්ද කුමාරස්වාමි වැනි විචාරකයන් පෙන්වා දී ඇත. එවන් පසුබිමක සෞන්දර්ය යනු කුමක් දැයි හඳුනා ගැනීම. එම සෞන්දර්ය සංකල්ප බුදුදහමට අනුකූල බව අවබෝධ කර ගැනීම. බුදුදහම සෞන්දර්ය අගය කළ බව වටහා ගැනීම. තවද බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ වැඩි කොටසක් සොභාව සෞන්දර්ය ඇසුරු කරමින් සෞන්දර්ය හිතකාමීව සෞන්දරය අගය කළ අයුරු අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණු වශයෙන් පෙන්වා දිය හැකි ය.

## පර්යේෂණයේ වැදගත්කම

සෞන්දර්ය යනු ලෞකික විෂයකි. අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම යන ත්‍රිලක්ෂණය පෙරටුකොට ගත් ආගමක් වන බුදුදහම හා ලෞකික විෂයක් වන සෞන්දර්ය සංකල්පය අතර ඇති සම්බන්ධය කුමක් දැයි කෙනෙකුට තර්ක කිරීමට පුලුවන. එපමණක් නොව එබඳු ආගමක් අදහන බෞද්ධයාට සුන්දරත්වය දැකිය හැකි ද? කලා රසයක් විදිය හැකි ද? යනුවෙන් ද ප්‍රශ්න කිරීමට ද පුලුවන. මේ ප්‍රශ්නවලට සතුටු දායක පිළිතුරු අපට සපයාගත හැක්කේ සමාජ විද්‍යාත්මක දෘෂ්ඨි කෝණයෙන් බුදුදහම විග්‍රහකර බැලීමෙන් ය. බුදුදහම වනාහි සමාජ සංස්ථාවකි. එය කිසිවිටෙකත් සමාජය ප්‍රතික්ෂේප කළ ආගමක් නොවේ. මිනිසා විමුක්ති මාර්ගයට බුදුදහමින් යොමු කෙරෙන්නේ සමාජ සංස්ථාවන්ට අනුකූලවය. ඊට හේතුව නම් මිනිසා සමාජ ගත පුදුගලයෙකු බව බුදුදහම මැනවින් තෙරුම් ගෙන තිබීමයි. බුදුසමය විසින් සමාජය කිසිවිටෙකත් බැහැර නොකරන ලද නිසා පුද්ගලයාගේ වින්දනාත්මක පක්ෂය වඩාත් තීව්‍ර කරන සෞන්දර්යාත්මක දේ පිළිබඳ උදාසීන ආකල්පයක් ඉදිරිපත් නොකරන ලදී. එහි දී අප සෞන්දර්ය ලෙස දකිනු ලබන ස්වාභාවික සෞන්දර්ය හා නිර්මාණාත්මක සෞන්දර්ය බුදුදහමින් ඇගයෙන බව පෙනේ. ඒ අනුව සමාජයේ සියල්ලන්ටම සෞන්දර්ය පිළිබඳ බුදුදහම දක්වන ආකල්පය අකාල්පය කෙබඳු ද යන්න මෙමගින් අධ්‍යයනය කළ හැකිය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ ප්‍රධානම ක්‍රමවේදය ලිඛිත මූලාශ්‍රය උපයෝගී කොට ගෙන දත්ත රැස්කිරීම යි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පාලි ත්‍රිපිටක ග්‍රන්ථත්, දෙවනුව ද්විතීයික මූලාශ්‍රයයන් භාවිත කෙරේ. ප්‍රථමයෙන් දත්ත රැස්කිරීමත් අනතුරුව දත්ත විශ්ලේෂණයත් එමගින් නිගමනයන්ට එළඹීමත් සිදු කෙරිණ.

## සාකච්ඡාව

ලෝකයේ විසූ ස්වභාව සෞන්දර්යවාදීන් අතුරින් බුදුරජාණන් වහන්සේට හිමිවන්නේ ප්‍රමුඛතම ස්ථානය යි. මානසික සෞන්දර්යයෙහි අග්‍ර ඵලය වන්නේ ස්වාභාවික පරිසරය යි. බුදුරජාණන් වහන්සේට බුද්ධත්වය අවබෝධ කර ගැනීම සඳහා උපකාරී වූයේ ද ස්වාභාවික පරිසරය බව අරියපරියේසන සූත්‍රයෙන් පැහැදිලි වේ.

> "රමණියො වන භූමිභාගො පාසාදිකො ච වනසණ්ඩො නදිං ච සන්‍දති සොතකා සුපතිත්ථා රමණියො සමන්තා ච ගොචරගාමො අලං වතිදං කුලපුත්තස්ස පධානත්‍ථිකස්ස පධානාය" (මජ්ඣිම නිකාය I 2005: 406).

උන් වහන්සේ භාවනා කිරීමට තෝරා ගන්නා ලද ස්ථානය මැනවින් වැඩුණු වනලැහැබ මැදින් ගලා බසින නිල් ජලධාරාවකින් හා නදියකින් යුක්ත ය. එමෙන් ම සුදෝ සුදු වැලිතලාවෙන්, වනාන්තරයෙන්, ගස්වැල්වලින් සුපිපි කුසුමින් යුක්ත නිසා සියල්ලන්ගේ ම සිත් ඇදගන්නා සුළු බව පෙන්වා දී ඇත. නොයෙක් සත්ත්වයන් වාසය කරනු ලබන රමණීය භූමිභාගයක් වූ නිසා භාවනාවට තෝරගත් බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.

බුදුසමයට අනුව පරිසරය මිනිසාගේ පරිහරණය සඳහා යොදා ගත යුතුය. එසේ පරිසරයෙන් ප්‍රයෝජනගත යුත්තේ දියාලුවෝ තමන් කැමති තැනට දිය ගෙන යති. ඊ වඩුවෝ තමන් කැමති පරිදි ඊ දිඩු නමති. (ධම්මපදය 2005: 42) යන දේශනාවට අනුව ස්වභාව ධර්මයේ පවතින දේවල් නිවැරදි අයුරින් ප්‍රයෝජන ගත යුතු බව බුදුන්වහන්සේ මෙමගින් පෙන්වා දී ඇති බව පැහැදිලි ය. එසේ පරිහරණය කිරීමේ දී තේරුම්ගත යුතු වන්නේ නුවණැත්තා තම ආත්මය දමනය කරන්නේ යම්සේ ද පුද්ගලයා විසින් පරිසරය පරිහරණය කළ යුත්තේ නුවණින් යුක්ත ව බවයි. බුද්ධිමත් මිනිසා විසින් ස්වභාව සෞන්දර්ය පරිහරණය කළ යුත්තේ කෙසේ ද යන්න ධම්මපදයේ දී පෙන්වා දී ඇත. යම් සේ බඹරා මලේ වර්ණයට ද මලේ සුවඳට ද හානියක් සිදු නොකර මල්පැණි ගෙන යයි. බඹරා ශාකයෙහි වර්ධනයට උපකාරී වන පරාග පෝෂණය කරයි. එසේ ම මිනිසා ද පරිසරයටත් පරිසරයේ ක්‍රියාවලීන්ටත් හානි නොකර එය පරිහරණය කළ යුතු වේ (ධම්මපදය 2005: 36).

එමෙන් ම ස්වභාවික පරිසරයෙහි පවත්නා සම්පත් සාහසික ලෙස පරිභෝජනයට ගැනීම නො කළ යුතු බව උදුම්බරකාදක උපමාව ආශ්‍රයෙන් දිඝජාණු කෝළිය පුත්‍රයාට බුදුරජාණන් වහන්සේ දේශනාකර ඇත. එම උපමාව නම්


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දිවුල් කෑමට අවශ්‍ය කරන පුද්ගලයා ගසට නැග අතු සොලවයි. එවිට පැසුණු ගෙඩි පමණක් නොව ගැට, මල් සහ අතු ද කඩා වැටේ. මේවායින් ප්‍රයෝජනයට ගන්නේ ඉදුණු හා පැසුණු ගෙඩි පමණි. අනික් සියල්ල ගසමුල දමා යයි. මෙවැනි ආකාරයේ පරිසර පරිහරණයන් බුදුසමය අගය නො කරයි. පරිසරයේ තිබෙන සම්පත් තමන්ට අවශ්‍ය ප්‍රමාණයට පමණක් ගෙන ප්‍රයෝජනයට ගත යුතු ය. ඒ අනුව පරසරයේ තිබෙන සම්පත් ප්‍රයෝජනයට ගත යුත්තේ වැනසීමට නොව රැක ගැනීමටයි. මේ බෞද්ධ ආකල්පය යි.

රමණීය වූ පරිසරය කාගේත් සිත් ඇදගන්නා අයුරින් පරිහරණය කළ යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. කාමභෝගීන් රමණීය පරිසරය දක්නා ස්වභාවයට වඩා වීතරාගී උතුමන් පරිසරය දක්නා වූ ස්වභාවය වෙනස් බව පෙන්වා දී ඇත. බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙස් ධර්මයන්ගෙන් මිදී ආධ්‍යාත්මික සෞන්දර්ය අවබෝධ කරගත් හ. එමෙන් ම උන්වහන්සේගේ ශ්‍රාවකයන් ද එම මාර්ගයේ ගමන් කරමින් අධ්‍යාත්මික සෞන්දර්ය වින්දනය කරමින් භෞතික ලෝකයෙහි පවත්නා ලද සුන්දරත්වය මෙවැනි වදන් තුළින් පෙන්වා දී ඇත.

> "රමණියානි අරඤ්ඤානි - යත්‍ථ න රමතී ජනො
> වීතරාගා රමිස්සන්ති - න තෙ කාමගවෙසිනො"
> (ධම්මපදය 2005: 46).

තව ද කාමභෝගී ගිහි ජනතාව ඇලුම් කරනු ලබන වන ලැහැබ ඇසුරෙහි වීතරාගී උතුමෝ ද රසවින්දනයක් ලබා ගනිති. ස්වභාවික ව අපට දායාද කරනු ලබන සුළඟ, ගලායන ගංගා, වහින වැස්ස, අහසෙහි පියාපත් විහිදවමින් හැසිරෙන පක්ෂීන් ආදිය රහතන් වහන්සේලාට මනා සෞන්දර්යාත්මක රසවින්දනයක් උරුම කරන බව පැහැදිලි ය. එහෙත් ගිහි ජනතාව එවැනි ස්ථානයන් තුළින් නිවැරදි රසවින්දනයක් උරුම කර නො ගන්නා බව සප්පක ථෙර ගාථාවෙන් පැහැදිලි වේ.

> "යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා - කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජීතා
> පලායන්ති ආලයමාලයෙසිනී - තදා නදී අජකරණී රමෙති මං" (ථෙරගාථා 2005: 100).

සසර භය නිමා කළ රහතන් වහන්සේ මෙලොව පවත්නා ස්වාභාවික අලංකාරයෙන් ආලෝකමත් වන ආකාරය මෙයින් පැහැදිලි වේ. එනම් යම් කලෙක පිරිසිදු සුදු පියාපත් ඇති කෙකිණියෝ කළු පැහැති වලාකුළ නිසා ඇති වූ භයින් තැතිගෙන වාසස්ථාන සොයමින් ඒවා කරා පලායත් ද එකල්හි අජකරණී නදිය මා සතුටු කරවයි. යනුවෙන් උන්වහන්සේ දක්නා ලද සෞන්දර්ය පෙන්වා දී ඇත.

තව ද ථෙරගාථාවල එන ගිරිමානන්ද ථෙරගාථාවෙන් ද ස්වාභාව සෞන්දර්ය වර්ණනාවට ලක් කර ඇත. තමන්ගේ බිරිද හා පුතු නැති වූ දුකින් කාලය ගත කළ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය සංසාර දුක කෙළවර කිරීමට හේතු විය. සංසාර දුක කෙළවර කර රහත්ඵලයට පත්වනවාත් සමග රහත්වීම නිසා සතුටට පත්වූවාක් මෙන් වැසි වසින්නට විය. ඒ වැස්සට තව තවත් වසින ලෙස ආරාධනා කරයි. වැස්ස වසින ස්වභාවය දැක එහි චමත්කාර ජනක භාවය සෞන්දර්යාත්මකව වර්ණනා කර ඇත්තේ මේ අයුරිනි.

> "වස්සති දෙවො යථා සුගීතං - ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා
> තස්සං විහාරාමි වූපසන්තො - අථ චෙ පත්ථයසී පවස්ස දෙව" (ථෙරගාථා 2005: 106).

> "මේඝය මනා ගීතයක් මෙන් වසී. මාගේ කුටිය මනාසේ සෙවිලි කරන ලද්දී වාතය නො හමන බැවින් සැප එලවන්නී වෙයි. සංසිඳුණු මම එහි වසමි. ඉදින් මේඝය තෝ කැමැත්තෙහි නම් වර්ෂා කරවායි කීය".

යනුවෙන් උන්වහන්සේ භාවනා යෝගීව වැඩ සිටි ස්ථානයට පතිත වූ වර්ෂාව තුළින් දකින ලද ස්වාභාව සෞන්දර්යය මේ අයුරින් වර්ණනාවට ලක් කර ඇති බව පැහැදිලි ය.

බුද්ධත්වයෙන් පසු බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට ගෙන්වා ගැනීමට සුද්ධෝදන රජු නොයෙක් උත්සහායන් දරා දූතයන් යැවීය. තම අභිමතාර්ථය ඉටුකර ගැනීම සඳහා කාලුදායී ඇමතියා බුදුරජාණන් වහන්සේ වැඩ සිටි ආරාමයට යැවීය. එහි දී පැවිදි බව ලැබූ කාලුදායී තෙරුන් වහන්සේ අනතුරුව බුදුන් වහන්සේ කිඹුල්වතට වැඩම කරවීමට තීරණය කළේ ය. එහි දී උන්වහන්සේට කිඹුල්වත් නුවරට පැමිණෙන මාර්ගය විචිත්‍ර අයුරින් වර්ණනාවට ලක් කළ අයුරු කාලුදායී ථෙර ගාථාවෙහි සඳහන් වෙයි.

> "අංගාරිනෝදනි දුමා හදන්තේ - ඵලේසිනෝ ඡදනං විප්පහාය
> තේ අච්චියන්තෝ ව පභාසයන්ති - සමයෝ මහාවීර භගීරසානං
> දුමානි ඵුල්ලානි මනෝරමානි - සමන්තතෝ සබ්බ දිසා පවන්ති
> පත්තං පහාය ඵලමාසමානා - කාලෝ ඉතෝ පක්කමනාය වීර
> නේවාතිසීතං නපනාතිඋණ්හං - සුඛො උතු අද්ධනියා භදන්තේ
> පච්ඡාමුඛං රොහිණීයං තරන්තං - පස්සන්තු තෙ සාකියා කෝලියා ච" (ථෙරගාථා 2005: 152).

එල අපේක්ෂාවෙන් කොළ හලා නව දලු පැමිණ ඇති ඇතැම් ගස් ගිණි අඟුරු මෙන් දිලිසෙයි. ගිනිසිළු මෙන් ප්‍රභාස්වර වෙයි. මුලු මහත් පරිසරය ම සුවඳ මලින් සුගන්ධවත් වී ඇත. උෂ්ණය හෝ සීතල අඩු වැඩි වශයෙන් ද නැත. මහාවීරයන් වහන්ස මේ කිඹුල්වතට වැඩීමට සුදුසුම කාලය යි. යනුවෙන් කරන ලද වර්ණනා කිරීමෙන් පසු බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කළහ. සිය ශ්‍රාවකයන්ගේ මෙවැනි වර්ණනා ප්‍රතික්ෂේප නො කිරීමෙන් පෙනෙන්නේ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බුදුන් වහන්සේ සෞන්දර්ය විරෝධියෙකු නොවී සෞන්දර්ය අගය කළ ආකාරය යි.

භාරතීය දර්ශනයන්හි පහළ වූ දර්ශනවාද අතුරින් බෞද්ධ දර්ශනයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. එයට මූලික වූ එක් කාරණයක් වන්නේ ශ්‍රාවකයන් භාවිත සිවුර ය. බුදුරජාණන් වහන්සේ සිවුර සඳහා අවශ්‍ය සැකැස්ම ලබා ගන්නේ ද පරිසරයෙනි. එනම් මනා ලෙස නියර බැඳ පිළියෙල කළ මගධ කෙතෙහි ලියදි බැඳි ආකාරයට අනුව සිවුරු සකස් කර ගන්නා ලෙස ශ්‍රාවකයන්ට උපදෙස් ලබා දී ඇත. (මහාවග්ගපාළි ii 2005: 708) භික්ෂූන් වැඩ සිටින ආරාම රමණීයව හා පිරිසිදුව තබා ගැනීමේ දී ඒවායෙහි පස්වනක් වර්ණයන්ගෙන් ආලේප කිරීමටත් මල්කම්, ලියකම් හා මෝරු දූති **"මාලාකම්මං ලතාකම්මං මකරං පඤ්චපටිකං......"** ආදිය ඇඳීමටත් උපදෙස් දුන් අයුරු චුල්ලවග්ග පාළියේ දැකගත හැකි ය (චුල්ලවග්ග පාළි I 2005: 124).

සෞන්දර්ය සංකල්පයන් අතුරින් ස්වාභාව සෞන්දර්යට බුදුරජාණන් වහන්සේ විශේෂ ස්ථානයක් ලබා දී ඇති අයුරු මහා පරිනිබ්බාන සූත්‍රයෙන් පැහැදිලි වේ. දිනක් ආනන්ද තෙරුන් සමග ධර්ම චාරිකාවේ වඩින විට ඒ අවට ඇති ස්ථාන වර්ණනා කරන ලදි. ආනන්ද මේ රජගහනුවර සිත් අලවන සුලුය. නිග්‍රෝධ හා චෝර පර්වත ද, ඉසිගිලි පර්වතයෙහි වූ කාල ශිලාව ද, වේභාර පර්වත පාමුල වූ සප්ත පර්ණී ගුහාව ද, ශීත වනයෙහි වූ සප්පසොණ්ඩික පර්වතය ද, තපෝදාරාමය ද, කලන්දක නිවාප නම් වූ වේලුවනය ද, මද්දකුච්චි නම් වූ මුව වනය ද සිත් අලවන සුලු සිත්කලු ස්ථාන වෙයි. (දීඝ නිකාය ii 2005: 182 -183) යනුවෙන් එහි පවත්නා ස්වභාව සෞන්දර්ය වර්ණනාවට ලක්කර ඇත. එමෙන් ම උන්වහන්සේ විශාලා මහනුවර සමීපයේ පිහිටි රමණීය චෛත්‍යස්ථානයන්හි පවත්නා ලද සුන්දරත්වය ද අගය කර තිබේ. විශාලා මහනුවර වනාහි ඉතාමත් දැකුම්කලු රාජධානියකි. එහි වූ උදේන, ගෝතමක, සත්තම්බක, බහුපුත්තක, සාරන්දද සහ චාපාල යන චෛත්‍යස්ථාන රමණීය හෙවත් සිත්කලු ඒවා බව වර්ණනා කර තිබේ.

> "රමණීයං ආනන්ද වේසාලියං, රමණීයං උදේනක චේතියං, රමණීයං ගෝතමක චේතියං, රමණීයං සත්තම්භක චේතියං, රමණීයං බහුපුත්තක චේතියං, රමණීයං චාපාල චේතියං........" (දීඝ නිකාය ii 2005: 184-185).

බුදුරජාණන් වහන්සේ වැරැද්දක් කරන ලද්දෙකුට දොස් නැගීමේ දී භාවිත කරන ලද බරපතල ම වචනය වන්නේ මෝඝ පුරුෂ යන්නයි. ස්වාභාව දහමට හානි කරන ලද පුද්ගලයන්ට ද මෙසේ දෝෂාරෝපණය කර ඇත්තේ උන්වහන්සේ ස්වාභාව දහම කෙරෙහි දැක් වූ මිත්‍රශීලී ආකල්පය නිසා ය. එක් කලෙක අලවි රට වැසි භික්ෂුවක් ආරාමය නවකම් කරනුයේ රුක් සිඳිත් අනුන් ලවා ද සිඳවත්. එකල්හි එම වෘක්ෂයට අධිගෘහිත දේවතා තොමෝ ඒ බව බුදුරජාණන් වහන්සේට දන්වා සිටියහ. එවිට උන්වහන්සේ කෙසේ නම් හිස් පුරුෂයිනි තෙපි රුක් සිඳීමත් සිඳවීමත් කරන්නාහු ද, හිස් පුරුෂයිනි මිනිස්සු රුක්හි ජීවය ඇතැයි යන හැඟීම් ඇතියෝය ආදී වශයෙන් ගර්හා කොට ශික්ෂා පද පැනවූහ.

> "කතං හි නාම තුම්හෙ මොඝපුරිසා රුක්ඛං ඡින්දිස්සථාපි ඡේදාපෙස්සථාපි, ජීවසඤ්ඤිනො හි මොඝපුරිසා මනුස්සා රුක්ඛසමිං......" (පාචිත්තියපාළි 2005: 106).

බුදුරජාණන් වහන්සේ සෞන්දර්යය විෂයයෙහි දැක් වූ ආකල්පය ප්‍රතීයමාන වන තවත් අවස්ථාවක් අංගුත්තර නිකායේ සඳහන් වෙයි. එහි දී උන්වහන්සේ මහණෙනි ස්ත්‍රී රූපය, ශබ්දය, ගන්ධය, රසය හා ස්පර්ශය හැර සිත් ඇද ගන්නා වෙනත් විසිතුරු දෙයක් පුරුෂයකුට ලොව නැතැයි ද ස්ත්‍රියකට ද පුරුෂයකුගේ රූපය, ශබ්දය, ගන්ධය, රසය හා ස්පර්ශය හැර සිත් ඇද ගන්නා වෙනත් විසිතුරු දෙයක් ලොව නැතැයි ද දේශනා කර තිබේ.

> "නාහං භික්ඛවේ අඤ්ඤං ඒක රූපම්පි සමනුපස-සාමි යං ඒවං පුරිසස්ස චිත්තං පරියාදය තිට්ඨති යථයිදං භික්ඛවේ ඉත්ථි රූපං, ඉත්ථි සද්දෝ, ඉත්ථි ගන්ධෝ, ඉත්ථි රසෝ...." (අංගුත්තර නිකාය I 2005: 02).

බුදුරජාණන් වහන්සේ සෞන්දර්යය විරෝධියකු නොවූ බවට සක්කපඤ්හ සූත්‍රය ද සාධක සපයයි. බුදුරජාණන් වහන්සේ ගණ්ඩබ්බ වෘක්ෂය මුල වැඩසිටින අවස්ථාවක ශක්‍ර දේවේන්ද්‍රයාගේ වීණා වාදකයා වූ පංචසිඛගේ වීණා වාදනය අගය කළේ එහි ඇති සරාගී බව හෝ සැලකිල්ලට නො ගනිමිනි. බුදුරජාණන් වහන්සේ ඉදිරියේ දී තම පැරණි පෙම්වතිය වූ සූරියවච්චසාව නම් තැනැත්තියගේ ශරීරාංග වර්ණනා කරමින් ගායනා කරන ලද ගීතයක් වීතරාගී උතුමකුගේ ප්‍රසාදයට ලක් විය හැකි යැයි කිසිවකු නො සිතනවා ඇත. ලා හිරු රැස් බඳු බබළන සිරුරක් ඇති හැම ශරීර අංගයකින් ම හොබනා වූ ගිලනුන්ට බෙහෙත් සේ ද, කුසගිනි ඇත්තවුන්ට ආහාර සේ ද ඔබ මට ප්‍රිය වන්නේ ය. බෙහෙවින් තැවුණු ඇතෙක් සිහිල් දිය ඇති පොකුණකට බසින්නා සේ කෙසේ නම් මම තිගේ තන බඩ තුරට බස්නෙම් දෝ. තිගේ ලස්සන ඌරු යුගලයට මත් වූ මම රාගය දුරලන්නට කිසිඳු කරුණක් නො දනිමි. මනා ඌරු යුගලක් ඇත්තිය, මද බැල්මක් ඇත්තිය, කල්‍යාණිය මා වැළඳ ගන්න ආදී වශයෙන් කරන ලද වර්ණනය කෙතරම් සෞන්දර්යාත්මක ලෙස උන්වහන්සේට දැනුනේ ද යන්න එම අවස්ථාවේ දී කරන ලද ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වෙයි. පංචසිකය තගේ වෙණෙහි තත් හඬ තගේ ගී හඬ සමග ද තගේ ගී හඬ තත් හඬ සමග ද සැසඳේ. ඔබේ ගී හඬ තත් හඬ නො ඉක්මවයි. තත් හඬ ගී හඬ නො ඉක්මවයි යනුවෙන් ඇගයීමට ලක් කර ඇති අයුරු මින් පැහැදිලි ය.

> "සංසන්දති බො තෙ පංචසිඛ තනතිසසරො ගීතස්සරෙන ගීතසසරො ච තන්තිස්සරෙන න ච පන තෙ පඤ්චසිඛ තනතිසසරො ගීතසසරං

> අතිවත්තති ගීතසසරො ච තනතිසසරං ....." (දීඝ නිකාය ii 2005: 402).

බුද්ධදේශනාව තුළ ස්වභාව සෞන්දර්යය අගය කළ තවත් අවස්ථාවක් ධනිය ගෝපාල සූත්‍රයෙන් දැක ගත හැකි ය. දිනක් වැසි වසින්නට ආසන්න අවස්ථාවක දී මහී ගං තෙර එතෙර හා මෙතෙර සිටි බුදුන් වහන්සේ හා ධනිය ගෝපාල අතර සිදු වූ සංවාදය පරිසරයේ ස්වභාව සෞන්දර්යය වීතරාගී හා අවීතරාගී දෙදෙනෙකු විඳ ගන්නා ආකාරය මැනවින් ප්‍රකට කරයි.

> "පක්කොදනො දුද්ධඛීරොහමසමි - අනුතීරෙ මහියා සමානවාසො
> ඡන්නා කුටි ආහිතො ගිනි - අථ චෙ පත්ථයසී පවස්ස දෙව" (ඛුද්දක නිකාය 2005: 12).

ආහාර අනුභව කොට, කිරිදොවා ගෙන මනාව සෙවිලි කළ පැල්පතට වී දොර වසාගෙන සහකාරිය සමග ජීවත් වන තමා තෘප්තිමත් ව සිටින බැවින් හැකි තාක් වැසි වසින්න යයි ධනිය ගෝපාල ප්‍රකාශ කරයි. එයට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මේ අයුරිනි.

> "අක්කොධනො විගතඛිලොහමස්මි - අනුතීරෙ මහියෙකරත්තිවාසො
> විවටා කුටි නිබ්බුතො ගිනි - අථ චෙ පත්ථයසී පවස්ස දෙව " (ඛුද්දක නිකාය 2005: 12).

ඉහත සඳහන් කිසිඳු කටයුත්තක් නිම නො කළ ද තමන් වහන්සේ ද හුදකලාව තෘප්තිමත් ව සිටින බැවින් කැමති තාක් වැසි වසින්න යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කරති. ලෞකික හා ලෝකෝත්තර තත්ත්වයන් තුළින් ස්වභාව සෞන්දර්ය දකින ලද ආකාරය මින් අවබෝධ කර ගත හැකි ය.

සෞන්දර්ය සුරැකීම සඳහා බුදුරජාණන් වහන්සේ අනුදත් ක්‍රියාමාර්ගයන් තුළින් ස්වභාවික සෞන්දර්යය පිළිබඳ බෞද්ධ විග්‍රහයන් තවත් ප්‍රතීයමාන වේ. ගංගා, ඇල, දෙළ, ගිරි සිඛර, මල්වතු උයන්වතු වෘක්ෂලතා වනසිවුපාවුන් හා පක්ෂීන් ආදිය ස්වාභාව දහමේ අපූර්වතම නිර්මාණයන් බව පැහැදිලි ය. බුදුදහමට අනුව පරිසරය අයත් වන්නේ මිනිසාට පමණක් නොව ස්වාභාව දහමේ ජීවත්වන සියලු සත්ත්වයන්ට බව චක්කවත්ති සිහනාද සූත්‍රයෙන් පෙන්වා දී ඇත. (දීඝ නිකාය iii 2005: 102) තව ද සත්ත්වයන් මෙන් ම ගහකොළ ආදිය පවා රැක ගැනීම පාලකයාගේ වගකීම බව බුද්ධ දේශනාව තුළින් පෙන්වා දී ඇත. එනම් බ්‍රාහ්මණ සමාජය තුළින් පෙන්වා දුන් යාග සංකල්පය සත්ත්ව ලෝකයටත් ශාක ලෝකයටත් විනාශකාරී කරුණක් බව පැහැදිලි ය. සිය දහස් ගණනින් සත්ත්වයන් බිලි දීම, යාග ස්තම්භ සඳහා ගස් කැපීම, යාග භූමිය පිළියෙල කිරීම සඳහා පැළෑටි විනාශ කිරීම, මේ තුළින් ස්වභාවික පරිසරය විශයෙහි දැඩි බලපෑමක් සිදු වූ බව පැහැදිලි ය. මෙවැනි යාගයන් සිදු කිරීමේ දී සත්ත්ව හිංසනයෙන් තොර ස්වාභාවික පරිසරය විනාශ කිරීමෙන් තොරව සිදු කිරීම යහපත් බව කූටදන්ත සූත්‍රය තුළින් පෙන්වා දී ඇත.

> "තස්මිං ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ නෙව ගාවො හඤ්ඤිංසු න අජෙළකා හඤ්ඤිංසු න කුක්කුට සූකරා හඤ්ඤිංසු න විවිධා පාණා සංඝාතං ආපජ්ජිංසු න රුක්ඛං ජිජ්ජිංසු යූපත්ථාය න දබ්බා ලුයිංසු බරිහිසත්ථාය......." (දීඝ නිකාය i 2005: 274).

බුද්ධ දේශනාවට අනුව පරිසර හිතකාමී ස්වාභාවික පරිසරයට ආදරය කරනු ලබන ප්‍රතිපත්තීන් පෙන්වා දීම තුළින් එවැනි යාගයන් සිදු කළ බව කූටදන්ත සූත්‍රයෙන් පැහැදිලි ය. එදා සිට පුරෝහිත බමුණාගේ මග පෙන්වීම යටතේ පරිසරය ගහ කොළ පැළෑටි සතා සිව්පාවුන් ආරක්ෂා කරනු ලබන යාගයක් වූ බව පැහැදිලි ය. මෙවැනි වැරදි චාරිත්‍රයන් නිවැරදි කරමින් ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කිරීමෙන් ස්වාභාව සෞන්දර්ය ආරක්ෂා කිරීමට ගත් ක්‍රියාමාර්ගයන් ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය. තවද බුද්ධ දේශනාව මගින් ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා පෙන්වා දුන් ක්‍රියා මාර්ගයන් මගින් ද ස්වභාව සෞන්දර්ය විෂයෙහි බුදුදහම දක්වන ලද ආකල්පය කෙබඳු ද යන්න පැහැදිලි ය. එනම් ජීව පරිසරයෙහි ශාක වර්ග අතුරින් මුලින් පැලවෙන බීජ, කඳින් පැලවෙන බීජ, පුරුක්වලින් පැලවෙන බීජ, දල්ලෙන් පැලවෙන බීජ, ඇටවලින් පැලවෙන බීජ, වශයෙන් පස්වර්ගයකි.

> "මූල බීජං, ඛන්ධ බීජං, ඵලු බීජං, අග්ග බීජං, බීජ බීජමෙව පඤ්චමං ඉතිවා ඉති එව රූපා බීජගාම භූතගාම සමාරම්භා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.... " (දීඝ නිකාය i 2005: 112).

මෙවැනි බීජවර්ග විනාශ කිරීමෙන් වැළකී සිටීම සම්‍යක් දෘෂ්ටික පුද්ගලයාගේ ශීලයට ඇතුළත් බව බුදුන්වහන්සේ සාමඤ්ඤ ඵල සූත්‍රයෙන් පෙන්වා දී ඇත. මේ අයුරින් ස්වාභාවික සම්පත් කෙරෙහි මෙතරම් සැලකිල්ලක් දක්වා ඇත්තේ සොබා දහමේ අලංකාරය අරක්ෂා කිරීම සඳහා ය. එනම් වස් ශික්ෂා පදය අනුමත කිරීම, සප්‍රාණික ශාඛයන් කඩා බිඳ දැමීම උපසපන් භික්ෂූන්ට ඇවතක් බව දැක්වීම, උදහරණ ලෙස දැක්විය හැකි ය. තවද නිල් තණ මත මළ මුත්‍ර බැහැර කිරීම, ජලයට කුණු රොඩු දැමීම, ඉදුල් ආදිය දැමීම නො කළ යුතු බවත් එසේ සිදු කරන්නේ නම් පාචිත්‍ය ඇවතක් වන බව පාචිත්‍ය පාලියේ දී පෙන්වා දී ඇත.

> "යා පන භික්ඛුණී උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා සංඛාරං වා විඝාසංවා හරිතෙ ඡඩ්ඩෙය්‍යා වා ඡඩ්ඩාපෙය්‍ය වා පාචිත්තියං.." (පාචිත්තිය පාලි 2005: 154).

එමෙන් ම ජලයෙහි මළ මූත්‍ර පහ කිරීම හා කෙළ ගැසීම නො කළ යුතු බව ද එය වරදක් බව ද පෙන්වා දී ඇත. "න උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා" (පාචිත්තිය පාලි 2005: 554) මෙවැනි කාරණාවන් තුළින් ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීමට බුදුදහම ගන්නා ලද උත්සාහය කෙබඳු ද යන්න මින් පැහැදිලි ය. තව ද සංයුත්ත නිකායේ වනරෝප සූත්‍රයේ දී දක්වන පරිදි වන,


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උයන් වතු වැවීම, ඒදඬු මං මාවත් ඉදි කිරීම, ලිං පොකුණු සකස් කිරීම සැමදා පිං වැඩෙන පිංකම් වශයෙන් පෙන්වා දී ඇත.

"ආරාමරෝපා වනරෝපා - යේ ජනා සේතු කරකා
පපඤ්ච උදපානඤ්ච - යෙ දදන්ති උපස්සයං
තේසං දිවා ච රත්තෝ ච - සද පුඤ්ඤං පවඩ්ඪති "
(සංයුත්ත නිකාය 2005: 60).

මේ අයුරින් ස්වාභාවික පරිසරය සුරකෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට උපදෙස් දෙමින් බුදුන්වහන්සේ අවධාරණය කරන්නේ ගස් වැල් කැපීම, මල්, ඵල ආදිය කඩා විනාශ කර දැමීම වෙනුවට තම සන්තානය තුළ ඇති කෙලෙස් නැමැති වනය සිඳ දමන ලෙසයි.

"වනං ඡින්දථ මා රුක්ඛං - වනතෝ ජායතී භයං
ඡෙත්වා වනඤ්ච වනථඤ්ච - නිබ්බානා හෝථ භික්ඛවෝ" (ධම්මපද පාළි 2005: 96).

එය බිය උපදවන බැවින් ඉන් මිදී නිර්වාණය ලබා ගැනීමට උත්සාහ ගත යුතු ආකාරය පැහැදිලි කර ඇත. පරිසරයේ විද්‍යමාන සියලු දෑ ආරක්ෂා කිරීමට උපදෙස් දෙන බුදුදහම පරිසරයේ අංග වන ජලය, ශබ්දය හා වායුව දූෂණය නො කළ යුතු බවට ද උපදෙස් ලබා දීම තුළින් සෞන්දර්ය පිළිබඳ බුදුදහමේ ආකල්පය තවත් පැහැදිලි ය.

බුද්ධ දේශනාවට අනුව විශ්වයෙහි ජීවත්වන ඕනෑම සත්ත්ව කොට්ඨාසයකට මෙන් ම ගහ කොළ ආදියට පවා ජලය අත්‍යවශ්‍ය සාධකයකි. ඛණිජ තෙල්, අපද්‍රව්‍ය වැනි දෑ ජලයට එක් කිරීම ආදී විවිධ හේතු නිසා ජල දූෂණය සිදු වෙයි. විනාශ වූ ජලය භාවිත කිරීමෙන් ස්වාභාවික ප්‍රාණීන් විනාශ වීම, රෝගාබාධ ඇති වීම ආදී අයහපත් ප්‍රතිඵල උදා කරයි. එම නිසා ජල සම්පත ආරක්ෂා කිරීම සඳහා බෞද්ධ ඉගැන්වීම් අතිශය වැදගත් වෙයි. ගිලන් භික්ෂූන් හැර වෙන කිසිඳු භික්ෂුවක් ජලයට කෙළ ගැසීම, මළ මූත්‍ර කිරීම, ආරාමයෙහි එකතුවන කුණු රොඩු ආදිය දැමීම නො කළ යුතුය. එසේ කරන්නවුන්ට දුකුලා ඇවතක් සිදුවන බව බුද්ධදේශනාවෙන් පෙන්වා දී ඇත. "**අප්පහරිතේ වා ඡඩ්ඩේහි අප්පාණකේ වා උදකේ ඕපිලාපේහි ඉති,**" යනුවෙන් දනය වැළඳීමෙන් පසු ඉතිරි වූ ඉඳුල් ආහාර නිල් තණ නැති ස්ථානයකට හෝ ප්‍රාණීන් නැති ජලයකට බැහැර කළ යුතුය. (ඛුද්දක නිකාය 2005: 110) ඉඳුල් ආහාර සහිත පාත්‍රය සෝදා ඉතිරි වූ ජලය ගමෙහි හෝ ඇතුළු ගමෙහි නො දමමියි හික්මිය යුතු ය. යනුවෙන් දේශනා කිරීමෙන් අවට පරිසරයේ සුන්දරත්වයට ආරක්ෂා කිරීමට ගත් උත්සාහය පැහැදිලි ය. එමෙන් ම භික්ෂූන් වහන්සේලාට පෙරහංකඩ ගෙන පෙරා පිරිසිදු කරගත් ජලය පමණක් පානය කිරීමට අනුදැන වදරා තිබීම ද සැලකිල්ලට ලක් කළ යුතු වැදගත් කරුණකි.

භික්ෂූන් වහන්සේලා වාසය කළ පැරණි ආරාමවල ජලය දෙයාකාරයකට වර්ග කර ඇත. පානීය ජලය හා පරිභෝජනීය ජලය වශයෙනි. පානීය ජලය යනු පානය කිරීමට හා මුව දෝවනයට ගන්නා ජලයයි. "**මුඛ විකාල හත්ථඤ්ඤේව පිවනතථඤ්ච**" යනුවෙන් සඳහන් වේ. චරියා පිටකයේ දී "**පානීයං පිපාසහරණත්ථාය**" යනුවෙන් පෙන්වා දෙන්නේ පිපාසය දුරු කිරීමට ගන්නා ලද ජලය වශයෙනි. පරිභෝජන ජලය ඇති දෙසට කොට්ට, මෙට්ට ආදිය ගසා නො දමන ලෙස බුදුදහම අවධාරණය කර ඇත. මෙසේ ලෙඩ රෝග ඇති වීම ප්‍රථමික අවදියේ ම වළක්වා ගැනීම අපේක්ෂා කර ඇත. භික්ෂු වාසය සඳහා වූ ආරාම අනුක්‍රමයෙන් සංවර්ධනය වන විට පරිභෝජනීය ජලය තබා ගැනීමට අවශ්‍යතාව ඇති විය. මේ සඳහා ජලය එක්රැස් කර තබා ගන්නා ජල භාජන විවිධ නම්වලින් හඳුන්වාදී ඇත. දිය බඳුන (**උදක භාජන**), ජල කටාරම (**උදක කටාහ**), ජල කලය (**උදක ඝට**). ජල සැළිය (**උදක චාටි**), ජලය තබා ගන්නා විශාල බඳුන (**උදක කුම්භ**), ජලය තබා ගන්නා උස් වූ කලය (**උදක ධොනික**), ජලය තබා ගන්නා මහා සැළි (**උදක මණික**), උස් මහත් ජල සැළිය (**උදක කුම්භ**) වශයෙන් ප්‍රධාන ජල භාජන හඳුන්වා දී ඇත. (චරියාපිටක අට්ඨකථාව 1976: 128)

පරිභෝජනීය ජලය යනු පානය කිරීමට හැර සෙසු ඕනෑ එපාකම්වලට ගන්නා ජලය යි. පුද්ගලයාගේ එදිනෙදා ජීවිතයේ නොයෙක් අවශ්‍යතාවයන්ට ගන්නා ලද ජලය පරිභෝජනීය ජලය වේ. පානීය ජලය හා පරිභෝජනීය ජලය මිශ්‍ර කිරීම ඇවතක් ලෙස චුල්ලවග්ගපාලියෙහි දක්වේ. අත්පා දෝවනයට තැබූ ජලය අපවිත්‍ර කිරීම ඇවතක් ලෙස පෙන්වා දී ඇත. පා සෝදන භික්ෂුවක් එක් අතකින් ජලය ඉසිය යුතුය. අනිත් අතින් පා සේදිය යුතුය. එක ම අතින් ජලය ඉසීමත් පා සේදීමත් නො කළ යුතු බව විනය පිටකයෙහි සඳහන් වේ. බුදුරජාණන් වහන්සේ ම.නි. බ්‍රහ්මායු සූත්‍රයේදී භික්ෂූන් වහන්සේලාට දේශනාකර ඇත්තේ තමාට ප්‍රමාණවත් පරිදි පැන් පිළිගෙන පරිභෝජනය කළ යුතු බවයි. පරිසරයට හා වෙනත් සම්පත්වලට හානි නොවන පරිදි ජල පරිහරණය කරන ලෙස බුදුදහමෙන් පෙන්වා දී තිබේ. මේ තුළින් ජලය විනාශ නො කර ස්වභාව සෞන්දර්යයෙහි අසිරිය ආරක්ෂා කිරීමට උපදෙස් ලබා දුන් අයුරු පැහැදිලි ය.

ස්වභාව සෞන්දර්යයට බාධා වන තවත් අංශයක් වන්නේ ශබ්ද දූෂණය යි. කර්මාන්ත ශාලා හා ජනගහණ වර්ධනය නිසා ද ශබ්ද දූෂණය සිදු වේ. අල්ප ශබ්දකාමී උතුමකු වූ බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට උපදෙස් දුන්නේ ද නිශ්ශබ්දතාව හෙවත් ආර්ය තුෂ්නිම්භූතභාවය වඩාත් උතුම් බවයි. දිනක් බුදුරජාණන් වහන්සේ හමු වීමට අඹ වනයට යන අවස්ථාවේ දී උන්වහන්සේ භික්ෂූන් දහස් ගණනක් පිරිවරාගෙන සිටිය ද කිසිඳු ශබ්දයක් නොවීය. එම නිසා පුදුමයට පත් වූ රජු ඒ බව තම නිලධාරීන්ගෙන් විමසූ විට ඔවුන් ප්‍රකාශ කළේ බුදුරජාණන් වහන්සේ ඇතුළු ශ්‍රාවකයන් නිශ්ශබ්දතාව අගය කරන බවයි. උන්වහන්සේ නිහඬතාව අගය කළ බවට පොට්ඨපාද සූත්‍රය ද සාධක සපය යි.

"අපපසදදා භොනෙතා භොනතු. මා භොනෙතා සදදමකත්ථ. අයං සමණො ගොතමො ආගච්ඡති. අපපසද්දකාමො ඛො සො පනායසමා අපපසද්දසස වණණවාදි..." (දීඝ නිකාය I 2005: 388).

උන්වහන්සේ වැඩම කරන අවස්ථාවක දී බමුණා ස්වකීය


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ශ්‍රාවකයන් නිහඬ කර ගත්තේ ශ්‍රමණ භවත් ගෞතමයන් අල්ප ශබ්දකාමී බැවින් නිහඬ වන ලෙස දන්වමිනි. නිතරම කෑ කෝ ගසමින් ශබ්ද පවත්වන භික්ෂූන් පවා බුදුරජාණන් වහන්සේගේ ගර්හාවට ලක් වී ඇත්තේ මාලු මරණ කෙවුලන් හා සමාන කරමිනි. උදාන පාලියේ යසෝජ තෙරුන් වහන්සේ ඇතුළු භික්ෂූන් පිරිසක් මහත් ශබ්ද ඇති කරමින් උස් හඬින් ඝෝෂා කරමින් පැමිණෙනවා දුටු බුදුරජාණන් වහන්සේ ඔවුන් පන්නා හැරි බවත් රැස් වූ අවස්ථාවල දී දහැමි කතාවකින් යුක්ත වීම හෝ ආර්ය තුෂ්ණිම්භූත භාවයෙන් යුක්ත වීම හෝ අනුගමනය කළ යුතු බවත් දේශිත ය. බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය සුන්දරව පවත්වා ගැනීම සඳහා කෙතරම් උත්සාහ ගත්තේ ද යන්න මේ තුළින් මැනවින් පැහැදිලි වෙයි.

වායු දූෂණය නිසා ද ස්වාභාවික පරිසරය අපිරිසිදු වන බැවින් එයින් අත් මිදීමට බුදුරජාණන් වහන්සේ උපදෙස් ලබා දී ඇත. මිනිසාගේ වචනයෙන් පිටවන නරක වායුව නිසා ද, ගින්නෙන් හා දුමෙන් ද, විෂ වායුව විස දුම් ආදිය ස්වාභාව දහමට මුදා හැරීම නිසා ද වායුව දූෂණය වෙයි. එසේ දූෂණය වූ වායුව ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙන් සත්ත්ව ලෝකයට හා පරිසරයට විවිධ විපත් පැමිණෙනු ඇත. එබැවින් වායු දූෂණය වළක්වා ගැනීමට බුදුදහම උපදෙස් දෙයි. වචනයේ අසංවර භාවය නිසා වායු දූෂණය සිදු වෙයි. බොරු කීම, කේලාම් කීම, හිස්වචන කීම, එරුස වචන කීම, නිසා පිටවන වායුව තුළින් අවට පරිසරය දූෂණය වෙයි. බුදුසමයට අනුව වචනයෙන් සංවර වීම තුළින් වායු දූෂණය නැති කර ගත හැකිය. **"කායේන සංවරෝ සාධු සාධු වාචාය සංවරෝ....."(ධම්මපද පාළි 2005: 114)** ගින්නෙන් හා දුමෙන් ද වායු දූෂණය සිදුවන බැවින් ඉන් අත්මිදිය යුතුය. විනය පිටකයට අනුව පැහැදිලි වන්නේ ශික්ෂා පද පැනවීමේ දී මෙවැනි කරුණු සැලකිල්ලට ගෙන ඇත්තේ බුදුරජාණන් වහන්සේ ස්වභාව සෞන්දර්යය විෂයයෙහි දක් වූ යහපත් ආකල්පය නිසා ය. ගිලන් වූ භික්ෂුවක් හැර වෙනත් භික්ෂුවකට ගිණි දල්වීම හෝ අනුන් ලවා ගිනි ගොඩවල් ගැස්සවීම තහනම් කොට ඇති අතර යම් භික්ෂුවක් එසේ කරයි ද ඉන් පාචිත්තිය ඇවතක් සිදුවන බව ද සඳහන් වෙයි. රෝගී වූ භික්ෂුවකට වුව ද රෝගය සන්සිඳෙන තාක් පමණක් ගිනි දැල්විය හැකිය. රෝගය සංසිඳුණු විහා ම ගිනි තැපීමෙන් අත් මිදිය යුතුය. සෙනසුන් පවිත්‍ර කිරීමේ දී වායු දූෂණය වලක්වා ගත හැකි ආකාරයට පිරිසිදු කළ යුතු බව ද චුල්ලවග්ගපාළියේ වත්තක්ඛන්ධකයේ දී උපදෙස් ලබා දී ඇත. (චුල්ලවග්ග පාළි ii 2005: 364) සෙනසුන මකුලුදැල් සහිත වේ නම් ඉහළ සිට පහළට ඉවත් කළ යුතුය. වෙහෙර කසල ඇත්නම් නියමිත ස්ථානයට දැමිය යුතුය. භික්ෂූන් සමීපයෙහි සෙනසුන් ගසා නො දැමිය යුතුය. උඩු සුළඟට හෝ යටි සුළඟට සෙනසුන් ගසා නො දැමිය යුතුය. ආදී වශයෙන් කරුණු දක්වා ඇති අතර එවැනි දේ කිරීම ඇවැත් සිදුවිය හැකි කාරණා බව ද දේශනා කොට තිබේ.

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් බොහොමයක් ම පාහේ සකස් වී ඇත්තේ පරිසර හිතකාමී පදනමකිනි. උන්වහන්සේ ආර්ථිකය පිළිබඳ සාකච්ඡා කළ ද දේශපාලනය පිළිබඳ සාකච්ඡා කළ ද ඒ සෑම අවස්ථාවක දී ම අවට පරිසරය ආරක්ෂා වන පරිදි ක්‍රියා කළ යුතු බව අවධාරණය කර ඇත. අවට පරිසරයේ අංග වන ගස් වැල් සතා සිවුපාවා කෙරෙහි දැක් වූ සංරක්ෂණශීලී ආකල්පයෙන් පැහැදිලි වන්නේ උන්වහන්සේ තුළ ස්වභාව සෞන්දර්යය කෙරෙහි පැවති යහපත් ආකල්පය බව පැහැදිලිය. බුදු සිරිත පමණක් නොව බුදුදහම ද ස්වභාව සෞන්දර්යයෙහි චමත්කාරජනක ස්වභාවය අගය කළ බවට ඉහත සඳහන් උදාහරණ කදිමට සාක්ෂි සපය යි. එමෙන් ම ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම මගින් අපට ලැබෙන යහපත් ප්‍රතිඵලයන් මොනවාද යන්න පශ්චාත් බෞද්ධ යුගයට අයත් මිළින්ද පඤ්හය තුළින් පෙන්වා දී ඇත (මිළින්ද පඤ්හ, 2005: 354).

- **රුක්ඛො නාම පුප්ඵ ඵලදරො** - ගසක් යනු මල් හා ගෙඩි දරන්නකි. මලින් ලෝකයට අලංකාරයත්, ගෙඩිවලින් ප්‍රණීත රසයත් ලබා දෙයි.
- **රුක්ඛො උපගතමනුපවිට්ඨානං ජනානං ඡායා දෙති.** ගස තමා වෙත එළඹෙන සියල්ලන්ට සෙවන ලබා දෙයි. ශරීරය දහඩියෙන් තෙත් වූ විට ගහෙන් ලැබෙන සෙවන කෙතරම් අස්වැසිල්ලක් ද යන්න පැහැදිලි ය. යමෙක් ගසක සෙවනෙහි හිඳින්නේ හෝ නිදන්නේ ද එවිට ගසක අත්තක් හෝ නො සිදෙන බව පේතවත්ථුවේ දී පෙන්වා දී ඇත.
"යස්ස රුක්ඛස්ස ඡායාය - නිසීදෙය්‍ය සයෙය්‍ය වා න තස්ස සාඛං භඤ්ජෙය්‍ය - මිත්ත දුබ්භොහි පාපාකො" (පේත වත්ථු 2005: 52).
- **රුක්ඛො ඡායා වෙමත්තං න කරොති** - ගස තම සෙවන සතුරු මිතුරු සැම දෙනාට ම සමව ලබා දෙයි. කිසිවෙකුට වෙනසක් නො කරයි. ගස සිඳින්නට එන පුද්ගලයන්ට ද සෙවන නිරන්තරයෙන් ලබා දෙයි.

මේ අනුව බෞද්ධ දර්ශනය තුළින් ස්වභාවික පරිසරයෙහි පවත්නා ගහ කොළ, සතා සිව්පාවුන් ආරක්ෂා කරමින් ස්වාභාව සෞන්දර්ය ආරක්ෂා කළ යුතු අයුරු ඉහත කරුණු තුළින් පෙන්වා දී ඇති බව පැහැදිලි ය.

## නිගමනය

වර්තමානයේ ස්වභාව සෞන්දර්යයේ අසිරිය දිනෙන් දින නොයෙක් අකටයුතුකම් හේතුවෙන් විනාශයට පත් වේ. ඒ සඳහා වර්තමානයේ දී සෞන්දර්යයේ අසිරිය ආරක්ෂාකර ගැනීමටත් පරිසරයට සිදු වන හානිය වළක්වා ගැනීමටත් නොයෙක් ක්‍රම උපායන් භාවිත කර ඇති බව පැහැදිලි ය. මේ සඳහා තාක්ෂණික හා යාන්ත්‍රික ප්‍රවේශයන් උපයෝගී කරගෙන ඇත. එක් ගැටලුවක් විසඳීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග නිසා අනාගතයේ ඒ තුළින් නොයෙක් පරිසර ගැටලු නිර්මාණය විය හැකි ය. වර්තමානයේ ස්වාභාවික පරිසරයෙහි අසිරිය ආරක්ෂා කිරීම සඳිහා නොයෙක් උපාය මාර්ග ගන්නා අතර මෙම උපාය මාර්ගයන්ට වඩා වෙනස් වූ ක්‍රමයන් බුදුදහමින් පෙන්වා දී ඇත. ස්වාභාව සෞන්දර්යයෙහි සෞන්දර්යාත්මක අගය පෙන්වා දීම ස්වාභාවික පරිසරයෙන් අපට ලැබෙන දායාද ආදිය තුළින් බුදුසමය වෙනස් වූ ක්‍රම උපායන් භාවිත කර


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඇති බව පැහැදිලි ය. නිර්වාණ මාර්ගය මූලික කරගත් දර්ශනයක් ඉදිරිපත් කිරීම බුදුදහම මූලික පරමාර්ථය යි. නිර්වාණාවබෝධය ලබන තුරු ලෞකික ජීවිතය සාර්ථකව පවත්වා ගත යුතු ය. ඒ සඳහා ස්වභාවික පරිසරයෙහි පවත්නා සම්පත් පරිහරණය කිරීම අත්‍යවශ්‍ය වේ. එය නිවැරදිව ස්වභාවික පරිසරයෙහි අසිරිය ආරක්ෂා කරමින් සිදු කළ යුතු අයුරු බුදුදහමින් පෙන්වා දී ඇත. ඒ අනුව පරිසරය සම්බන්ධයෙන් පුද්ගලයා තුළ ශික්ෂණයක් ඇති කිරීමට බුදදහම පෙන්වා දී ඇති මෙම උපාය මාර්ග බෙහෙවින් වැදගත් බව පෙන්වා දිය හැකි ය.

බුද්ධ චරිතයේ බොහෝ සිදුවීම් හා පරිසරය හා සම්බන්ධ ය. තවද බුදහදහම පෙන්වා දෙන මෛත්‍රී සංකල්පයයෙන් ද ඒ බව පැහැදිලි ය. මේ ලෝකයේ උපන් නූපන් පෙනෙන නො පෙනෙන සත්ත්වයන් හා ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීමට මෛත්‍රීසහගත ව කටයුතු කළ යුතු බව පෙන්වා දී ඇත. ඒ අනුව පරිසරය ආරක්ෂා කරමින් ස්වාභාවික සෞන්දර්යයේ අසිරිය ලොවට දායාද කිරීමට බෞද්ධ දර්ශනය උත්සාහ ගෙන ඇති බව මින් නිගමනය කළ හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


### ප්‍රාථමික මූලාශ්‍රය

අංගුත්තර නිකාය, (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ඛුද්දක නිකාය, (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ඛුද්දක නිකාය, ථේරගාථා පාලි (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ඛුද්දක නිකාය, ධම්මපදය (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ඛුද්දක නිකාය, පෙතවත්ථු පාලි (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

චුල්ලවග්ග පාළි (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

චරියාපිටක අට්ඨකථාව (1976) සයිමන් හේවාවිතාරණ මුද්‍රණය.

දීඝ නිකාය, (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පාචිත්තියපාළි, (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිම නිකාය, (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මහාවග්ගපාලි ii, (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මිලින්දපඤ්හ (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සංයුත්ත නිකාය, (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීයික මූලාශ්‍රය

පියරතන හිමි, වෑගම (2006) සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය, දිවුලපිටිය, සරස්වති ප්‍රකාශන.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2007) පාලි සාහිත්‍යය, කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ.

රාමායණය (සංස්.) කවිචින්තාමණි අභයසිංහ (1959) කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම,

සුධම්ම හිමි, තලංගල්ලේ (2001) පරිසර ගැටලුව හා පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ආකල්පය, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ශබ්දකෝෂ හා විශ්වකෝෂ

අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය (2004) අලගියවන්න, පුවතිසි කොළඹ 10, සූරිය ප්‍රකාශකයෝ.

නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය (2003) ලියනගේ, සිරි කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මහා සිංහල ශබ්දකෝෂය (2008) විජයතුංග, හරිශ්චන්ද්‍ර කොළඹ, ඇම් ඩී ගුණසේන සහ සමාගම,

ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (1999) සෝරත, වැලිවිටියේ වැල්ලම්පිටිය, චතුර මුද්‍රණාලය.

සිංහල ශබ්දකෝෂය (1992) දෙහිවල, සංස්කෘතික දෙපාර්තමේන්තුව.




© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
නවවැනි කලාපය; 2018 දෙසැම්බර්, පිටු 10-16
ISSN 1800-1459 eISSN 2673-1177

© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ගී පද රචනාවලින් මතු වන ශබ්ද'ර්ථ රස නිෂ්පත්තිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් : තෝරා ගත් ගීත නිර්මාණ කිහිපයක් ඇසුරින්

## (An Analysis of the Effect of Melody and Meaning on Aesthetic Enjoyment in Selected Lyrics of Sri Chandraratne Manawasinghe)

ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර[1*]

[1]භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
*darshani.priyanka1970@gmail.com

**සාරසංක්ෂේපය**

ප්‍රතිභාපූර්ණ කවියෙකු, ගීත රචකයෙකු වූ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සිංහල ගීත සාහිත්‍යයේ ශබ්ද'ර්ථ මූලික රසෝද්ජනනය කළ ගීත රැසක් නිර්මාණය කළ පුරෝගාමී ගීත රචකයෙකු ලෙස හැඳින්විය හැකි ය. සිංහල ගීත සාහිත්‍යය ඉතිහාසයේ ග්‍රැමෆෝන් යුගයෙහි අනුකාරක ඕලාරික ගීත බිහි වන අවධියක, සිංහල ගීතය කාව්‍යමය ගුණයෙන් පිරුණු අර්ථවත් කලාංගයක් බවට පත් කිරීමට මානවසිංහගේ ගීත නිර්මාණ බෙහෙවින් දායක විය. 1950 දශකය පමණ වන විට සිංහල ගීතය නැමැති කලා මාධ්‍යයේ ස්වතන්ත්‍රතාව ඇති කිරීමට දායක වුණු පුරෝගාමී ගීත රචකයින් වූ සුනිල් ශාන්ත, ආනන්ද සමරකෝන් වැනි නිර්මාණකරුවන් ගත් උත්සාහය මානවසිංහ ගීත නිර්මාණ මගින් ඵල දැරිණි. සිංහල ගීත ක්ෂේත්‍රයේ මානවසිංහ ගීත රචනා සුවිශේෂත්වයට පත් වන්නේ ඔහුගේ ගී පද රචනා විලාසයෙහි ඇති අනන්‍යතා ලක්ෂණ නිසා බව මානවසිංහ ගී පද අධ්‍යයනයෙන් පැහැදිලි වෙයි. ප්‍රවීන භාෂා විශාරදයෙකු වූ මානවසිංහ සිය ගී පද නිර්මාණ කාර්යයේ දී කවි බස, ශබ්ද'ර්ථ රස රස නිෂ්පත්තිය අනූන වින්දනාත්මක කාව්‍යෝක්තිවලින් පෝෂිත සුගායනීය ලෙස හසුරුවන්නට දැක් වූයේ අපූරු දක්ෂතාවකි. ගීතයට උපයුක්ත බසෙහි මතුපිට අරුත නොව එහි ධ්වනිය සහ එමගින් ප්‍රකට වන අරුත කෙරෙහි සියුම් අවධානයක් යොමු කරමින් ඉතා සංකීර්ණ අනුභූතියක් වුව ද සරල ව සුගායනීය රිද්මයකින් යුක්ත ව මානවසිංහ ප්‍රශස්ත ගීත රැසක් නිර්මාණය කළේ ය. අව්‍යාජ ගැමි පරිසරයෙන් තමා ලද අද්දැකීම් ඇසුරෙන් ඔහු රචනා කළ ගීතවල ආකෘතිය ද ප්‍රස්තුතයට ගැලපෙන පරිදි තෝරා ගැනීමට මානවසිංහ දැක් වූ කුසලතාව නිසා ඔහුගේ ගීතවල පදවැල්වල තිබුණු සුගායනීය බව, තනු නිර්මාණයේ දී නිර්මාණ ශිල්පියාට සිය කාර්යය වඩාත් පහසු කළේය. කවියේ සහ ගීතයේ ආකෘතිය මැනවින් හඳුනා ගත් නිර්මාණකරුවෙකු වූ මානවසිංහ, සිය නිසඟ කවීත්වය ශ්‍රව්‍ය ගෝචර කලා මාධ්‍යයක් වූ ගීතයට යොදා ගත් අයුරු සහ එහිදී ඔහුගේ නිර්මාණ ශිල්පීය කුසලතාවෙහි විශේෂතා මෙහි දී ඔහු විසින් රචිත තෝරා ගත් ගීත නිර්මාණ කිහිපයක් ඇසුරින් අධ්‍යයනයට ලක් වෙයි. ගුණාත්මක පර්යේෂණයක් වූ මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ මුල් ම කාව්‍ය සංග්‍රහය වූ "කෝමල රේඛා" නම් ගීත පද්‍ය නිර්මාණ සංග්‍රහයත් ද්විතියික මූලාශ්‍රය ලෙස මානවසිංහගේ ගීත පිළිබඳ ලිය වී ඇති ශාස්ත්‍රීය ලිපි ලේඛන භාවිත කෙරිණි.

කේන්ද්‍රීය වචන : ශබ්ද රසය, අර්ථ රසය, රස නිෂ්පත්තිය, චමත්කාරය.

Sri Chandraratne Manawasinghe was a pioneer lyricist in Sinhala literature who immensely contributed to create aesthetic enjoyment of music. In a time where imitative and distasteful songs prevailed in the Sri Lankan literature, Manawasinghe's contribution was paramount in converting Sinhala lyrics into creative, aesthetic songs. In the 50's Sunil Santha and Ananda Samarakoon strived to generate uniqueness in Sinhala lyrics which fruited in Manawasinghe's literary creations. Manawasinghe was a prolific linguist and it enabled him to employ diction and rhyme to produce delightful lyrics in a skillful manner. As a poet, he was highly concerned with the implicit meaning of lyrics and the implications of the tone. This facilitated him to convert complicated experiences in simplistic yet rhythmic songs. He skillfully made use of the authentic natural experiences of rural villages for structure and content of his lyrics which made the composer's task easier. Hence, the researcher intends to study how Manawasinghe employed his inherent poetic abilities to compose lyrics by selecting some of the important ones that connote aesthetic sensibility. Text analysis and literary appreciation will be used in relation to methodology to arrive at the conclusion which establishes the view that Manawasinghe is a creative and aesthetic lyrist.

Key words: Taste of Melody, Taste of Meanings, Aesthetic Enjoyment, Aesthetic Delight

## හැඳින්වීම

"සංගීතයේ ජනප්‍රියතම ශාඛාව වන ගීතය සංගීතයේ හා භාෂාවේ අනුකූලතා පූර්වක සංයෝගයේ ඵලය ලෙස හැඳින්වීම මැනවැයි සිතමි. එසේ වුව ද සංගීතය හා භාෂාව එකිනෙකට වෙනස් මං පෙත් හි සැරි සරන්නේ වෙනස් වූ ගමන් ලීලාවන්ගෙන් ද සැදෙමිනි" (අමරදේව 1989: 15).

ගීතය වූ කලි සංගීතයේ පමණක් නොව නූතන කලා'ංග අතර වඩාත් ම ජනප්‍රිය කලා මාධ්‍යය ලෙස හැඳින්විය හැකි ය. ගුවන්විදුලිය, රූපවාහිනිය, සිනමාව, කැසට්පටය මෙන් ම අන්තර්ජාල ඇතුළු නූතන සන්නිවේදන මාධ්‍යයන්හි වැඩි ම ඉඩහසර ගීතය මගින් අත්පත් කර ගෙන ඇති බව විද්‍යමාන ය. ශ්‍රව්‍ය ගෝචර කලා මාධ්‍යයක් වූ ගීතයේ ආරම්භය දුරා'තීතය දක්වා දිවෙන බව එහි ඉතිහාසය පිරික්සීමෙන් පැහැදිලි වෙයි. සිංහල ගීතයේ ආරම්භය පිළිබඳ මේ වන

විට විද්වතුන් විවිධ අදහස් පළ කොට ඇත. නූතන සිංහල ගීතයේ ආරම්භය 19 වන සියවසයේ මෙරට ප්‍රචලිත වන නාඩගම්, නූර්ති නාටක ගීත ඇසුරෙන් සිදු වූ බව මහාචාර්ය සුනිල් ආරියරත්න පෙන්වා දෙයි.

> "වර්තමාන අර්ථයෙන් ගීත පදමාලා හැඩ ගැසුණේ නාඩගම් සහ නූර්ති නාටක ඇසුරෙනි. මෙම රංගන සඳහා ඉන්දීය රාගධාරි සංගීතය උපයෝගී කර ගන්නා ලදී. ඉන්දීය සංගීතයෝ නූර්ති ගීත සඳහා කර්ණ රසායන තනු සැපයූහ. නාට්‍ය රචකයෝ එම තනු සඳහා පදමාලා 'ගැට ගැසූහ" (ආරියරත්න 1994: 52).

ඉතිහාසයේ සිට සිංහලයා 'ගීතය' නම් කලා මාධ්‍යය රස විඳිමින් ගීතය හා සමීප සම්බන්ධතාවක් ගොඩ නගා සිටි බව දෘශ්‍යමාන සාධක ඇසුරෙන් ප්‍රත්‍යක්ෂ වෙයි. නූතන අර්ථයෙන් "ගීතය" ලෙස ස්වාධීන ව වැඩුණු කලා මාධ්‍යක් අතීතයේ ජනයා අතර ප්‍රචලිත ව නොතිබුණ ද ඔවුන්ගේ සමස්ත රස වින්දන මාධ්‍ය ගීතය, සංගීතය සමඟ අවියෝජනීය ලෙස බද්ධ වී තිබෙන අයුරු සාධක මගින් සනාථ වෙයි. කලා මාධ්‍ය අතර ගීතය වර්තමානයේ ජනප්‍රියතම කලා'ංගය බවට පත් ව ඇති අතර මේ වන විට ගීතය තරම් වෙනස්වීම්වලට හා විවිධ අත්හද බැලීම්වලට ලක් වුණු කලා මාධ්‍යයක් නැති තරම් ය. මේ හේතුවෙන් සාහිත්‍යාංගයක් ලෙස ගීතයෙහි අගය වර්ධනය වූවා සේ ම හීන වූ අවස්ථා ද බොහෝ ය. ඉකුත් සියවසට සාපේක්ෂ ව පසුගිය දශක කිහිපය තුළ සිංහල ගීතයෙහි විවිධ ප්‍රවණතා රැසක් දැක ගත හැකි ය. මෙහි දී ගීතයේ අකෘතිය, අන්තර්ගතය පමණක් නොව එය ඉදිරිපත් කරන විලාසය, ගීතයක් රස විඳීමෙන් අපේක්ෂිත අරමුණු ද සාකල්‍යයෙන් විපර්යාසයන්ට බඳුන් වී තිබේ. මෙසේ විවිධ විපර්යාසයන්ට බඳුන් වෙමින් දශක ගණනාවක් තුළ සහෘදයා පිනවන ලද සිංහල ගිතයේ ගමන් මග හෙළි පෙහෙළි කරමින් එහි කලාත්මක මෙන් ම සාහිත්‍යයික අගය වැඩි දියුණු කිරීමට වෙහෙසුණු නිර්මාණකරුවන් රැසක් සිංහල ගීත ක්ෂේත්‍රයේ, පද රචනයෙහි, තනු නිර්මාණයෙහි, ගායන විෂයෙහි දක්නට ලැබෙයි. ඒ අතර 1950 දශකයේ ගීත පද රචනා විෂයෙහි සිංහල ගීතයේ අනන්‍යතාව ඉස්මතු කරමින් එය රුවෙන් සහ ගුණෙන් පිරි සුභාවිත කලා'ංගයක් බවට පත් කරන්නට කැප වූ නිර්මාණකරුවන් අතර ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. ප්‍රතිභාපූර්ණ කවියකු වූ මානවසිංහ වර්තමානයේ පවා සම්භාවනාවට ලක් වන්නේ, කවිය සහ ගීතයේ ඥතීත්වය මනා වැටහීමකින් යුක්ත ව, සිය නිසඟ කවීත්වයේ ආලෝක ධාරාව ගීත නිර්මාණ ක්ෂේත්‍රය වෙත පතිත කරමින් සාර්ථක ගීත නිර්මාණ රචනා කළ නිර්මාණකරුවකු ලෙස ය. මෙනිසා මානවසිංහ ගී පද රචනා සුගායනීය අර්ථ පූර්ණ මධුර බවින් අනූන විය.

> "මානවසිංහගේ රචනා විෂයෙහි ගැනෙන තවත් විශේෂතාවක් වන්නේ, සිය අද්දැකීමට සරිලන පරිදි කවියේත් ගීයේත් ආකෘතිය නිර්මාණය කරන්නට ඔහු සතු වූ සුවිශේෂ හැකියාවයි"
> (මානවසිංහ 2013 xvi).

මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණ වන්නේ සිංහල ගීත ක්ෂේත්‍රයේ මානවසිංහ සලකුණ සටහන් වීමට හේතු සාධක වූ මානවසිංහ ගීත නිර්මාණ ශෛලියෙහි අනන්‍යතා ලක්‍ෂණ ඔහුගේ ගීත නිර්මාණ ඇසුරෙන් හඳුනා ගැනීම යි.

## සාහිත්‍ය විමර්ශනය

අනාදිමත් කාලයක සිට රසික සිත් සතන් ආනන්දයෙන් පිනවන ලද ගීතය නූතන කලා'ංග අතර රසික ප්‍රසාදයට පත් ජනප්‍රිය ම කලා මාධ්‍යය බවට පත් ව ඇත. ගීතය සහ එහි ප්‍රවණතා පිළිබඳ ව මුද්‍රිත සාහිත්‍යාංගවල මෙන් ම ගුවන්විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය වැනි තාක්‍ෂණික මාධ්‍ය ඔස්සේ පුළුල් ව කරුණු සාකච්ඡා වෙයි. ශ්‍රව්‍ය ගෝචර මාධ්‍යයක් වූ ගීතය ඇසීමෙන් ම රසය උපදියි. ඒ අනුව ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් විසින් රචනා කරන ලද ගීත සවන් දීමෙන්, ඒවා ගැයීමෙන් ලද අද්දැකීම් මෙම පර්යේෂණ කාර්යයේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත වූ බව කිව යුතු ය. මෙම පර්යේෂණයේ සාහිත්‍ය විමර්ශනයේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ජන්ම ශත සංවත්සරය නිමිත්තෙන් ප්‍රභාත් මානවසිංහ විසින් නව සංස්කරණයක් ලෙස 2013 වසරේ ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ මුල් ම කාව්‍ය සංග්‍රහය වූ "කෝමල රේඛා" නම් ගීත හා පද්‍ය නිර්මාණ සංග්‍රහය භාවිත විණි. මෙයට අමතර ව ද්විතියික මූලාශ්‍රය ලෙස මානවසිංහගේ ගීත පිළිබඳ ව ලියවී ඇති ශාස්ත්‍රීය ලේඛන සහ ගීතයේ නූතන ප්‍රවණතා පිළිබඳ ලියවී ඇති ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි ලේඛන භාවිත කෙරිණි.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ගී පද රචනාවල සාර්ථකත්වයට එම ගී පද රචනාවලින් උත්පාදනය වන ශබ්ද'ර්ථ රසය සාධනීය ලක්ෂණයක් ලෙස බලපා ඇත් ද?

## පර්යේෂණ අරමුණු

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ගී පද රචනාවලින් මතු වන ශබ්ද'ර්ථ රස නිෂ්පත්තිය පිළිබඳ විමර්ශනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වෙයි.

ද්විතියික අරමුණු ලෙස මානවසිංහගේ ගී පද රචනා ශෛලියේ අනන්‍යතා ලක්‍ෂණ හඳුනා ගැනීමත්, කවියෙකු ලෙස මානවසිංහ සිංහල ගීත ක්ෂේත්‍රයේ සුවිශේෂත්වයට පත් වීමට බල පෑ හේතු විමර්ශනය කිරීමත් දැක්විය හැකි ය.

## පර්යේෂණයේ වැදගත්කම

නූතන කලා මාධ්‍යය අතර ජනප්‍රියතම කලා මාධ්‍යය ලෙස විචාරක අවධානයට ලක් ව ඇති කලා මාධ්‍යය වූ සිංහල ගීතයේ ආරම්භය, විකාශනය සහ අද්‍යතන ප්‍රවණතා පිළිබඳ කතිකාවත් ගොඩ නැගෙමින් පවතී. සිංහල ගීතයේ අද්‍යතන ප්‍රවණතා පිළිබඳ අවධානයට ලක් කරන විට පසුගිය දශක දෙකක පමණ කාලය තුළ එහි ආකෘතිය, වස්තු විෂය පමණක් නොව ගායන ශෛලීන් සහ ගීතයක් නිර්මාණය කිරීමේ සහ රසවිඳීමේ අරමුණු ද ඉතා ශීඝ්‍රයෙන් වෙනස්


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වීම්වලට බඳුන් වෙමින් පවතී. අතීතයේ හුදෙක් රසවිඳීමේ අභිලාෂයෙන් ගැයුන ගීතය, වර්තමානයේ වෙළඳ ලෝකයේ ඉහළින් ම වැජඹෙන ප්‍රකාශන මාධ්‍යයක් බවට පත් ව තිබේ. මෙලෙස වාණිජ අරමුණු මුල් කරගෙන ජනප්‍රිය ගීත රැල්ල සිංහල ගීත ක්ෂේත්‍රයේ ඉස්මතු වන අතර, එහි ම අන්තර් ප්‍රතිඵලයක් ලෙස සුභාවිත ගීතයේ අවශ්‍යතාව පිළිබඳ රසික, විචාරක අවධානය දැඩි ලෙස යොමු වෙමින් පවතී. ශ්‍රව්‍ය ගෝචර කලා මාධ්‍යයක් වූ ගීතයේ ශබ්ද රසය මෙන් ම එහි අර්ථ රසය තීව්‍ර කිරීමට හේතු සාධක වන ගීතයේ සාහිත්‍යමය අගය ඉස්මතු කරමින් ගීත රචනා කළ නිර්මාණකරුවන් අතර ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ගී පද රචනා ඉදිරියෙන් ම ඇති බව ඒවා රස විඳින විට අවබෝධ වෙයි. ප්‍රතිභාපූර්ණ කවියෙකු වූ මානවසිංහ සාහිත්‍යයෙන් තමා ළඳ පන්නරය ගීතය නම් මාධ්‍යය වෙත උපයෝගී කර ගනු ලබන්නේ කවිය සහ ගීතය යන මාධ්‍යය දෙකෙහි ආකෘතික වෙනස මනාව අවබෝධ කර ගනිමින් ය. මෙනිසා ම ඔහුගේ ගී පද රචනා ගීතයේ ආකෘතිය මනාව හඳුනා ගත් ශබ්ද'ර්ථ රසයෙන් පරිපූර්ණ නිර්මාණ විය. මානවසිංහගේ ගීත රචනා ශෛලියේ අනන්‍යතා ලක්ෂණ අතර ප්‍රබල ලක්ෂණයක් වන්නේ ඔහු සතු කවීත්වය ගීතයෙහි අපූරුවට ඉස්මතු වීම යි. මෙනිසා මෙතෙක් ප්‍රාමාණික අධ්‍යයනයට හසු නොවුණු මානවසිංහ ගීතයේ මතුවන ශබ්ද'ර්ථ රස නිෂ්පත්තිය පිළිබඳ විමර්ශනයක් සිදු කරන මෙම පර්යේෂණය සිංහල ගීත ක්ෂේත්‍රයේ මානවසිංහ සලකුණ පිළිබඳ ව අධ්‍යයනය කරන පර්යේෂකයන්ට වැදගත් වනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණයක් (Qulitative Research) වූ මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ජන්ම ශත සංවත්සරය නිමිත්තෙන් ප්‍රභාත් මානවසිංහ විසින් 2013 වසරේ නව සංස්කරණයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ මුල් ම කාව්‍ය සංග්‍රහය වූ "කෝමල රේඛා" නම් ගීත පද්‍ය නිර්මාණ සංග්‍රහය භාවිත විණි. එමෙන් ම මානවසිංහ ගී පද රචනා රසවිඳීමෙන් සහ ගැයීමෙන් ලද අද්දැකීම් ද පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කෙරිණි. ද්විතියික මූලාශ්‍රය ලෙස මානවසිංහගේ ගීත පිළිබඳ ලිය වී ඇති ශාස්ත්‍රීය ලිපි ලේඛන සහ ගීතයේ නූතන ප්‍රවණතා පිළිබඳ ප්‍රකාශිත ග්‍රන්ථ, ලිපි ලේඛන භාවිත කෙරිණි.

## සාකච්ඡාව

සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍යයේ විශ්වනාථ නම් පඬිවරයා "රසය ආත්මය කොට ගත් වාක්‍යය කාව්‍යය" ලෙස හඳුන්ව යි. සංස්කෘත සාහිත්‍යයේ "කාව්‍ය" යන්න පුළුල් අරුතකින් සමස්ත සාහිත්‍ය විෂයෙහි ගද්‍ය, පද්‍ය, ශ්‍රව්‍ය-දෘශ්‍ය කලා මාධ්‍ය උදෙසා භාවිත කරයි. මේ අනුව කවියෙහි නිවුන් සොහොයුරෙකු බඳු ගීතයෙහි ද මුඛ්‍ය හරය රස නිෂ්පත්තිය හෙවත් සහෘදයා තුළ රස ජනනය කිරීම යි. ප්‍රශස්ත කවියක හෝ ගීතයක රසෝ'ද්දීපනය සඳහා හේතු වන බසෙහි ශබ්ද සහ අර්ථ රසය එකිනෙකින් වෙන් ව හඳුනා ගත නොහැකි ය. ශබ්දයේ රස නීරස බව තහවුරු කිරීමට එක ම මිනුම්දණ්ඩ, ශබ්දය එහි අර්ථය උද්දීපනයට හේතු වන්නේ ද? නැද්ද? යන්න යි. එනම් කවියක හෝ ගීතයක ශබ්දය වූ කලී එහි අර්ථයේ දේංකාරය යි. කවියට සාපේක්ෂ ව ශබ්ද රසය තීව්‍ර ලෙස මතු කරන ගීතයේ පදවැල්වලින් උපදින රසය අසන්නා තුළ චමත්කාරය උපදව යි. ගීතයෙහි මෙම සුවිශේෂත්වය මැනවින් පසක් කර ගත් ප්‍රතිභාපූර්ණ කවියෙකු වූ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ නිර්මාණවල දැකිය හැකි සුවිශේෂත්වය භාවිත භාෂාවේ ශබ්ද'ර්ථ පූර්ණ මධුර බව යි.

> "ප්‍රශස්ත ගේය පදයක් නම් එය නිසැක වශයෙන් කවීත්වයෙන් ආඪ්‍ය ප්‍රබන්ධයක් විය යුත්තේ ය; හෙවත් කවියක් විය යුත්තේ ය; එබැවින් පද යන්නට වඩා යෝග්‍ය වචනය නම් "කාව්‍ය" යන්න සක් සුදක් සේ පැහැදිලි ය. මේ නයින් ගේය කාව්‍ය යනු ගැයිය යුතු හෝ ගායනා කරන කවිය"
> (ආරියරත්න 2005: 23).

එද මෙද'තුර සිංහල ගීත සාහිත්‍යය පෝෂණය කළ ගී පද රචකයින්ගේ සංඛ්‍යාව ප්‍රාමාණික වශයෙන් සැලකුවහොත් සිංහල කවි කිවිඳියන්ගේ සංඛ්‍යාවට නොදෙවෙනි ය. ගුවන්විදුලිය, රූපවාහිනිය, සිනමාව, ටෙලි නාට්‍ය, කැසට්පට මෙන් ම අන්තර්ජාල වැනි නූතන කලා මාධ්‍යයන්හි ගීතය සුවිශේෂ ඉඩහසරක් අත්පත්කර ගෙන ඇත. මෙසේ දශක කිහිපයක සිට සහෘදයන් පිනවමින් විකාශනය වූ සිංහල ගීත ක්ෂේත්‍රයේ මුල් යුගයේ බිහි වන අනුකාරක ගීත රැල්ලෙන් මිදී ස්වතන්ත්‍ර ගීත නිර්මාණයට උනන්දුවක් දක්වන ශිල්පීන් රැසක් 1950 දශකයෙහි බිහි විය. ඒ අය අතර ආටිගල සරච්චන්ද්‍ර, හර්බට් එම් සෙනෙවිරත්න, පියසේන කොස්තා, මර්සලින් ජයකොඩි පියතුමා, සරත් විමලවීර, කරුණාරත්න අබේසේකර ආදීහු වෙති.

> "නූර්ති යුගය සහමුලින් ම ගී තනුවලට වචන දැමූ යුගයකි; ග්‍රැමෆෝන් ගී යුගය ද මුළුමනින් ම වාගේ ගී තනුවලට වචන දැමූ යුගයකි. ගුවන් විදුලි ගීයෙහි ප්‍රථම දශක කිහිපය ද එබඳු ය. මෙම කාල පරිච්ඡේදයවල වචන දැමීමේ කාර්යයට එරෙහි ව උන්නේ ආනන්ද සමරකෝන්, සුනිල් ශාන්ත, අමරදේව ආදී කිහිප පොළකි"
> (ආරියරත්න 2008: 2).

වර්ෂ 1947 සිට සුනිල් ශාන්ත ස්වතන්ත්‍ර ගීත නිර්මාණ ඉදිරිපත් කරමින් ගුවන්විදුලි සේවය ඔස්සේ සිංහල ගීත නිර්මාණ ක්ෂේත්‍රයේ ප්‍රගමනයට මාවත සකස් කළේ ය. මෙම මාවතෙහි ගමන් ගත් ආනන්ද සමරකොන් සූරින්ගේ ප්‍රශස්ත ගීත රචනා එවකට රසිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය විය. ග්‍රැමෆෝන් යුගයේ ආරම්භයේ දී අනුකාරක මාවතක් ඔස්සේ ගමන් කළ සිංහල ගීත ක්ෂේත්‍රය ස්වාධීන මගකට අවතීර්ණ කිරීමට උත්සාහ දැරූ ගී පද නිර්මාණකරුවන් අතර මානවසිංහයන්ට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. බහුශ්‍රැත භාෂා පඬිවරයෙක් වන මානවසිංහ පාලි, සංස්කෘත භාෂා පමණක් නොව බෙංගාලි භාෂාව ද මැනවින් දැන සිටියේ ය. ඔහුගේ ගී පද රචනාවල උපයුක්ත බස අර්ථපූර්ණ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ධ්වනියෙන් යුතු ව රසෝද්ජනනය කිරීමට සමත් වන්නට හේතු වන්නේ ඔහු සතු මෙම පුළුල් භාෂා දැනුම යැයි සිතිය හැකි ය.

> “මානවසිංහගේ කවි බසෙහි ඇති මේ සුවිශේෂත්වය බෙංගාලි බස උගැන්වීමෙන් ලත් පන්නරය නිසා විය යුතු යි. ඔහු ගීතයක් ලියන විට ගීතයේ අරමුණ තහවුරු කර ගැනීමට තමා දත් කවර බසකින් හෝ වචන ගොනු කර ගැනීමට සමත් විය. එහෙත් ඒ වචන අපේ සිංහල භාෂාවට පිටස්තර වූ ඒවා සෙයින් නොපෙනේ. ඒවා එතරම් ම සරල ය. බොහෝ විට අප මෙතෙක් පරිහරණයට නොගත් වචන ඔහු එළියට ඇද දැමී ය”
> (රත්නායක 1996: 86).

මානවසිංහගේ ගීතවල උපයුක්ත බසෙහි ශබ්ද'ර්ථ දෙකෙහි අන්‍යෝන්‍ය සංකලනයෙන් මතු වන රසය ධ්වනිත කළ සාර්ථක ගී පබැඳුමක් ලෙස ඔහුගේ “ගඟබොඩ සැනසිල්ල” නම් ගීත නිර්මාණය දැක්විය හැකි ය.

“නැගෙන නැගෙන දිවෙන දිවෙන තරඟ වළලු පිට නැගී
සෙලවි සෙලවි පාවෙන මල් පියලි ගඟ දිගේ
වැලි තලයේ හැපි හැපී
සිලි සිලියෙක ගැලි ගැලී
ගඟටම යයි යළි යළී
හමන සිහිල පවන සමග වෙළි වෙළී
ළපලු රිකිලි නැමී නැමී
ගඟට බරවෙලා - ගඟට බරවෙලා
ගඟට බරවෙලා
තැන තැන තුරු සෙවණැලී
යට ඇති තණ පියවිලී
ගඟබඩ දෙයි සැනිසිලී”
(මානවසිංහ 2013: 78 )

මෙම ගීතයෙහි අනුභූතිය වන්නේ ගඟක් අසබඩ පුද්ගලයකු ලබන සුවදායි සැනසිල්ල යි. මෙහි ගීතය පුරා ම ඇති උත්ප්‍රාස රසය නොනවත්වා ගලන ගඟක අසිරිය සහෘද සිතෙහි සිතුවම් කරයි. ගීතයෙහි උපයුක්ත වදන්වල ශබ්ද මාධුර්යය ගඟබඩ අසිරිය විඳිමින් සැනසිලි සුව ලබන්නාගේ සිත සිහිල් කරයි.

මානවසිංහගේ තවත් ප්‍රශස්ත ගීත නිර්මාණයන් වන “වසන්ත ගීතය” නම් ගී පද රචනාවේ ද උපයුක්ත පදවැලෙහි සුගායනීය බව ගීතයට අපූරු චමත්කාරයක් එක් කරයි.

“කුසුම් පිපේ අතු පතරේ
සතර දිගන්තේ
කෝකිල කූජනය නැගේ
මධුර වසන්තේ ...”
(මානවසිංහ 2013: 56 )

විෂය ලෝකයෙන් තමන් ලබන අද්දැකීම් අපූර්වත්වයෙන් යුතු ව සහෘද සිතෙහි චමත්කාරය දනවන අයුරින් ප්‍රතිනිර්මාණය කිරීමට මානවසිංහ දැක්වූයේ මනා කුසලතාවකි. සොබාදහමින් තමා ලද අනුභූතීන් අපූර්වත්වයෙන් යුතු ව මානවසිංහ විසින් ගීතයට නගා ඇති අතර මෙහි ඇති සුවිශේෂත්වය වන්නේ සොබාදහම තේමා කොට ගත් බටහිර රෝමාන්තිකවාදී කවීන්ගේ සංකල්ප අනුකරණය නොකොට, තමා සැබවින් ම අත්විඳි අව්‍යාජ ගැමි අද්දැකීම් නවමු ආකාරයෙන් මානවසිංහ තම නිර්මාණ ඔස්සේ ප්‍රතිනිර්මාණය කිරීම යි. මේ සඳහා ඔහු අතින් ලියැවුණු “ගුරු ගෙදරට යන අතරමග” නම් ගීත නිර්මාණය කදිම උදාහරණයකි.

“අකුරට යනවයි කියලා - ටිකිරි අයියා බැදිවලමයි
ඉන්නකො මම ගුරු ගෙදරට ගිහින් කියන්නම්
ගිහින් කියල - මේ බැද්දෙදි අල්ලල දෙන්නම්

පඳුරු අස්සෙ කුරුල්ලන්ට - ඔමරි කරනවා විතරයි
සිළිඳු ඉතින් දර කැඩුවද මමත් කියන්නම්
ගිහින් කියල- පොඩි නැන්දට අල්ලල දෙන්නම්

ඉඳුණු කරඹ ගොඩාරයක් - මගේ ඔඩොක්කුවෙ තියනව
ටිකිරි අයියටත් දේතක් පුරවල දෙන්නම්
පුරවල දී තව මිදි නම් හිඹුටුත් දෙන්නම්

සිළිඳුට සී පද කියන්න - කුරුල්ලන්ට මල තියන්න
ලොකුවුණාම මේ බැද්දෙම හේන් කොටන්නම්
හේන් කොටල අපි දෙන්නට පැලක් හදන්නම්

මාළු ඇඹුල් තියල් කරල - පොල් සම්බල් රසට හදල
ඇල් හාලේ බතුත් එක්ක අනල කවන්නම්
කවන ගමන් මමත් කවන තරමක් කන්නම්

හැන්දෑවට කහ සුදු රතු- හෙන්දිරික්ක මල් පිපුණම
ඒ ළඟ ගල් පොත්තක් උඩ වාඩි කරන්නම්
වාඩි කරල ළඟින් ඉඳන් නළා පිඹින්නම්

ගමේ ළමිස්සියන් එක්ක - විලට ගිහින් පන් උගුලල
රටා පුරල මෝවිටියා පැදුරු වියන්නම්
පැදුරු වියල ඒකෙ ඉඳන් පංචි දමන්නම්.........”
(මානවසිංහ 2013 :71, 72).

මෙම ගීතයට ප්‍රස්තුත වන චරිත දෙක වන “ටිකිරි” සහ “සිළිඳු” නම් නැනා මස්සිනා දෙපළ බැද්දෙ දි හමු වී ඇති වන සංවාදය මානවසිංහ රසවත් කාව්‍යෝක්ති භාවිත කරමින් ගීතයට නගයි. “අකුරට යනවා, කුරුල්ලන්ට මල තියන්න, බැද්ද, ඇල් හාලේ බත” වැනි යෙදුම් ශ්‍රවණය


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කිරීමෙන් අසන්නා තුළ අව්‍යාජ ගමක අසිරිය සිතුවම් වෙයි. කහ, සුදු, රතු හෙන්දිරික්ක මල් පිපෙන්නේ හැන්දෑ යාමට ය. හෙන්දිරික්ක මල් පූදින විට සවස් කාලය උදවන බව ගැමියෝ දනිති. ගොම්මන උදවන විට සිළිඳුගේ තනි රකින්නට ටිකිරි සූදනමින් සිටියි. මෙමගින් මානවසිංහ ගමෙහි නැනා මස්සිනා අතර උපදින ප්‍රේමය ව්‍යංග්‍යාර්ථවත් ව දක්වයි. මෙහි සඳහන් ගමේ ළමිස්සියන් සමඟ විලට ගොස් පන් උදුරාගෙන විත් වියන මෝවිටියා පැදුර ගමක විවාහ සංස්ථාව මගින් අපේක්ෂිත සශ්‍රීකත්වය සංකේතවත් කරයි. සරල ආකෘතියක් ඔස්සේ රසවත් කාව්‍යෝක්ති භාවිත කරමින් රචිත මෙම ගීතයෙහි උපයුක්ත බස මනා සංයමයකින් යුතු ව කෘෂි ආර්ථික රටාවක් ඇති ගමක නැනා- මස්සිනා අතර ඇති වන ප්‍රේමය සහ විවාහය ධ්වනිත කරයි. මානවසිංහයන් බොහෝ කාව්‍ය සහ ගීත නිර්මාණ සඳහා අනුභූතින් සපයා ගත්තේ තමන් අත්විඳි ගැමි අද්දැකීම් ඔස්සේ ය. මෙහිදී ගැමි අද්දැකීම් විශ්ලේෂණය කරමින් කවි ලියූ නිර්මාණකරුවකු වූ විමලරත්න කුමාරගම කවියාට නොදෙවෙනි කුසලතාවක් මානවසිංහ තම නිර්මාණ මගින් දක්ව යි.

"සෙවි වහර අනුව බස හික්මවීමට වඩා ගැමි වහර අනුව බස හික්මවීම අමාරු කාරියකි. ගැමි වහර අනුව තමාගේ රීතිය දැඩි කොට හික්මවන්නේ සෙවි වහර මෙන් ගැමි වහර ද දත් කෘතහස්ත ලේඛකයෙකි"
(වික්‍රමසිංහ 1992).

කුඩා දරුවෙකුගේ සිතෙහි ඇති වන ළමා සිතිවිලි පාදක කර ගනිමින් ස්වභාව සෞන්දර්යයත් බොදු බැතියත් එකට කැටි කොට ගත් මානවසිංහගේ ප්‍රශස්ත ගීත නිර්මාණයක් ලෙස "බුදු මිහිර" ගීතය හඳුන්වා දිය හැකි ය.

"මොනවද අම්මේ අකුරු ජාතියක්
මල් පෙතිවල කව්දේ ලියලා
කවුරුද අම්මේ මේව ලියන්නේ
පාට පාට ඉරි හැඩ ගහලා

පුතා දන්නෙ නෑ හඳ ඇති කාලෙට
වනන්තරේ හරි වැඩ කෙරෙතී
බෝසත්වරු බණ කතා කියද්දී
වන දෙවඟනො මල්වල ලියති....."
(මානවසිංහ 2013 : 54).

මෙහි එන කුඩා දරුවා සියුම් ලෙස පරිසරය නිරීක්ෂණය කිරීමට හපනෙකි. ඔහු මල්වල ඇඳ ඇති පාට පාට රටා දැක ඒවා කොහෙන්දැයි තම මවගෙන් විමස යි. බෝසත්වරු කියූ බණ කතා වනදෙවඟනො මෙසේ මල්වල ලියා ඇති බව මව සිය පුතුට පවස යි. සොබාදහමේ අසිරිය විඳිමින් දරුවා අසන සෑම පැනයකට ම මව ඉතා සංයමයෙන් දරුවාට වැටහෙන පරිදි පිළිතුරු දෙන්නේ ළමා ලෝකයේ සිතිවිලිවලට අනුකූලව ය. මෙම පිළිතුරු සියල්ලේ ම ගැබ් වී ඇත්තේ දහමට, පරිසරයට, සතා සිව්පාවට සහ සමස්ත පරිසරයට ම සෙනෙහස දක්වන අනාගත පරපුරක් බිහි කිරීමේ අභිලාෂය යි. මානවසිංහ ලියූ "ඇත් ගාලේ දරු පෙම" නම් ගීත රචනාවට පාදක වන්නේ ඇත් පැටවකු සහ මව් ඇතින්නියක අතර ඇති වන සංවාදයකි. මෙහි දී "බුදු මිහිර" ගීතයට වඩා ඉඳුරා ම වෙනස් අනුභූතියක් මව්-පුතු දෙබසක් ලෙස මානවසිංහ ගීතයට නගයි. එනම් සමාජ අසාධාරණය, නොමිනිස්කම නිසා පීඩා විඳින්නන්ගේ දුක්ඛ දෝමනස්සයන් මානවසිංහ විසින් සහෘද සිතෙහි භාව ප්‍රකෝපනය නොවන අයුරින් සංයමයෙන් යුතු ව බස හසුරුවමින් ගීතයට නගා ඇත. නොදරුවෙකු වූ ඇත් පැටවා සමාජ පීඩනයට හසුවන තම මව් ඇතින්නියගෙන් දුක විමසන අයුරු සහ සියලු වේදනාවන් සඟවා යථාර්ථය සිය කුඩා පුතුට පහදන්නට මව් ඇතින්නිය ලබා දෙන පිළිතුරු සහෘද සිත කම්පනයට පත් කරයි.

"මොකටද අම්මේ අම්මට ගැහුවේ
මාමල දෙන්නකු වට කරලා
ඇඟපත තැළිලා රිදෙනව ඇතිනේ
කොච්චර ගැහුව ද බැඳ දමලා
දෙපා සතාගේ ළඟ කා බීගෙන
සිටියම ගතිගුණ වෙනස් වෙලා
මාම ල ඔහොමයි උන්ගේ බහටම
හැරෙනව නැකම අත් හැරලා ...."
(මානවසිංහ 2013 : 65-68 ).

සරල ආකාතියක් ඔස්සේ සාටෝපවත් නොවූ බස්වහරක් භාවිත කරමින් "ඇත් ගාලේ දරු පෙම" ගී පද රචනය මගින් මානවසිංහයන් විරෝධා'කල්ප සංයමයෙන් යුතු ව ගීතය නම් කලා මාධ්‍යයෙන් දක්වන ආකාරය පෙන්වා දෙයි. අනුභූතියට ගැළපෙන ආකෘතියත්, බස් වහරත් භාවිතයේ දී මානවසිංහ දැක් වූ අපූරු කුසලතාව නිසා ඔහු ලියූ ගීත රසවිඳින්නෙකු තුළ ඇති වන්නේ සුලබ ආස්වාදය නොව, පංචේන්ද්‍රයන්ට ගෝචර නොවන, ඉන් ඔබ්බට ගිය රසයේ පරමාස්වාදය හෙවත් බ්‍රහ්මාස්වාදය යි. පැරණි සංස්කෘත සාහිත්‍යවේදීහු ප්‍රශස්ත නිර්මාණයක් රසවිඳීමෙන් රසයේ පරමාස්වාදය වූ චමත්කාරය සහෘදයා තුළ ඇති වන බව පවසති. මානවසිංහගේ ගීත රචනාවල අනන්‍යතාව වූයේ ඔහු ලියූ ගීත රසවිඳීමෙන් රසිකයා තුළ උපදින මෙම අපූරු චමත්කාරය යි.

සාහිත්‍ය නිර්මාණයෙහි යෙදෙන්නකුට අවශ්‍යයෙන් ම තිබිය යුතු පුළුල් වාක්කෝෂයක් හිමි ව තිබූ නිර්මාණකරුවකු වූ මානවසිංහ නිර්මාණයේ ප්‍රස්තුතයට ගැළපෙන පරිදි ආකෘතියට උචිත භාෂාව යොද ගැනීමේ කුසලතාවක් දැක්විය. මානවසිංහගේ ගී පද නිර්මාණ අතර රසික ප්‍රසාදයට පත් "මහ බෝ වන්නම" මීට කදිම නිදසුනකි.

"වැලි තල අතරේ හෙමිහිට බසිනා
නේරංජන නදියේ ගයා හිස
වැඩ සිට බුදුවුණු ද - තිලෝහිමි
මොක්සුව ලද මොහොතේ - සමාධි භාවනා

හිමකඳු වැටියේ සීතල සෙවණේ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

චන්දන තුරු පිහිරා - හැපී එන
මල්මුව රද රසිනේ - සුවඳ මුසු
කෝමල මද පවනේ - ගැටිලා පාවනා...."
(මානවසිංහ 2013 : 52).

මෙම ගීතයේ පද කැටි කොට ඇත්තේ ආකෘතියේ ගීතවත් බව තීව්‍ර කරමිනි. මෙහි දී මානවසිංහයන් සතු ශබ්ද'ර්ථ පූර්ණ බස භාවිතයෙන් නිරායාසයෙන් නැගෙන කවීත්වය, මානවසිංහ නම් ගීත රචකයා තුළ ජීවත් වන ප්‍රතිභාපූර්ණ කවියා ගීතයේ ආකෘතිය තුළ ඉස් මතු වෙයි. ලොව්තුරු සුවය ලබා ගැනීමට පිටිවහල් වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ පලුපත් අතු රිකිලි තාලයට සෙලවෙන අයුරු ලෞකික රසය ලබා ගැනීමට හේතු සාධක වන අයුරු මනා සංයමයෙන් යුතු ව දක්වන්නේ ඔහු තුළ ඇති නිසඟ කවීත්වය නිසා ය. මෙ නිසා මහබෝ වන්නම රස විඳීමේ දී සහෘද සිත් ලෞකික සුවය අතික්‍රමණය කළ ලෝකෝත්තර සුවය මුසු ශාන්ත රසයෙන් පිරී යයි.

ගැමි වහර පමණක් නොව වියත් වහර භාවිතයේ ද මානවසිංහයන් සිය ගී පද රචනාවල කුසලතාව දක්වා ඇත. මෙයට උදහරණ ලෙස සුභාවිත ගීත ක්ෂේත්‍රයේ රසිකයින් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත් අමරදේවයන් විසින් තනු නිර්මාණය කොට ගයන ලද "ජගත් මෝහිණී - මධුර භාෂිණී" ගීතයත්, පී. වී නන්දසිරි විසින් තනු නිර්මාණය කොට ගයන ලද "පංකජ නයනී - කෝමල පාණී" ගීතයත් දැක්විය හැකි ය. මෙම ගී පද රචනා දෙකෙහිදි ම මානවසිංහ සතු ප්‍රාචීන භාෂා දැනුම සාටෝපයෙන් තොර ව ශබ්ද'ර්ථ රස ජනනය වන අයුරින් ගීතයට යොද ඇති ආකාරය පැහැදිලි වෙයි.

"ජගත් මෝහිණී - මධුර භාෂිණී
චාරු දේහිනී - කමල වාසිනී
සරස්වතී දේවි වන්දේ සරස්වතී දේවි......"
(රත්නායක 2017: 104).

පාලි භාෂාවෙන් රචනා කරන ලද "බුද්ධ ජයන්ති" ගීතය මානවසිංහගේ භාෂා ප්‍රවීණත්වය මැනවින් විශද වන අවස්ථාවකි.

"පාතුර හෝසී බුද්ධ ජයන්තී
ධම්ම සමය උදපාදී
උට්ඨහථ නිසීද ථ ධාජෙථ දම්මං
ආරභක නික්ඛමක වරක වාරිකං........."
(රත්නායක 2017: 104).

මානවසිංහ කුසලතාපූර්ණ නිර්මාණ කෞශල්‍යය ගුවන්විදුලි ගීතයට පමණක් සීමා නොවී ය. චිත්‍රපට ගීතය මගින් ද මානවසිංහයන් සිය හැකියාවන් ගීත රචකයකු ලෙස පෙන්වා ඇත. ඔහු විසින් සිකුරු තරුව චිත්‍රපටයට රචනා කරන ලද "ඉර හඳ පායන ලෝකේ" සහ "ගමන නොනිමෙයි ලෝකයේ" ගීත තුළින් ගැඹුරු දර්ශනික චින්තන චමත්කාරය දනවන ලෙස සරල බස් වහරකින් ගීතයට නගා ඇත.

"ඉර හඳ පායන ලෝකේ - ආලෝකය අතරේ
සැප දුක සමබර වේ - මේ ජීවන කතරේ
සැප දුක සමබර වේ......."
චිත්‍රපටය : සිකුරු තරුව
ගායනය තනු නිර්මාණය : පණ්ඩිත් අමරදේව

"ගමන නොනිමෙයි ලෝකයේ මේ
පුරුදු ජීවන මං තලේ
ගැටෙන සැප දුක මාරු වී යයි
පුරුදු ජීවන මං තලේ"
චිත්‍රපටය : සිකුරු තරුව
ගායනය : නාරද දිසාසේකර

"ස්වභාව ධර්මය විචිත්‍ර ලෙස ප්‍රතිරූපණය කිරීම හා ඒ ප්‍රතිරූපණය තුළින් දර්ශනික සංකල්ප මතුකර ලීම යන ලක්‍ෂණ අද්‍යතන ගීත රචකයන් ගේ නිර්මාණ තුළ දක්නට ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. ස්වභාවධර්මයේ එන වස්තු ගැඹුරු ජීවන ධර්මතාවන් මෙන් ම අතිශය සංකීර්ණ මනෝභාවයන් වුව ද පසක් කර ලීමේ සුදුසු ශිල්ප ක්‍රමයක් තිබුණ බව මානවසිංහ නිර්මාණ ඉතා සූක්ෂම ලෙස ගවේෂණය කිරීමෙන් අවබෝධ කර ගත හැක"
(පෙරේරා 2009: 69).

මානවසිංහ විසින් දෛවයෝගය චිත්‍රපටයේ රචනා කරන ලද "ජීවන ගමනේ, ආදරියේ රුව්රාණනියේ, හද ගිලෙයි අම මිහිරේ, දොයි දොයිය පුතා ගීතත්, රන්මුතු දුව චිත්‍රපටයේ බුද්ධ දිවාකරයාණෝ, ගලන ගඟකි ජීවිතේ, පිපී පිපී රේණු නටන ගීතත් ඇතුළු චිත්‍රපට ගීත රැසක් වර්තමානයේ පවා සහෘදයෝ දැඩි රුචියකින් යුතු ව රස විඳිති. පසු කාලීන ව මානවසිංහයන් ගුවන්විදුලි ගීත නාටක රචනයට ද යොමු විය. මෙම ගීත නාටකවල ඔහු රචනා කරන ලද ගීත නිර්මාණ ද රසිකයින් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත් විය.

"ප්‍රේම තටාකේ මේකයි මැණිකේ
ආදර රැල්ලයි අර දිව යන්නේ
අබිමන් අබිමන් කියලයි මැණිකේ
ඒ රැළි මේ වැව් ඉවුරෙ වදින්නේ
මගෙ පෙම් කෝකිලයෝ ඔබෙ ගීයේ
තාලෙට නොවැ දිය සුළි කැරකෙන්නේ
පියුමට පියුමක් හැපෙනව දැකලයි
හංස පැටව් මේ හැටි දඟලන්නේ ...."
(රත්නායක 2017: 110).

"උල්පත" නම් ගීත නාටකයට ඔහු ලියූ ප්‍රේම තටාකේ ගීතය එවකට රසිකයන් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත් විය. ස්ත්‍රී- පුරුෂ ප්‍රේමය අපූර්ව ආකාරයෙන් පරිසරයේ සුන්දර වස්තූන් සමඟ මුසු කරමින් ධ්වනිත කරන්නේ, මානවසිංහගේ නිසඟ කවීත්වය හේතු කොට ගෙන ය. සොබා දහමේ අසිරිය විඳින්නට ගුර නිර්මාණ ශිල්පියෙකු


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වූ මානවසිංහ අනුභූතියට උචිත සරල ආකෘතියක් සහ සුගායනීය බස භාවිත කරමින් රසය දනවන පරිදි පරිකල්පනය කොට රසවත් ගීත නිර්මාණ කිරීමට දැක්වූයේ අපූරු කුසලතාවකි.

> "එකල, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් රචනා කළ ගීත නාටක ද නිර්මාණ සංගීතයේ නව නැම්මක් ඇති කිරීමට හේතු විය"
> (ඤාණිස්සර 2009:xvii).

මලෙස ප්‍රතිභාපූර්ණ කවියෙකු ලෙස ගී පද රචනයට පිවිසෙන මානවසිංහ ගුවන්විදුලි ගීතය, චිත්‍රපට ගීතය, ගුවන්විදුලි ගීත නාටක ගීත ක්ෂේත්‍රයේ ශබ්ද'ර්ථ රස මුසු වූ ප්‍රශස්ත ගීත රැසක් නිර්මාණය කළේ ය. අනුකාරක ඕලාරික ගීත බිහි වෙමින් තිබුණු යුගයක ගීතයේ සහ කවියේ ආවේණික සුවිශේෂත්වය මනාව පසක් කොට ගෙන ගීතයට කවියෙන් ලද හැකි ආලෝකය සිය නිර්මාණවලට දයක කර ගනිමින් ප්‍රතිභාපූර්ණ නිර්මාණකරුවකු වූ මානවසිංහ ප්‍රශස්ත ගීත රැසක් නිර්මාණය කර, සිංහල ගීත නිර්මාණ ක්ෂේත්‍රයේ සුභාවිත ගීතයේ ප්‍රගමනයට අමිල දයකයත්වයක් ලබා දී ඇත.

> "මානවසිංහ, සිංහල ගීත ක්ෂේත්‍රයෙහි කටු කොහොල් හරින්නට උත්සහ ගත්තේ ය; ගීතය පිළිබඳ මිත්‍යාමත බණ්ඩනය කරමින් සැබෑ ගීතය හඳුන්වා දෙන්නට වැර වැඩී ය." (ආරියරත්න 2008: 3).

## නිගමනය

සිංහල ගීතයේ ආරම්භය සහ විකාශනය පිළිබඳ අවධානය යොමු කරන විට චිරාත් කාලයක සිට සිංහලයා ගීතය නම් කලා මාධ්‍යය රස විඳි බවට සාධක හමු වෙයි. "ග්‍රැමෆෝනය" බිහි වීම සිංහල ගීතයේ නව පරිච්ජේදයක් ඇරඹීමට හේතු සාධක වූ බව සිංහල ගීතයේ විකාශනයේ සන්ධිස්ථාන පිළිබඳ අවධානය යොමු කරන විට පැහැදිලි වෙයි. මෙනිසා සිංහල ගීත ක්ෂේත්‍රයෙහි ගීතය රස විඳින රසිකයින්ගේ මෙන් ම විවිධ ශෛලීන් ඔස්සේ නිර්මාණය වන ගීතවල ප්‍රාමාණික වර්ධනයක් සිදු විය. සිංහල ගීතයේ සන්ධිස්ථාන ලෙස සැලකෙන ග්‍රැමෆෝන් යුගය, නාඩගම්, නූර්ති සහ ගුවන්විදුලියේ මුල් දශක කිහිපයෙහි බිහිවුණු බොහෝ ගීත අනුකාරක ඕලාරික බවකින් යුක්ත, ගීතයෙහි ගුණාත්මක බව කෙරෙහි අවධානය යොමු නොකර රචනා වූ ඒවා බව එම ගී පද නිරීක්ෂණයෙන් පැහැදිලි වෙයි. මෙම යුගයේ බොහෝ විට ගී පද රචනා නිර්මාණය වනවා වෙනුවට සිදු වූයේ ප්‍රසිද්ධ තනුවලට වචන දැමීමකි. මෙවන් යුගයක 1950 දශකයේ සිංහල ගීත නිර්මාණ ක්ෂේත්‍රයට පිවිසෙන නිර්මාණකරුවන් වූ ආනන්ද සමරකෝන්, සුනිල් සාන්ත වැනි නිර්මාණකරුවන් සිංහල ගීතයේ ගුණාත්මක පක්ෂය වැඩි වර්ධනය කරමින්, එහි අනන්‍යතාව ඇති කරවන සාර්ථක නිර්මාණ බිහි කිරීමට දයක විය. කලාත්මක බවින් යුක්ත සාහිත්‍යා'ංගයක් ලෙස ගීතයෙහි ඇති වටිනාකම අවබෝධ කර ගත් මෙම නිර්මාණකරුවන්ගේ සාර්ථක ගිත නිර්මාණ සිය නිර්මාණ දිවියට පෙරවදනක් කොට ගනිමින් ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ රචනා කළ ගීත, සිංහල ගීත ක්ෂේත්‍රයේ සුභාවිත ගීතයේ පදනම සකස් කරමින් එහි පැවැත්ම සහ විකාශනයට මහත් පිටිවහලක් විය. "මානවසිංහ සිංහල ගීත ක්ෂේත්‍රයේ කටු කොහොල් හරින්නට උත්සාහ ගත්තේ ය, ගීතය පිළිබඳ මිත්‍යාමත බණ්ඩනය කරමින් සැබෑ ගීතය හඳුන්වා දෙන්නට වැර වැඩී ය" යන සුනිල් ආරියරත්න මානවසිංහ ගීත පිළිබඳ දක්වා ඇති අදහස මෙමගින් තව දුරටත් තහවුරු වෙයි. මෙසේ සැබෑ සිංහල ගීතය, සිංහල ගීත ක්ෂේත්‍රයේ තහවුරු කරන්නට මානවසිංහට හැකියාව ලැබෙන්නේ ප්‍රතිභාපූර්ණ කවියෙකු ලෙස ඔහු සතු නිසඟ කවීත්වයත්, භාෂා විශාරදයකු ලෙස ඔහුට හිමි පොහොසත් වාක්කෝෂයක් නිසා බව ඔහුගේ නිර්මාණ රසවිඳීමෙන් ප්‍රත්‍යක්ෂ වෙයි. මෙනිසා ඔහුගේ ගීත රසවිඳීමෙන් සහෘද සිතෙහි අපූරු චමත්කාරයක් උපදියි.

## පරිශීලිත මූලාශ්‍රය


අමරදේව, ඩබ්ලිව්. ඩී (1989) නාද සිත්තම්, සී/ ස ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ.

ආරියරත්න, සුනිල් (1994) මහගමසේකර සහ කලා නිර්මාණ; මහගමසේකර ගීත, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ආරියරත්න, සුනිල් (2005) නූතන ගේය කාව්‍ය සංහිතා, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ආරියරත්න, සුනිල් (2008) දෙවන මුද්‍රණය, මානවසිංහ ගීත නිබන්ධන, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

පෙරේරා, සුනිල් සරත් (1994) ගීත පද රචනා විමර්ශණ, සී/ ස සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

මානවසිංහ, ප්‍රභාත් (සංස්) (2013) කෝමල රේඛා, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ; ගීත හා පද්‍ය නිර්මාණ සංග්‍රහය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ඤාණිස්සර හිමි, පාතේගම (2009), ගී රස විනිස, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

රත්නායක, මඩවල එස් (2017) ගී සිංදු සාහිත්‍යය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

වික්‍රමසිංහ, මාර්ටින් (1992) 4 වන මුද්‍රණය, නව පද්‍ය සිංහලය, සී/ ස තිසර ප්‍රකාශකයෝ, දෙහිවල.



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
නවවැනි කලාපය; 2018 දෙසැම්බර්, පිටු 17-22
ISSN 1800-1459 eISSN 2673-1177

© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# මාතෘකාවක් සොයන වචන අනූතුන්දාහක්: ජාතිකවාදී ගැටලුව දෙස යථාර්ථවාදී ව ප්‍රවේශ වීම - ආරියවංශ අබේසේකර

# (Mathrukavak Soyana Vachana Anudahak : A Realistic Approach to the Ethnic Problem by Ariyawansa Abeysekara)

චම්පා එස්. ද සිල්වා[1*]

[1]භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
[*]champasdesilva@gmail.com

**සාරසංක්ෂේපය**

කිසියම් ක්‍රියාදාමයක මූලාරම්භය සඳහා හේතුකාරක වන්නා වූ සාධකයන් බොහෝ තිබිය හැකි ය. දශක තුනක පමණ ආසන්න වූ කාලයක් පුරා මෙරට පිළිලයක් මෙන් ඔඩු දුවා තිබූ ජනවාර්ගික අර්බුදය පදනම් කොට ගත් යුද්ධය පිළිබඳ ව විමසා බැලීමේදී ද ඒ සඳහා හේතුපාදක වූ සාධක කිහිපයක් ම තිබෙන බව හඳුනා ගත හැකි ය. වත්මනවන විට යුද්ධ අවසන් වී වසර කිහිපයක් ගත වී ගොස් තිබුණ ද පශ්චාත් යුධ වතාවරණයක් සහිත රාජ්‍යයක ගැටලු පූර්ණ වශයෙන් ම සන්තර්පණය වී ඇතැයි කිව නොහැකි ය. ප්‍රධාන වශයෙන් ම මෙම යුද්ධය සිදු කෙරුණේ ශ්‍රී ලංකා රාජ්‍යයත්, එල්.ටී.ටී.ඊ. සංවිධානයත් අතර ය. ජාතීන් දෙකක් අතර වූ මෙම ගැටුම සඳහා ප්‍රබල ලෙසින් දේශපාලන අර්ථයක් කුළු ගැන් වී ඇත. එනම් භූමියේ අයිතිය පිළිබඳ ප්‍රශ්නය ය.ග භූමි දේශපාලනය (Geo Politics) යන සංකල්පය අනුසාරයෙන් මෙම ගැටලුව තේරුම් ගත හැකි ය. ඕනෑ ම රාජ්‍යයක පවත්නා ආවේණික ගතිකයක් වන්නේ තම රාජ්‍යය භූමිය විශාල කර ගැනීම කෙරෙහි වූ අභිලාෂය යි (දේවසිරි 1995 :3). වරින් වර සිදු වන වෙනත් රාජ්‍යයක ආක්‍රමණ කිරීම්, දේශ සීමා ගැටුම්, අභ්‍යන්තර බෙදුම්වාදී ගැටුම්, යනාදිය මගින් තහවුරු වන්නේ මෙම භූ දේශපාලන සාධක තවමත් නූතනය තුළ කාර්යභාරයක් ඉෂ්ට කරන බව ය (එම). තත් නවකතාවෙහි තේමාව ද "යුද්ධය" වේ. එක් අතෙකින් යුද්ධය වනාහි මිනිස් ප්‍රාර්ථනා හා අපේක්ෂා මුලිනුපුටා දමන්නකි. එය මනුෂ්‍ය වර්ගයාට හිතකර සාධකයක් නොව මානව වර්ගයාගේ ප්‍රගමනය සම්බන්ධයෙන් වූ මරු පහරක් වශයෙන් හැඳින්විය හැකි ය. විවිධ දශක ගණනාවක් පුරා නවකතාකරුවන්ට වස්තු බීජ සපයනු ලැබුවා වූ ජාතිවාදි අරගලය මෙම නවකතාව සඳහා ද වස්තු බීජ සපයා ඇති බව පෙනේ. අනූව දශකයේ දි අනුලා විජයරත්න මැණිකේ විසින් රචිත 'වඩබාගින්න' නම් වූ නවකතාවෙහි මුඛ්‍ය තේමාව බවට පත් ව ඇත්තේ ද ජාතිවාදී අරගලය යි. මුහුදු පතුළෙහි සැඟ ව ඇතැයි සැලකෙන වඩබාගින්න සියලු දෑ විනාශ කරන්නා සේ ම ජාතීන් දෙවර්ගයට ම සියල්ල අහිමි කරලිමේ ඛේදවාචකය ද මනුෂ්‍යත්වයේ දෑත් සියල්ලන් කෙරෙහි දිගු කළ යුතු බව ද එහි දී කතුවරියගේ ජීවන දෘෂ්ටිය බවට නිතැතින් ම පත් ව ඇත. යුද්ධය වූ කලි කිසිවිටෙකත් සුබවාදී ප්‍රපංචයක් නොවන බවත්, එහි සමාජ භූමිකාව පරදවා යථා තතු මතු කරලීමත් මාතෘකාවක් සොයන වචන අනූතුන්දාහක් සඳහා වස්තු විෂය වී ඇතැයි දැක්විය හැකි ය.

කේන්ද්‍රීය වචනඃ ජනවාර්ගික අර්බුදය, ජීවන දෘෂ්ටිය, අපේක්ෂා භංගත්වය.

Many are the factors behind the emergence of any series of events around the world. The same is true when reviewing the war based on ethnic crisis that engulfed almost the entire island for nearly three decades. Several years have lapsed since the end of the war, yet a perfect resolution to the issues of the State in a post-war context has not yet become a reality. This war was mainly fought between the Government of Sri Lanka and the L.T.T.E. It was heavily led by political motives namely the ownership of land, which is better understood in terms of the concept Geopolitics. The distinctive characteristic of any Nation is the expansion of its territory (Devasiri,1995:3). The invasions, internal territorial disputes, internal conflicts that emerge from time to time stand in evidence that these Geopolitical factors have a role to play in the contemporary world. The novel's theme is 'war'. On the one hand war is evil as it roots out all human wishes and expectations, which is by no means favorable to the mankind and can be considered as a fatal blow to the advancement of humanity itself. The ethnic conflict which has, for decades provided the ideal setting for many novelists has become the major theme of this novel as well. The novel 'Vadabaginna' written in the 90's by Anula Wijerathna Menike too was woven around this ethnic conflict. Undoubtedly in the novel, the novelist's outlook on life of war considering it as a catastrophe which makes both ethnic groups lose everything they have just as 'Vadabaginna' which is believed to be destroying everything hidden under the seabed. Further she emphasizes the need of humanity to confront such situations. 'A 93,000-word Untitled Art of Work' tries to emphasize the fact that war can never be a good omen and the novel shows further interest in surfacing the realistic view of the ethnic issue.

Keywords: Ethnic Conflict, Outlook, Hopelessness

## හැඳින්වීම

සාහිත්‍යකරුවා යනු නිරන්තරයෙන් ම සමාජය සමඟ අරගලයක යෙදෙමින්, සමාජය වෙත මහත් බලපෑමක් කළ හැකි පුද්ගලයෙකි. එනිසා ම පෙරදිග විචාරකයෝ නිර්මාණකරුවා ප්‍රජාපතියෙකු හෙවත් අලුතින් මවන්නකු ලෙසින් හැඳින් වූහ. ආනන්දවර්ධන නම් විචාරකයා සිය 'ධ්වන්‍යාලෝකය' නම් කෘතියේ දී "අපාරෙ කාව්‍යසංසාරෙ

කවිරේකඃ ප්‍රජාපතිඃ'' යනුවෙන් දක්වා ඇත්තේ එබැවිනි.

'අපූර්ව වස්තු නිර්මාණක්ෂමා ප්‍රඥා ප්‍රතිභා' යනු අභිනව ගුප්තගේ ප්‍රකාශයකි. ප්‍රබන්ධ ලේඛකයා විසින් නිර්මාණය කරනු ලබන නවකතාව හෝ කෙටිකතාව ද අපූර්ව වස්තුවකි. ඒ නිර්මාණය නවකතාව යන නාම ප්‍රඥප්තිය ලබනුයේ පෙර නොවූ අපූර්ව වස්තුවක් වන හෙයිනි. එහි විශේෂත්වය නම් යථාර්ථරූපී අපූර්වත්වයක් තිබීම ය (සුරවීර 1991 : 150). උක්ත කියමනෙහි අදාළත්වය පූර්ණ වශයෙන් ම විදාරණය වන්නකි, මාතෘකාවක් සොයන වචන අනූතුන්දාහක්.

උක්ත නවකතාවෙහි තේමාව කුළු ගැන්වීම සඳහා යොදා ගෙන ඇති ප්‍රධාන චරිත දෙකකි. තම ජාතිය උදෙසා ස්වරාජ්‍යය සංකල්පයෙහි ඉතා තර ව එල්බ ගෙන සිටින නාදන් නැමැති ගරිල්ලා සටන්කරුවා ද සිංහල මහා සමාජය විසින් ප්‍රශස්ති ගායනා මගින් උත්කර්ෂයට පත් කොට ඇති සිංහල රණවිරුවෙකු වන ප්‍රියන්ත යන චරිතද්වයෙහි ගන්දබ්බ ආත්මයන් හෙවත් කයින් විනිර්මුක්ත වූ මනෝකායන් විසින් හෙළි කරනු ලබන ආත්ම භාෂණයන් හා සංවාදය ප්‍රධාන වශයෙන් ම විශ්වීය අදාළත්වයක් හිමි කොට ගෙන ඇත. තවත් අවශේෂ චරිත මගින් ද උත්ප්‍රාසාත්මක ව විදාරණය කෙරෙනුයේ යුද්ධයේ අන්තර්ගත කුරිරුතර ස්වභාවය හා සමස්ත මානව වර්ගයා වෙත වාර්ගිකත්වයෙන් ඔබ්බෙහි පවත්නා වූ පොදු මනුෂ්‍ය ගුණධර්මයන් ය. එම කරුණු නිර්මාණාත්මක ව පරිකල්පනය කිරීමේ දී යථාර්ථවාදී රීතිය මෙන් ම ඉන්ද්‍රජාලික යථාර්ථවාදී රීතිය ද කතුවරයා විසින් උපයුක්ත කොට ගෙන තිබේ.

## සාහිත්‍ය විමර්ශනය

ජාතිකවාදී ගැටලුවත් සමඟ පැන නැගුණ යුද්ධය පසුබිම් කොට නව කතා, කෙටිකතා, කාව්‍ය මෙන් ම ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ ද ගණනාවක් විද්‍යමාන ය. එවැනි බහුතරයක් නිර්මාණ මගින් ද මතු කර ඇත්තේ එහි ඇති නිස්සාරත්වය සහ මනුෂ්‍ය කඳුළුවල උණුසුම් සහගත බව ය. මෙම පර්යේෂණය සඳහා නිර්මාල් රංජිත් දේවසිරි විසින් ජනවාර්ගික ගැටලුව- යුද්ධය හා සාමය යන මැයින් 1995 ප්‍රවාද සඟරාවට ලියූ ලිපිය ද 'ඊලම පිළිබඳ මිථ්‍යාව' නම් වූ රාම් මානික්කලිංගම් විසින් ලියූ ශාස්ත්‍රීය ලේඛනය ද (1995) 'සාමය එල්.ටී.ටී.ඊ. හා දෙමළ බුද්ධිමතුන්' යනුවෙන් 1996 සසංක පෙරේරා ලියූ ශාස්ත්‍රීය ලිපිය ද උපයෝගි කොට ගන්නා අතර මෑතක දි ඉමහත් ප්‍රසිද්ධියට පත් වූ තමළිනි ජෙයකුමාරන් විසින් රචිත සාමිනාදන් විමල් විසින් සිංහලයට පරිවර්තිත 'තියුණු අසිපතක සෙවණ යට' (2016) නම් වූ කෘතිය ද විශාල ආලෝකයක් බව දැක්විය හැකි ය.

## පර්යේෂණ ගැටලුව

ජනවාර්ගික යුද්ධයෙහි සැබෑ යථාර්ථය මෙම නවකතාව මගින් පිළිබිඹු වී තිබේ ද? සහ එය මිනිස් ජීවිත මත පතිත කොට ඇති බලපෑමෙහි ස්වභාවය කෙබඳු ද ?

## පර්යේෂණ අරමුණු

ජනවාර්ගික අර්බුදයෙහි යථා ස්වභාවය හෙළි කිරීම සඳහා සාහිත්‍ය නිර්මාණයන් කෙතෙක් දුරට ප්‍රයෝජනවත් දැයි අවබෝධ කොට ගැනීම මෙහි පර්යේෂණ අරමුණ වේ.

## පර්යේෂණයේ වැදගත්කම

දශක තුනක් පුරා පැතිර පැවතියා වූ යුදමය වතාවරණය මේ වන විට පූර්ණ වශයෙන් ම සමථයකට පත් ව ඇතැයි කිව නොහේ. අළු යට ගිනි පුපුරු මෙන් සැඟව ඇති ශේෂයන් මතු ව ඒමට අවස්ථා ඇතැයි ද උපකල්පනය කළ හැකි ය. කතු කෙසේ වුව ද වසර 30 ක් පුරා ඔඩු දිවූ අනාගතයෙහි ද යම් යම් ගැටුම්කාරී තත්ත්වයන් උද්ගත විය හැකි ව පවතින මනුෂ්‍ය ජීවිතවලට අවම ලංසුවක් හිමි කර දෙමින් මනුෂ්‍යත්වයේ අවපක්ෂය නිරූපණය කරන, මනුෂ්‍ය දෙකොට්ඨාසයන් තුළ ජාතික සංකල්පය උදෙසා සිදු කෙරෙන්නා වූ යුදමය වතාවරණයක පවතින නිස්සාරත්වය සහ අර්ථශූන්‍යභාවය ද ම්ලේච්ඡ ස්වභාවය ද අනාවරණය කර ගත හැකි වීම අංශයෙන් ද මෙම අධ්‍යයනය වැදගත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහිදී 'මාතෘකාවක් සොයන වචන අනූතුන්දාහක් ' නැමති කෘතිය ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් යොදා ගැනෙන අතර තත් විෂය අරබයා ලියැවුණු වෙනත් නව කතා විශේෂයෙන් ම වඩබාගින්න, ගින්දර කඳුළු හා වානේ වැනි නවකතා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් යොදා ගැනීමට අපේක්ෂිත ය.

## සාකච්ඡාව

'ජාතිකවාදය' (nationalism) යනුවෙන් මෙහිදී හැඳින්වෙන්නේ ජාතික හැඟීම විසින් ජනිත කරන ලද උද්වේගී චින්තනයකි. ජාතික හැඟීම, එනම් තමන්ට කිසියම් ජාතික සම්ප්‍රදායක් උරුම ව ඇතිය යන විශ්වාසය පුද්ගලයෙකු තුළ ස්ථාපිත ව තිබිය හැකි ය .එහෙත් එය දැඩි මමායනයකින් වැළඳ ගනිමින් තම ජාතිකත්වය සඳහා අරගලයක යෙදීමට ඔහු අවදි වූ අවස්ථාව ජාතිකවාදී අවස්ථාවක් ලෙස සලකමු(ධර්මදාස 2007:35).

මනුෂ්‍ය ජීවිතය යනු ඒකමානීය ව කියවිය නොහැකි බහුමානීය ව කියවිය යුතු ප්‍රපංචයකි. යුද්ධය තේමා කොට ගනිමින් බොහෝ නව කතා සෑම දශකයක දී ම පාහේ ලිය වී ඇත.ඒ අතරින් සුමිත්‍රා රාහුබද්දගේ 'සුර අසුර' අනුලා විජේරත්න මැණිකේගේ 'වඩබාගින්න' රෝහණ මැන්දිස් සේනාධීරගේ 'ගින්දර කඳුළු හා වානේ' චන්ද්‍රරත්න බණ්ඩාරගේ 'වන සපුමල' ලාල් පෙරේරා විසින් රචිත 'ඉරා අඳුරු පට' විමලදාස සමරසිංහගේ 'ඒකච්ඡත්‍ර' ,සීතා කුමාරිහාමි විසින් රචිත 'අරටු' බුද්ධදාස හේවගේගේ 'සුළං හෝරාව' යන නවකතා දැක්විය හැකි ය. ඉතා මෑත කාලීන ව ලියැවුණු නිශ්ශංක විජේමාන්නගේ 'තාරා මගේ දෙවදුව' නවකතාව සඳහා තේමා වී තිබෙන්නේ ද වාර්ගික අර්බුදය සුන්දර වූ ස්ත්‍රී පුරුෂ ප්‍රේමය මත කර ඇති බලපෑම ය. කිනම් අංශයකින් අවධානය යොමු කළ ද පසක් කර ගත හැකි වන්නේ යුද්ධය සහ ජනවාර්ගික අර්බුදය වූ කලි මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි සුභවාදී ප්‍රපංචයක් නොවන බව ය.

යුද්ධය තේමා කොට ගනිමින් නවකතා පමණක් නොව කෙටි කතා රාශියක් ද පුර හඳ කළුවර වැනි අතිශයින්



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ජනප්‍රිය වූ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ ද බිහි ව ඇත. දේශයෙහි මුර දේවතාවුන් යන සංකල්පය පිරුවට පොරවා සමාජගත කරන ලද ලාංකේය තරුණයාගේ වැලපෙන අධ්‍යාත්මය දෝතට ගත් නවකතාවක් වශයෙනුත්, 'ස්වරාජ්‍ය' සංකල්පයෙන් වශීකෘත වී සන්නද්ධ අරගලකරුවෙකු බවට පත් වූ ද්‍රවිඩ තරුණයන්ගේ අධ්‍යාත්මවල රිද්මය, ජාතීන් දෙකක කඳුළුවල උණුසුම ඒකාත්මික වන ආකාරය පෙන්වා දීම අතිනුන් මෙම නවකතාව සුවිශේෂ වන බව අවධාරණයෙන් ම දැක්විය යුතු ය. ජාතීන් දෙකකට අයත් වුව ද ලාංකේය තාරුණ්‍යයේ අසරණභාවයත්, අපේක්ෂාභංගත්වයත් මෙතරම් කදිම ලෙස විවරණය වූ නවකතාවක් තවත් නොමැති තරම් ය. ග්‍රාමීය තරුණයින් යුද්ධය වෙත අවශෝෂණය කරගන්නා වූ ක්ෂිතිමය අවකාශය පිළිබඳ ව මෙහිදි සාකච්ඡා කළ හැකි අතර පරිකල්පනීය ගොඩ නැන්වීම් ඉක්මවා ගිය භෞතික අවබෝධයක් ලබා ගැනීම උදෙසා චරිත මඟින් දක්වනු ලබන හැඟවුම්කාරකයෝ බොහෝ ය.

මෙහි තේමාව කුළුගැන්වීම සඳහා ජාතීන් දෙකක තාරුණ්‍යයේ ආත්මීය හඬ නවකතාකරුවා අපූරු ශිල්ප ධර්ම උපයෝගි කොට ගනිමින් යථාර්ථවාදි ලක්ෂණ අභිබවනය කොට ගනිමින් ඉන්ද්‍රජාලික යථාර්ථවාදී රීතිය ද අනුගමනය කොට ඉදිරිපත් කර තිබීම ප්‍රසංශා කටයුතු ය. මෙහි උපයුක්ත අධියථාර්ථවාදි භාවිතාවන් පූර්ණ යථාර්ථය ද නොවේ. එහෙත් යථාර්ථයෙන් පරිබාහිර ද නොවේ. මෙහි එන අපූර්වත්වය නම් එය යි. මෙහි කතා නායකයා වූ කලි නාදන් නම් වූ 'ස්වරාජ්‍ය සංකල්පය ' වෙනුවෙන් සිය තරුණ ජීවිතය ම කැප කළ ද්‍රවිඩ ගරිල්ලා සටන්කරුවෙකි. යුදමය වාතාවරණයක දී ඔහු මිය යයි. එහෙත් ඔහුගේ මනෝකාය ප්‍රේමසිංහ නම් වූ සිංහල-බෞද්ධ සොල්දාදුවාගේ කායික ශරීරය තුළට ඇතුල් වේ. එසේ ම ප්‍රියන්ත නම් වූ සිංහල සොල්දාදුවාගේ මනෝකාය හෙවත් ආත්මය ප්‍රවිෂ්ට වන්නේ වෙනත් ද්‍රවිඩ සටන්කාමියෙකුගේ කායික ශරීරයක් තුළට ය. මෙය සිංහල නවකතාවක දී හමු වූ අසිරිමත් පරිකල්පනීය අවස්ථාවකි. එම පරිකල්පනීය තත්ත්වයන් ඉක්මවා ගිය හැකි භෞතික යථාර්ථයන් ළඟා කර ගත හැකි වීම එහි විශේෂත්වයකි. බෞද්ධාගමික ප්‍රවේශයකට අනුව පුද්ගලයෙකුගේ මරණය හෙවත් අභාවය යනුවෙන් හඳුන්වන්නේ කායික ශරීරය හැර දමා මනෝකාය හෙවත් ආත්මය විශ්වයට එකතු වීම ය. එම නිදහස් වූ ආත්මය තමන්ට සුදුසු වූ උත්පත්ති ස්ථානයක් සොයමින් අනන්ත වූ විශ්වයේ සැරිසර යි. එම ආත්මය බුදු දහම අනුව 'ගන්දබ්බ' අවස්ථාව , සේ සැලකේ. එහෙත් තථ්‍ය ලෝකයේ දී එම ගන්දබ්බයා සුදුසු මව් කුසක කළලයක් සේ තැන්පත් ව නව ජීවියෙක් සේ උත්පාදනය වේ. එහෙත් මෙම නවකතාවේ දී තථ්‍ය මායාව බිඳී යන අතර මනඃකල්පිත ෆැන්ටසිමය තත්ත් වයක ඇතැම් අවස්ථා නිරූපණය වුව ද කතුවර අධ්‍යාශය හා එම ශිල්ප ධර්මය සාකල්‍යයෙන් ම උචිත වන බවත් පෙනේ. ප්‍රියන්ත නම් වූ සොල්දාදුවාගේ මනෝකාය ප්‍රවිෂ්ට වන්නේ ද්‍රවිඩ ජාතික සටන්කාමියෙකුගේ ශරීරයක් තුළට ය. එම ද්‍රවිඩ ශරීරයට හිමි මනෝකාය ප්‍රියන්ත පසු පස ලුහු බඳී. ප්‍රියන්ත හා සංවාදයේ යෙදේ. මෙසේ අවතාරමය පැවැත්මකින් යුතු ව නැවත ප්‍රාදූර්භූත වීම මඟින් යුද්ධයේ භෞතික යථාර්ථයන් මතු කරවීමට අවකාශය සළසා ගනි.

> "............... මං වන්නියේ දුප්පත් කොල්ලෙක්. අපි කැරැල්ලට ආවේ දුක් විඳලා විඳලා බැරිම තැන. අපිට රස්සා තිබුණානං , අපිට අපේ පාඩුවේ අපේ රටකම ජීවත් වෙන්න තිබුණානං අපි මැරෙන්ඩ එන්නේ නෑ. අපි කැරැල්ලට ආවේ උඹලා වගේ රස්සාවට නෙවෙයි. කාටවත් යටත් වෙන්නේ නැතුව ජීවත් වෙන්ඩ රටක් ඉල්ලගෙන. උඹලා අපි වගේ නෙවෙයි, රස්සාවට මැරිච්ච උං. කැරලිකාරයාගේ ආත්මය හඬ ගා කීවේ ය " (පි : 146).

යුද්ධයේ ඇතුළාන්තය සැබැවින් ම සිංහල තරුණයන්ගේ ජීවන යථාර්ථය ඉතා කුරිරුවූත්, නග්නවූත් අයුරින් ද්‍රවිඩ සටන්කාමියාගේ ආත්මීය භාෂණයෙන් සංකේතවත් නොවන්නේ ද? සත්තකින් ම සිංහල තරුණයින් යුද හමුදාව වෙත ආසක්ත වන්නේ වෙනත් රැකියා කිරීමට තරමේ අධ්‍යාපන සුදුසුකම් සපුරා නොතිබූ බැවිනුත් , ආකර්ෂණීය වැටුපක් ඒ වෙනුවෙන් ලැබෙන බැවිනුත් යන වාස්තවික යථාර්ථයන් හේතුකොට ගෙන ය. ඔවුනගේ මූලික ප්‍රයත්නය වූයේ ප්‍රධාන වශයෙන් ම දරිද්‍රතාවෙන් මිදී යහපත් ජීවන අපේක්ෂා වෙත ළං වීම ය. ප්‍රියන්තගේ සැබෑ අරමුණු වූයේ අවසන් නොවූ නිවස සාදා ගැනිමත්, තම පවුලට ශක්තියක් වීමත් ය. එහෙත් එම අරමුණු ශාක්සාත් කර ගැනිමට ප්‍රථම ඔහු කුරිරු යුද්ධයේ ගොදුරක් බවට පත් වේ. සැබෑ යථාර්ථය නම් මෙය යි. ජාතියේ මුර දේවතාවා 'රණ විරුවා' යන භූෂණයෙන් සමලංකෘත කොට තබන ලද තරුණ ජීවිතයන්හි සැබෑ යථාර්ථය, සැබෑ දේශ ප්‍රේමය හෝ සැබෑ ජාතික වාත්සල්‍යය නොවන බව අදීන කලාකරුවෙකු වශයෙන් අබේසේකරයන් පැවසීමට නිර්භය වී ඇත්තේ 'බිඩලු ගලවාලා කෙසෙල් ගස්වල හර නැති නියාව දක්වන්නාසේ' ය.

මේ අතර නාදන් නම් ද්‍රවිඩ විමුක්තිකාමියාගේ ආත්මය ඇතුල් වන්නේ ප්‍රේමසිංහ නම් සිංහල සොල්දාදුවාගේ ශරීරය තුළට ය. හෙදිය විසින් ප්‍රතිකාර කිරීම සඳහා නාදන්ගේ අත එස වූ විට ඔහු දකින්නේ රජයේ යුධ හමුදා ඇඳුමකි. එය දකිනවාත් සමඟ ම ඔහු සිහිසුන් වේ. එසේ ම වනාන්තරය තුළ දී ප්‍රියන්ත නම් සොල්දාදුවා දැඩි මානසික වික්ෂෝභකාරි තත්ත්වයකට පත් වන්නේ ද්‍රවිඩ ගරිල්ලා භටයෙකුගේ ශරීරයක් තමාට උරුම වීම සම්බන්ධයෙනි. තමා කවුරුන්දැයි යන අනන්‍යතාව සොයා ගැනීමට නොහැකි ව මෙම දෙදෙනා ම ජීවන මහෝඝයෙහි වල්මත වූවෝ වෙති. මෙහි දී භික්ෂුවගේ භූමිකාව ද සුවිශේෂ තලයක පිහිටා ඇත. අසාධාරණ යුද්ධයක් වෙත කෲර ලෙස මිනිසුන් ඇද දමා ඇති බවත්, එය ඔවුනට අයත් නොවන දෙයක් බවත් යුද්ධයේ සැබෑ සැඟවුම්කාරකයන් ය. එහි යථාතතු ප්‍රියන්තගේ මුවින් පිටවෙන්නේ මෙසේ ය.

> "මේ යුද්දේ මට අයිති දෙකක් නෙවෙයි හාමුදුරුවනේ ....... ඉවසා බැරිම තැන සොල්දාදුවා කිව්වේය." ඇත්තම කියනවනම් මං ගියේ රස්සාවට ......" (පි 110).



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව වත්මනෙහි පවතින්නේ පශ්චාත් ගෝලීය ස්වභාවක ය. ගෝලීයකරණය (Globalization) යනු ඉතා සරල ලෙස අර්ථ දැක්වුව හොත් ප්‍රාග්ධනය, බලය,චින්තන රටා,පාරිභෝගික භාණ්ඩ, සන්නිවේදන ක්‍රම,ජීවන විලාසිතා යනාදිය කේන්ද්‍රයක සිට ඉතා ශීඝ්‍රයෙන් පරිධියේ ඇති රටවල් කරා ක්ෂණික ව ප්‍රසාරණය වීම ය. පශ්චාත්ගෝලීය මිනිසාගේ ඉරණම තීරණය කරණු ලබන සාධක මොනවා ද? අද්‍යතනයෙහි මිනිසා ජීවත් වන පශ්චාත් ගෝලීය සමාජයේ සැබැවින් ම විද්‍යමාන වන්නේ ඊර්ෂාව හා වෛරය පමණි. බහුභාණ්ඩිකත්වය, අරුමෝසම් ජීවන විලාසිතාවන්, මුහුණු පොත් අතරේ හැල්මේ දිවයන ජනකායකගේ ආධ්‍යාත්මික සෝදා පාළුව ඉසිලීමට නොහැකි තරම් බරකි. භික්ෂුවගේ දෛනික ජීවිතය ද වත්මනෙහි සපුරා වෙනස් ය. කවිබණ කියන, පුයර තවරා ගත් දසදහස් ගණක් මිලැති චීවර දරන, පාර්ලිමේන්තු ව නියෝජනය කරන වත්මන් භික්ෂුව පශ්චාත් ගෝලියකරණය වූ රටක සුලබ දසුනකි. එවන් භික්ෂූන් අතර තම අනන්‍යතාව සොයා යන, සිව්බඹවිහරණය සහිත වූ මෙහි එන භික්ෂුව අප ප්‍රාර්ථනා කරන පරිකල්පනීය ලෝකයෙහි ප්‍රබල හැඟවුම්කාරකයක් වන අතර පරිකල්පනීය තලය පුපුරා ගොස් යථාතලය මතු කරවන අවස්ථාවකි.

මෙම නවකතාව සමකාලීන සමාජයේ පවත්නා දෘෂ්ටි වාදයන් මතු කරන්නා වූ නවකතාවකි. යුධ සෙබලා, රණවිරුවා, ජාතියේ මුර දේවතාවා, රට ජාතිය වෙනුවෙන් දිවි පිදූ ජාතික වීරවරයෙක් බවට පත් ව ඇත. එම මව්වරු වීර මාතාවෝ ය. තම පුතුන් වෙනුවෙන් උපදින උණුසුම් කඳුළැලි සගවා ගනිමින් පෙර වූ සාකච්ඡාවන්ට අනුව ඔවුන් පවසනුයේ තම පුත්‍රයා ජාතිය වෙනුවෙන් දිවිදුන් බැවින් මවක වශයෙන් තමන් ආඩම්බර වන බව ය. තවත් පුතුන් සිටිනවා නම් ජාතිය වෙනුවෙන් යුධ හමුදාවට පූජා කරන බව ය. සත්‍ය යටපත් කොට ගනිමින් ව්‍යාජයේ රජවන අයුරු ලාංකේය සමාජ හැසිරීම් මගින් මෙලෙස පෙන්වා දිය හැකි ය. සත්‍ය පිටපත් යටපත් ව ගොස් ව්‍යාජ පිටපත් මතු ව ඇත. වත්මන් ලාංකේය සමාජයෙහි ම දිස් වන්නේ ව්‍යාජත්වය නිර්ව්‍යාජත්වය ලෙස ආරෝපණය කොට දැක්වීමකි. මෙය ප්‍රථම වරට සංකල්පයක් සේ මතු කොට එහි න්‍යායාත්මක තත්ත්වය පැහැදිලි කර දෙන ලද්දේ ෆෙඩ්රික් ජේම්සන් නම් වූ මාක්ස්වාදී විචාරකයා විසිනි. ඔහු විසින් 1991 වසරේ රචිත 'පශ්චාත් නූතනවාදය නොහොත් පසු ධනවාදයේ සංස්කෘතික තර්කණය' යන ග්‍රන්ථයේ දී එම කරුණු දක්වා ඇත. මුල් ප්‍රකෘතිය වෙනුවට අනු කෘති මතු වන බවත් එම ව්‍යාජ පිටපත් පුද්ගල ජීවිතවලට පැමිණෙන බවත් සඳහන් ය (Jameson 1991:18). මෙහි එන ප්‍රේම් අයියාගේ මරණය ද සැබෑ යථාර්ථය යටපත් වූ ව්‍යාජය භූෂිත වූ අවස්ථාවකි. අධිපතිවාදී රජයන් විසින් සත්‍යය යටපත් කරමින් පොදු ජනයා වෙතින් තව දුරටත් යථාර්ථය දුරස් කරවනු ලබයි.

ප්‍රභාකරන් දකුණේ සිංහයාට සතුට ජනනය කරන හෝ දුක ජනනය කරන වස්තුවක් බවට පත්වීම ද මෙම ජාතිකවාදය තුළ යටපත් වූ සංසිද්ධියක් විය. රැකියා නැති දකුණේ තරුණයාට ප්‍රභාකරන් සමඟ යුද්ධය රැකියාවක් ගෙන දුන්නේය. සමාජයේ කිසිදු පිළිගැනීමක් නැති ග්‍රාමීය තරුණයා ව ජාතියේ මුර දේවතාවෙක් බවට පත් කළේ ය. හමුදා පවුල්වලට ආර්ථික හයියක් ගෙන දුන්නේය. හමුදා පවුල්වල සාමාජිකයන්ට හමුදා සෙබළාගේ ජීවිතය යුද්ධය නිසා නැති වීමෙන් දුකක් ගෙන දුන්නත් ආර්ථික ප්‍රතිලාභ හා දේශප්‍රේමියෙක් ලෙස මිය යාමේ සංතුෂ්ටියක් ජාතික වාදය විසින් සාදා දුන්නේ ය(ගුණරත්න 2007:27).

මෙම නවකතාවෙන් කතුවර ජීවන දෘෂ්ටිය (vision of life) කුළුගැන්වෙන ප්‍රබල අවස්ථාවක් ලෙසින් හා ජාතීන් වශයෙන් අප බෙදී වෙන් වී සිටිය යුතු නැත යන ප්‍රබල පණිවිඩය දෙන ප්‍රධානම අවස්ථා මෙහි අන්තර්ගත ය. ජාතීන් දෙකොටසක් එක ම බැම්මකින් මාතෘ - පුත්‍ර බැම්මෙන් බැඳී, එම කඳුළු ජාතීන් වශයෙන් වෙන් කළ නොහැකි අවස්ථාව හෘද සාක්ෂියක් ඇත්තවුන්ගේ හදවත සසල කරවන අවස්ථාවකි ප්‍රේමසිංහ නම් යුදබටයාගේ මවගේ භූමිකාව.

ප්‍රේමසිංහ නම් යුදබටයා ජීවතුන් අතර සිටීයැයි දැන ගන්නා ඔහුගේ මව ඇතුළු ඥාතීන් ඉමහත් සතුටින් ඔහු දැකීමට රණවිරු සුවථා ස්ථානයකට පැමිණේ. ඉන් පසු සිදු වන අවස්ථාව කතුවරයා ඉතා සංවේදී ව විදාරණය කොට ඇත. එහෙත් ප්‍රේමසිංහ නම් හමුදා නිලධාරියාගේ කය තුළ සිටින්නේ නාදන් නම් ද්‍රවිඩ කැරලිකරුවා වන බව මොවුහු නොදනිති.

> "ඔහු තමන්ටවත් අදහා ගන්නට බැරි ලෙසින් මේ නන්නාඳුන සිංහල ස්ත්‍රිය බදාගෙන හඬන්නට පටන් ගත්තේ ය. මේ කය අයත් ප්‍රේමසිංහ නැමැති සිංහල සොල්දාදුවාගේ අම්මා හෙවත් සෝමලතාට මේ ඇගේ කුසින් උපන් පුත්‍රයා විය. නාදන් වූ මේ තමත් වැළඳ ගෙන හඬා වැටෙන ස්ත්‍රීය තමන්ගේ ම මව විය. ඇගේ උණුසුම් කඳුලින් කැරලිකරුවාගේ මුහුණ තෙත් වූ අතර ඔහුගේ දෑසින් ගැලූ කඳුළු ඇගේ මුහුණෙහි තැවරුණි. ඉන් පසු මේ දෙකඳුල වෙන් කළ නොහැකි සේ එකට මිශ්‍ර ව ඒකාත්ම විය" (පි 157).

යුද්ධයක් වැනි මානව ආචාරධාර්මික පද්ධතීන් සුණුවිසුණු වී යන අවස්ථාවක දී මනුෂ්‍යත්වය පලා යන බවත් , තම සමීපතමයින් අහිමි වන බවත් දුක් සෝ ගංගා පමණක් උරුම වන බවත් අපි කවුරුත් දන්නා සත්‍යයන් ය. 'තියුණු අසිපතක සෙවණ යට' නමින් සාමිනාදන් විමල් විසින් සිංහලයට පරිවර්තිත තමළිනි ජෙයකුමාරන් විසින් රචිත ග්‍රන්ථය විශ්ව සාධාරණ අගයක් අත්පත් කර ගන්නා කෘතියක් යැයි සඳහන් කළ හොත් එය නිවැරදි ය. ද්‍රවිඩ ඊලාම්විමුක්ති කොටි සංවිධානයෙහි ප්‍රබල අරගලකාරිනියක් ලෙස යුද්ධයට බැඳුණු ඇය පිළිකා රෝගයට ගොදුරු ව මහරගම පිළිකා රෝහලයෙහි ගත කළ සුළු කාලය තුළ දී ජීවිතය යනු කුමක්දැයි සැබැවින් ම අවබෝධ කොට ගෙන ඇති අයුරු එම ග්‍රන්ථය කියවීමෙන් පසක් වේ.

> "සැබෑ සාමයේ මාර්ගය යනු යුද්ධයෙහි මාර්ගයට වඩා දුෂ්කරය යන්න මම තේරුම් ගෙන සිටිමි. ඒ සඳහා කොතරම් බාධක පසු කළ යුතු ද යන්න



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තේරුම් ගැනීමට මෙම පොත උදාහරණයක් ලෙස සඳහන් කළ හැකි ය. මානව හිතවාදය ද සැබෑ සමාජ ප්‍රේමය ද සහිත වූ දහස් ගණනක් සාම අරගලකරුවන් මා සමඟ අත්වැල් බැඳගනු ඇතැයි යන විශ්වාසයෙන් යුතුව මම මගේ දෑත් සාමය වෙනුවෙන් ඔසවමි'' (2016 : 07).

යුද්ධය වෙනුවට ඇය යෝජනා කරන්නේ සාමය ය. නැවත මේ මිහි මත යුද්ධයක් ඇති නොවේවා යන්න ඇයගේ පරම ප්‍රාර්ථනය වූ බව ග්‍රන්ථයෙහි පෙරවදන ම සාක්ෂ්‍ය සපය යි. තියුණු ජීවිතාවබෝධයක් ලබමින් ඇය අවසන් හුස්ම හෙලන්නට ඇතැයි ද ඇය විසින් ලියන ලද 'තියුණු අසිපතක සෙවණ යට' යුගකාරක ග්‍රන්ථයක් යයි ද සඳහන් කිරීම නිරවද්‍යය ය.

තමළිනි විසින් යුද්ධයේ යථා තතු තම කෘතිය මතින් මතු කරන්නාසේ ම මාතෘකාවක් සොයන වචන අනුතුන්දාහක්හි ද යුද්ධයේ යථාතතු විවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ විවිධ ශිල්ප ධර්ම භාවිත කරමින් ඉදිරිපත් කර ඇත. එය අනාගත පුරවැසියන්ට මහත් දායාදයක් වනු නොඅනුමාන ය.

මෙහි දී කතුවරයා ඉන්ද්‍රජාලික යථාර්ථවාදය පැහැදිලි වශයෙන් ම භාවිත කොට ඇත්තේ ඔහුගේ එක් අධ්‍යාශයක් මුදුන්පත් කර ගැනිම සඳහා බව ඉතා පැහැදිලි ව ම විද්‍යමාන වේ. එනම් යුද්ධයෙහි පවතින්නා වූ බියකරු ස්වභාවය හා මනුෂ්‍යත්වයට පටහැනි බව, හෘදය ශාක්ෂ්‍යයක් ඇති අයට එය දරා ගත නොහැකි බව යනාදිය පෙන්වා දීම සඳහා ය.

අධියථාර්ථවාදය හෙවත් අදිසත්තාවාදය හෙවත් Surrealism යනුවෙන් අප හඳුන්වන්නේ නිරන්තරයෙන් ම කලාවත්, චින්තනයත් ආකර්ෂණය කරන්නා වූ එක්තරා දාර්ශනික ආස්ථානයකට ය. කාලාන්තරයක් පුරා මේ දාර්ශනික ආස්ථානය වෙත ඇදී යමින් නොයෙක් අන්දමින් හැඩ ගැසුණු කලාව හා චින්තනය මතවාදයක් හැටියට 1924 තරම් කාලයේ දී සංවිධානය වී පැරිස් පුරවරයෙන් අප අතරට පැමිණියේ ආන්ද්‍රෙ බ්‍රෙතොන්ගේ මූලිකත්වයෙනි (පෙරේරා 1995ඃ49-50). ලියනගේ අමරකීර්ති විසින් සිය අමුතු කතාව යන ග්‍රන්ථයේ දී ඉන්ද්‍රජාලික යථාර්ථවාදය හඳුන්වනු ලබන්නේ ආශ්චර්යාත්මක යථාර්ථවාදය නමිනි (අමරකීර්ති 2005:212). වෙන්ඩි බී. ෆාරිස් ආශ්චර්යාත්මක යථාර්ථවාදය පිළිබඳ ව නිර්වචන සැපයූ අය අතරින් වඩාත් සවිස්තර නිර්වචනයක් ඉදිරිපත් කර ඇති බව අමරකීර්ති එහි තවදුරටත් දක්වයි. ෆාරිස්ට අනුව එය අප දන්නා විශ්වයේ නීති රීති ඇසුරෙන් පැහැදිලි කරගත නොහැකි ආශ්චර්යාත්මක අංග අඩංගු කර ගනි. එසේ ම එහි අඩංගු විස්තර වර්ණනා අප වසන එදිනෙදා ජීවිතයට ඉතා සමීප ය. එසේ ම ආශ්චර්යාත්මක යථාර්ථවාදය එකිනෙකට සපුරා වෙනස් ලෝක දෙකක් එකට ඈඳ යි. මේ ලෝක දෙක මළවුන්ගේ සහ ජීවත් වන්නවුන්ගේ ලෝකය ද, සැබෑ ලෝකය සහ ප්‍රබන්ධ ලෝකය ද ලෙස වෙන්ඩි බී. ෆාරිස් විස්තර කරයි (2005ඃ212-218). ටෙනිසන් පෙරේරා විසින් 2014 වසරේ දී රචිත 'සසර දිගන්තය' නැමති නවකතාවේ දී ද මළවුන්ගේ ලෝකය හා සැබෑ ලෝකය එක්වන අවස්ථා ඇත. එනම් සියදිවි නසා ගත් බෝධි, උපැවිදි වූ ඉන්ද්‍රසිරි නම් තම සොයුරා සමඟ සංවාදයේ යෙදෙන අවස්ථාව. මළවුන්ගේ ලෝකයත් ප්‍රබන්ධ ලෝකයත් සැබෑ ලෝකයත් යා කරවමින් ආශ්චර්යාත්මක අයුරින් යම් යම් සිද්ධි, අවස්ථා හා සංවාද බොහෝ ප්‍රමාණයක් මාතෘකාවක් සොයන වචන අනූතුන්දාහක්හි බෙහෙවින් ම අන්තර්ගත ය. එම ඉන්ද්‍රජාලික දෑ සැබෑ සත්‍ය නොවුව ද සත්‍යයෙන් තොර ද නොවේ. ශරීරය අහිමි ආත්ම ගෙන එන සංවාද සැබෑ යථාර්ථයේ පිළිබිඹුවන් ය. සැබෑ යුද්ධයේ ඇතුළාන්තය කියාපාන අවස්ථාවන් ය.එනිසා යථාවේ මායාව නිරූපණය කිරීමේදී කතුවරයා දක්වා ඇති ප්‍රතිභාව ප්‍රශස්ත යැයි ද එනිසා කෘතියේ කලාත්මකභාවයට හානි සිදු නොවී ඇතැයි ද දැක්විය හැකි ය.ඒ අනුව පැහැදිලි වන්නේ සමාජීය දේශපාලන ව්‍යුහය තුළින් ම බිඳී ආ අධියථාර්ථවාදයෙන් නියෝජනය වන්නේ මනුෂ්‍ය වේදිතයන් මනුෂ්‍ය හෙවත් හැඟීම් තුළ ගැබ් වී පවත්නා එක්තරා අර්ථයක් බව ය (පෙරේරා 1995:50).

## නිගමනය

ඉහත සාකච්ඡාවට අනුව නිගමනය කළ හැක්කේ යුද්ධය වනාහි මානව වර්ගයාගේ ප්‍රගමනය සම්බන්ධයෙන් බලන කල එය මරු පහරක් වන බව ය. පශ්චාත් නන්දිකඩාල් යුද මෙහෙයුම දක්වා රටක් වශයෙන් ද ජාතියක් වශයෙන් ද අප ලද පරාජයන් බොහෝ ය. අපට අහිමි වූ ජනතාවගේ සංඛ්‍යාව ද ඔවුනගේ ඥාති මිත්‍රාදීන්ගේ සෝකඳුළුවල උණුසුම ද දැරිය නොහැකි තරම් වන බව ය. ගින්දර කඳුළු හා වානේමෙන් ම උණුසුම් බව ය. පශ්චාත් යුද ජයග්‍රහණ රටක අප වාසය කළ ද ලැබූ ජයග්‍රහණ සැබැවින් ම විජයග්‍රහණක් දැයි විසඳා ගත නොහැක්කේ අපගේ අනෙකා වන ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න එක තැන ලොප් වී ඇති නිසා ය. එසේ ම ඉදිරියේ දී ද ජාතිකවාදී ප්‍රශ්නය වෙත අප ව යොමු කරවනු ලබන බලවේග තවදුරටත් හිස ඔසවමින් තිබෙන බව යාපනය විශ්වවිද්‍යාලයීය සිසු ගැටුම මතින් ද විද්‍යමාන වේ. කෙසේ නමුදු මාතෘකාවක් සොයන වචන අනූතුන්දාහක් මෙන් අපගේ අනන්‍යතාව සොයමින් තවදුරටත් අප වල්මත් විය යුතු ද යන කරුණ නවකතාවේ කේන්ද්‍රීය ප්‍රශ්නය බවට පත්ව ඇතැයි පෙනෙන අතර මෙහි තේමාව කුළු ගැන්වීම සඳහා ජාතීන් දෙපාර්ශයෙහි ම තාරුණ්‍යයේ ආත්මීය හඬ නවකතාකරුවා ප්‍රයෝජනයට ගෙන ඇත. සැබවින් ම මෙය එතරම් විචාරක අවධානයට පාත්‍ර නොවුව ද කලාකරුවෙකුගේ සමාජ කාර්යභාරයෙහි පතුළ ස්පර්ශ කරන්නා වූ කෘතියකැයි ප්‍රමාණ කළ හැකි ය.

පශ්චාත් යුධ පරිසරයක ජීවත් වන වත්මන් පාඨකයාට මෙම නවකතාව අපූර්වත්වයක් ජනනය කරනුයේ සාහිත්‍ය කෘතියක් එය නිර්මාණය වුණු ඓතිහාසික සන්දර්භය අහෝසි වූ පසුත් සර්වකාලීන වටිනාකමකින් යුතු ව කියවිය හැකි නිර්මාණයක් වන බැවිනි. පුළුල් අවලෝකනයක් සහිත ව විමසා බැලිය හැකි නවකතාවක් වන බැවිනි.

## පරිශීලිත මූලාශ්‍රය

අබේසේකර ආරියවංශ (2014) මාතෘකාවක් සොයන වචන



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අනුතුන්දාහක්, රාවය ප්‍රකාශන, මහරගම.

අමරකිර්ති ලියනගේ (2005) අමුතුකතාව, 2005, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය,මුල්ලේරියාව .

ගුණරත්න, දිප්තිකුමාර සහ තවත් අය (2007) විනෝදය,පෙරටුගාමී පක්‍ෂය,රත්මලාන .

දේවසිරි නිර්මාල් රංජිත් (1995) ජනවාර්ගික ගැටලුව යුද්ධයේ හා සාමයේ ගැටලු, ප්‍රවාද 9 වන කලාපය, ප්‍රවාද ප්‍රකාශකයෝ, කොළඹ 05.

පෙරේරා රංජිත් (1995) සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයේ අධියථාර්ථවාදී පරිකල්පන ධාරාව, ප්‍රවාද 9 වන කලාපය, ප්‍රවාද ප්‍රකාශකයෝ, කොළඹ 05.

පෙරේරා ටෙනිසන් (2014) සසර දිගන්තය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

ධර්මදාස කේ.එන්.ඕ., (2007) ජාත්‍යානුරාගය, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

විමල් සාමිනාදන් (පරි) (2016) තියුණු අසිපතක සෙවණ යට, ත්‍රිකෝනී සංස්කෘතික පදනම, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

සුවීර ඒ.වී., (1991) නවකතා නිර්මාණය හා අවබෝධය ප්‍රදීප ප්‍රකාශකයෝ කොළඹ 12.

Jameson Fredric (1991) Postmodernism or the Cultural Logic of the Late Capitalism, Durham, Duke University Press.



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
නවවැනි කලාපය; 2018 දෙසැම්බර්, පිටු 23-31
ISSN 1800-1459 eISSN 2673-1177

© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලාංකේය ජන ගායන ක්ෂේත්‍රයෙහි ඇතුළත් නෙළුම් ගායන ශෛලිය පිළිබඳ මානවවංශ සංගීත විද්‍යාත්මක විමර්ශනයක්

## (An Ethnomusicological Treatise into the Harvest Song (Nelum Kavi) in Sri Lankan Folk Songs)

ඉරංගා සමින්දනී වීරක්කොඩි[1*]

[1]සංගීත විද්‍යා අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
*isamindani@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ජන ගායන පිළිබඳ විමසීමේ දී විවිධ ප්‍රදේශානුගත ව, විවිධ ක්ෂේත්‍ර තුළ පවතින ජන ගායන රාශියකි. එම ජනගායන පිළිබඳ වර්ගීකරණ කිහිපයක් මේ වන විට ඉදිරිපත් ව තිබේ. සිංහල ජන සංගීතයෙහි අන්තර්ගත සියලුම ලක්‍ෂණ හඳුනාගත හැක්කේ ජන සංගීතයෙහි ඇතුළත් ජන ගායන ක්ෂේත්‍ර තුළිනි. නෙළුම් ගායන ශෛලිය ඉන් එක් ගායන ශෛලියකි. කුඹුරේ වල්පැල නෙලීමේ දී හෝ අලුත් පැල සිටුවීමේ දී හෝ ගයන ගී නෙළුම් ගී ලෙස හැඳින් වේ. සාමූහිකත්වය ප්‍රකට කෙරෙන මෙය ගැමි ජනයා අතර ප්‍රචලිත ගායන ප්‍රකාරයකි. කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගත් ගැමි සමාජය තුළ ගොයම් නෙලුම සඳහා කාන්තාවගේ දායකත්‍වයට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. දක්‍ෂ පළපුරුදු ගායිකාවක මුල පිරූ නෙළුම් ගීයට සෙසු පිරිස ද එක්වීම විශේෂතාවකි. නෙළුම් ගායන ආරම්භ වන්නේ ආශිර්වාද ලබා ගනිමිනි. වල් නෙලීමේ දී මෙන් ම කුරහන්, තලමල, තෙතඟු ගී ආදිය ද නෙළුම් ගායන ශෛලියට ඇතුළත් වේ. නෙළුම් ගායනාවේ ප්‍රධාන වර්ග දෙකකි. නෙළුම් ඕසය හා නෙළුම් සින්දුව වශයෙනි. ඕස යනු තනුව යන්නට යෙදෙන්නකි. විලම්භ ලයෙන් යුත් ගායන ප්‍රකාරයකි. ඕසේ ගායන රටාවේ විවිධත්‍වය අනුව පිරිත් ඕසේ, හොරණෑ ඕසේ නමින් වර්ග කිහිපයක් ප්‍රචලිතව පවතී. නෙළුම හමාර කරන අවස්ථාවේ ගැයෙන ගී නෙළුම් සින්දු මධ්‍ය හා දෘත ලයෙන් ගැයේ. කණ්ඩායම් වශයෙන් ගායනය කරනු ලබන ජන ගී අතුරින් නෙළුම් ගායන ශෛලියේ විශේෂතා කිහිපයකි. සංවර ව, සංයමයෙන් යුතුව ගැයීම කැපී පෙනේ. නෙළුම් ගායනාවේ ස්වර සීමාව ඉතා පටු ය. ස්වර තුනක්, හතරකට වඩා ඇසුරු නොකෙරේ. පාරම්පරික නාදමාලාවලින් යුක්ත ය. රිද්මය විවිධාකාර ය. ශ්‍රී ලාංකේය ජන ගායන ලක්‍ෂණවලින් සමන්විත නෙළුම් ගී පාරම්පරික ගැමි ගී අතර මිහිරි ගායන විශේෂයකි. පිරිත් සජ්ජායනයේ ආභාසය ද නෙළුම් ගායන සඳහා ලැබී තිබේ. නෙළුම් ගායන ශෛලියේ විශේෂතා මානවවංශ සංගීතවිද්‍යාත්මකව විග්‍රහ කිරීම මෙහිදී සිදු කෙරේ. ලිඛිත සාහිත්‍ය අධ්‍යයනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය ද මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ.

කේන්ද්‍රීය වචනඃ නෙළුම් ගායන ශෛලිය, ජනශ්‍රැතිය, ජන ගී, ජන ගායන ක්ෂේත්‍රය, මානවවංශ සංගීතවිද්‍යාව

There are numerous forms of folk songs existing across many professions and many areas in Sri Lanka that have been classified in different ways before. The harvest song (Nelum Kavi) singing style is one such song style. Nelum Kavi are the songs that are sung when reaping weeds or when sowing new seeds in the crops. It is a type of folk song that signifies community teamwork and collectiveness which has become a very popular tradition among villagers.In the agriculture-based village society which is spread throughout the country the participation of womenfolk in the activities has an extensive history. A specialty here is that the womenfolk join in while an experienced and skilled person leads the singing. Nelum Kavi are commenced by taking blessings from the triple gem and they encompass a wide range of Kavi such as Kurahan, Thalamala and Thethangu Gee.There are two main types of Nelum Kavi namely Nelum Oose and Nelum Sindu. Oose is a term used to signify a melody sung in the ad lib style. According to the style that the Oose is sung there are classifications such as Pirith Oose and Horana Oose. As the end of sowing approaches the singing style switches to a mid-tempo and allegro tempo. An outstanding feature of Nelum Kavi is the calm and the disciplined manner in which they are sung. The songs do not have a wide pitch range and they are usually in a range of three or four notes and are consisting of traditional rhythmic styles that vary. This is a very enjoyable folk song style that has been influenced by Pirith chanting. The main research methodologies used here are field visits and library based research.

Keywords: Nelum Singing Style, Folklore, Folk Song, Field of Folk Song, Ethnomusicology

## හැඳින්වීම

ජන සංගීතය යනු විදග්ධ ශාස්ත්‍රීය සංගීතයෙන් පාරම්පරික සංගීතය වෙන් කොට දැක්වීම සඳහා භාවිතයට ආ යෙදුමකි. ජනශ්‍රැතිය සම්බන්ධ ක්ෂේත්‍රයක් වන ජන සංගීතය හඳුන්වා දී ඇත්තේ ජන සමූහයා තුළින් බිහි වූ නිර්නාමික කලා නිර්මාණ විශේෂයක් වශයෙනි. ප්‍රාථමික සමාජයන්හි දී ගායන හා නර්තන අවස්ථාවන් පසුබිම් කොටගෙන බිහි වූ ජන සංගීතය යම් යම් ජන සමූහයන්ගේ අනන්‍යතාව හෙළිකරන කැටපතක් සේ හැඳින්වේ. මේ අනුව රටක ජන සංගීතය එම රටේ ජන උරුමයේ සංකේතයක් සේ දක්වනු ලැබේ. (මහේන්ද්‍ර 1997) ගැමි ගී, ජන ගීත, ජන කවි, දේශීය ගීත, ජන සම්මත කාව්‍ය සහ පාරම්පරික ගීත යැයි පාරිභාෂික වචන කිහිපයකි. මෙම වචන සමුදායේ වාච්‍යාර්ථ වෙනස් වුව ද ඒවායෙහි ලක්ෂ්‍යාර්ථය සාමාන්‍යයෙන් එකක් කොට සැලකෙන බව භාවිතයේ දී දැකගත හැකි වේ. ඉංග්‍රීසි බසින් “folk song” යන්න යෙදේ. ගැමි ගී යනු කවරේ ද ඒවායේ අනන්‍යතා ලක්ෂණ මොනවාදැයි යන කරුණු පිළිබඳ විවිධ

මත තිබේ.

ගැමි ගී යනු පොදු ජනයා අතින් නිපැයී ඔවුන් අතර ව්‍යවහාරයේ එන ගීයක් හෝ කවි කතාවක් හෙවත් සැහැල්ලකි. මේ ගීත පුරාවෘත්ත හෝ කතන්දරවලින් ලබන ආභාසය හා ඇල්ම සමඟ ඔවුනගේ පොදු ජීවිතය විදහාපායි. පොදු මාතෘකාවක් යටතේ එන කවි කථානුසාරයෙන් සැකසුණු ගීතමය කාව්‍යය ද ගැමි ගී ගණයෙහි ගැනේ. ග්‍රාමීය සංගීතය සෑම රටක ම පොදු ජනතාවගේ සහජ උරුමයකි. ගැමි ගී ගැයීමෙහි හා ඇසීමෙහි ආශාව ඔවුන් තුළ නිසඟයෙන් හා සතතින්ම වේ. ලොව ඇති සෑම සංගීතයකට ම වඩා ඔහුට ඔහුගේ පාරම්පරික ගීය අගනේ ය. එය ඔහු ජීවත්වන සමාජයේ ඕනෑ එපාකම් උඩ ගොඩ නැගුණු කලාවක් හෙයිනි. ග්‍රාමීය සංගීතය ගැමියා මෙන් ම අව්‍යාජය; මිශ්‍රිත ආටෝපයන්ගෙන් තොර ය. ගැමි සමාජයටම පොදු ය. (මකුලොලුව 2000) ගැමි ගීයක හෝ ග්‍රාමීය සංගීතයක දැකිය හැකි ලක්ෂණ කිහිපයකි. මුඛ පරම්පරාගතව පැවතීම, නිර්මාපකයා හෝ රචකයා නිර්නාමික වීම, එදිනෙදා ජීවිතයේ කිසියම් කරුණක් වස්තු විෂය කර ගැනීම, නිර්මාණය කළ කවි නොව නිර්මාණය වූ කවි වීම, නිර්ව්‍යාජ බව, සංයමයකින් යුතු වීම, සංක්ෂිප්ත බව, කිසියම් කාර්යයකට අදාළ වීම, පොදු ජනයා විසින් සාමූහික ව පිළිගැනීම, පොදු ජනයාගේ සිතුම් පැතුම්, ඇදහිලි, ජනකතා, ඓතිහාසික සිදුවීම්, ජීවන වෘත්තීන්, ජීවිතය පිළිබඳ අත්දැකීම්, විශ්වාස ආදි කරුණු ගැමි ගී ප්‍රස්තුත වීම, සෞන්දර්යය උද්දීපනය කර වීම, හිතකර තම වටපිටාවෙන් ගත් උපමාවන් යෙදීම, අවස්ථා නිරූපණයේ බුහුටි බව ආදිය වේ. (වීරක්කොඩි 2013: 9) ශ්‍රී ලංකාවේ ජන ගායනා පිළිබඳ විමසීමේ දී විවිධ ප්‍රදේශානුගතව විවිධ ක්ෂේත්‍ර තුළ පවතින ජන ගායන රාශියකි. එම ජන ගායන පිළිබඳ වර්ගීකරණ කිහිපයක් මේ වන විට ඉදිරිපත් ව තිබේ. ඩබ්. බී. මකුලොලුව මහතා ජන ගී වර්ගීකරණය කරනුයේ මෙලෙසිනි (මකුලොලුව 2000).

| | |
|---|---|
| **බැති ගී** | භක්ති රසය විදහාපාන ගී, බැති ගී නම් වේ. විශේෂයෙන් ම ආගමික පසුතලයක් ඇති ගී මේ ගණයෙහි ලා ගැනේ. ගුරුදෙගුරුන්, වැඩිහිටියන්, දෙවියන් පිදීමෙහි එන ගීත ද බැති ගී ගණයට අයත් වේ. |
| **යාග ගී** | බලි, තොවිල්, යක්කම් ආදි ශාන්තිකර්ම හෝ පූජා කර්ම සමඟ ගැයෙන ගී යාග ගී නම්. |
| **මෙහෙ ගී** | ජීවන වෘත්තීන් හා සබැඳුණු ගී මෙහෙ ගී නම්. ගොවිකම්, කම්මල්කම්, කුඹල්කම්, ගැල් පැදවීම ආදි ජීවන වෘත්තීන් සමඟ ගැයෙන ගී මෙහෙ ගී ගණයෙහි ලා ගැනේ. |
| **සමාජ ගී** | ජීවන වෘත්තීන් හා නොබැඳුණු එහෙත් ජීවිතයේ වෙනත් අවස්ථා සඳහා භාවිත ගී සමාජ ගී නම්. දරු නැළවිලි ගී, මඟුල් ගී, අවමඟුල් ගී, තුති ගී, වැනුම් ගී, පෙම් ගී, වැලපුම් ගී ආදිය මේ වර්ගයට අයත් වේ. |
| **කෙළි ගී** | ක්‍රීඩා සමඟ භාවිතයේ එන ගී කෙළි ගී නම්. එවවන් කෑම, ඔන්චිලි පැදීම, මේවර සෙල්ලම, අං ඇදීම, පොර පොල් ගැසීම, හවරි හැංගීම ආදි ගැමි ක්‍රීඩා සමඟ ගැයෙන ගී මේ ගණයෙහි ලා ගැනේ. |
| **නළු ගී** | නැටුම් සමඟ භාවිත ගී නළු ගී නම්. පන්තේරු, උඩැක්කි, රබන්, වන්නම්, සව්දම්, කළගෙඩි, ලී කෙළි ආදි නැටුම් සමඟ ගැයෙන ගී මේ ගණයෙහි ලා ගැනේ. |
| **විරිඳු ගී** | (ප්‍රශස්ති) විශේෂයෙන් පුද්ගල වර්ණනාව සඳහා භාවිත ගී විරිඳු ගී නම්. ප්‍රශස්ති යනු ද මෙයටම නමකි. |
| **රණ ගී** | සටන් කටයුතු ගී හා සටන් වැණුම ගී රණ ගී නම්. පරංගි හටන, ඉංග්‍රීසි හටන ආදි හටන්වල ඇතැම් ගී මේ ගණයෙහි ලා ගැනේ. |
| **වැණුම් ගී** | ස්වභාව සෞන්දර්ය හෝ වෙනත් වර්ණනා පැවසෙන ගී වැණුම් ගී ගණයෙහි ලා ගැනේ. |

උපතේ සිට මරණය දක්වා විසිර පවතින ජීවන ක්‍රියාවලිය ඇසුරු කරගනිමින් සිංහල ජන සංගීතයේ අන්තර්ගත ගායන ක්ෂේත්‍රය පිළිබඳ රෝහණ බැද්දගේ මහතාගේ වර්ග කිරීමට අනුව ගායන ශෛලීන් කිහිපයකි (බැද්දගේ 2005).

- නැළවිලි ගායන ශෛලිය
- ගද්‍ය ගායන ශෛලිය
- සීපද ගායන ශෛලිය
- නෙළුම් ගායන ශෛලිය
- වැලපුම් ගායන ශෛලිය
- භක්ති ගායන ශෛලිය
- ප්‍රශස්ති ගායන ශෛලිය
- ජන නාට්‍ය, ජන නැටුම්, නාඩගම් ගායන ශෛලි

ලෙස විවිධ ගායන ක්ෂේත්‍ර පිළිබඳ දක්වා තිබේ. ඉහත පළමු වර්ගීකරණය ක්ෂේත්‍ර හා ස්වර අනුව බෙදා දක්වා ඇති අතර, දෙවැනි වර්ගීකරණය නාද සංයුති අනුව වර්ගීකරණය කර ඇති බව පෙනේ. සිංහල ජන සංගීතයේ අන්තර්ගත සියලුම ලක්ෂණ සපයාගත හැකි වන්නේ ජන සංගීතයෙහි ගායන ක්ෂේත්‍ර තුළිනි. ගායන ක්ෂේත්‍රයේ විසිරී ඇති එම නෙළුම් ගායන ශෛලියේ ලක්ෂණ හා විශේෂතා පිළිබඳ අවධානය යොමු කිරීම ද වැදගත් වේ.

මහා මාර්ගයක් අසල හැල් කෙතක් රක්නා දාසියක හෙළ බසින් ගැයූ ගීයක් අසා එම මාර්ගයෙහි ගමන් කළ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නාද මාලාව 1:

| **නෙළුම් ගායන - පිරිත් ඕසේ** (අනාඝාතාත්මකව ගායනය කෙරේ.) | **කරණීය මෙත්ත සූත්‍රය** |
|---|---|
| නි - - ස - - - රි ග - රි - ස - | නි ස - - - ස රි - - - - ස රි ග - - - - |
| නා ऽ ऽ මා ऽ ऽ ස් කා ऽ ऽ ර ऽ ऽ ऽ | ක ර ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ ණී ऽ ය ऽ ऽ ऽ ऽ |
| රි ග - රි - ස - ස - - රි ස නි - - - - | ග රි - - - - ස - - - රි - - - ස රි ග - - - රි - - - ස |
| ක ऽ ऽ ර ऽ ऽ ऽ මු ऽ ऽ ව ऽ ऽ ऽ ऽ ऽ ऽ | මත් ऽ ऽ ऽ ऽ ථ ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ කුසඃ ऽ ऽ ऽ ලේ ऽ ऽ ऽ න |
| නි - - ස - - - රි ග - රි - ස - | නි ස - - - රි - - - ග - - - ස - රි ග |
| හි ऽ ऽ රු ऽ ऽ ऽ දෙ ऽ ऽ වි ऽ ऽ ऽ | යංතං ऽ ऽ ऽ සං ऽ ऽ ऽ තං ऽ ऽ ऽ ප ऽ දං |
| රි ග - රි - ස - ස - - - - - - | රි රි - - ස - - - ග රි - - ස - - - - |
| යා ऽ ऽ ऽ ऽ ऽ න් ට යි ऽ ऽ ऽ ऽ ऽ ऽ | අභි ऽ ऽ ස ऽ ऽ ऽ මෙ චි ऽ ऽ ච ऽ ऽ ऽ ऽ |
| | නි ස - - නි ස - - රි ග - - නි ස - - - රි ග - - - රි - - - නි - ස |
| | සක්බෝ ऽ ऽ උ ऽ ऽ ජූ ච ऽ ऽ සූ ऽ ऽ ऽ ऽ ජූ ऽ ऽ ऽ ऽ ච ऽ ऽ ऽ ऽ ऽ ऽ |

භික්ෂුන්වහන්සේලා හැටනමක් රහත් වූ බව සාරත්ථ දීපනී අට්ඨකතාවෙහි සඳහන් වේ. සිංහල සන්දේශ කාව්‍ය යනු ඇල්කෙත් රකින ස්ත්‍රීන් ගැයූ ගී පිළිබඳ මූලාශ්‍රයකි.

"අයා නෙත් බලන රුසිරි අනැගීය
නොයා දෙන බැහැර වුවන් සමගීය
කියා සරත ඇල්ගෙවිලිය ලිය ගීය
තොයා සබඳ ඒ අසමින් නොලැගීය

ලියන් කියන ගී මල් විඳ කඩින් කඩින්
සසින් සැදුණු වෙල් යා දැක මඩින් ගොඩින්
කමින් ගොදුරු බැස මුං වතු බඩින් උඩින්
සෙමෙන් සිටම සකි මා වේ බඩින් බඩින්"
(ජයතිලක 2002).

කෙත්වතුවල ඇල්ගෙවිලියෝ ගී කියති. නිසි පරිදි මිහිරි ගී කියති. එම ගීතය අම මෙන් සිත් ඇලවෙන බව සන්දේශකරුවෝ පෙන්වා දෙති.

"පැසී තිබෙන කෙත්වත්වල හිඳින නිතී
නිසී ව ඇල් ගෙවිලිය ලිය ගී කියති
ඇසී සවන අම මෙන් සිතු ඇලී යති
පැසී නොව ඔවුන් වෙත සිතු යනුව සුතී

විහිද පැසෙන එහි කෙත්වත්වලට බැඳේ
දැන පමණින් බුදිමින් නිසි තැනෙක හිඳේ
එහි තැන තැන ලිය ගී දනු අසා ඉඳේ
යව නොලසින් දුටු දන මන නුවන් බැඳේ"
(හේන්පිටගෙදර පියනන්ද 1954).

තම තමා කැමති පරිදි මාත්‍රාවලින් යුත් ළයාන්විත ගීතිකා ගයන කාන්තාවන් පිළිබඳ හංස සන්දේශකරුවා මෙසේ වර්ණනා කරයි.

"ගත් මත්වලින් ලිය ලිය ගී තමන් ලෙස
නෙත් සිත් සතුටු කැර කෙළි කුමරියන් රැස
වෙත්පත් තැන් පොරට ගව මී රළන් බැස
කෙත්වත් නොයෙක් ගම් බිම් පෙනෙය වම්පස

ඇසෙයි කියන රස ගී ලිය තුඩින් තුඩින්
දිසෙයි බසින ගව මී රළ කඩින් කඩින්
පැසෙයි රුවට කළ කෙත්වත් ගොඩින් මඩින්
තොසෙයි එගම දුට ඒ වැබඩින් වටින්"
(සේනානායක 1991).

කාන්තාවන්ගේ හඬින් ගැයෙන රසවත් ගීතිකා ඇසෙයි. රංචු වශයෙන් බසින ගවයන් හා මී හරකුන් පෙනෙයි. ගොඩමඩ වගා කෙරුණ වතු හා කුඹුරු ලස්සනට පැසෙයි. ඒ ගම දුටුව හොත් සතුට ලැබෙයි යනුවෙන් කාව්‍යයේ අර්ථය දැක්වේ. ඉහත කවි විමසීමෙන් තහවුරු වන්නේ නෙළුම් කවි කියමින් කෙත්වතුවල කටයුතු කළ බව ය. (සේනානායක 1991) කුඹුරේ වල් නෙලීමේ දී හෝ අලුත් පැළ සිටුවීමේ දී හෝ ගයන ගී නෙළුම් ගී ගැමි ජනයා අතර ඉතා ප්‍රකට ගායන ශෛලියකි.

## සාහිත්‍ය විමර්ශනය

පර්යේෂණය සඳහා සාහිත්‍ය විමර්ශනය සිදු කිරීම අසීරු කරුණක් වූයේ මෙකී විෂය පථයෙහි නිශ්චිත ව හඳුනාගත් පර්යේෂණ නොමැති වීම හේතුවෙනි. පර්යේෂණ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නාද මාලාව 2:

**නෙළුම් ගායන ශෛලිය - පිරිත් ඕසේ**

(අනාඝාතාත්මකයි)

| | |
|---|---|
| ඕං එහෙනම් ආරම්භ කළා තිස් තුන් කෝටියක් | ස - - - සරි සරි ග - රි - ස - සරි සරි ග - |
| දෙවි දේවතාවුන් වහන්සේලාගේ ආරක්ෂාවයි ආනුභාවයි අවසර ගන්නේ | මා ऽ ऽ ऽ ऽऽ ऽऽ න් ऽ සො ऽ ऽ ऽ දුऽ ऽऽ ऽ ऽ |
| මං සොඳ දෙවි වැඳ අවසර ගන්නේ | ග - - - රි - සරි ස ස - - - ස - - - |
| මේ පළාත ආරක්ෂා කරන්නා වූ ගම්භාර, කළු බණ්ඩාර දෙවියන්ගේ ගුණ නිතර කියන්නේ | දෙ ऽ ऽ ऽ වි ऽ ऽऽ ऽ වැ ऽ ऽ ऽ ඳ ऽ ऽ ऽ |
| පෙම් වඩවන කවි නිතර කියන්නේ | ස - - - සරි සරි ග - රි - ස - සරි සරි ග - |
| අප හට සිදු වී ඇති අණ වින කොඩි වින ඇත්නම් සියල්ල දුරලන්නේ | අ ऽ ऽ ऽ වඃ ऽऽ ऽ ऽ ස ऽ ऽ ऽ රුऽ ऽऽ ऽ ऽ |
| ඉන් වරදක් ඇති මුත් දුරලන්නේ | ග - - - රි - සරි ස ස - - - ස - - - |
| මේ කවි කියන්නා වූ අප සැම හට අවසර දෙන්නේ | ගා ऽ ऽ ऽ ऽ ऽ ऽऽ ऽ ऽ ऽ ऽ න් නේ ऽ ऽ ऽ |
| පිං ඇති සැම දෙවි අවසර දෙන්නේ | |

නාද මාලාව 3:

**රතන සූත්‍රය - නාද මාලාව**

| |
|---|
| නි ස - - නි ස - - ස - - රි - - ග - - - ස - - රි සරි සරි (රි) |
| ඛීනං ऽ ऽ පු ऽ ऽ ऽ රා ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ නං ऽ ऽ ऽ ऽऽ ऽऽ ( ऽ ) |
| නි ස - - රි - - ග - - - - - රි - - - ස - - - - ස - - - |
| නවං ऽ ऽ නත් ऽ ऽ ථි ऽ ऽ ऽ ऽ ऽ සම් ऽ ऽ ऽ භව ऽ ऽ ऽ ං ऽ ऽ ऽ |
| ස රි - - සරිග - - - රි - - - ස - නි ස - - සරි සරි ග රි - - - - ස |
| විරත්ත ऽ චිත්තා ऽ ऽऽ ऽऽ ऽ ऽ ऽ ऽ ऽ ऽ ऽऽ ऽऽऽऽ ऽ ऽ ऽ ऽऽ ऽ ऽ |

මාතෘකාවට ඍජු ව අදාළ වන සාහිත්‍යයක් දැකගත නොහැකි වුව ද වෙනත් ප්‍රවේශයන් ගෙන් සිදු කළ ග්‍රන්ථ හා ලේඛන කිහිපයක් හඳුනාගත හැකි විය. සී. ද. එස්. කුලතිලක මහතා විසින් රචනා කරන ලද 'ජන සංගීත සිද්ධාන්ත', 'සංගීත සම්භවය' කෘති ද්විත්වය ද, එතුමා විසින් සංස්කරණය කරන ලද 'සිංහල සංගීත පර්යේෂණ වාර්තා, අංක 1' ද මෙකී අධ්‍යයනයට වැදගත් ය. රෝහණ බැද්දගේ මහතා විසින් රචනා කරන ලද 'සිංහල සංගීත ශෛලිය' කෘතිය, ඩබ්. බී. මකුලොලුව මහතාගේ 'හෙළ ගී මග' නෙලුම් ගායන පිළිබඳ සමගාමී මූලාශ්‍රයකි.

## පර්යේෂණ ගැටලුව

උපතේ සිට මරණය දක්වා විසිරුණු ජන ජීවිතය තුළ කෘෂිකර්මාන්තය පදනම් වූ ගායන සම්ප්‍රදායක අනන්‍යතා ලක්ෂණ පවතී ද?

## පර්යේෂණ අරමුණු

මෙහි අරමුණු කිහිපයකි.

1. ශ්‍රී ලාංකේය ජන සංගීතය හඳුනා ගැනීම හා ගායනා ශෛලීන් අධ්‍යයනය කිරීම.
2. නෙළුම් ගායන ශෛලියෙහි විශේෂතා විමසීම.

## පර්යේෂණයේ වැදගත්කම

රටක සංගීත අධ්‍යාපනයෙහි අඩිතාලම ජන සංගීතය යි. රටට වැඩදායක වූ සංගීතයන් බිහිවීමට නම් සිය රටේ ග්‍රාමීය සංගීතය පිළිබඳ ඉතා හොඳ දැනීමක් අවශ්‍ය වේ. රටක ළදරු සංගීත අධ්‍යාපනය විශේෂයෙන් ම ගැමි ගී ගායනය මත සකස් විය යුතුම ය. දත් දෙයින් නොදත් දෙයට යන අධ්‍යාපන මූලධර්මය ඒ සඳහා ඵලදායකය. ඩබ්. බී. මකුලොලුව මහතා පෙන්වා දෙන්නේ සැම පාසලක මෙන් ම සංගීතායතනයකම ගැමි ගී අනිවාර්ය විෂයක් වශයෙන් ඉගැන්වීම වැදගත් වන බව ය. (මකුලොලුව 2000) වංග දේශයේ ජන සංගීතය පිළිබඳ පර්යේෂණය කළ රවින්ද්‍රනාත් තගෝර් මහතා පෙන්වා දුන්නේ ජන උරුමයේ ස්පන්දනය රැඳී ඇත්තේ ජන සංගීතයේ බව ය. නවීකරණය වීමත් සමඟ අභාවයට යන ජන ගීය රැකගැනීමට යුරෝපයේ සංගීතයෝ ක්‍රියා කළහ. සිසිල් ජේ. ෂාර්ප්, මෝඩ් කාර්පලස්, වෝරන් විලියම්ස් ඒ අතර වූහ. හංගේරියානු ජන සංගීතය ඉහළට ඔසවා තැබීමට බෙලා බාටොක් වැනි සංගීතයන්ගේ දායකත්වය වැදගත් විය. සිය ජාතික සංගීතය සකස් කර ගැනීමෙහි ලා ඒ ඒ ජාතීන්ගේ ගැමි ගී උපයෝගී කරගත් බව විදේශීය රටවල සංගීත ඉතිහාසය විමසීමේ දී දැකගත හැකි වේ. පැරණි සිංහල ගායන ලක්ෂණ රාශියක් ම සුරැකී ඇත්තේ සිංහල නෙළුම් ගී ගායනයෙහි බව අවධාරණයෙන් පැවසිය යුතු ය. ශ්‍රී ලාංකේය මානවවංශ සංගීතවේදයට අයත් ගායන ශෛලියක් වන නෙළුම් ගායන අධ්‍යයනය කිරීම විෂයේ ප්‍රගතියට හේතුවන්නකි.

## පර්යේෂණ ක්‍රමවේදය

ලිඛිත සාහිත්‍යය අධ්‍යයනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය යි. ලිඛිත සාහිත්‍යය අධ්‍යයනයේ දී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය හඳුනා ගැනීමත්, එම මූලාශ්‍රය විශ්ලේෂණය කරමින් උපකල්පනය කිරීමත් සිදු විය. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, පටිගත කළ ශ්‍රව්‍ය තැටිවලට සවන් දීම ආදිය භාවිත කෙරිණ.


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නාද මාලාව 4:

**නෙළුම් ගායන ශෛලිය - හොරණෑ ඕසේ**

(නාද මාලාව)

| | | | |
|---|---|---|---|
| ස - - - - - - | ස රි - ස -නි - | නි ස - - - - - | ස රි - ස - නි - |
| ආ s s s s s s | සා s s s s s s | වෙ s s s s s ත් | ම s s s s යි s |
| නි ස - නි - ග - | රි ග - රි - ස - | ස රි - ග - ස - | ස - - - - - - |
| ගො s s ය s s s | මේ s s සි s s s | ටි s s s s s s | තේ s s s s s s |

නාද මාලාව 5:

| | | | | |
|---|---|---|---|---|
| ස ග රි රි | ග රි ග රි ස - | ස රි | ග රි ග රි ස - | ස ස |
| තෙ ල්s ගා | s s s s s s | ලාs | s s s s s s | හි ස |
| ස ග රි රි | ග රි ග රි ස - | ස රි | ග රි ග රි ස - | ස ස |
| පී ss ර | ත් s s s s s | නෑs | s s s s s s | තෝ s |
| ස ග රි රි | ග රි ග රි ස - | ස රි | ග රි ග රි ස - | ස ස |
| ඇ ටs වැ | ලs s s s s | අs | රs s s s s | ගෙ න |
| ස ග රි රි | ග රි ග රි ස - | ස රි | ග රි ග රි ස - | ස ස |
| බැ ඳුs ග | ත් s s s s s | නෑs | s s s s s s | තෝ s |

## සාකච්ඡාව

කුඹුරේ වල් නෙලීමේ දී හෝ අලුත් පැළ සිටුවීමේ දී හෝ ගයන ගී නෙළුම් ගී වශයෙන් හැඳින්වේ. මෙය ගැමි ජනයා අතර ඉතා ප්‍රකට ගායන ශෛලියකි. පැල්, කුරහන්, තලමල, තෙතඟු ගී ආදිය ද නෙළුම් ගායන ශෛලියට ඇතුළත් වේ. නෙළුම් ගී සෑමවිටම සාමූහිකත්වය ප්‍රකට කරන අතර, කණ්ඩායම් වශයෙන් ගායනා කෙරේ. මෙම කාර්යයෙහි නියුක්ත වන්නෝ ස්ත්‍රීහු වෙති. සෑම කණ්ඩායමකම ගායනය සඳහා දක්ෂ පළපුරුදු ගායිකාවක සිටී. ගීතයෙහි පාදයක් බැගින් ඇය පිරූ විට සෙසු පිරිස එහි අත්වැල සමූහ ලෙස ගයති. නෙළුමකට සහභාගිවන පිරිස දහදෙනෙකුගෙන් හෝ සමහර විට විසි තිස් දෙනෙකුගෙන් වුව ද යුක්ත විය හැක. නෙළුම් ගායනය ආරම්භ වන්නේ හිරු, සඳු, මිහිකත් ආදී දේවාශිර්වාදය ලබා ගැනීම සඳහා වන නමස්කාරයකිනි.

"නමෝ නමස්කාරයි හිරු දෙවියන්ට
නමෝ නමස්කාරයි සඳ දෙවියන්ට
නමෝ නමස්කාරයි ගණ දෙවියන්ට
නමෝ නමස්කාරයි මිහිකත් දෙවිට"

නෙළුම් ගායනාවේ ප්‍රධාන වර්ග දෙකකි.

- නෙළුම් ඕසය
- නෙළුම් සින්දුව

නෙළුම් ඕසය යනු විලම්භ ලයෙන් යුත් ගායන ශෛලියකි. ඕසය යනු තනුව යන්නට යෙදෙන්නක් බව සී. ද එස්. කුලතිලක මහතා පෙන්වා දෙයි. ඕස යනු ද්‍රවිඩ 'ඕසෙ' යන වචනයේ විකෘතියක් බව ද එහි තේරුම නාදය, තනුව, නාදමාලාව ගෙන දෙන බව කුලතිලක මහතාගේ අදහස ය. නෙළුම් ගායනයේ හරය පවතින්නේ නෙළුම් ඕසේ ගායනයේ බව ඔහු වැඩිදුරටත් කියා සිටී. (කුලතිලක 1972) ඕසේ ගායන රටාවන්හි විවිධත්වය අනුව පිරිත් ඕසේ, හොරණෑ ඕසේ නමින් වර්ග කිහිපයක් ප්‍රචලිත ය. අතීතයේ ඕසේ වර්ග දහ අටක් භාවිත වූ බව ඩබ්. බී. මකුලොලුව මහතාගේ අදහස ය. (මකුලොලුව 2000)

මෙහි ගැයෙන 'පිරිත් ඕසේ' ශෛලිය සඳහා පිරිත් සජ්ජායනයෙහි බලපෑම ලැබී ඇති බව පැහැදිලි වන්නකි (නාද මාලාව 1).


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නාද මාලාව 6:

## නෙළුම් ගායන ශෛලිය - පිරිත් ඕසේ
### (අනාසාතාත්මකයි)

| |
|---|
| ස ගු ^රි^ස රිගු   රි රි ගු -   රිස සරිරිස ස -   ස සරි රි සගු |
| අ ඩි යෙ sන්  අ ඩි ය s   ss s s s s   s s  ව  ඩිs මි sන් |
| රි රිස ස  -  සරි ගු  රිස රිගු රි සරි ගු -  රිස සරිරිස ස - |
| පි sන් න s පාs s  ss   ss තේ ss ආ s  ss   ssss  s s |
| ස රි ස රිගු රි ගුරි ස  - - -  - - - - - - - |
| ආ s s  ss s  ss  s s s s s s s s s s |

රාත්‍රිය පුරා පිරිතට සවන් දුන් ගැමියා කෙතෙහෙි, කුඹුරෙහි කෙරෙන කටයුතුවල දී, වෙහෙස මහන්සිය දුරු කර ගැනීමට පිරිතේ ආභාසය ලබා ඒ අනුව නෙළුම් කවි ගයන්නට ඇත. සාමූහික වන්දනා ක්‍රමය සඳහා මහායාන ආභාසයෙන් සිදු වූවා මෙන් ම කුඹුරේදීත් ඔවුන් සාමූහික ව නෙළුම් කවි ගායනා කරන්නට විය. එක් අයෙකු මුල පුරා, ඉතිරි පද සඳහා අත්වැල් ගායනා කිරීම නෙළුම් කවියේ දී ඇසිය හැකි වන්නේ ඒ නිසා ය. ඇද පැද ගායනා කිරීම ද පිරිතේ මෙන් විය. පිරිත් ඕසේ ගායනය සඳහා මත්සම සිව්පද විරිත යොදාගෙන ඇතත්, ගායනයෙන් පැන නගින රාවය මුළුමනින් ම පිරිත් සජ්ඣායනයේ හඬට සමාන ය. පිරිත් ගායනයට අයත් නාද පරිමාණය, නාද සංකලනය නෙළුම් ගීයට බලපා ඇති බව පෙනේ (නාද මාලාව 2 සහ 3).

ශ්‍රී ලාංකේය ජන ගායන ක්ෂේත්‍රයේ නෙළුම් නාදමාලා සහ තෝරා ගත් අංග විමසා බැලීමේ දී නාද පරිමාණය ස්වර හතරකට සීමා වන පරිදි ශුද්ධ හා කෝමල ස්වර සහිතව ශ්‍රවණය කළ හැකි වීම දැක ගත හැකි වූ ලක්ෂණයකි. හ ලෙළිදීම් සියල්ල ප්‍රස්තාර සටහනකට යෙදිය නොහැකි වුව ද ගායන ශෛලියෙන් ඉස්මතු වන ස්වර, සජ්ජය පාදක ස්වරය ලෙස ගෙන විමර්ශනය කළ කල්හී කෝමල නිශාදය, නිශාදය, සජ්ජය, කෝමල රිෂභය, රිෂභය, කෝමල ගාන්ධාරය, ගාන්ධාරය ආදී ස්වර ස්ථාන යෙදී ඇති බව පෙනේ. බටහිර සංගීත ස්වර සාධනයට අනුවසෙමිටෝන පහක් ඇතැම් ගායන සඳහා යෙදී ඇත. නෙළුම් ගීතවල ස්වර සීමාව පටු වුව ද එහි ස්වර සංගති කිහිපයක් දක්නට ලැබෙන්නකි. නෙළුම් ගීත වර්ධනය වී ඇත්තේ ස්වර සංඛ්‍යාව අනුව නොව මාත්‍රා සංඛ්‍යාවෙන් යන්නය බව දත්ත විශ්ලේෂණයේ දී විද්‍යමාන වූවකි. මාත්‍රා 16, 18 ප්‍රබන්ධ ගී පාදයක් මාත්‍රා 56, 63, 73 දක්වා වර්ධනය වීම එහි ප්‍රතිඵලයකි (නාද මාලාව 4).

නාද මාලාව 7:

| |
|---|
| ස ග - රි ස- ස රිරි ග - රිරිස - රි රි - ස රි ස රිස - - - - |
| මෙ ලො s වත් s ප ර s s ss ss s s s s s s s s s s s s s s |
| ස ගුරි ස - ස රිගු ග ග - -රිරිස - රිරි - ස රි ස රි ස - - - |
| ලො වත් s සෑ පsදෙ ති s s ss s s ss s s s s s s s s s  s |
| ස - රි ග - ග ස රිග - - රිරිස - රිරි - ස රි ස රි ස - - - |
| සු sද ssන හ ට s s s ss s s ss s s s s s s s s s |
| ස රි ග ස රි ග - රිරිස - රිරි - ස රි ස රි ස - - |
| s s s s s s s ss s s s s s  s s s  s s  s s |

**නෙළුම් ගායන ශෛලිය - හොරණෑ ඕසේ**

“ආසාවෙන්මයි ගොයමේ    සිටින්නේ
ආසාවෙන් වද විඳ    රැකගන්නේ
ආසාවෙන් සත් මස    පසුවන්නේ
ගෝසාවෙන්මයි ගොයමේ    සිටින්නේ”
(මාත්‍රා 16)

තවද එක ම නාද ඛණ්ඩයක් පුන පුනා ගැයීම ද නෙළුම් ගීයේ විශේෂතාවකි. එම පුනරුක්තිය නාද මාලාව තුළ අනුගමනය වී තිබෙන්නේ නාද මාලාව 5හි ලෙසිනි. මෙලෙස සේලේ අරගෙන ඇඳගත් නැනෝ, ගොයම් නෙලන්නට යමු අපි නැනෝ යන පාද ද ගැයේ.

නෙළුම් ගීයේ මන්ද්‍ර ස්වර ඇසුරු කොට ඇත්තේ ආරම්භක 'ග්‍රහ' ස්වර වශයෙනි. බොහෝ නාද රටා මන්ද්‍ර සප්තකය ඇසුරු කරමින් කෝමල නිශාදයෙන් ආරම්භ වීම ද, නාද සංයුති සප්තකයේ පූර්වාංගයෙහි යෙදී ඇති බව ද හෙළි වේ. මේ අනුව මෙම විමර්ශනයට පාදක වූ ගායනා සියල්ල අවධාරණ සංයුතියට ඇතුළත් වේ. නෙළුම් ගීතබොහෝ විට ශ්‍රැති ස්වරයෙන් ම ආරම්භ වී පාද අන්තය ශ්‍රැතියෙන් ම අවසාන කිරීම ද දැකිය හැක්කකි. ගායන ශෛලිය හා බැඳි පවතින නාද ලාලිත්‍යයෙන් වර්ණවත් කරමින් ගායනා කිරීමේ දී ගායන ශෛලියේ නාද රටාව දළ ප්‍රස්තාර සටහනකට වඩා සංකීර්ණ ස්වරූපයකින් යුක්ත වන බව ද පෙනි යන්නකි (නාද මාලාව 6).

නාද මාලාව 6 අනුව

කොඩියෙන් කොඩිය එළියකි නුවර සේසතේ
ආ - - ෦ - - - -
අඩියෙන් අඩිය ගිය දන්ඩෙ බැල්ම නෙතේ
ආ - - ෦ - - - -
අඩියෙන් අඩිය වැඩියයි වනයෙ පරුවතේ
ආ - - ෦- - - -


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නාද මාලාව 8:

| | | | |
|---|---|---|---|
| නි ස රි | - රි ග | ස රි ස | ග රි ස ස |
| බෝ ග S | ම් බ ර | අ පි S | S S S S |
| නි ස රි | - රි ග | ස රි ස | ග රි ස ස |
| නෙ ළු ම | ට ය න | කො ට S | S S S S |
| ස - - | ග රි රි - | රි - - | ග රි ස - - |
| ති S S | S S S ස් | දෙ S S | S S S S න් |
| ස රි ස | ග රි ස ස | ස - - | - - - - |
| නෙ S S | S S S ක් | නෙ S S | ල S S S |
| ස - - | ග රි රි - | රි - - | ග රි ස - - |
| තෙ S S | S S S යි | තා S S | SS S S S |
| ස රි ස | ග රි ස ස | ස - - | - - - - |
| S S S | S S S S | ල ම් S | S S S S |

ඕස ගායනයේදී විලම්භ ලයක් අනුගමනය කරමින් ගැයීම ද ආං - -වැනි ශබ්ද යොදා ගැයීම ද එම ශෛලියේ විශේෂතාවකි. එය බොහෝ විට චතුර් මාත්‍රික ක්‍රමයට ගයනු ලැබුව ද එම නාද මාලාව තුළ මැදුම් මහ දෙතිතෙහි ස්වරූපය දැකිය හැකිවේ. කර්ණාට සංගීත පද්ධතියෙහි දැකිය හැකි මිශ්‍ර ගති ලක්ෂණය මෙනි. පහත ගායන විලාසය ඊට සාක්ෂි දරයි (MR 7 1970). (නාද මාලාව 7)

**නෙළුම් ගායන ශෛලිය - පිරිත් ඕසේ**
(අනාඝාතාත්මකයි)

"මෙළොවත් පරලොවත් සැප දෙති සුදන    හට
බලවත් බසක් පවසමි මිතුමේ    ඔබට
පිහිටත් ලැබෙයි සැම දෙවියන්ගෙන්    අපට
සිදුහත් කුමරුගේ මව්පියො කියන්    මට"

18 මත් විරිත චතුර් මාත්‍රික විභාගවලින් ඇසිය හැකි වන්නේ නෙළුම් ගීත පමණක් විය යුතු -වේ. අනාඝාත්මකව ගැයෙන පිරිත් ඕසයට අයත් එක් පාදයක් කොටස් හතරකට බෙදී ඇති බව නාදමාලා විශ්ලේෂණයේ දී හෙළිවන්නකි.

1. මෙලොවත් පර. . . . . . . . .
2. ලොවත් සැපදෙති. . . . . . . .
3. සුදන හට. . . . . . . . .
4. අ අ අ අ ආ. . . . . . . . .

නෙළුම හමාර කරන අවස්ථාවේ ගැයෙන ගී නෙළුම් සින්දු වේ. නෙළුම් සිංදුව ගැයෙන්නේ මාත්‍රා තුනෙන් තුන නැතහොත් තුන හතර මිශ්‍රණයෙන් (මධ්‍යලය, කඩිනම්ලය) ස්වරූපයෙනි. මධ්‍ය හා ද්‍රැත ලයෙන් එම ගායන ඇසිය හැකි වේ (නාද මාලාව 8).

නාද මාලාව 9:

**ගීමත්**

| | | | |
|---|---|---|---|
| ස - - - | රි - ස නි | නි ස - - | රි - ස නි |
| නා S S S | න S වි S | ලේ S S S | S S S S |
| නි ස - - | රි - ස නි | ස ග රි ග | රි ස ස ස |
| නා S S S | S S S S | ග S S ස් | න S ව S |
| ස - - - | රි - ස නි | නි ස - - | රි - ස නි |
| ය S S ක් | ති S බු S | ණා S S S | S S S S |
| නි ස - - | රි - ස නි | ස ග රි ග | රි ස ස ස |
| S S S S | S S S S | S S S S | S S S S |

(මාත්‍රා 64)

**නෙළුම් ගායන ශෛලිය - නෙළුම් සින්දු**
(මැදුම් තනිතිත හා මැදුම් මහ දෙතිත)

"බෝගම්බර අපි නෙලුමට    යනකොට තිස්දෙන්නෙක්
නෙලතෙයි තාලම්
තිස්දෙන්නෙක් නෙලුවාට    කුමක්ද වෙද සුහුරුලියන්
නෙලතෙයි තාලම්
සුහුරුලියේ නුඹේ ගන රන්    දැතටවළලු ළවා
නදදෙයි තාලම්
බෝගම්බර සිටි සුහුරු    කිඩැකෙළි සැම දෙවියෝ
රැක දෙයි තාලම්"

විරිත යනු ලඝු ගුරු අක්ෂර සංයෝගය යි. එහෙත් සීමා කරන ලද ලඝු ගුරු අක්ෂර සංඛ්‍යාවක සංයෝගය විරිතකයි ගැනීම යුක්ති යුක්ත ය. ගද්‍යයෙහි එන වාක්‍යයන් ද සැදුනේ ලඝු ගුරු අක්ෂර සංඛ්‍යාවෙන් වූව ද වාක්‍යයක අක්ෂර සංඛ්‍යාවෙහි සීමාවක් හෝ ලඝු ගුරු අක්ෂර පිහිටුවීම පිළිබඳ නියමයක් හෝ නොවන හෙයින් ගද්‍ය වාක්‍ය විරිත් ගණයෙහිලා ගනු නොලැබේ. එබැවින් විරිත යනු පැදියක ලඝු ගුරු අකුරු සංයෝගය යි. (මකුලොලුව 2000) විරිතෙහි මූලික පදනම සඳැස ය. අක්ෂරයන් ගේ සංඛ්‍යා නියමය ඡන්දසයි. එකම ඡන්දසෙහි ලඝු ගුරු අක්ෂර සංයෝග වෙනස් වීමෙන් විරිත් රාශියක් ලැබේ. අකුරු විරිත් හා මත් විරිත් යැයි දෙපරිදි වේ. ලුහු ගුරු බව නොතකා අකුරු ගණන අනුව ගනු ලබන්නේ අකුරු විරිත ය. අකුරුවලට හිමි ලුහුමත් ගණන අනුව ගනු ලබන්නේ මත් විරිත ය. ලුහු අකුරක් එක් මතක් කොට ද ගුරු අකුරක් දෙමතක් කොට ද ගැනීම මත් විරිතක මත් ගණන ගිණීමෙහි සාමාන්‍ය නියමය යි.

මත් ගණනින් පාද සතර ම එකිනෙකට සම වූයේ සම හෙවත් මත් සම පැදිය යි. මෙහි මත් සම පැදි හෝ මත්


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සම විරිත් වශයෙන් හඳුන්වනු ලබන්නේ පෙරදිග ඡන්දස් ශාස්ත්‍රයෙහි එන සොළොස්මතකට සීමා කරන ලද මාත්‍රා සම විරිත නොවේ. පස්මත්, දොළොස්මත්, එක් විසිමත් ආදී ඕනෑම මාත්‍රා ගණනකින් පාද හතර එකිනෙකට සමාන නම් ඒ මත්සම පැදි හෝ සම විරිත් ලෙස හැඳින්වේ. (මකුලොලුව 2000) මත් ගණනින් පාද සම වන මත් සම පැදි හඳුන්වන කල එක් පාදයකට සීමා වූ මත් ගණනින් පැදිය නම් කිරීම සිරිත ය. එළුසඳැස්ලකුණට අනුව සිව්පද යනු ගණ වශයෙන් හෝ ගණ සංඛ්‍යා වශයෙන් විෂම වුව ද මාත්‍රා සමාන වූ එළිසම, විරාම, සමාන වූ පද්‍ය වේ. (වැලිවිටියේ සෝරත 1944) සිව්පද යටතේ ඡන්දස් 14 ක් එළු සඳැස් ලකුණේ දක්වා ඇති අතර, කෙටි ම සිව්පදය එක් ගුරක් හෝ මාත්‍රා දෙකකින් ද දීර්ඝතම සිව්පදය ගුරු 14 කින් හෝ මාත්‍රා 28 කින් යුක්ත බව සඳහන් වේ.

"ගුරෙක් දෙමත් පටන් - තුදුස් ගුරු විසි අටමත්
කෙළ දනු සඳස පිළිවෙල - මෙසෙසින් නම් සිව් පෙදේ"

මෙම අධ්‍යයනයට පාත්‍ර වූ ගායනයන් හි අන්තර්ගතය විමසීමේ දී මත් සම පැදි දැකිය හැකි වේ. ගායනයන්හි අන්තර්ගත මත් ගණයට අයත් ගායන සිව්පද ලෙසින් ද හැඳින් වේ.

**සොළොස්මත් පැදි / සොළොස්මත් සිව්පද**

| | | |
|---|---|---|
| කෙතක ගොයම් පැල නිල | දිලිසෙනවා | - -මාත්‍රා 16 |
| තැනක ඉඳත් මල් මාල | ගොතනවා | - -මාත්‍රා 16 |
| වටක ඉඳත් මල් වඩම් | තනනවා | - -මාත්‍රා 16 |
| මලක බඹරු සේ වට | නදදෙනවා | - -මාත්‍රා 16 |

**දසඅටමත් පැදි / දසඅටමත් සිව්පද**

| | | |
|---|---|---|
| රොඩු බොල් නැතිව බිත්තර වී | පොලාපන් | - -මාත්‍රා 18 |
| ගොම බෝ නොකර අත්තට වී | පොලාපන් | - -මාත්‍රා 18 |
| පඳුරු මල් ලෙසට වී අත | වනාපන් | - -මාත්‍රා 18 |
| සත්වෙනි දිනට කුඹුරට වැඩ | මවාපන් | - -මාත්‍රා 18 |

**සූවිසිමත් පැදි /සූවිසිමත් සිව්පද**

නන්ද උතුම් උයනෙ උතුම් අනුරාධපු වරුණේ
—මාත්‍රා 24
ගැමුණු රජුන් එදිනේ දුටුව කල දාගැබ ගිලුණි අනේ
—මාත්‍රා 24
ධාතු නැතිව රජුනේ රුවන්වැලි දාගැබ ගිලුණි අනේ
—මාත්‍රා 24
ඇමතිවරුන් එදිනේ රජුන්හට වැඳ වැඳපවසන්නේ
—මාත්‍රා 24

සඳැස්මත් ගණන අනුව පද්‍ය ප්‍රබන්ධයන්හි දක්නට ලැබන විරිත් ලක්ෂණය ගායනයේ දී වෙනස් වන අවස්ථා දැක ගත හැකි වීම ගායන විශේෂතාවකි. ගායනය කළ විට ලැබෙනුයේ ගී මත් වේ. ඒ අනුව අක්ෂර මත යති පිහිටුවීමෙන් පැදිය ගායනය කිරීමේ දී අකුරුවලට හිමි මාත්‍රා ගණන වැඩි වන බව පෙනේ (නාද මාලාව 9හි සැඳැස්මත් 18 කි. එහෙත් ගීමත් 64 කි).

**නෙළුම් ගායන ශෛලිය -හොරණෑ ඕසේ සඳැස්මත්**

| | |
|---|---|
| නානවිලේ නා ගස් නවයක් | තිබුණා |
| නානවිලේ නා ගස්වල අතු | බෙදුණා |
| නානවිලේ නා අතු අග මල් | පිපුණා |
| නානවිලේ නාමල් මුනිඳුට | පිදුනා |
| | (මාත්‍රා 18) |

ඇතැම් නෙළුම් ගීයක ප්‍රස්තුතය වී ඇත්තේ බුදු ගුණ වර්ණනා වේ. ගායනයෙහි ඇති සංවර බව, ප්‍රස්තුතයට ගැලපෙන නාද සංයෝජනය විමසීමේ දී විධාව සංසිඳුවා ගැනීමට අමතරව කිසියම් ආගමික වතාවත් සඳහා ගැයූ සාමූහික ගායනයක් බව ද පෙනී යන්නකි. නෙළුම් කවි සඳහා ගැයෙන තල මල, තෙතඟු ගී ප්‍රබන්ධ ලක්ෂණ ඊට සාක්ෂි දරනු ඇත.

සිරිමා බෝ මුල වැඩ සිට මුනි බුදුවෙනවා තෙතඟු
තා දිගු අඩියේ රිගුතරි රාජ සිපන්තා
වැඩ සිටි මිණි පළඟේ බුදු රැස් විහිදෙනවා තෙතඟු
තා දිගු අඩියේ රිගුතරි රාජ සිපන්තා
හොඳට හොඳයි බුදුවෙනවා මල් වැසි වැස්සා තෙතඟු
තා දිගු අඩියේ රිගුතරි රාජ සිපන්තා
එන ඒ මෙත් මුනිඳු වඳිමු සාදුකාර දී තෙතඟු
තා දිගු අඩියේ රිගුතරි රාජ සිපන්තා

විවිධ රස භාවයන් නිරූපනය වන බව අධ්‍යයනයේ දී හෙළි විය. ඉන් ප්‍රධාන කොට කරුණ රසය පෙන්වා දිය හැක.

## නිගමනය

අතීතයේ තුලනාත්මක සංගීත විද්‍යාව ලෙස හැඳින් වූ මානවවංශ සංගීත විද්‍යාව යනු සංගීතය, එයට අයත් වන මානව හා සංස්කෘතික සන්දර්භයක් තුළ අධ්‍යයනය කිරීම ය. ලෝක ව්‍යාප්තව සහ ප්‍රාදේශික වශයෙන් පැතිර පවතින නැටුම් හා සංගීත පද්ධතීන්ගේ සමාජමය සහ සංස්කෘතික නැඹුරුව අධ්‍යයනය කිරීම වශයෙන් පුළුල් අර්ථ නිරූපණයකට භාජනය වී ඇති මානවවංශ සංගීත විද්‍යාව (Ethnomusicology) සංගීත විද්‍යාවේ (Musicology) ප්‍රධාන ශාඛාවකි. එමෙන් ම එය සංස්කෘතික මානවවිද්‍යා විෂය ධාරාවේ මානවවංශ විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයට අයත් වූවකි.

ශ්‍රී ලාංකේය ජන ගායන ක්ෂේත්‍රයේ නෙළුම් නාදමාලා විමසා බැලීමේ දී නාද පරිමාණය ස්වර හතරකට සීමා වන පරිදි ශුද්ධ හා කෝමල ස්වර සහිතව ශ්‍රවණය කළ හැකි වීම දැක ගත හැකි වූ ලක්ෂණයකි. ගායන ශෛලියෙන් ඉස්මතු වන ස්වර, සජ්ජය පාදක ස්වරය ලෙස ගෙන විමර්ශනය කළ කල්හී කෝමල නිශාදය, නිශාදය, සජ්ජය, කෝමල රිෂභය, රිෂභය, කෝමල ගාන්ධාරය, ගාන්ධාරය ආදී ස්වර ස්ථාන යෙදී ඇති බව පෙනේ. නෙළුම් ගීතවල ස්වර සීමාව පටු වුව ද එහි ස්වර සංගති කිහිපයක් දක්නට ලැබෙන්නකි. නෙළුම් ගීයේ මන්ද්‍ර ස්වර ඇසුරු කොට ඇත්තේ ආරම්භක 'ග්‍රහ' ස්වර වශයෙනි. බොහෝ නාද රටා මන්‍ද සප්තකය ඇසුරු කරමින් කෝමල නිශාදයෙන් ආරම්භ වීම ද, නාද සංයුති


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සප්තකයේ පූර්වාංගයෙහි යෙදී ඇති බව ද හෙළි වේ. මේ අනුව මෙම විමර්ශනයට පාදක වූ ගායනා සියල්ල අවධාරණ සංයුතියට ඇතුළත් වේ. නෙළුම් ගීත වර්ධනය වී ඇත්තේ ස්වර සංඛ්‍යාව අනුව නොව මාත්‍රා සංඛ්‍යාවෙන් යන්නය බව දත්තවිශ්ලේෂණයේ දී විද්‍යමාන වූවකි. නෙළුම් ගීතවල ස්වර සීමාව ඉතා පටු වුව ද කණ්ඩායම් වශයෙන් ගායනා කරන ජන ගී අතුරින් නෙළුම් ගී සංවරව ගයන ගීත විශේෂයකි. මුඛ පරම්පරාගතව පැවතීම, රචකයා නිර්නාමික වීම, නිර්මාණය කළ කවි නොව නිර්මාණය වූ කවි වීම, නිර්ව්‍යාජ බව, සංක්ෂිප්ත බව, කිසියම් කාර්යයකට අදාළ වීම, පොදු ජනයා විසින් සාමූහිකව පිළිගැනීම, පොදු ජනයාගේ සිතුම් පැතුම්, ජීවිතය පිළිබඳ අත්දැකීම් ප්‍රස්තුත වීම, කාන්තාවන් ගේ දායකත්වය ඇති ව සිදු වීම ආදිය නෙළුම් ගීත විශේෂතා වේ.

## පරිශීලිත මූලාශ්‍රය


**සංස්කරණ**

එළු සඳැස් ලකුණ 1944 දෙවැනි (සංස්) වැලිවිටියේ සෝරත ස්ථවිර, මරදාන

කහකුරුළු සඳෙස 1954 (සංස්) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර, සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම,

මහාවංසය සිංහල 2003, (සංස්) දෙහිවල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, සිංහල ථූපවංසය 1966, මරදාන බලගල්ලේ විමලබුද්ධි, විමල විජයසූරිය, (සංස්) රත්න පොත් ප්‍රකාශකයෝ

හංස සන්දේශය 1991 තෙවැනි (සංස්) ජී. එස්. බී. සේනානායක, ප්‍රදීප ප්‍රකාශකයෝ

**කෘති**

කුලතිලක සී. ද. එස්. 1972, සිංහල සංගීත පර්යේෂණ වාර්තා, අංක 1, (සංස්) , කොළඹ, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රකාශනයකි.

කුලතිලක සී. ද. එස්. 1991 දෙවන, ජන සංගීත සිද්ධාන්ත, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

කුලතිලක සී. ද. එස් 1996 දෙවන, සංගීත සම්භවය, කොළඹ එස්. ගොඩගේ සහ සහෝදරයෝ

ජයතිලක කේ. 2002 දෙවන, විමර්ශන සහිත පරෙවි සන්දේශය (සංස්) ප්‍රදීප ප්‍රකාශකයෝ

බැද්දගේ රෝහණ 2005 දෙවන, සිංහල සංගීත ශෛලිය, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මකුලොලුව ඩබ්. බී. 2000 නව, හෙළ ගී මග, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මහේන්ද්‍ර සුනන්ද 1997, සන්නිවේදන ශබ්දාකාරය, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

වීරක්කොඩි ඉරංගා සමින්දනී, 2013, නැළවිලි ගීයෙන් නිරූපිත සිංහල ජනශ්‍රැතිය, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

**තැටි**

MR 7 1970. 06. 28 පටිගත කළ තැටිය, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

**විදේශීය**

Adhikaram E. W. 1946, Early History of Buddhism in Ceylon

Folk Songs and Music, Lecture by Professor S.N. Ratnajankar on June 1952, JRAS, Volume 11, Part 2.1. 103-12236

The Universal Encyclopedia, 1921/2,The Education Book Co.Ltd, England

Pegg, Carole:. Ethnomusicology. , Grove Music Online ed. L. Macy (Accessed February 3, 2008), http://www.grovemusic.com




© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
නවවැනි කලාපය; 2018 දෙසැම්බර්, පිටු 32-36
ISSN 1800-1459 eISSN 2673-1177

© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# බටහිර තරණය කෘතිය තුළින් චීන සාම්ප්‍රදායික දර්ශනවාද නිරූපණය කෙරෙන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

(A Study of the Implications of Traditional Chinese Doctrines in Journey to the West)

දසනායක, එන්. එස්. වයි.[1*]

[1]භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.
[*]noel@ssl.sab.ac.lk

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණ පත්‍රය මගින් විශ්ලේෂණය කෙරෙනුයේ චීන ශිෂ්ටාචාරයේ ආගමික සහ දාර්ශනික චින්තනයන් සම්භාව්‍ය චීන සාහිත්‍ය නිර්මාණයක් වන බටහිර තරණය කෘතිය තුළින් නිරූපණයකොට ඇති ආකාරය යි. තාඕ ධර්මය, බුදුදහම සහ කොන්ෆියුසියස් දර්ශනය චීනයේ ප්‍රධාන දර්ශනයන් ලෙස ව්‍යාප්ත වූ අතර ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම පැවති මළවුන් ඇදහීම, මුතුන්මිත්තන් ඇදහීම, නොයෙක් දෙවිවරුන් ඇදහීම වැනි ඇදහිලි හා විශ්වාස බොහෝමයක් පැවතුණි. වූ චං අන් බටහිර තරණය නිර්මාණය කිරීමේදී මෙම සියලු ඇදහිලි, විශ්වාස, ආගම් සහ දර්ශනයන්වල ලක්ෂණ ඇතුළත්කොට ඇති බව මෙම පත්‍රිකාව මගින් නිරීක්ෂණය වේ. පුරාතන යුගයේ සිට ම චීන ශිෂ්ටාචාරය තුළ ඒකදේවවාදී, මූලධර්මවාදී ආගම් ව්‍යාප්තවාදයක් දක්නට නොලැබිණි. චීනය තුළට ක්‍රි. ව. පළමු සියවසේ පමණ සංක්‍රමණය වූ බුදුදහම ද, චීනය තුළ උපත ලැබූ තාඕ ධර්මය සහ කොන්ෆියුසියස් දර්ශනය ද වසර දහස්ගණනක් තිස්සේ අන්‍යෝන්‍ය සහසම්බන්ධයෙන් චීනය තුළ පැවතුණු අතර මෙම ලක්ෂණය චීන සාහිත්‍ය කෘතීන් තුළින් ද නිරූපණය වන බව නිගමනය කළ හැක.

කේන්ද්‍රීය වචනඃ බටහිර තරණය, සාම්ප්‍රදායික චීන ආගම්, කොන්ෆියුසියස් දර්ශනය

Doaism, Buddhism and Confucianism have been coexistent in China from 6BCE as the three main religious doctrines and they have had extensive influence on the evolution of Chinese civilization. Principles of all these three doctrines have been manifested by Chinese literary works and Wú Chéng.�n.s Journey to the West, one of the four great classics of Chinese literature, has been examined by this study, to evaluate the manifestation of Chinese religious doctrines through its plot. The study has been conducted by comprehensive study of Journey to the West and the principles of Chinese religious doctrines. Although, Journey to the West is considered as a Buddhist legend, it has been observed that it comprises of allegations to all three main doctrines of China. The teachings of the Taoist Dào are prominent throughout the first part of the plot where the monkey king is trained with a Taoist master. One of the strongest references to Toism is the appearance of Tài shàng l�o j�n. References to Confucianism are also observed in Journey to the West. Chinese civilization did not develop a monotheistic god worship but a unified belief system of many gods, spirits, ghosts and ancestors. It is found that apart from allegations to the three main doctrines, Journey to the West comprises of characteristics of all these beliefs.

Keywords: Journey to the West, Chinese Religious Doctrines, Confucianism

## හැඳින්වීම

බටහිර තරණය හෙවත් Journey to the West（西游记− Xīyóu jì）යනු ක්‍රිස්තු වර්ෂ දහසය වන සියවසේ දී පමණ වූ චං අන් Wú Chéng.ēn（吴承恩）නැමති චීන සාහිත්‍යධරයා විසින් රචනා කරන ලද පැරණි චීන සාහිත්‍යයේ ප්‍රධාන සම්භාව්‍ය සාහිත්‍ය කෘති හතර අතුරින් එකකි. මෙය ථං ෂුවැන් සං Tángxuánzàng（唐玄奘）නැමති බෞද්ධ ශ්‍රමණයන් වහන්සේ ත්‍රිපිටකය ඇතුළු බුදුදහමේ ධර්ම ග්‍රන්ථ සොයා චීනයේ සිට තම ශිෂ්‍යයින් වන සුන් වූ කුං Sūnwùkōng（孙悟空）, ජූ පා චියෙ Zhū bājiè (猪八戒）සහ ශා වූ චිං Shā wùjìng（沙悟净）සමග ඉන්දියාව බලා යන ගමන පිළිබඳව ලියැවුණු පුරාවෘත කතාවකි. චීනයේ සිට බොහෝ දුරක් ඉන්දියාව බලා දිවෙන මම චාරිකාව තුළ දී ථං ශ්‍රමණයන් ඇතුළු චරිත නොයෙක් බාධක හමුවේ දෝලනය වන ආකාරය සහ ඔවුන්ගේ චරිතවල පරිණාමය සාම්ප්‍රදායික චීන චින්තනය තුළින් නිරූපණය කොට ඇත. ථං ශ්‍රමණයන් වහන්සේ සහ උන්වහන්සේගේ ශිෂ්‍ය ශ්‍රමණයන් වහන්සේ විසින් මධ්‍යම ආසියාවේ සහ ඉන්දියාවේ ලද අත්දැකීම් පිළිබඳ වාර්තා හේතුවෙන් පසුකාලීන චීනයේ උන් වහන්සේ බෙහෙවින් ප්‍රචලිත වූහ (Zimmerman ) Wu 2011: ix).

වසර පන්දාහකට එහා ඉතිහාසයක් ඇති චීනය ලොව පැරණිතම ශිෂ්ටාචාරයන්ගෙන් එකක් වන අතර වර්ග කිලෝමීටර මිලියන 9.6 පමණ වූ විශාල වපසරියක භූමියකට හිමිකම් කියන චීනය තුළ මුතුන්මිත්තන් ඇදහීම, දෙවිවරුන් ඇදහීම, බුද්ධාගම, කොන්ෆියුසියස් දර්ශනය, ථාඕ දහම වැනි නොයෙක් ආගම් , ඇදහිලි සහ විශ්වාස බොහෝ ඈත අතීතයේ සිට පැවතුණි. යාඕ ගේ මතයට අනුව චීන සංස්කෘතියේ විශේෂිත ම ලක්ෂණයක් වන්නේ එහි ඇති අවිරෝධී සකල්‍යවාදය යි. එවන් ක්‍රමවේදයක් තුළ ගොඩනැගුණු චීන ආගම් සහ දර්ශනයන් තුළ ඇතම්විට එකිනෙකට පරස්පර මූලධර්මයන් ද සංකලනය වීම දක්නට ලැබේ. (Yao 2010: 10) බටහිර තරණය බෞද්ධ පුරාවෘත

කතාවක් වුව ද ඒ තුළ චීනයේ බොහෝ පැරණි සාහිත්‍ය කෘතීන් චීනයේ වෙනත් ආගම් සහ ඇදහිලිවල මූලධර්මයන් දක්නට ලැබේ. මෙම පත්‍රිකාව මගින් අධ්‍යනයට ලක් වන්නේ බටහිර තරණය කෘතිය තුළ නිරූපණය වන සාම්ප්‍රදායික චීන ආගමික චින්තනය යි. මේ දක්වා චීන සාහිත්‍ය සම්බන්ධ ව සිංහල භාෂාවෙන් ලියැ වී ඇති පර්යේෂණ ලිපි ප්‍රමාණය ඉතා අල්ප ය. චීන පැරණි සම්භාව්‍ය සාහිත්‍ය කෘති පිළිබඳ අධ්‍යනය කිරීම චීන භාෂාව සහ සාහිත්‍ය යන අධ්‍යන ප්‍රදේශයේ ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ පදනම ශක්තිමත් කිරීමට සහ කියවීම් ප්‍රමාණය ඉහළ නැංවීමට උපකාර වන බව විශ්වාස කෙරේ. එබැවින් මෙම පර්යේෂණය මගින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සහ නිරීක්ෂණ චීන භාෂාව සහ සාහිත්‍ය පිළිබඳ අධ්‍යනයට කැමැති ශාස්ත්‍රයින් සඳහා වැදගත් වනු ඇති බව ද විශ්වාස කෙරේ.

## සාහිත්‍ය විමර්ශනය

### චීන ආගමික සහ දාර්ශනික චින්තනයන්ගේ විකාශනය

අනෙකුත් ශිෂ්ටාචාරවල මෙන් ම චීනයේ ද මහා ආගම් බිහිවීමට පෙර සිට ම ජන විශ්වාස සහ ඇදහිලි පැවතුණි. චීන දේව ඇදහිල්ල දෙවිවරුන් සියගණනක් පිළිබඳ විශ්වාස කෙරෙන බහුදේවවාදී දේව ඇදහිල්ලකි. මේ දෙවිවරුන් අතර සුර, අසුර දෙවිවරුන් ද අර්ධ දෙවිවරුන්ගෙන් ද සුර දූතයින් ද සිටි යි. එසේ ම විශේෂිතම කාරණයක් වන්නේ මායා සතුන් පිළිබඳ බොහෝ විශ්වාස පැවතීම යි. Shénnóng（神农）නොහොත් චීන ගොවිතැන සහ ඖෂධ සම්බන්ධ මිථ්‍යා චක්‍රවර්තීන් පැරණි චීන ජනප්‍රවාද තුළ මෙන් ම පසුකාලීන සාහිත්‍ය කෘති තුළ ද බහුල ව කියැවෙන චරිතය කි. ඔහු පිළිබඳ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව (2838-2698) පමණ කාලය දක්වා දිවෙන අතර මනුෂ්‍යයින්ට ගොවිතැන් කිරීමට ඉගැන්වූයේ ඔහු බව විශ්වාසය යි. (Roberts 2010:107) ජීවමානව සිටින්නන් සහ මළවුන් අතර ප්‍රබල බැඳීමක් ඇති බව බොහෝ පැරණි චීන ජාතිකයෝ විශ්වාස කළහ. ඔවුන්ගේ විශ්වාසයට අනුව මනුෂ්‍යයින්ට ඇත්තේ තාවකාලික ශරීරයක් සහ සදාකාලික ආත්මයකි. (Roberts 2010: 2) මුතුමිත්තන් වන්දනා කිරීම සහ ඔවුන් වෙනුවෙන් වතාවත් ඉටු කිරීම ද පුරාතන චීනයේ පැවති විශ්වාස අතරින් ප්‍රධාන එකකි. ප්‍රභූන්ගේ මුතුන්මිත්තන් ඉතා ප්‍රබල ය. ඔවුන්ට යුද්ධය, දඩයම සහ ගොවිතැනේ සාර්ථකත්වය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි බව විශ්වාස කෙරුණි (Rainey 2010:4).

කොන්ෆියුසියස් ධර්මය, බුදු දහම සහ ථාඕ දහම යන විශ්වාසයන් තුන ම බොහෝ ඈත අතීතයේ සිට ම චීනය තුළ ප්‍රචලිතව පැවතුණි. සැමුවෙල් බීල් ගේ මතයට අනුව ඉතා දීර්ඝ කාලයක් තිස්සේ චීනය තුළ මෙම දර්ශනයන් සමකාලයෙහි පැවතුණු නිසා එකිනෙකට ආ-වේණික මූලධර්මයන් පවා වෙන්කොට හඳුනාගත නොහැකි පරිද්දෙන් මුහු වී ඇත. (Beal 1996: 2) කොන්ෆියුසියස් දර්ශනය චීනය තුළ ව්‍යාප්ත වීම ආරම්භ වන්නේ ක්‍රිස්තු පූර්ව පස් වන සියවසේ සිට ය. කොන්ෆියුසියස් (ක්‍රි පූ 551-479) විසින් හඳුන්වා දෙන ලද කොන්ෆියුසියස් දර්ශනය Rújiā（儒家）චීනය තුළ විකාශනය වූයේ දර්ශනයක් ලෙස ය. ෂින් චුං යාඕ විසින් සඳහන් කර ඇති පරිදි කොන්ෆියුසියස් දර්ශනය කොන්ෆියුසියස් විසින් බොහෝ කාලයක් තිස්සේ චීනයේ මුල්බැසගෙන පැවති සම්ප්‍රදායන් පෝෂණය කරනු ලැබූවක් මිස නව පර්යායක් හෝ දර්ශනයක් බිහි කිරීමක් නොවන්නේ ය. (Yao 2008:17) කොන්ෆියුසියස් දර්ශනය යනු මිනිසෙක සහ තවත් අයෙකු අතර ඇති සම්බන්ධතාවය නිරූපණය කරන්නා වූ සංකීර්ණ ආචාරධර්ම පද්ධතියකි. පුද්ගලික, කුටුම්බ සහ සමාජ සම්බන්ධතා සංස්කෘතිය කෙරෙහි බලපාන සමාජ ආචාරධර්ම පද්ධතිය නියාමනය කිරීමේ දී එහි භූමිකාව ප්‍රමුඛ ය. (Hui 2012: 10) කොන්ෆියුසියස් දර්ශනයේ ඉස්මතුකොට දැක්වෙන මූලධර්මයන් අධ්‍යයනය කිරීමේදී මෙම කියමන තහවුරු කළ හැකි සාධක හමු වේ. rén (仁) හිතකාමීත්වය, xiào(孝) පුත්‍ර දාරක සෙනෙහස, lǐ (礼) ව්‍රතය, yì（义）ධාර්මිකතාවය dé（德）සදාචාරය සහ zhì (智) හෙවත් ඥාණය කොන්ෆියුසියස් දර්ශනයේ මූලික මූලධර්මයන් වේ. කොන්ෆියුසියස් ඉගැන්වීමට අනුව ප්‍රාඥයෙකු jūnzǐ (君子) බිහි කිරීමෙහි ලා මෙම ලක්ෂණ බෙහෙවින් ඉවහල් වේ. මෙමගින් පැහැදිලි වන්නේ කොන්ෆියුසියස් දර්ශනය මනුෂ්‍ය සමාජය තුළ පුද්ගල පෞර්ෂය සහ යහපත් බව පිහිටුවීම වෙනුවෙන් සම්ප්‍රදායික සමාජයේ සංස්ථිතික පිළිගැනීම් පෝෂණය කිරීමේ දර්ශනයක් බව ය. කොන්ෆියුසියස් පාලන තන්ත්‍රය සහ යහපාලනය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ අතර එහි දී රාජ්‍යත්වය දෙව්ලොවින් ලැබුණු වරමක්, tiānmìng（天命）, සේ සලකා දේව උදහසට ළක් නොවී ජනහිතවාදී පාලනයක් ගෙන යාම පාලකයාගේ පරම වගකීමක් බව තරයේ අවධාරණය කොට ඇත. එසේ ම සමාජ සංස්තිථිය තුළ එකිනෙකාගේ වගකීම් සහ චරිතයන් වටහා ගෙන කටයුතු කිරීම උසස් කොට සැලකේ.

> “යහපාලනය පවතින්නේ පාලකයා පාලකයකු ලෙසත්, අමාත්‍යවරයා අමාත්‍යවරයෙකු ලෙසත්, පියා පියෙකු ලෙසත්, පුත්‍රයා පුත්‍රයකු ලෙසත් නිසි ලෙස කටයුතු කළ විට ම ය” (Analects:12.1).

ආරම්භක ශාස්තෘවරයා ලාඕ ත්සු Lǎozi（老子）ලෙස සැලකෙන තාඕ ධර්මය ද චීනයේ බොහෝ සෙයින් ප්‍රචලිත පැරණි දර්ශනයකි. ලාඕ ත්සු පිළිබඳ නොයෙක් මතවාදයන් පවතින අතර ථාඕ ධර්මය විශ්ව ශක්තිය සහ ආධ්‍යාත්මික සමාධිය මුල්කොට ගත් දර්ශනය කි. තාඕ （道- Dào）යන චීන රූපාක්ෂරයෙහි අදහස මාර්ගය හෝ සිදත වශයෙන් හැඳින් විය හැක. ජේම්ස් මිලර් සඳහන් කරන පරිදි චීන ආගමික ශිෂ්ටාචාරය හැඩගැස්වීමේ දී මෙම තාඕ නොහොත් මාර්ගය කුමක් ද යන ගැටලුව වැදගත් ම කාරණය යි. (Miller 2008: 45) තාඕ දහම තුළින් මතුවූ යින් යං Yīnyáng（阴阳）වැනි සංකල්ප චීන සටන් කලාව වැනි ශාස්ත්‍රයන් තුළ ද විශේෂයෙන් සාම්ප්‍රදායික චීන වෙදකමෙහි රෝග නිශ්චය මෙන් ම රෝග නිවාරණ ක්‍රමවේදයන් සැකසීමේදී ද වැදගත් විය.

ක්‍රිස්තු වර්ෂ පළමු සියවසේ පමණ හන් යුගයේ දී චීනය තුළට ආගමනය වන බුදුදහම රාජානුග්‍රහ ද සහිත ව පූර්ණ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පුනරුදයකට ලක් විය. ක්‍රි ව පස්වන සියවසේ දී පමණ බෝධිධර්ම නම් ඉන්දියානු ශ්‍රමණයන් වහන්සේ නමක් චීනය වෙත ගොස් ප්‍රධාන චීන බෞද්ධ ගුරුකුලයක් වන චන් බුදුදහම ආරම්භ කළ බවට සාක්ෂි ඇත. ඉන් පසුව ථං යුගයේ දී (ක්‍රි. ව. 618- 907) යුන් නන් පළාතේ තාලී ප්‍රදේශයේ ද මිං යුගයේ දී (ක්‍රි. ව. 1368 - 1644) ද නොයෙක් බෞද්ධ ගුරුකුල යටතේ බුදු දහම ප්‍රචලිත විය. චීන බෝධිසත්ව සංකල්පය චීන බුදුදහමේ විශේෂිත ලක්ෂණයක් වේ. කුවන් යින් බෝධිසත්වයින් ලෙස හඳුන්වනු ලබන මෙම බෝධිසත්වයින් ස්ත්‍රියක් වන අතර මුළුමහත් විශ්වය කෙරෙහි ම සානුකම්පාවෙන් බලන ඇය "කරුණාවේ දෙවඟන" , "දෙව් රැජිණ" වැනි නම්වලින් ද හඳුන්වනු ලබ යි. (Beal 1996:2) චීන බුදුදහම ප්‍රධාන වශයෙන් මහායාන බුදුදහමේ බොහෝ ලක්ෂණ ද පැරණි චීන ජන විශ්වාසවල ලක්ෂණ ද සහිත ව චීනය තුළ විකාශනය විය.

## පර්යේෂණ ගැටලුව

වූ චං අන් ගේ බටහිර තරණය කෘතිය තුළින් චීන සාම්ප්‍රදායික ආගම් සහ දර්ශනවාදයන් පිළිබිඹු කෙරෙන්නේ කෙසේ ද?

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණය මගින් ප්‍රධාන වශයෙන් අරමුණු කෙරෙන්නේ පැරණි බෞද්ධ කතා පුවතක් වටා ගෙතුණු බටහිර තරණය කෘතියේ බෞද්ධ දර්ශනය හැරුණුකොට සමකාලීන සහ පුරාණ චීනයේ පැවති වෙනත් දර්ශනවාදයන් පිළිබිඹු කෙරෙනවා ද යන්න විශ්ලේෂණය කිරීම යි. එසේ බටහිර තරණය තුළින් ආගම් සහ දර්ශනවාදයන් පිළිබිඹු කෙරෙන ආකාරය අනුව ඒවා චීනය තුළ පරිණාමය වූ ආකාරය සහ එකිනෙක අතර සහසම්බන්ධය ද අධ්‍යනයට ලක් කිරීම ද්විතියික අරමුණකි.

## පර්යේෂණයේ වැදගත්කම

චීන සාහිත්‍ය පිළිබඳ සිංහල භාෂාවෙන් ලියැවුණු පර්යේෂණ පත්‍රිකා ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පවතී. ශ්‍රී ලංකාව තුළ චීන භාෂාව ඉගෙනීම සහ ඉගැන්වීම ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින වර්තමානයේ මෙම පත්‍රිකාව චීන භාෂාව ඉගෙන ගන්නා සිසුන්ට සහ ගුරුවරුන්ට ද පර්යේෂකයින්ට ද වටිනා පරිශීලන මූලාශ්‍රයක් බවට පත් වනු ඇත. මෙම පර්යේෂණය මගින් සාකච්ඡාවට ලක් කෙරෙන කෘතිය චීනයේ ප්‍රධානතම පුරාණ සාහිත්‍ය කෘති හතරින් එකක් වන බටහිර තරණය කෘතිය පිළිබඳ ව ශ්‍රී ලංකාව තුළ මෙතෙක් මෙවැනි විශ්ලේශණයක් සිදු කොට නොමැති බැවින් එම කෘතිය පිළිබඳ අධ්‍යනයට කැමැති පර්යේෂකයින්ට මනා පිටිවහලක් වනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර පදනම් කරගෙන සිදු කරනු ලැබූ පර්යේෂණයකි. දත්ත එක් රැස් කිරීම සඳහා බටහිර තරණය කෘතිය ගැඹුරින් අධ්‍යනය කරන ලද අතර ද්විතියික මූලාශ්‍රය ලෙස ඒ පිළිබඳව ලියැවුණු පොත්පත් සහ වෙනත් පර්යේෂණ පත්‍රිකා ද පරිශීලනය කර ඇත. චීන බුදුදහම, තාඕ දහම සහ කොන්ෆියුසියස් දර්ශනය පිළිබඳ ලියැ වී ඇති පොත්පත් සහ පර්යේෂණ පත්‍රිකා ද මෙම අධ්‍යනයේ දී ද්විතියික මූලාශ්‍රය ලෙස යොදා ගෙන ඇත.

## සාකච්ඡාව

බටහිර තරණය මූලික වශයෙන් නිර්මාණය වී ඇත්තේ මහායාන බෞද්ධ දර්ශනය මුල්කොටගෙන වුවද පැරණි චීන ඇදහිලි විශ්වාස බහුලව නිරූපණයකොට ඇත. පැරණි චීන ජනප්‍රවාද තුළ පැවති ඇදහිලි, විශ්වාස බොහෝමයක් බටහිර තරණය තුළින් ගම්‍ය වේ.

> "හුදෙකලා කඟවේනුන් නෙරා ඇති ගිරිකුළු ඉදිරියේ වැතිරී සිටිති කඳු ශිඛර මතින් ගොපල්ලන්ගේ විලාපය ඇසේ ගල් ගුහා තුළට මකරුන් යති එති..." (බටහිර තරණය : 1 පරිච්ඡේදය).

චීන නක්ෂත්‍රවේදයයේ ද මායා සතුන් සහ සාමාන්‍ය සතුන්ගෙන් සමන්විත රාශි චක්‍රයක් ඇත. මකරා යනු චීන ජනප්‍රවාදයේ එන ශක්තිය, යහපත්බව පිළිබිඹු කෙරෙන සංකේතයක් වන අතර විපරිණාමය වන ආත්මයකි. ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා චීන පුරාණ ප්‍රවාදවල මකරා අශ්ව හිසක්, අං දෙකක් සහ නළල මැද මුතු ඇටයක් සහිත සර්පයෙකු ලෙස නිරූපණයකොට ඇත (Roberts 2010: 29, 30).

> "ආඕ කුවං, නැගෙනහිර මුහුදේ මහලු මකර රජු, ඉතා කලබලයෙන් ඔහුගේ මකර පුතුන්, මුණුබුරන්, සොල්දාදු ඉස්සන් සහ කකුළු ප්‍රධානීන් සමග සුන් වූ කුං හමුවීමට ගියේය...
>
> ඔබේ සොයුරන් සිටින්නේ කොහෙද?
>
> ආඕ චින්, දකුණු මුහුදේ මකර රජු ය. ආඕ ෂුන් උතුරු මුහුදේ මකර රජු ය. ආඕ රුන් බටහිර මුහුදේ මකර රජු ය" (බටහිර තරණය : 3 පරිච්ඡේදය).

තං ශ්‍රමණයන් වහන්සේගේ අශ්වයා වන Bái lóngmǎ (白龙马) බටහිර මුහුදේ මකර රජුගේ පුත්‍රයා ය. ඔහුට මිනිස්, අශ්ව සහ මකර වශයෙන් වේශයන් තුනකි. මේ ආකාරයෙන් මකරා බටහිර තරණය වෘතාන්තය තුළ බොහෝ අවස්ථාවල දී යොදා ගෙන තිබේ. ප්‍රධාන චරිතය වන සුන් වූ කුං බාහිර පෙනුමින් සාමාන්‍ය වානරයකු වුව ද ඔහු සතු ව ප්‍රබල මායා ශක්තියකි. රන්වන් පාෂාණයකින් උපත ලද ඔහුගේ සිරුර ලෝහ මෙන් ශක්තිමත් වන අතර ඔහුට වේශයන් 72 කි. ඔහුගේ දෙවන හා තෙවන සගයින් පිළිවෙලින් ඌරු හිසක් සහ මිනිස් ශරීරයක් හිමි ජූ පා චියෙ Zhū bājiè (猪八戒) සහ වාලුකා රාක්ෂයා ලෙස හඳුන්වනු ලබන ෂා වූ චිං Shā wùjìng（沙悟净）වේ. ජූ පා චියෙ අතීතයේ සුර ලොව ඉතා ප්‍රබල නිලධාරියෙකු ලෙස


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කටයුතු කොට සඳ බීමතින් සඳ දෙවඟන වෙත රාගාන්විත ලීලාවෙන් ළං වීමට උත්සාහ කිරීමේ වරදට දේව උදහසට ළක්වූ අයෙකි. ඔහුට විරූපී පෙනුමක් ලැබී තං ශ්‍රමණයන්ගේ සිසුවෙකු බවට පත් වන්නේ පෙර කළ පාපයට දඬුවමක් ලෙස ය. මෙවැනි මනුෂ්‍ය-සත්ව සංයුක්ත සත්වයින් පිළිබඳ ව චීන ජනවහර තුළ ප්‍රකට විශ්වාසයන් බොහෝමයක් බටහිර තරණය කෘතිය තුළ ඇතුළත් වී ඇත.

49 වන පරිච්ඡේදයේ ගංගාවේ කැස්බෑවා නැමැති විශාල කැස්බෑවෙකු පිළිබඳව කියැ වේ. ඔහු තං ශ්‍රමණයන් ඇතුළු පිරිස මහා ගංගාවකින් එතෙර කරවන අතර ඊට කෘතගුණ සැළකීමක් වශයෙන් තං ශ්‍රමණයන් වහන්සේ බුදුන්වහන්සෙගේ පිහිටෙන් ඔහුට මනුෂ්‍ය ආත්මයක් ලබා ගැනීමට උපකාර කරන බවට පොරොන්දුවක් ලබා දෙති. චීන ජනප්‍රවාදයට සහ සාහිත්‍යට අනුව කැස්බෑවා යනු චිරස්ථිතිය හඟවන්නා වූ සංකේතයකි. පන්කු ලෝකය නිර්මාණය කිරීම පිළිබඳ චීන ප්‍රබන්ධය තුළ ද කැස්බෑවකු ඔහුට උපකාර කළ බව කියැ වේ (Roberts 2010: 119).

ඉන්ද්‍රජාලයන්, මායාවන් උපයෝගී කර ගනිමින් සිදු කරනු ලබන අද්භූත අභිචාරයන් සම්බන්ධ සිද්ධීන් මෙම කෘතිය තුළ නොමඳ ව ඇතුළත් කොට ඇත. කතාවේ මුල් භාගයේ ඉතා නොහික්මුණු ගතිගුණ පෙන් වන, කිසිවෙකුගේ උපදෙසට කීකරු නොවෙන සුන් වූ කුං දමනය කිරීම සඳහා කුවන් යින් බෝධිසත්වයින් විසින් ඔහුගේ හිස මත පළඳනාවක් පළඳ වන අතර එයට මන්තරයක් ජප කිරීමෙන් පැළඳ සිටින්නාට දැරිය නොහැකි හිසේ වේදනාවක් ඇති වේ. බටහිර තරණය කෘතිය තුළින් පැරණි චීන සමාජයේ ඇදහිලි, විශ්වාස පිළිබඳ ව විශේෂ කාරණා ගම්‍ය වේ. යක්ෂයින් මිනිස් ස්වරූපයෙන් පැමිණ ථං ශ්‍රමනයන් නැසීමට උත්සාහ කරන අවස්ථා කිහිපයක් ම කෘතියේ මුල් භාගයේ ඉදිරිපත් කොට තිබේ. මනුෂ්‍යයින්, යක්ෂයින්, අර්ධ රාක්ෂයින්, දෙවිවරුන්, මායා සතුන්, භූතයින් යන සියලු කොටස් එකිනෙකා වෙන් කොට හඳුනා ගත නොහැකි තරමට ම සමීප ව නිරූපණය කොට තිබේ.

තාඕ ධර්මයේ මූලික ම සංකල්පයන් දෙක ලෙස තාඕ dào（道）සහ ත dé（德）හැඳින්විය හැක. තාඕ dào（道）යනු ස්වභාවධර්මය සමග සුසංයෝගයෙන් කටයුතු කිරීම වන අතර ත dé（德）යනු අනෙකුත් මනුෂ්‍යයින් සමග සුසංවාදයෙන් කටයුතු කිරීම වේ (Lee සහ තවත් අය 2009 : 70).

yīn, yang සංකල්පය තාඕ ධර්මයේ සුසංයෝග harmony මූලධර්මය විවරණය කරන සංකල්පයකි. yīn, yang සංකල්පය බටහිර තරණය කෘතියේ කිහිප තැනකම යොදා ගෙන තිබේ.

> “ගින්න සහ ජලය සංතුලිත වූ විට අයහපතකට ඉඩ නොමැත අඳුර (yīn) සහ එළිය (yang) සුසංවාදයෙන් වලාකුළු පරයයි” (බටහිර තරණය :62 පරිච්ඡේදය).

බටහිර තරණය කෘතියේ දේව සංකල්පය තාඕ ධර්මයේ විශ්-වාසයන් හා සසැඳෙන බව නිරීක්ෂණය වේ. දේව මණ්ඩලයේ ප්‍රධානියා වන Yùhuángdàdì（玉皇大帝）ගේ පටන් දේවතාවුන්, දෙව්ලොවේ ආරක්ෂකයින්, සතර මුහුදේ මකර රජවරුන්, යම ලොවේ යම රජුන් දසදෙනෙක්, කාලගුණයට අධිපති දේවතාවුන් සතරදෙනෙක්, ප්‍රධාන දිශාවන්ට අධිපති සතුන් සතර දෙනෙක් ඇතුළු සුර අසුර දේවතාවුන් ද අර්ධ දෙවිවරුන් ද නොයෙක් වැරදි නිසා දඬුවම් ලැබ දෙව්ලොවින් පිටුවහල් කරන ලදුව නොයෙක් වේශයෙන්ගෙන් මිහිමත සිටිනා සතුන් ද ඇතුළු සියලු චරිත ප්‍රමාණය සියය ඉක්මවයි. සාම්ප්‍රදායික චීන පිළිගැනීමට අනුව මෙම දේව මණ්ඩලය මූලික වශයෙන් තාඕ ධර්මයට අයත් බව පිළිගැනේ. පස් වන පරිච්ඡේදයේ කියැවෙන Tài shàng lǎo jūn（太上老君）තාඕ ධර්මයට සම්බන්ධ අයෙකි. ඇතැම් චීන ජාතිකයින්ගේ විශ්වාසයට අනුව මරණයෙන් පසු දෙව්ලොවේ ඉපදුණු තාඕ ධර්මයේ නිර්මාතෘ ලෙස සැළකෙන Lǎozi（老子）ම ය.

ථං ශ්‍රමණයන් වහන්සේගේ මස් අනුභව කළ විට අමරණීය බව ලැබේයැයි සිතන යක්ෂයෝ උන් වහන්සේ නසා එසේ අමරණීය බව ලැබීමට නොයෙක් ප්‍රයත්න දරති. අනුභව කළ විට අමරණීයත්වය ලැබෙන Jīn dān（金丹）නැමැති ඖෂධ ගුලි වර්ගයක් පිළිබඳ තාඕ ධර්මය අදහන්නෝ විශ්වාස කළහ. (Roberts 2010: 2)

කොන්ෆියුසියස් දර්ශනය චීනය තුළ බෙහෙවින් ප්‍රචලිත වූයේ ආගමක් ලෙස නොව ශිෂ්ටාචාරය තුළ මනුෂ්‍ය ජීවිතය යහපත් කර ගැනීමට අවශ්‍ය දේශපාලන සහ සමාජ දර්ශනයක් ලෙස ය. බටහිර තරණය කෘතියේ කොන්ෆියුසියස් පිළිබඳව අවස්ථා කිහිපයකදී ම සෘජුව ම සඳහන්කොට ඇත. දසවන පරිච්ඡේදයේ ඇති පහත මිනිස් වෙස් ගත් මකර රජු පිළිබඳ ව විස්තරය මනා උදාහරණයකි.

> “කඩවසම් සේම උදාර ය...ඔහු වචනයෙන් කොන්ෆියුසියස් සහ මෙන්සියස් වෙත ඇති ගෞරවය පෙන්වූවේය...” (බටහිර තරණය :10 පරිච්ඡේදය).

කොන්ෆියුසියස් දේශපාලන සහ සමාජ දර්ශනයට අනුව රාජ්‍ය පාලනය සිදු කිරීම හා ජීවන රටාව හැඩගස්වා ගැනීම ද කොන්ෆියුසියස් දර්ශනයට ගරු කිරීම ද චීනයේ අතීතයේ සිට ම උසස් ලෙස සලකන ලදී. 35 වන පරිච්ඡේදයේ ද “කොන්ෆියුසියස් මහා ප්‍රායා” ලෙස සඳහනක් ඇත. Xiào（孝）නොහොත් වැඩිහිටියන්ට සහ ධූරාවලියට ගරු කිරීම කොන්ෆියුසියස් දර්ශනයේ ප්‍රධාන ඉගැන්වීම් අතරින් එකකි. නොහොත් වැඩිහිටියන්ට සහ ධූරාවලියට ගරු කිරීම කොන්ෆියුසියස් දර්ශනයේ ප්‍රධාන ඉගැන්වීම් අතරින් එකකි. සාම්ප්‍රදායික කොන්ෆියුසියස් ආචාරධර්ම පද්ධතියට අනුව පවුලේ සියලුදෙනා අතර අනුක්‍රමික සම්බන්ධතාවක් ඇත. (Sarkissian 2010:726) නොහික්මුණු සුන් වූ කුං ශික්ෂණය කිරීමට අවසානයේ ඔහුව තං ශ්‍රමණයන් වෙත ඔහුව යොමු කෙරේ. වැඩිහිටි ගුරුවරයෙකු යටතේ ඉගෙනීම පැරණි කොන්ෆියුසියස් චින්තනයට අනුව අනිවාර්ය කරුණක් විය. කොන්ෆියුසියස් චින්තනයේ මෙම ඉගැන්වීම් බටහිර තරණය කෘතිය තුළ අවස්ථා ගණනාවක දී ම ඉස්මතු කොට තිබේ.


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## නිගමනය

ඉහත තොරතුරු විශ්ලේෂණය අනුව පැහැදිලි වන්නේ වූ චං අන් බටහිර තරණය නිර්මාණය කිරීමේ දී හුදෙක් බුදුදහම පමණක් නොව පැරණි චීන සංස්කෘතිය තුළ පැවති බොහෝ ඇදහිලි සහ විශ්වාස ද, තාඕ ධර්මය කොන්ෆියුසියස් දර්ශනය ආදී ප්‍රධාන චීන ආගමික දර්ශනයන්ගේ ඉගැන්වීම සහ පුරුෂාර්ථ ද ඒ තුළ ගැබ්කොට ඇති බව පැහැදිලි ය. මුල් කාලීන චීනයේ ආගමක් ලෙස ප්‍රධාන වශයෙන් ගොඩ නැගුණේ තාඕ ධර්මය යි. තාඕ ධර්මය මගින් ඉගැන්වෙන සංකල්පයන් පසුකාලීන ව චීනයට සංක්‍රමණය වූ බුදුදහමේ සංකල්ප සමග බොහෝ සෙයින් සසැඳේ. බුදුදහම ද චීනය තුළ දී බොහෝ සෙයින් චීනකරණයට ලක් වූ බව ඉතා පැහැදිලි ය. කුවන් යින් බෝධිසත්ව සංකල්පය මෙයට කදිම උදාහරණයකි. තාඕ ධර්මය මගින් ඉගැන්වෙනුයේ මනුෂ්‍යයා තුළ ඇති ශක්තිය දියුණු කිරීම සහ ගමන් මග ස්වභාවධර්මයේ ක්‍රමවේදයට අනුගත වීම ඉගැන් වෙන විශ්වවිද්‍යාවකි. එබැවින් ආගමික න්‍යායන් අතර සංඝට්ඨනය සිදු වූයේ ඉතා විරල වශයෙනි. එසේම පරම දෙවියෙකු, ශාස්තෘවරයෙකු භක්තියෙන් ඇදහීම හෝ සම්භවවේදය මුල් කොට ගත් මූලධර්මවාදී ආගම් චීනය තුළ ප්‍රචලිත නොවීම නිසා ද අතීතයේ සිට චීනය තුළ ආගමික ව්‍යාප්තවාදයක් නොපැව තුණි. එමනිසා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැවත ආ ඇදහිලි, විශ්වාස සහ චාරිත්‍ර විධික්‍රම ද, ක්‍රි.පු. පස්වන සියවසේ සිට චීනය තුළ බිහි වූ ආගමික සහ දාර්ශනික චින්තනයන් ද අන්‍යෝන්‍ය සහසම්බන්ධයෙන් පැවතුණු අතර මූලධර්ම සහ විශ්වාස මුසු වීම ද දක්නට ලැබේ. චීන ජනසමාජය තුළ පැවති මෙම ආගමික ලක්ෂණ සාහිත්‍ය කෘති තුළින් ද ගම්‍ය වන බව බටහිර තරණය අධ්‍යනය කිරීමෙන් පැහැදිලි වේ.

## පරිශීලිත මූලාශ්‍රය


Barker, E. (n.d.). Religion in China: Some Introductory Notes for the Intrepid Western Scholar. Social Scientific Studies of Religion in China, 109-132. doi:10.1163/ej.9789004182462.i-312.37

Beal, S. (1996). Buddhism in China. Asian Educational Services.

Hui, G., ) Grove, M. (2012). Confucianism and Chinese Families: Values and Practices in Education. International Journal of Humanities and Social Science, 2(3).

Jensen, L. M. (1997). Manufacturing Confucianism: Chinese traditions ) Universal Civilization. Durham: Duke Univ. Press.

Lee, Yueh-Ting; Yang, Honggang; and Wang, Min (2009) "Daoist Harmony as a Chinese Philosophy and Psychology," Peace and Conflict Studies: Vol. 16: No. 1, Article 5.

Lee, Yueh-Ting; Yang, Honggang; and Wang, Min (2009) "Daoist Harmony as a Chinese Philosophy and Psychology," Peace and Conflict Studies: Vol. 16: No. 1, Article 5. Available at: http://nsuworks.nova.edu/pcs/vol16/iss1/5

Miller, J. (2008). Daoism: A Beginners guide. Oxford: Oneworld.

Rainey, L. D. (2010). Confucius and Confucianism: The essentials. Malden, MA: Wiley-Blackwell.

Roberts, J. (2010). Chinese mythology, A to Z. New York: Chelsea House.

Sarkissian, H. (2010). Recent Approaches to Confucian Filial Morality. Philosophy Compass, 5(9), 725-734. doi:10.1111/j.1747-9991.2010.00319.x

Wu, C., ) Yu, A. C. (2012). The journey to the West. Chicago, IL: University of Chicago Press.

Yao, X. (2008). An introduction to Confucianism. Cambridge: Cambridge Univ. Press.

Yao, X., ) Zhao, Y. (2010). Chinese Religion: A contextual approach. London: Continuum.

Zimmerman, M., ) Wu, C. (2011). Journey to the west: A play. Evanston, Ill: Northwestern University Press.

Zürcher, E., ) Teiser, S. F. (2007). Buddhist Conquest of China the Spread and Adaptation of Buddhism in Early Medieval China. Boston: BRILL.




© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
නවවැනි කලාපය; 2018 දෙසැම්බර්, පිටු 37-48
ISSN 1800-1459 eISSN 2673-1177

© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# පහතරට තෙත් කලාපය ඇසුරෙන් සාම්ප්‍රදායික දැනුම පදනම් ව ශ්‍රී ලංකාවේ ශාකාවරණය හඳුනා ගැනීම සහ වර්ගීකරණය

## (Identification and Classification of the Vegetation Cover in the Lowland Wet Zone in Sri Lanka Based on Traditional knowledge Systems)

එම්.එස්.එම්.එල්. කරුණාරත්න[1*]

[1]භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
*mlankanath@gmail.com

**සාරසංක්ෂේපය**

විවිධ නිර්ණායක පදනම් කර ගනිමින් වෘක්ෂලතා ආවරණය හඳුනා ගැනීමට හා වර්ගීකරණය සඳහා බොහෝ උත්සාහ ගෙන තිබේ. ඒවා සියල්ල ම පාහේ උද්භිත විද්‍යාව, දේශගුණ විද්‍යාව, වැනි ශුද්ධ විද්‍යාවක් පදනම් කොටගත් ඒවා ය. නමුත් මෙරට ජනයාගේ සාම්ප්‍රදායික දැනුම මත හා ඔවුන්ගේ ජීවන ව්‍යාවහාර ඇසුරෙන් නිම වූ වර්ගීකරණයක් දැනට ඉදිරිපත් වී නැත. මෙම ලිපියේ අරමුණ වන්නේ එවැනි හඳුනා ගැනීමක් හා වර්ගීකරණයක් සඳහා වන මූලික ප්‍රවේශයක් ගැනීම යි. මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණයක් වන අතර දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සඳහා ද උපයෝගී කොට ගෙන ඇත්තේ ද ගුණාත්මක ප්‍රවේශයකි. අධ්‍යයනය ප්‍රදේශය පහත රට තෙත් කලාපය ලෙස සැලකුවත් එහි තිබෙන ශාක ප්‍රමුඛ කොටගත් සෑම භෞමික පරිසර පද්ධතියක් ම මෙහි දී සාකච්ඡාවට බඳුන් නොවේ. එහෙයින් අදාළ ප්‍රදේශයේ ශාකාවරණය පිළිබඳ පරිපූර්ණ විග්‍රහයක් ලෙස මෙය නොසැලකිය යුතුය. උපයෝගීතාව, ව්‍යාප්තිය හා සුවිශේෂීතාව යන සාධක මත භාෂා ව්‍යාවහාරයන් ඇසුරින් පහත රට තෙත් කලාපයේ වෘක්ෂලතා ආවරණය හඳුනා ගැනීමට උත්සාහ කරන අතර ඒ ඒ පරිසර පද්ධතිවල ලක්ෂණ ද ඉදිරිපත් කරයි. මේ අනුව නිගමනය කළ හැක්කේ ඉහත සාධක ත්‍රිත්වය මත ශාකාවරණය හඳුනා ගැනීම හා වර්ගීකරණය සිදුකළ හැකි බවත්, පාරම්පරික ව පැවත එන සාම්ප්‍රදායික දැනුම් පද්ධති විසින් එකිනෙකින් වෙනස් ව මෙම පරිසර පද්ධති හඳුනා ගැනීමට සහ වර්ගීකරණයට සමත් වන බවත් ය. ඒ තුළ උද්භිත විද්‍යාත්මක, දේශගුන විද්‍යාත්මක හෝ භූ විද්‍යාත්මක නිර්නායක පමණක් නොව සමාජීය විද්‍යාත්මක, සංස්කෘතික, අධ්‍යාත්මක, අගයන් ද මිශ්‍ර ව පවතී. එහෙයින් නූතන, ප්‍රජා පාදක වන කළමණාකරන හෝ පරිසර සංරක්ෂණ සහ කළමනාකරන ප්‍රවේශවල දී අවධානය යොමු කළ යුතු කේෂ්ත්‍රයක් ලෙස මෙම කේෂ්ත්‍රය හඳුන්වා දිය හැකි ය.

කේන්ද්‍රීය වචන : වෘක්ෂලතා ආවරණය, සාම්ප්‍රදායික දැනුම, භාෂාව, ජීවන ව්‍යවහාර, පහත රට තෙත් කලාපය

There are different types of vegetation classifications based on botanical and climatological indicators. All these classifications indicate pure science disciplines. However still there is no classification and identification has been found related to native traditional knowledge and life styles. The aim of this text is to take a step to make an approach to identify and classify the vegetation cover at local level. This is a qualitative study and it has utilized qualitative methods and techniques to collect, analyze and present data. Lowland wet zone has been determined as the study area. However, this study does not cover each and every vegetation types of the area. Therefore, this study should not be considered a completed one. This study has identified and classified natural vegetation cover in the area by using utilization, geo-spatial distribution and uniqueness which is associated with language of the communities. The study has discovered features and characteristics of particular vegetation covers. According to this study, it can be concluded that we can identify and classify natural vegetation cover of the lowland wet zone in Sri Lanka and it is highly connected with traditional knowledge systems and language. In that classification, there are indicators related to natural sciences and social sciences. Hence, this holistic perspective will be the most appropriate in modern forest conservation and management practices.

Key words: Vegetation Cover, Traditional Knowledge, Language, Lowland Wet Zone

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වන ආවරණය (Total forest cover with plantations) මුළු භූමි ප්‍රමාණයෙන් 32.2% කි. වගා කරන ලද වනාන්තරයන් මීට අයත් වන අතර සමස්ත ව්‍යාපෘතිය හෙක්ටයාර් මිලියන 6.616 කි. මෙයින් වැසුණු වියන සහිත ස්වාභාවික වන ආවරණය (Closed canopy natural forests) 23.9% කි. ජෛව විවිධත්වයෙන් පොහොසත් නිවර්තන වැසි වනාන්තර අයත් වන්නේ ද මේ යටතට යි. විසුරුණු සහ විවෘත කැලෑ (Sparse and open forests) ප්‍රමාණය 7% වේ. වියළි හා ශුෂ්ක කලාපීය කටු පඳුරු සහිත හුඳකලා වන බිම් මේ යටතට ගැනේ. වගා කරන ලද වනාන්තර (Forest plantation) 1.3% වන අතර තේක්ක, යුකැලිප්ටස්, පයිනස් වැනි ශාකවලින් මේ බිම් ආවරණය වී තිබේ (Legg and jwell, 1995 cited in FAO,2000). ශ්‍රී ලංකාව සමස්ත භූමි පරිහරණ රටාව විමසූ විට, සමස්ත භූමියෙන් 35% ක් කෘෂි කාර්මික (Agriculture) කටයුතු සඳහා ද වනාන්තර නොවන වෘක්ෂලතා ආවරණය (Trees Outside Forests – TOF) 24% ක් ද වෙනත් භූමි පරිහරණය සඳහා 9% ක භූමි ප්‍රමාණයක් ද වෙන්ව පවතී (FAO, 2000). මුළු භූමියෙන් 68% ක පංගුවක් නියෝජනය කරන මෙම බිම් ප්‍රමානයට වනාන්තර අයත් නොවූවත් ශාක ප්‍රමුඛ කොටගත් විවිධ පරිසර පද්ධතීන් එහි

නිරීක්ෂණය කළ හැකිය. වනාන්තර සමඟ පමණක් නොව ඒවා සමඟ ද ප්‍රජාවගේ සෘජු සහ වක්‍ර සබඳතා නිර්මාණය වී තිබේ. ඔවුන්ගේ ජීවන ව්‍යාපාර පවත්වා ගැනීමට මෙම පරිසර පද්ධති සුවිශේෂී කාර්යභාර්යයක් ඉටු කරමින් පවතී. නිදසුන් ලෙස මුළු බිම් ප්‍රමාණයෙන් 24% නියෝජනය කරන වනාන්තර නොවන වෘක්ෂලතා ආවරණයට අයත් එක් සංරචකයක් වන පහත රට ගෙවතු, උඩරට ගෙවතු, ආදියෙන් සැලසෙන වනජ නිෂ්පාදන සහ සේවා පිළිබඳ පර්යේෂන මගින් අනාවරණය කරගෙන තිබේ (Karunarathne, 2009). සෙසු මිනිසුන් ප්‍රමුඛ භූමි පරිහරණය රටාවන් තුළ වුව ද සුවිශේෂ ගති ලක්ෂණ, ප්‍රකට කරන ශාඛාවරණයක් හඳුනා ගත හැකි අතර එම හඳුනා ගැනීම සිදු කර ඇත්තේ දීර්ඝ කාලයක් එම පරිසර පද්ධති ඇසුරේ ජීවත් වූ ප්‍රජාවන් විසිනි. එනිසා ප්‍රජාවගේ පාරම්පරික ඥානය මත පදනම් වූ එම හඳුනා ගැනීම් සුවිශේෂ වැදගත්කමකින් යුක්ත ය. මන්ද යත් ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන වේගයට සාපේක්ෂව වන ආවරණයේ සීඝ්‍ර අඩුවීමක් දක්නට ලැබෙන බැවිනි (FAO, 2000). එහෙයින් වනාන්තර හරණය (Deforestation) සහ හායනය (Forest degradation) සඳහා මෙන් ම හරිත ආවරණ (Greenary) වැඩි කිරීම සඳහා ප්‍රජාව සමඟ බද්ධ වූ වඩා පුළුල් හා විවෘත ප්‍රවේශයකට එළඹිය යුතු ය. එවැන්නක් සඳහා විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් මිනිසා හා මෙම පරිසර පද්ධති අතර ඇති සබඳතාවන් විශ්ලේෂණය කළ යුතු ව ඇත. ඉහත දැක් වූ පරිදි ශ්‍රී ලංකාවේ වනාන්තර සඳහා විවිධ විද්‍යාත්මක දර්ශක භාවිතා කරමින් වර්ගීකරනයන් ඉදිරිපත් කොට තිබේ. ඊට අමතර ව පරිපාලන කටයුතු සඳහා ද උපයෝජනයන් සඳහා ද ඒවා බහුවිධ වර්ගීකරනයන්ට යටත් ව හඳුනා ගැනීම හා වර්ගීකරනය කිරීම ද දක්නට ලැබේ. එසේ වුවත් දීර්ඝ කාලයක් තිස්සේ පාරම්පරිකව පැවත ගෙන ආ සාම්ප්‍රදායික දැනුම ඇසුරින් මෙම ශාක ආවරනය හඳුනා ගැනීමට මෙතෙක් ප්‍රශස්ත උත්සාහයක් ගෙන නැත (නන්දාරාම,1997; සමරකෝන්,2009). මෙම ලිපියේ අරමුන එවැන්නක් සඳහා මුලපිරීමත් වර්ගීකරණයක් සඳහා මූලික ප්‍රවේශයක් ලබා ගැනීමත් ය. ඒ සඳහා ලංකාවේ පහතරට තෙත් කලාපීය ශාඛාවරණය පමණක් පාදක කර ගන්නේ සමස්ත දිවයින සැලකුවහොත් ඇති විය හැකි සංකීර්ණ බව වළක්වා ගැනීම සඳහා ය. පහතරට තෙත් කලාපයේ ද තෝරා ගත් ශාඛාවරණ පමණක් සංකච්ඡාවට බඳුන් කෙරේ. නිදසුන් ලෙස වෙරළ කලාපීය පරිසර පද්ධති මෙම අධ්‍යයනයෙන් බැහැර කොට තිබේ. ඒවා පර්යේෂණයේ සීමාකම් වශයෙන් සැලකිය යුතු ය. මන්ද මෙම ශාඛාවරනයන්හි විවිධත්වය සහ ඒ හා බැඳි සම්ප්‍රදායික ඥානය ඉතා පුළුල් ක්ෂේත්‍රයක පැතිරී තිබෙන බැවිනි. ඒවා වෙන් වෙන් වශයෙන් ගෙන වඩා ගැඹුරින් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයි.

## සාහිත්‍ය විමර්ශනය

මිනිසා සහ පරිසරය ඇති සබඳතාව විග්‍රහ කිරීමට පෙරදිග මෙන් ම අපරදිග චින්තන සම්ප්‍රදායන් ඔස්සේ ද විවිධ උත්සාහයන් ගෙන තිබේ. සොබා දහම-සමාජය (Nature – Society) හෝ මිනිස් - පරිසර (Man – Environment) සබඳතාව විග්‍රහ කිරීමට බටහිර චින්තනය සම්ප්‍රදාය අනුව ප්‍රධාන දෘෂ්ටීන් ත්‍රිත්වයකි.

- සොබාදහම විසින් මනුෂ්‍යය වර්ගයාගේ ක්‍රියාකාරකම් සීමා කරන බව
- මිනිසා විසින් සොබාදහම තම අවශ්‍යතා අනුව වෙනස් කරන බව
- මනුෂ්‍යය වර්ගයා සොබාදහම සමඟ එකමුතුව සිටින බව
(Dikshit 1997:244).

සොබාදහම විසින් මිනිස් ක්‍රියාකාරකම් පාලනය කරන බවත්, සොබාදහම ඉක්මවා යෑමේ හැකියාවක් මිනිසාට නොමැති බවත්, පරිසරනියතවාදී දැක්මෙහි, (The Environmental Deterministic Perspective) පිළිගැනීම විය. එනම් පරිසරයේ නියමයට අනුකූල ව මිනිස් ක්‍රියාකාරකම් තීරණය වන බවයි. භූගෝල විද්‍යා චින්තනයේ මූලික න්‍යායක් වූ මෙය දීර්ඝ කාලයක් තිස්සේ පැවති කතිකාවක් විය. නමුත් පසුකාලීන ව, මෙම දෘෂ්ටිවාදයට දැඩි විවේචන එල්ල වූ අතර, තමන් ජීවත්වන භෞතික පරසරය වෙනස් කිරීමට හැකි ය යන සංකල්පය ඉදිරිපත් විය. එය ශඛ්‍යතාවාදය (Possibilism) නම් වේ. නමුත් ශක්‍යතාවාදීන් සම්පූර්ණයෙන් නියතිවාදී අදහස් ප්‍රතික්ෂේප නොකළ නමුත් පරිසරය වෙනස් කිරීමට විකල්ප රැසක් පවතින බව මිනිසුන් තේරුම් ගන්නා බවත්, එම විකල්ප අතුරින් වඩා ප්‍රශස්ත විකල්පය තෝරා ගැනීමට මිනිසාට හැකි බවත් ප්‍රකාශ කරන ලදි. එනම් පරිසරය විසින් දෙනු ලබන විකල්ප රැසක් තිබුන ද එයින් ඇතැම් විකල්ප පිළිගැනීමට ඇති ඉඩකඩ වැඩි බව යි. කෙසේ වුවත් වර්තමාන භූගෝල විද්‍යාව පිළිගනු ලබන්නේ මිනිසා පරිසරයේ අභ්‍යන්තර අංශයක් වශයෙනි. එනම් සොබාදම නම් පරිතයෙහි මිනිසා ද එක් සංරචකයක් වශයෙනි. පරිසරයේ මූලධර්ම හා ක්‍රියාකාරීත්වය මිනිසාට බලපානු ලබන අතර ම මානව ක්‍රියාකාරම් ද පෙරළා පරිසරයට බලපෑම් කරයි. මෙය දෙපසට සිදු වන ක්‍රියාවලියකි. කෙසේ වුව ද මිනිසාගේ පාරිසරික කාර්ය ලෙසට අර්ථ දක්වනුයේ ඔහු පරිසරයේ භාරකරු (The Custodion) ලෙස ක්‍රියා කාරීම යි. එය අධිපතිවාදී, පරිසරයේ අයිතිකරු (The Owner) යන දෘෂ්ටියෙන් මිදුණු සංරක්ෂණවාදී එළඹුමකි.

නූතනයේ පාරිසරිකවාදය (Enviromentalism) සහ මිනිසා හා පරිසරය අතර ඇති සබඳතාව විශ්ලේෂණය කිරීම සඳහා වන විකල්ප පර්යාවලෝකනයෙන් (Perspectives) ද්විත්වයකි.

i. ගතානුගතික පර්යාවලොකනය (Conservative Perspective)

ii. ආමූලික පර්යාවලෝකනය (Manipulative Perspective)

මෙම පර්යාවලෝකනයෙන් ද්විත්වය රූපකයන් ත්‍රිත්වයක් මත සංකල්ප ගත කෙරේ. එනම්, දෙවියන් (God) සොබාදහම, (Nature) හා මිනිසා (Man) වශයෙනි. දෙවියන් යන්න නොදන්නා දෙය, නොදන්නා බව සහ ගුප්ත දේ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සඳහා වන රූපකය යි. ගතානුගතික පර්යාවලෝකනයේ දී සොබාදහම, සදාචාරය, උපචාරයන් පිළිබඳ කොන්දේසි සම්පාදනය කර දෙන අතර ආමූල පර්යාවලෝකනයේ දී ආත්මයන් මත ඇති කරන තරහය ආචාරධර්මයන් පිළිබඳ කොන්දේසි සහ උපචාරයන් කුසලතාව විසින් අතික්‍රමණය කරනු ලබන බව පිළි ගනී. දෙවියන් යන රූපකය මෙහි දී වැදගත් වන අතර මිනිසා මිහිතලය මත ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ මඟ පෙන්වීම සහ සොබාදහම සඳහා වන මිනිසාගේ වගකීම් සහගත බව ඉන් නිරූපණය කෙරේ.

ගතානුගතික පර්යාවලෝකනයේ දී මෙම රූපකයන් පෙළ ගැසෙන්නේ දෙවියන්, සොබාදහම, මිනිසා ආදී වශයෙනි. මෙහිදී මානව සදාචාරය මූර්තිමත් කරනුයේ සොබාදහමේ නියමය, පාරිසරික සංරක්ෂණය සහ සොබාදහමේ පාරිසරික තුලිතය පවත්වා ගැනීමෙනි. මෙය සොබාදහම සමඟ ජීවත් වීමෙන් එය ආරක්ෂා කිරීම පිළිබඳ කියවීමයි. සංරක්ෂණවාදී මෙම දැක්ම පරිසර කේන්ද්‍රය දැක්ම ලෙස (Eco-centric) හඳුන්වයි. ආමූලික ප්‍රවේශයේ දී ඉහත රූපකයන් ත්‍රිත්වයෙහි ප්‍රමුඛතාව දෙවියන්, මිනිසා, සහ සොබාදහම ආදී වශයෙන් පෙළ ගැසේ. මෙහි දී සොබාදහම මිනිසාගේ උපයෝජනය සඳහා නිර්මාණය වී ඇති බව පිළිගැනේ. මිනිසා ප්‍රමුඛව සැලකෙන අතර සොබාදම දෙවන පෙලෙහි ලා සැලකේ. එහෙයින් මිනිසා ඔහුට අවශ්‍යය ඔවුන්ගේ ම සදාචාරයන් පිළිබඳ ප්‍රමිතීන් තනා ගනී. කුසලතාව විසින් පාරිසරික සදාචාරයන් අතික්‍රමණය කරනු ලබන මෙම දැක්ම තාක්ෂණ කේන්ද්‍රය (Techno-centric) හෝ මානව කේන්ද්‍රය (Ethno-centric) නම් වේ.

පරිසරවාදය පිළිබඳ නූතන කතිකාව දිගහැරෙන්නේ "Gaianism" නමිනි. මෙය ව්‍යුත්පන්නව ඇත්තේ ග්‍රීක දේවතාවියක් වන "Gaia" සහ ඇගේ දියණිය වන "Themis" පාදක කරගත් විශ්වාසයක් සමඟිනි. "Gaia" මිහිතලයේ සියලු මූලධාතු ජනිත කරන මවයි. Themis වන ඇගේ දියණිය යුක්තියට අධිපති වන අතර ඇය සොබාදහමේ තුලිතතාව රකිනු ලබන්නේ මිහි මවගේ මූලධාතූන් ප්‍රධානය කරමින් හා ඒවා නාස්ති කරන්නන්ට දඬුවම් ලබා දීමෙනි (Lovelock,1995).

මේ ආකාරයෙන් මිනිස් - පරිසර සබඳතාව තේරුම් ගැනීමට විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් ඇසුරින් උත්සාහ දරා ඇති බව පෙනේ. මෙය සියළු එළඹුම් යම් යම් විෂය ශික්ෂනයන් තුළට බහා විශ්ලේෂණය කිරීමට ගත් ශාස්ත්‍රීය උත්සාහයන් වේ. මිනිසා තමා අවට පරිසරය සමඟ පැවැත් වූ සබඳතාවේ ස්වරූපය වඩා පැහැදිළි ව අවබෝධ කොටගත හැක්කේ ඔහු ඒ පිළිබඳ ව සිතූ ආකාරය අවබෝධ කර ගැනීමෙනි. එය ප්‍රකට කරන ප්‍රධානාකාර ත්‍රිත්වයකි.

i. චින්තන විධිය සහ සාරධර්ම පද්ධතිය

ii. භාෂාව

iii. ජීවන ව්‍යවහාරය

"සංස්කෘතිය කිසියම් සමාජයක නිශ්චිත මඟපෙන්වන්නා මෙන් ම එම සමාජ ක්‍රමය හැදී වැඩී තිබෙන ආකාරය පිළිබඳ පූර්වාදර්ශයක් සපයයි. මේ මඟින් මිනිසුන්ගේ සාමූහික නියෝජනයක් ඉදිරිපත් කරනු ලබන අතර එය එම සමාජයේ කේන්ද්‍රීය සාරධර්ම පද්ධතියයි. මෙමගින් මිනිසුන්ට සපයනු ලබන චින්තන පද්ධතිය අනුව මිනිස් හැසිරීම් ක්‍රියාවලිය සිදු වේ" (Betine 1977 ; cited in, හේරත් 2004: 82).


පෙරදිග චින්තන සම්ප්‍රදාය "විශ්ව කේන්ද්‍රීය" (Cosmo-centric) එකකි. එය පෙරදිග "මානව කේන්ද්‍රීය"(Ethno-Centric) චින්තන සම්ප්‍රදායෙන් වෙනස් වූවකි (හේරත්, 2004). සොබාදහම පිළිබඳ පෙරදිග චින්තන විධිය අනුව මිනිසා සොබාදහම නැමති වියමනේ එක් හුයක් පමණක් විය. සොබා දහමේ සෑම අංගයකට ම සමාන පිළිගැනීමක් ගෞරවයක් ඒ තුළ විය. මෙය චින්තන විධිය සහ සම්ප්‍රදාය සොබාදහමේ දායාදයක් වූ වනාන්තර, ගස්-කොළන් සමඟ ඇති කරගත් මානව සබඳතා පවත්වා ගැනීමේදීත් එහි තිරසාර භාවය රැක ගැනීමටත් හේතු විය.

භාෂාව යම් ප්‍රජාවකට අනන්‍යතාව, විකාශනය, ස්විත්වය, පළ කරන ප්‍රධාන අංගයකි. යම් ප්‍රජාවක් තම අවට පරිසරය සමඟ සබඳතා පවත් වන ආකාරය භාෂාවක් තුළින් වටහා ගත හැකිය. ඇස්කිමෝවරුන්ගේ භාෂාව පිළිබඳ අධ්‍යයනය කළ "Lauras Martin" පෙන්වා දෙන්නේ "හිම" සහ එහි ඉතා සුළු වෙනස්කම් සහිත ප්‍රභේද හඳුනාගැනීම සඳහා ඇස්කිමෝවරු භාෂාවෙහි වචන රාශියක් භාවිත කරන බවය (Martin,1986). එහි අදහස වන්නේ ඔවුන් තමන් අවට පරිසරය කෙරෙහි කොතරම් සංවේදී වූවා ද යන්න යි. එනම් එහි ඉතා සුළු වෙනස්කම් පවා පරීක්ෂණය කරමින් ඒවා තම භාෂාව තුළට අන්තර්ග්‍රහණය කරගත් බව යි.

ශ්‍රී ලංකාව වැනි නිවර්තන කලාපීය රටවල ප්‍රජාවන් වසර පුරා ලබන හිරු එළිය, වර්ෂාව සහ යෝග්‍යය පස හේතුවෙන් සදාහරිත ව දිස්වෙන තම අවට පරිසරයේ ඇති ශාකාවරණයේ දක්නට ඇති සුළු වෙනස්කම් පවා නිරීක්ෂනය කර ඒවායේ සුවිශේෂිතාව අනුව විවිධ නම්වලින් හඳුනාගෙන ඇත. එම නාමකරණ සියල්ල එකතු වන්නේ භාෂාව තුළට ය. පරිසරයේ පවතින විවිධත්වයත්, මිනිසා ඒ කෙරෙහි හෙළු වූ දෘෂ්ටිය හා සබඳතාවයන්ගේ ස්වරූපය මතත් භාෂාව සංවර්ධනය වී තිබේ. එනිසා භාෂාව අධ්‍යයනය කිරීමෙන් ඊට පසුබිම් වූ ඉහත සාධකයන් අනාවරණය කර ගත හැක. ඒ අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවකි.

ජීවන ව්‍යවහාරය යනු යම් භූගෝලීය ඒකකයක් තුළ ජීවත් වන ප්‍රජාව නියෝජනය කරන්නා වූ සංස්කෘතිය යි. මිනිසා විසින් තම ආරක්ෂාව මෙන් ම පැවැත්ම සඳහා සංස්කෘතිය උපයෝගී කර ගනියි. සංස්කෘතියට නිතැතින් ම පරිසරය අයත් වන්නේ සංස්කෘතියක් නොමැති ව මිනිසාට ඔහුගේ පරිසරය නිර්වචනය කිරීමටවත් හැකියාව නොමැති හෙයිනි (සිරිසේන, 2004, 733). මෙහි දී එය ජීවන ව්‍යවහාරයක් ලෙසට සීමා කොට දක්වන්නේ සංස්කෘතිය යන පුළුල් අර්ථය සහිතව නොව, ප්‍රජාව පරිසරය සමඟ පැවැත් වූ සබඳතාව දැක්වීම සඳහා ය. එහෙයින් ඉන් පලවන අරුත නියෝජනය කරන්නේ එම ප්‍රජාවගේ සමස්ත සංස්කෘතික වපසරිය ම නොවේ. ශ්‍රී ලංකාවේ ජන ගහනයෙන් 70%


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**රූපසටහන් අංක 1:** ජීවන ව්‍යවහාරයන් සමඟ සාම්ප්‍රදායික දැනුම බද්ධ වීම

මූලාශ්‍රයඃ කරුණාරත්න, 2015

අධික ප්‍රමාණයක් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල ය. ඉන් බහුතරයක් ම තම ජීවිකාව සඳහා ප්‍රාථමික ආර්ථික කටයුතුවල නිරත වේ. පරිසරය පිළිබඳ උනන්දුවක් දක්වන පරිසරවේදීන් නිතර ම සරල සමාජයන් දෙස අවධානය යොමු කරමින් ඔවුන්ගෙන් පරිසරයට අවම හානියක් සිදු වන බවත් ඔවුන්ගේ සංස්කෘතීන් පරිසරය ආරක්ෂා වන ආකාරයට හැඩගැසී ඇති බවත් පෙන්වා දී ඇත (සිරිසේන, 2004, 730).

යම් සමාජයක ඉහත ධාරා ත්‍රිත්වය අධ්‍යයනය කිරීමෙන් ඔවුන් තමා අවම පරිසරය සමඟ ගොඩනගාගත් සබඳතාවේ ස්වරූපය මැනවින් වටහා ගත හැකිය. ඊට අදාළ සියලුම දැනුම ගබඩා වී ඇත්තේ සාම්ප්‍රදායික දැනුම් පද්ධති තුළ ය. "මගේ අභිවෘත්තිය වන්නේ ජන විද්‍යාව (Folk science) පිළිබඳ සාම්ප්‍රදායික පද්ධතීන් තේරුම් ගැනීම යි. මෙහි ප්‍රායෝගික වටිනාකම් පිළිබඳ ව මාගේ මූලික අවධානය යොමු කෙරේ. ලෝකයේ ගොවීන්, ධීවරයින්, දඩයම්කරුවන්, එකතුකරන්නන් සහ ශිල්පීන් අතර පවත්නා සාම්ප්‍රදායික ඥාණය, (Folk wisdom) නිවැරදි අතර නූතන ලෝකය සඳහා අතිශය වැදගත් වේ (Anderson, 1996). ඔහු තවදුරටත් පෙන්වා දෙන්නේ නිවර්තන කලාපීය වනාන්තර තුළ සහ පර්යන්තයේ වෙසෙන ප්‍රජාව බහුවිධ අවශ්‍යතා සඳහා ශාඛ භාවිත කරන ආකාරයෙන් එහි ප්‍රායෝගික බව මනාව ඔප්පු වන බවයි (Anderson, 1996). මේ ප්‍රවේශය යටතේ අප විසින් පූර්වයෙහි ඉදිරිපත් කරන ලද ශාඛ ප්‍රමුඛ කොටගත් පද්ධති සමඟ මෙරට ජනයා ගොඩනංවාගෙන තිබෙන සබඳතාවේ ස්වරූපය මෙන් ම, ඊට අනුබද්ධ ව පවතින වෙනත් භෞතික හා මානව සාධකයන් ද හඳුනා ගැනීමට අවකාශ ලැබේ. ඔවුන් මෙම හඳුනා ගැනීම සිදු කිරීමට පාදක කොටගත් ප්‍රධාන නිර්නායක ත්‍රිත්වයකි. එනම්,

i. විවිධත්වය තුළ සුවිශේෂතාව (Speciality in the diversity)

ii. උපයෝජනය (Utilization)

iii. භූගෝලීය අවකාශීය ව්‍යාප්තිය (Geo-spatial distribution)

විවිධත්වය තුළ සුවිශේෂතාව යනු විශාල පරිසර පද්ධතියක් තුළ පවතින්නා වූව ද සුවිශේෂී ගති ලක්ෂණ අනුව ඉන් වෙන්කර හඳුනා ගැනීමට තිබෙන හැකියාව යි. නිදසුනක් ලෙස වනාන්තර පරිසර පද්දතියක් තුළ හිමය, අඩවිය, මණ්ඩිය, ආදී වශයෙන් සුවිශේෂතාව අනුව වෙන් වෙන් ව හඳුනා ගැනීමට තිබෙන හැකියාව යි.

උපයෝජනය යනු දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රජාව මෙම පරිසර පද්දතිය සමඟ ගනුදෙනු කළ ආකාරය යි. ඒ තුළින් වර්ධනය කරගත් අත්දැකීම් හා දැනුම් සම්භාරයකි. නිදසුනක් ලෙස හිමය, අඩවිය වැනි වනාන්තර ප්‍රදේශ දැව, දර, දඩයම වැනි දෛනික අවශ්‍යතා සඳහා ඉලක්කගත වූයේ නැත. එම ප්‍රදේශ ඉතා දුර්ලබ ඖෂධ සපයා ගැනීමට වැනි සීමිත අවශ්‍යතාවලට පමණක් සීමා විය. මෙම විභේදනය සිදුවන්නේ උපයෝජනය පදනම් කොට ගෙන යි.

භූ අවකාශීය ව්‍යාප්තිය යන්නෙන් අදහස් කරන්නේ ඒ ඒ ශාක ආවරණයන් කොතරම් විශාල භූ අවකාශීය ප්‍රදේශයක ව්‍යාප්ත ව තිබේ ද යන්න යි. හිමයකට, අඩවියකට සාපේක්ෂ ව මණ්ඩිය කුඩා භූ අවකාශීය ප්‍රදේශයක ව්‍යාප්ත වේ. ඒ සඳහා වන මායිම්, භෞතික සීමාවන් වනවා සේ ම ඇතැම් අවස්ථාවල භෞතික නොවන, සංස්කෘතික හෝ සාම්ප්‍රදායික පිළිගැනීම් මත පදනම් වූ ඒවා වේ.

මේ අනුව පැහැදිළි වන්නේ චින්තන විධිය හා සාරධර්ම පද්ධතිය, භාෂාව සහ ජීවන ව්‍යාවහාරය යම් ප්‍රජාවක් පරිසරය සමඟ පවත්වාගනු ලබන සබඳතාවේ ස්වභාවය සහ ස්වරූපය තීරණය කිරීමට හේතු වන බවත් එම සබඳතාවේ ප්‍රතිඵලයක් ලෙසට සාම්ප්‍රදායික දැනුම ජනනය වීම සහ සංවර්ධනය සිදු වන බවත් ය. මෙසේ නිෂ්පාදනය වන දැනුම පෙරළා එම සමාජයේ චින්තනය විධිය හා සාරධර්ම පද්ධතිය, භාෂාව, සහ ජීවන විව්‍යහාරය මූර්තිමත් කරයි. මෙය දෙපසට සිදු වන ක්‍රියාවලියකි. සාම්ප්‍රදායික දැනුම් පද්ධති අනුව ශාකාවරණය හඳුනා ගැනීමේ දී හා



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වර්ගීකරණයේ දී ඉහත සියලු කලාපයන් නිරායාසයෙන් ම ස්පර්ෂ වන්නේ මෙම අවියෝජනීය සබඳතාව හේතුවෙනි. එහෙයින් ඔවුන් සෘජු ව හා වක්‍ර ව තම ජීවන ව්‍යවහාර පවත්වා ගැනීම සඳහා මෙම පරිසර පද්ධති මත යැපේ. එම ජීවන ව්‍යවහාර තව දුරටත් මෙම දැනුම් පද්ධතිය සංවර්ධනයට සහ සංරක්ෂණයට හේතු වේ.

## පර්යේෂණ ගැටලුව

මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව වන්නේ පහතරට තෙත් කලාපයේ විසිරි පවතින ශාක ප්‍රමුඛ කොට ගත් බහුවිධ පරිසර පද්ධති, ප්‍රජාවගේ සාම්ප්‍රදායික දැනුම අනුව හඳුනා ගැනීමට හැකි ද යන්න පරීක්ෂා කිරීම යි.

## පර්යේෂණ අරමුණු

- ප්‍රජාවගේ සාම්ප්‍රදායික දැනුම් පද්ධති පදනම් කරගෙන පහතරට තෙත් කලාපීය වෘක්ෂලතා ආවරණයන් හඳුනා ගැනීම හා වර්ගීකරණය.
- සාම්ප්‍රදායික දැනුම් පද්ධති පෝෂණයට යම් ප්‍රජාවකගේ ජීවන ව්‍යාවහාර ඉවහල් වන ආකාරය අධ්‍යයනය කිරීම.
- ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා සාම්ප්‍රදායික දැනුම පදනම් කර ගත් මෙම ක්ෂුද්‍ර පරිසර පද්ධතිවල වැදගත්කම හඳුනා ගැනීම.
- නූතන “ප්‍රජා වන විද්‍යාව” (Community Forestry) සහ “ප්‍රජා සංරක්ෂණය” (Community Conservation) වැනි විෂය ශික්ෂණයන් සංවර්ධනයට දේශීය අනන්‍යතාවක් සහිත ප්‍රවේශයක් නිර්මාණය කිරීම.
- මෙම පරිසර පද්ධතිවල වැදගත්කම සමාජය වෙත යොමු කිරීමේ ක්‍රම හඳුනා ගැනීම සහ එමගින් ප්‍රජාවට සිදු වන සේවාව සන්නිවේදනය.

## පර්යේෂණයේ වැදගත්කම

මානවයා හා ශාක අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවකි. මීට වසර 2000 - 6000 කට පූර්වයෙහි නව ශිලා යුගයේ ශාක ගෘහස්තකරණය කර ගනු ලැබූ මිනිසාට තම සහජය වූ ද්‍රව්‍ය රැස් කිරීමෙන් (Collecting and gathering) පූර්ණ ලෙසට ඉවත් වීමට තවදුරටත් නොහැකි වී තිබේ. ශ්‍රී ලංකාවේ ද ප්‍රාග් ඓතිහාසික යුගයන්ට අදාළ මෙම සාක්ෂි පුරා විද්‍යාව මගින් සනාථ කොට ඇත (Somadeva, 2006; එපිටවත්ත සහ ප්‍රේමතිලක, 2005). මෙසේ දීර්ඝ කාලීන ඇරඹුමක් සහිත මෙම සබඳතාව ඒ ඒ පාරිසරික තත්ත්වයන් මත විවිධ වෙනස්කම් පාරම්පරික ව නිරූපනය කරමින් නූතනය දක්වා ම විකාශනය වෙමින් තිබේ.

අපගේ අවධානයට ලක්වන ක්ෂේත්‍රය වන්නේ මිනිසාගේ තම අවට පරිසරය, විශේෂයෙන් මෙහි දී ශාක ආවරණය පිළිබඳ වූ දැනුම සංවිධානය වී පවත්නා ආකාරය හඳුනා ගැනීම යි. එය මූලික වශයෙන් ම උපයෝජනය මත සිදුවන්නට ඇතැයි අනුමාන කළ හකි අතර දීර්ඝ කාලයක් තිස්සේ අත්දැකීම් ලබමින් විකාශනය වීමේ ප්‍රතිඵලයක් ලෙස සංවර්ධනය වීම සහ ඒ ඇසුරින් පුළුල් ක්ෂේත්‍රයක විසිරී ගිය දැනුම් සම්ප්‍රදායන් නිෂ්පාදනය වීමත් සිදු වන්නට ඇත.

මෙබඳු දැනුම් පද්ධතියක් ඇසුරින් ශාඛ ආවරණය හඳුනා ගැනීම හා වර්ගීකරණය ආකාර කිහිපයකින් වැදගත් වේ. එනම්,

1. මෙම හඳුනා ගැනීම් සහ වර්ගීකරණය ප්‍රජාව විසින් ම සිදුකර තිබෙන නිසා ඒවා ඔවුන්ට වඩා සමීප වීම.
2. දීර්ඝ කාලයක් තිස්සේ මේවා භාවිත කර තිබෙන බැවින් ඒවායේ තිරසාරභාවය සහ ප්‍රත්‍යක්ෂ මූලික බව.
3. සංකීර්ණ වූ නූතන පරිභෝජනවාදී සමාජයක් තුළ වුව ද පුද්ගල සහ ජාතීන්ට ආමන්ත්‍රණය කිරීමේ හැකියාවක් මෙබඳු ප්‍රවේශයක දැකිය හැකි වීම.
4. නූතන ගෝලීය පාරිසරික ගැටලු හා අභියෝගයන්ට ප්‍රාදේශීය වශයෙන් මුහුණ දීමේ දී මෙබඳු දැනුම් පද්ධතියක් සතුව පුළුල් විභවතාවක් පැවතීම.
5. සාම්ප්‍රදායික දැනුම සංරක්ෂණයට කළමනාකරණයට සහ නව දැනුම් සම්ප්‍රදායන් නිර්මාණයට තිබෙන හැකියාව.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක අධ්‍යනයක් (Qualitative) වන (Hennink et al., 2011) මේ සඳහා ප්‍රාථමික මෙන් ම ද්විතීක දත්තයන් ද උපයෝගී කොට ගන්නා ලදි. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී විවෘත සම්මුඛ සාකච්ඡා, ඉලක්ක ගත සම්මුඛ සාකච්ඡා, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයන (Life history interviews) සෘජු නිරීක්ෂන, යන ක්‍රම වේදයන් ද ද්විතීක මූලාශ්‍ර වශයෙන් මේ සම්බන්ධ ව ලියවී ඇති ග්‍රන්ථ, පර්යේෂණ පත්‍රිකා ආදිය ද උපයෝගී කොට ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය කිරීම හා ඉදිරිපත් කිරීම ද විස්තරාත්මක (Discriptive) ගුණාත්මක ප්‍රවේශය ඔස්සේ සිදු කරන ලදි.

### සාම්ප්‍රදායික දැනුම පදනම් වූ ශාකාවරණ වර්ගීකරණය

මේ යටතේ ස්වාභාවික හෝ සීමිත වශයෙන් මානව බලපෑමට යටත් වූ ශාක ආවරණ කිහිපයක් හඳුනා ගැනීමට උත්සාහ ගනී. ඇතැම් ඒවා විශාල භූගෝලීය ප්‍රදේශයක පැතිර තිබෙන අතර ඇතැම් ඒවා සාපේක්ෂ ව කුඩා හෝ ඉතා කුඩා වපසරියක ව්‍යාප්ත වී තිබේ.

#### හිමය/ හිමේ

“හිමය” යන යෙදුම ද බෞද්ධ සාහිත්‍යය ඇසුරෙන් ජනශ්‍රැති ගත වන්නට ඇතැයි අනුමාන කළ හැක. අඩවිය සේ ම “හිමය” ද අධි මානුෂීය බලයන්ගෙන් සමන්විත ගුප්ත ප්‍රදේශයක් ලෙස පිළිගැනීමට ලක් ව තිබේ. ශ්‍රී පාද නැතහොත් සමනල අඩවියේ ඉහළ ප්‍රදේශයේ වන ආවරණය හඳුන්වන්නේ “හිමය” නමිනි. මෙය පහළ ප්‍රදේශයට වඩා සීත දේශගුණයෙන් යුක්ත ය යන්න “හිම” “හිමය” යන වදන්වලින් අරුත් ගැන් වේ. “හිමය” සන වෘක්ෂලතා


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ආවරණයකින් ගැවසී ගත් විශාල කඳන් සහිත රුක්ෂ ඇති ප්‍රදේශයකි. ස්ථර හතරකින් හෝ පහකින් මෙහි වෘක්ෂලතා සමන්විත වේ. පර්නාංග සහ වැල් වර්ග, පෙඳපාසි නෙරූ (Emergent Layer) සහ වියන් (Canopy Layer) ස්ථර දක්වා ම ව්‍යාප්ත වී ඇති බැවින් තෙතමනය සහිත අඳුරු ස්වභාවයක් දරයි. “හිමය” සෑම විට ම මිනිසාගේ අත පෙවීම්වලින් දුරස්ථ ව පිහිටි බිමකි. නූතන වන සංරක්ෂණ සංකල්පවලට අනුව “හිමය” යනු වනාන්තරයක “හර” (Core) කලාපය ලෙස හඳුනා ගත හැකි ය. ශ්‍රී පාද වන්දනාවේ යන බැතිමතුන් විසින් වනාන්තරයේ ලක්ෂණ, ස්වභාවය, දේශගුණික තත්වය ආදී සාධක දීර්ඝ කාලයක් තිස්සේ නිරීක්ෂණය කිරීමෙන් මෙම නම් කිරීම සිදු කරන්නට ඇත. හිමය, අඩවියටත් වඩා බෞද්ධාගමික සංසිද්ධි හා දේව විශ්වාස සමඟ බද්ධ වනු හඳුනා ගත හැකිය. හොඳ කළ අයට යහපත් ප්‍රතිඵල සේ ම නරක කල අයට අයහපත් ප්‍රතිවිපාක ද ලැබේ යන “කර්මය” පිළිබඳ බෞද්ධ විශ්වාසය හිමය තුළ දී අනිවාර්යයෙන් ම අත්විඳීමට සිදුවන බව ජන සම්මතයේ පවතින්නකි. හිමය තුළ ස්වභාව ධර්මය ආස්වාදනයට මිනිසාට අවකාශ පැවතියත්, ඒවාට හානි කිරීමට, දූෂණයට හෝ නාස්තියට ඉඩක් නැත. හිමය මිනිසාගේ පාලනයෙන් තොර භූමියකි. එය දෙවියන්ගේ බිම යි. එහි වසන සතා, සිව්පාවාට, ගස් වැල්වලට හානි කිරීමට හෝ ජල උල්පත්, ජල පහරවල් අපිරිසිදු කිරීමට මිනිසාට නොහැකි ය. මිනිස් ඇසින් සැඟවුණු බොහෝ දෑ හිමය තුළ පවතින්නේ යැයි ප්‍රවාදගත ය. මේවා ප්‍රකට කරන ජනශ්‍රැති රාශියක් ශ්‍රී පාදය වන්දනා කරන බැතිමතුන් අතර පවතී. වන්දනාව අතරතුර හිමේ දී යම් අතුරු අන්තරාවක් හෝ අසරණ තත්වයට මුහුණ පෑ පුද්ගලයන් වෙත සුදු වතින් සැරසී ගත් පිරිමි පුද්ගලයෙකු අදිසියේ පැමිණ සියලු උපකාර කොට ඔහු හෝ ඇය අසරණ තත්වයෙන් මුදවා නොපෙනී යයි. මෙම ජනැශ්‍රැතිය වන්දනාකරුවන් අතර ඉතා ප්‍රකට වන අතර එසේ පැමිණෙන්නේ සුමනසමන් දෙවියන් බව බැතිමත්තු තදින් ම විශ්වාස කරති. එසේ ම උන් වහන්සේ හිමයේ අතරමං වූවන්ට පළතුරු උයන් වෙත යන්නට මඟ පෙන්වා ඔවුන්ගේ කුසගින්න හා විඩාව නිවාලයි. අනතුරුවලින් ආරක්ෂා කරයි. එම පළතුරු උයන්වලින් කොපමණ පළතුරු ආහාරයට ගත්ත ද ඒවා හිමෙන් පිටතට රැගෙන පැමිණිය නොහැකි ය. එය අකැප දෙයකි. වරක් එබඳු උයනකට පිවිසි අයෙකුට නැවත එම ඉසව්ව සොයා ගැනීමට ද නොහැකි වී ය යන්න තවත් ප්‍රවාදයකි. කට වරද්දා ගැනීම, අතර මඟදී කිළිදොස් ඇති වීම හෝ වෙනත් අකැප යමක් කිරීම හේතුවෙන් අලින් අතු බිඳින හඬ හෝ අලි වසුරු දකින්නට සැලැස්වීම හෝ කොටියාගේ ගෙරවිලි හඬ වැනි අනතුරු ඇඟවීම්වලට මුහුණ දීමට සිදු වේ. ඇතැම් විය “කෝඩයට” (මීදුමට) හසු වී මග සොයා ගැනීමට අපහසු වේ. තවත් විටෙක දැඩි පීඩාකාරී සුළංවලට මුහුණ දීමට සිදු වේ. අදටත් ශ්‍රී පාද අඩවියේ හිමය ලෙස හඳුනා ගන්නා ප්‍රදේශයේ පහළ මායිම වශයෙන් සැළකෙන “දිවියාගල” මුදුනෙන් කොටියාගේ ගෙරවිල්ල ඇසුනහොත් එය පහළ ගම්මානවල ගැමියන්ට ලඟදී ම මුහුණපාන්නට වන අනිවාර්ය විපතක පෙර නිමිත්තක් බව පිළි ගනී. කොටියා (Panthera pardus kotiya) අලියා (Elephas maximus maximus) වැනි සතුන් වාසය කරන්නේ හිමයේ ය. මිනිසාට උන්ගෙන් හිරිහැරයක් නැත. 2003 වසරේ රත්නපුර ප්‍රදේශයේ ඇති වූ දරුණු ගංවතුරට හේතුව එම වසරේ දී ශ්‍රී පාද හිමයේ වාසය කළ ඇතෙකු දඩයම්කරුවන් විසින් මරා දැමීම බව ප්‍රදේශයේ ජනතාව පිළි ගනී. සුමන සමන් දෙවියන්ගේ ගමන් සගයා ලෙස සැළකෙන්නේ “සුදු ඇතෙකි”. අවාරයේ මෙම ඇතා සිරිපා වන්දනා කරන බව ජනශ්‍රැතියේ සඳහන් ය. දුර්ලභ වන සතුන් පමණක් නොව ජටා මාංශ (Nardostachys jatamansi), ඉරරාජ (Zeuxine regia), සඳරාජ (Hypericum japonicum), වනරාජ (Anoectochlus setaceus), දුහුඳු (Celastrus paniculatus) වැනි දුර්ලභ සහ වටිනා ඖෂධ වර්ග පවතින්නේ ද හිමේ ය.

### අඩවියම්

විශාල භූගෝලීය ඒකකයන් පුරා පැතිර ඇති වනාන්තර ප්‍රදේශයක් හැඳින්වීම සඳහා “අඩවිය” යන්න ගෞරවාර්ථයේ යෙදී ඇති බව පෙනේ. එය ඒ ඒ ප්‍රදේශවලට අධිගෘහිත දෙවි- දේවතාවන්ගේ බල සීමාවන් දැක්වෙන යෙදුමක් වශයෙන් ද හඳුනාගත හැක. වනාන්තර ප්‍රදේශ සම්බන්ධව නම් “අඩවිය” යන්න ඉතා පුළුල් ප්‍රදේශයක් දැක්වීම සඳහා භාවිත කොට තිබේ. ශ්‍රී පාද අඩවිය, නැතහොත් සමනල අඩවිය, සිංහරාජ අඩවිය, දුම්බර අඩවිය වැනි වනාන්තර ප්‍රදේශ නිදසුන් වශයෙන් දැක්විය හැකිය. සමනල අඩවිය බෞද්ධ විශ්වාසයන්ට මූලාශ්‍ර වන සුමන සමන් දෙවියන්ගේ අඩවිය ලෙස පිළිගැනෙන අතර සිංහරාජ අඩවිය කොහොඹ දෙවියන් නොහොත් කොහොඹ යකාට අයත් යැයි පිළිගැනේ. දුම්බර පිදුම ලබන්නේ කන්දේ දෙවියන් ය. මොවුන් මනුෂ්‍යයන් වශයෙන් සිටිය දී කළ කී දෑ නිසා දේවත්වය ආරෝපණය කරන ලද දේශීය සම්භවයක් සහිත දෙවිවරුන් ලෙස සැළකේ. බොහෝ බෞද්ධ සාහිත්‍යය මූලාශ්‍රවල සඳහන් වන හිමාල අඩවිය යන යෙදුම ඇසුරින් “අඩවිය” යන යෙදුම දේශීය වනාන්තර ප්‍රදේශ හැඳින්වීමට ව්‍යවහාරයට එන්නට ඇතැයි අනුමාන කළ හැක. “අඩවිය” විශාල වනාන්තර ප්‍රදේශයක් වනවා සේ ම වන සතුන්ගෙන් ගහන, ගුප්ත අධි මානුෂීය බලවේගයන් සක්‍රීය ප්‍රදේශයක් ද වෙයි. මෙහි වෘක්ෂලතා ආවරණය “හිමය” නමින් හඳුන්වන ප්‍රදේශය සේ ම ස්ථර හතරකින් හෝ පහකින් සැඳුම්ලත් ය. “හිමය” ඉහල උන්නතාංශ වල ඉතා සංකීර්න වූ භූ ලක්ෂණ සහිත බිමක පිහිටි වන ආවරණයක් හඳුනා ගැනීමට යෙදෙන විට අඩවියක එබඳු සංකීර්නතාවක් හඳුනා ගත නොහැකි ය. අඩවිය “හිමය” ආසන්නයේ හෝ ඒ වටා පිහිට යි. එහි ඕනෑ ම මිනිස් ක්‍රියාකාරකමක් සිදු කළ යුත්තේ ප්‍රවේසම් සහගත ලෙස යි. අශුද්ධ කටයුතු ලෙස ගැනෙන කිළි දෝෂ (උපත්, කොටහළු, මස්, මඟුල්, සහ මරණ කිල්ල ආදී) ආදියෙන් මෙන් ම කටවරද්දා ගැනීම්වලින් ද දෙවියන්, යකුන්, ප්‍රේතයන්, භූතයන් කෝපගන්වන ක්‍රියාකාරකම්වලින් වැලකී සිටීමට වන අඩවිවල දී මනුශ්‍ය ප්‍රාණීන් වග බලා ගත යුතුය. එසේ නොවුනහොත්, අනිවාර්යයෙන් ඔවුන් කළ වැරැද්දේ ප්‍රමාණයට කෝප ගැන් වූ අධි මානුෂීය බලවේග විසින් දඬුවම් කරනු ඇත. එම දඬුවම් මං මුලා කිරීම, දඩයම් වැරැද්දීම, මාර්ග අවහිර කිරීම, බිය ගැන්වීම ආදී වන


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අනතුරු ඇඟවීමේ සීමාවේ සිට සිහි විකල් කිරීම, දරුණු සතුන් මුණ ගස්වා අනතුරු සිදු කිරීම සහ භයානක මරණ අත්කර දීමේ සීමාවන් දක්වා පැතිර පවතී. එනිසා අඩවිය තුළ සිදු කරන මානව කටයුතු සීමා සහිත ය. ඒ සඳහා විශේෂ සූදානමක්, පැවැත්මක් ඇති ව කටයුතු කළ යුතු ය.

**කැලය/ කැලෑව/ කැලේ**

"කැලය" යන යෙදුම විවිධ තත්ත්වයේ හා විවිධ ප්‍රදේශවල විවිධ වර්ගයේ වනාන්තර හැඳින්වීම සඳහා භාවිත කර තිබේ. ඒවා වර්ග කිහිපයක් යටතේ ගොනු කළ හැකි ය.

I. මහ කැලේ/ ඝණ කැලේ
මේවා විශාල භූගෝලීය ප්‍රදේශයන් පුරා පැතිර තිබෙන වනාන්තර වශයෙන් හඳුනා ගත හැකි ය.

II. කලු කැලේ/ ඇඳිරි කැලේ
මෙම නම්වලින් හඳුනාගෙන ඇත්තේ කැලෑව තුළ ඝන වෘක්ෂලතා ආවරණයක් (වැසුණු වියන සහිත) ගැවසීගත් බැවින් සූර්යාලෝකය වනාන්තරය අභ්‍යන්තරයට පැමිණීමට බාධා වූ වනාන්තර ප්‍රදේශ වේ. මෙම ප්‍රදේශ සාපේක්ෂ ව ප්‍රමාණයෙන් කුඩා ය. හිරු එළිය පොළොවට ඍජු ව පතිත නොවන නිසා අඳුරු සහිත ප්‍රදේශ වේ. තෙත් සහිත බිමක් පවතී. තුරු මුදුන් පර්නාංගවලින් ගැවසී ගත් ප්‍රදේශ වේ. ශ්‍රී පාද අඩවියේ රත්නපුර දිස්ත්‍රික් මායිමේ "කලු කැලේ" නමින් මෙබඳු ලක්ෂණ සහිත වනාන්තර කලාපයක් නිරීක්ෂණය කළ හැකි අතර "ඇඳිරිකැලය" නමින් ගමක් සහ ඒ ආශ්‍රිත ව මෙයට සමාන ලක්ෂණ දරණ වනාන්තර ප්‍රදේශයක් සිංහරාජ වනාන්තරයේ වයඹ දිග ප්‍රදේශයේ ද නිරීක්ෂණය කළ හැකි ය.

III. රූස්ස කැලේ
විශාල සහ සාපේක්ෂ ව උසින් වැඩි කඳන් සහිත වනාන්තර ප්‍රදේශයන් හැඳින්වීම සඳහා මෙම නාමය භාවිත කර තිබේ. විශේෂයෙන් ම හොර (Dipterocarpus zeylanicus) වැනි රූක්ෂ සහ එම කුලයේ වෙනත් රූක්ෂවලින් ගැවසීගත් ප්‍රදේශ මේ නමින් හඳුන්වා ඇත. ශ්‍රී පාද අඩවිය, සිංහරාජ, කන්නෙළිය, දෙදියගල, රම්මලේ කන්ද වැනි වනාන්තර පර්යන්ත ප්‍රජාව අතර මෙම යෙදීම සුලභ ය.

IV. හෙලේ කැලේ
කඳු බෑවුම්වල පිහිටි වන ආවරණය හැඳින්වීම සඳහා මෙම යෙදුම භාවිත කර ඇත. මෙම ප්‍රදේශ භූගෝලීය වශයෙන් දළ බෑවුම් සහිත ප්‍රදේශ වේ. එම භූ රූප පස සහ සුළංවලට හැඩ ගැසුණු ශාක සන්තතියක් (Plant succession) එම ප්‍රදේශවල දී නිරීක්ෂණය කළ හැකි ය. මේවායේ මානව හැසිරීම දුලභ ය.

V. විහාර කැලේ/ ආරණ්‍යය කැලේ
ඇතැම් වනාන්තර ප්‍රදේශවල ආරණ්‍යය, විහාර හෝ එවැනි වෙනත් පිහිටීම් නිරීක්ෂණය කළ හැක. බොහෝ විට මෙම ප්‍රදේශ ද සාපේක්ෂ ව ඉහළ බිම් ප්‍රදේශවල පිහිටා තිබේ. මේවායේ වැඩ වසනා භික්ෂූන්ගේ / තවුසන්ගේ පැවැත්මට බාධා කරන කටයුතු හෝ එම පිළිගැනීම්වලට පටහැනි දඩයම, ගස් කැපීම, ස්ත්‍රීන්ගේ ගැවසීම, ශබ්ද කිරීම ආදිය මෙබඳු ප්‍රදේශවල සිදු කිරීම අකැප බව ජන සම්මතය යි. මෙම වනාන්තර ආගමික නැඹුරුවක් සහිත ව ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ප්‍රමුඛතාව දෙමින් පවත්වා ගෙන ගොස් තිබේ.

VI. තහංචි කැලේ
මෙම යෙදුම වනාන්තරයේ ගති ලක්ෂණ නිසාවෙන් නිර්මාණය වූවක් නොව වනාන්තරය උපයෝජනය සහ පරිපාලනය නිසාවෙන් උපන්නක් බව පෙනේ. "තහංචි කැලේ" නම් තහනම් කරන ලද කැලෑව යන අරුතයි. පූර්ව යටත් විජිත සමයේ, වැඩ වසම් සමාජය තුළ භූමියේ භාරකරු වූ රජු ඇතැම් වනාන්තර ප්‍රදේශ ඍජු ව තම පාලනයට යටතේ පවත්වා ගෙන ගොස් තිබේ. එය යුධ හෝ ආරක්ෂක අරමුණු, දඩයම හෝ විනෝදාත්මක කටයුතු ආදී විවිධ දේ සඳහා විය. මහනුවර නගරයෙහි දළදා මාලිගය පසුබිමේ දක්නට ඇති "උඩවත්ත කැලය" රාජකීයයන්ගේ විනෝදය හා විවේකය සඳහා පවත්වා ගෙන ගිය වනාන්තරයකි. රොබට් නොක්ස්ට (1681) අනුව කඩුගන්නාව ආශ්‍රිතව සහ කන්ද උඩරට රාජධානියේ මායිම්වල වනාන්තර ආවරණය පවත්වා ගෙන යාමට රජු විශේෂයෙන් කටයුතු කර තිබේ. ඒ "වන දුර්ගවලින්" සැලසෙන ආරක්ෂාව සැළකීමෙනි. මේවා සාමාන්‍ය ජනයාට ඇතුළුවීම හෝ උපයෝජනය තහනම් කරන ලද "තහංචි කැලෑ" විය. ඒවා පාලනය හා ආරක්ෂා කිරීමට රාජ්‍ය නිලධාරීන් පත් කර තිබූ බවට සාධක හමු වේ. ඉංග්‍රීසි යටත් විජිත සමයේ ද (1796-1948) යටත් විජිත පාලකයන් විසින් දේශීය ප්‍රජාවට පිවිසීමට නොහැකි සහ උපයෝජනය කළ නොහැකි පරිද්දෙන් "රැජිනගේ වනාන්තර" වශයෙන් රජයේ කැලෑ පවත්වාගෙන ගොස් ඇති අතර ජනනතාව ඒවා හඳුන්වා ඇත්තේ "තහනම් හෝ තහංචි කැලෑ නමිනි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (කැලෑ කන්තෝරුව/ කැලෑ දෙපාර්තමේන්තුව) යටත් විජිත සමයේ ස්ථාපිත කරන්නේ ද එම යටත් විජිත අරමුණු සාධනය සඳහා වන අතර නිදහසින් පසුවත් වනාන්තර පර්යන්ත ප්‍රජාව ආරක්ෂිත වනාන්තර හැඳින්වූයේ "තහංචි කැලේ" යන නමිනි.

VII. වෙනත් කැලෑ/ පිට කැලේ/ මුර කැලේ / බෙහෙත් කැලේ/ අලි කැලේ
පිට කැලේ, නැතහොත් එපිටහ, (එ) පිට කැලේ නමින් හඳුන්වා ඇත්තේ ආසන්නයේ පවතින වනාන්තරයකට ඈතින් පිහිටි වනාන්තර ප්‍රදේශයකි. යම් භෞතික සීමාවන් හෝ වෙනත් සුවිශේෂ ලක්ෂණ හේතුවෙන් ඒවා වෙන ම සුවිශේෂ භූ ගෝලීය ඒකකයක් වශයෙන් හඳුන්වා ඇත. "පිටකැලේ" ගම සහ වනාන්තරය සිංහරාජ වනාන්තරයේ කලවාන, කුඩව පර්යන්තයේ දක්නට ඇත. "මුර කැලේ" ගම සහ වනාන්තරය සිංහරාජ වනාන්තරයේ කලවාන, කුඩව පර්යන්තයේ දක්නට ඇත. "මුර කැලේ" යන්න ද එම ප්‍රදේශයේ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ම සිංහරාජ පර්යන්තයේ දක්නට ඇති වනාන්තර ප්‍රදේශයකි. එය "මුර කැලේ" නම් ගැනීමට හේතු වී ඇත්තේ සිංහරාජයේ දැව ඉවත් කළ (Selective logging) සමයේ මෙම ප්‍රදේශයේ පරිපාලන අවශ්‍යතා වෙනුවෙන් මුර කුටියක් ඉදිකර තිබීමයි. එය අද වන විට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන වනාන්තරයක් වන අතර සංචාරක බංගලාවක් ද එහි ඉදිකර තිබේ. බෙහෙත් කැලේ නැතහොත් ඖෂධ කැලේ නමින් හඳුන්වා ඇත්තේ සිංහල හා ආයුර්වේද වෙදකම සඳහා අවශ්‍ය පැලෑටි, ශාකවලින් ගැවසී ගත් වනාන්තර ප්‍රදේශ වේ. බිං කොහොඹ (Munronia pinnata) ඉරුරාජ, සඳරාජ, ජටාමාංශ, දුහුදු, නව හංදි (Euphorbia tirculli), හැඩයා (Lycopodium squarrosum), වෙනිවැල් (Coscinium fenestratum) ආදී දුලබ සහ සුලභ සියලු ඖෂධ පැලෑටි හා ශාක ඇති ප්‍රදේශ මේ නමින් හඳුන්වා ඇත. නෝක්ස් (1981) සිංහලයාගේ ඖෂධ ගබඩාව වනාන්තරය ලෙස හැඳින්වූයේ එහෙයිනි. මෙම ප්‍රදේශවල ඖෂධ එකතු කිරීම හැර වෙනත් කටයුතු සඳහා යොදා ගෙන නැත. ඊට හේතුව එම ප්‍රදේශ ශුද්ධ භූමි ලෙස පවත්වා ගැනීම ය. ඖෂධීය ශාක විශේෂ නෂ්ට (Extinct) නොවන ආකාරයට දීර්ඝ කාලයක් තිස්සේ එම බිම් පරිහරණය කර තිබෙන අතර සාම්ප්‍රදායික දැනුම් පද්ධති ඒ සමඟ සෘජු ව බද්ධ ව ඇත. දොළුකන්ද, රිටිගල, නිල්ගල වනාන්තරය, බලංගොඩ ප්‍රදේශයේ ඇතැම් වනාන්තර ඖෂධ වනාන්තර වශයෙන් ප්‍රකට ය. "අලි කැලේ" නමින් වහරන්නේ සැබවින් ම එහි අලින් සිටින නිසා පමණක් නොව අලින් සිටියත් නොසිටියත් එම වනාන්තරයේ පැතිරීම හා උපයෝජන වටිනාකමේ පරාසය සැළකීමෙනි. මීට අමතර ව එක් ශාක විශේෂයක් ප්‍රමුඛ ව (Dominance) පැතිර ඇති වනාන්තර ප්‍රදේශයක් එම විශේෂයේ නමින් ම හඳුන්වා ඇත. නෙල්ලි කැලේ, කිරල කැලේ, බට කැලේ, දං කැලේ, තේක්ක කැලේ (වනවගා) පයනස් කැලේ (වනවගා), ආදිය මේවාට නිදසුන් වේ.

### බැද්ද/ බැදි

"බැද්ද" යන්න ව්‍යවහාර වී ඇත්තේ ගම්මාන ආශ්‍රිත වනාන්තර ප්‍රදේශ හැඳින්වීම සඳහා ය. මෙම වනාන්තර බොහෝ මානව කටයුතු සඳහා විවෘත ව පැවත ඇත. හේන් වගාව, ඇල් වී වගාව ප්‍රධාන ය. දෛනික වනජ, දැව, දර අවශ්‍යතා තෘප්ත කර ගැනීමට ද මෙම වනාන්තර ප්‍රදේශ උපයෝජනයට ගෙන ඇත. මෙම වනාන්තර කොටස් බොහෝ විට හුදකලා හෝ විසුරුණු ස්වරූපයක් ගෙන ඇති බව පෙනේ. ඒ නිසා "බැදි කුට්ටි" වශයෙන් හඳුන්වා ඇත.

### ලන්ද/ ලඳු

"ලඳු කැලෑ" නමින් ද හැඳින් වූයේ මේවා ය. විශාල වෘක්ෂයන්ගෙන් තොර වූ "ලන්ද" පැවතියේ ගම්මාන අද්දරට වන්නටයි. මේවා කලින් කලට මානව කටයුතු සඳහා යොදාගත් බිම් වෙයි. කැන්ද (Macaramga peltata), කදුරු (Cerbera odollam), දං (Syzygium caryophyllatum), බෝම්බු (Symplocos cochinensis. laurina var.laurina), වැරනියා (Hedyotis fruitcsa), සහ කැල (Bridelia retusa) ආදී ශාක සන්තතියකින් ද හාවුන් (Lepus nigricollis), ඉත්තෑවන් (Hystix indica), මී මින්නන් (Tragulus meminna), කොළ දිවියන් (Prionailurus rubiginosus) සර්පයන්ගෙන් සංචිත සත්ත්ව සන්තතියක් ද මේවායේ දක්නට ලැබේ. "ලැහැබ" යන්න යෙදී ඇත්තේ මෝරා ගිය එනම් පරිනත වූ "ලඳුකැලෑ" ප්‍රදේශ හැඳින්වීම සඳහා යි. "ලවල්" හෝ "ලපල" යනුවෙන් හඳුනාගෙන ඇත්තේ "ලඳුවල" මුල් අවස්ථාවන්ට යි. කැකිල්ල (Gleichenia linearis), මානා (Pennisetum purpureum Schum) ආදියෙන් වැසීගත් ප්‍රදේශ මේ නමින් හඳුන්වා ඇත. එනම් පිළිවෙළින් ලවල්, "ලන්ද" "ලැහැබ" ආදී වශයෙනි.

### මණ්ඩිය

"මණ්ඩිය" නමින් හඳුන්වා ඇත්තේ යම් ශාක ආවරණක් සහිත සුවිශේෂ ව ප්‍රමුඛ ශාක විශේෂයක් ව්‍යාප්ත වී ඇති සහ එය අවකාශීය ව කුඩා ප්‍රදේශයක විසිරි ඇති වනාන්තර ප්‍රදේශයක් හැඳින්වීම සඳහා ය. වනාන්තරයේ ඇති දුන් (Doona zeylanica) ගස් මණ්ඩි, හල් (Vateria copallifera) ගස් මණ්ඩි, බෙරලිය (Shorea megistophylla) ගස් මණ්ඩි, නා (Mesua ferrea) ගස් මණ්ඩි ගැමියන් හඳුනති. දුම්මල එකතු කිරීම/ කැඩීම සඳහා ගැමියන් යන්නේ දුන් ගස් මණ්ඩි වෙතයි. හල් වාරෙට හල් ඇහිදීම සඳහා යන්නේ හල් මණ්ඩි වෙත ය. වසර හතකට වරක් එල දරනවා යැ යි විශ්වාස කරන බෙරලිය ඇහිදීම සඳහා යන්නේ බෙරලිය ගස් මණ්ඩි වෙත යි. මෙම හඳුනා ගැනීම් හා නාමකරණයන් උපයෝජනය පදනම් කරගෙන ඇතිවුණා යැයි අනුමත කළ හැකි ය. ශ්‍රී පාද අඩවිය, සිංහරාජය, කන්නෙලිය, දෙදියගල, රම්මලේකන්ද, සහ වෙනත් පහතරට කුඩා වනාන්තර කොටස් තුළ ද ගැමියන් විසින් මේ අයුරින් දී ඇති නාමකරණයන් හඳුනාගත හැකි ය. එම ප්‍රදේශ ආශ්‍රිතව ඇති වෙනත් ලක්ෂණ හඳුනා ගන්නේ ද ඒ නම ඇසුරු කරගෙනයි. සිංහරාජයේ වඩාත් ප්‍රචලිත "හල්මණ්ඩිය දොල" එසේ නම් කෙරුණකි.

### ගමුව/ ගොමුව/ ගොල්ල/ ගොන්න

"ගොමුව" "ගොල්ල" යනුවෙන් බොහෝ විට හඳුනාගෙන ඇත්තේ යටි රෝපණය ඝන ව ව්‍යාප්ත ව ඇති ප්‍රදේශයකි. මේවායේ දක්නට ඇත්තේ ජලය ආශ්‍රිත ව ප්‍රචාරණය වන "හබරල" (Alocasia macrorrhizos) හෝ එවැනි වෙනත් ජලය හා වගුරු පරිසරය ප්‍රිය කරන ශාක ප්‍රජාවකි. බොහෝ විට මේවායේ ව්‍යාප්ත ව ඇත්තේ එක් ප්‍රමුඛ ශාඛ විශේෂයකි. සබරගමුව නම් පළාත් නාමකරණය උපන්නේ දැනට සබරගමුව සමන් දේවලය පිහිටි ප්‍රදේශයේ අතීතයේ ව්‍යාප්ත ව පැවති විශාල "හබරල ගොමුවක්" නිසා බව ප්‍රවාදගත ය. හබරගමුව පසු කාලීනව සබරගමුව විය. එක් ප්‍රවාදයකට අනුව රාම විසින් රාවණා රජු ඉලක්ක කර මුදාහැරි "හීය" තම ඉලක්කය ද සපුරා අවසන නතර වූයේ ඉහත හබරල ගමුවේ තිබූ හබරල අලයක් වැදීමෙනි. අදටත් මෙම හීය සමන් දේවාලයේ පෙරහැර භාණ්ඩ අතර පවත්නා ශුද්ධ දේව භාණ්ඩයකි. ඇතැම් විට "ගොල්ල" යන්න එක ම විශේෂයේ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හොර, ගොරකා (Gracinia quaesita), සියඹලා (Tamarinda indica) වැනි විශාල ගස් බහුල ප්‍රදේශ හැඳින්වීමට ද භාවිත කර ඇත. බස්නාහිර පළාතේ ඇති හොරගොල්ල මීට නිදසුනකි. වර්තමානයේ අභය භූමියක් වන මෙහි අදටත් හොර ගස් බහුල ව නිරීක්ෂණය කළ හැකි ය.

"ගොන්න" යන්න ව්‍යවහාර වී ඇත්තේ "පඳුරු ශාක සහිත වනාන්තර බිමක් හඳුනා ගැනීම සඳහා ය." බොහෝ විට ඒවායේ වැසුණු වියනක් දක්නට නැත. විසුරුණු පඳුරු ස්වරූපයකුයි දක්නට ඇත්තේ. පොදු ලක්ෂණය නම් මේවායේ ද එක් විශේෂයක් ප්‍රමුඛ වීමයි.

**වදුල/ ගොම්මන/බූටෑව**

මේවා විශාල වනාන්තර ප්‍රදේශ නොවේ. ගම්මාන ආසන්නයේ පවතින කුඩා වනාන්තර බිම් ප්‍රදේශ මේ නමින් හැඳින්වේ. මේවායේ වනාන්තරමය ශාක විශේෂ මෙන් ම ගෘහස්ථකරණය කරන ලද රට දෙල් (Artocarpus incises) කොස් (Artocarpus heteropyllus), පුවක් (Areca catechu) ගොරකා වැනි ශාක විශේෂ ද වෙයි. මෙහි විශේෂත්වය වන්නේ මෙම බිම් අඳුරු ස්වභාවයක් දැරීමයි. එනම් තුරු වියන විසින් පොළොවට හිරු එළිය පතිත වීම වලක්වනු ලැබ තිබීමයි. එනිසා දහවල් කාලයේ දී මෙම ප්‍රදේශ "ගොම්මන්" (සවස් කල, ගවයින්/ගොනුන් "මං" බසින වෙලාව) ස්වභාවයක් දරයි. ගම් මණ්ඩියක් තවත් ගම් මණ්ඩියකින් හෝ ගෙයක් තවත් ගෙයකින් වෙන්වූයේ වන වදුලකිනි. නැතහොත් "බූටෑව" කිනි. කාන්තාවන්ට සහ ගැටිස්සියන්ට ඉව කරන භූතාත්ම ඇතැයි විශ්වාස කරන බැවින් මෙම බිම් ඔවුනට තනිව සැරිසැරීමට අකැප ඒවා ලෙස ජනප්‍රවාදයේ එයි.

**වන රොද/රොද**

"වන රොද" ලඳු කැලෑවකට වඩා ඝන ව වර්ධනය වූ වනාන්තරයකි. එහි බොහෝ විට ඇත්තේ ස්වභාවිකව ව්‍යාප්තව රෝපණය වූ ගස්වැල් ය. ඇටඹ (Mangifera zeylanica), ගොරක (Gracinia quaesita), රට ගොරක (Garcinia xanthochymus), බැදි දෙල්, (Artocarpus nobilis), කදුරු, හිබුටු (Strychnos nux-vomica), කිතුල් (Caryota urenus), රුක් (Horsfieidia iryaghedhi) සහ ගල් අන්නාසි (Anansa comosus) වැනි ශුෂ්ක රූපී පඳුරුවලින් වන රොදක් සමන්විත වේ. යටි රෝපණය මෙන් ම වියන ද වැසී පවතී.

**ගාල/ගාල්**

"ගාල්" ද ගම්මාන අවට මානව බලපෑම ලැබ පසු ව මිනිස් පරිහරණයෙන් වෙන් ව ගිය (අත්හරින ලද) වනාන්තර බිම් වේ. මේවා බොහෝ විට නග්නීකරණයට බඳුන් වූ ආන්තික බිම් වේ. එනිසා මේවායේ දක්නට ඇත්තේ වර්ධනය වෙමින් පවතින ප්‍රාථමික ශාක ප්‍රජාවන් ය. විශේෂයෙන් මානා, කැකිල්ල, ඉලුක් (Imperata cylindrical) වැනි ශාක විශේෂ යි. මේවා වනාන්තර සංශ්‍රේණි ක්‍රියාවලියක මුල් අදියර නියෝජනය කරයි. ඇතැම් ප්‍රදේශවල ලෝක පාළු (Mikania cordata), පඹ (Lygodium flexuosum), බාඳුරා (Nepenthes distillatoria), වෙනිවැල් (Coscinium fenestratum) තුඩ රුන (Calamus ovoideus Thw.exTrim) වැනි වේවැල් විශේෂවලින් වියන වසාගත් ශාක ප්‍රජාවන් විස්තර කිරීම සඳහා ද "ගාල" යන වදන ව්‍යවහාර වෙයි. ජලය හා වගුරු පරිසර පද්ධතිවල දී කෙටල (Lagenadra ovata), හබරල, කොහිල (Lasia spinose) වැනි ශාක ආවරණයක් හැඳින්වීම සඳහා ද "ගාල" යන්න යෙදේ.

**මූකලාන**

තෙත් කලාපයේ "මූකලාන" නමින් හඳුන්වන වනාන්තර බිම්වල වනාන්තරමය සහ ගෘහස්ථකරණය කරන ලද යන ශාක විශේෂයන් ද්විත්ව ම දක්නට ලැබේ. විශේෂයෙන් ම වනාන්තරයට යාබද ව හෝ මායිම් ව මූකලන් පිහිටා තිබේ. ඇතැම් මූකලන් බිම් හේන් වගාව කොට අත්හරින ලද ඒවා ය. ඒවා පූර්ණ වශයෙන් එළි කිරීම දීර්ඝ කාලයට පෙර හෝ පූර්ණ ලෙස ම නතර කරන ලද බිම් ය. එනිසා එහි ශාක ප්‍රජාව පරිනත අවිධියේ පසු වෙයි. කෙසේ වුවත් තවදුරටත් මෙම බිම් පුවක්, රටදෙල්, වල්දෙල්, කිතුල්, හතු වර්ග, රට ගොරක, ගොරක වැල් වර්ග, දර වැනි වනජ ද්‍රව්‍ය රැස් කිරීම සඳහා ද කෘෂි කාර්මික කටයුතු සඳහා අවශ්‍ය පොලු, කණු ආදී ලී වර්ග ලබා ගැනීමට ද ගෘහීය දැව අවශ්‍යතා සපුරා ගැනීමට ද භාවිත කරයි. ශ්‍රී පාද රක්ෂිතය අවට පවත්නා මෙබඳු වන බිම්වලට පෞද්ගලික හිමිකම් සහිතයි. ඇතැම් ඒවා හවුලේ භුක්ති විඳින පාරම්පරික ඉඩම් ය. "හොළී මූකලාන" නමින් හඳුන්වන්නේ පැරණි හා පරිනත තත්වයට පත් වූ වෘක්ෂ සහිත මූකලන් ය. මුහුකළ - ආනෘ මූකලාන බවට පරිණාමය වූ බව වාග්විද්‍යාත්මක ව දක්වා ඇත්තේ මේ ද්වත්ව ලක්ෂණ මෙම බිම්වල නිරීක්ෂණය කළ හැකි වූ නිසා බව නිගමනය කළ හැකිය.

**අරඹ**

භූ රූප විද්‍යාත්මක ව මේවා දිය සීරාව සහිත කඳුබෑවුම් හා දෙනි බිම් ආශ්‍රිත ව පිහිටා තිබේ. මේවායේ දක්නට ඇත්තේ රටදෙල්, ගොරක සහ ප්‍රමුඛ ව ව්‍යාප්ත වූ පුවක් ගස් වැස්මකි. ඒ ඒ ප්‍රමුක ශාක විශේෂවල ව්‍යාප්තිය අනුව මේවා පුවක් අරඹ, දෙල් අරඹ ආදී නම් ගනී. ශ්‍රී පාද රක්ෂිතයේ පිහිටි මෙබඳු අරඹවලින් බහුලව ම සිදු කෙරෙන්නේ සෘතුමය වශයෙන් පුවක් කැඩීම සහ ඇහිලීම ය. මේවායේ බිම් ස්ථිරය තෙත් සහිත වන නිසා ඌරන් (Sun surofa cylonicus) හා ගෝනුන් (Rusa unicolor unicolor) වැනි සතුන් දිවා කල ලැග සිටින ස්ථාන බවට මෙම බිම් පත් ව තිබේ. කිතුල් මැදීම, හා වෙනත් වනජ ද්‍රව්‍ය රැස් කිරීම, සුළු හා කෘෂි කාර්මික දැව අවශ්‍යතා සපුරා ගැනීම ආදිය මෙම බිම්වලින් ඉටු කරගන්නා අනෙක් ප්‍රමුඛ ප්‍රජා අවශ්‍යතා වෙයි. පූර්ණ ලෙස ම එළි කිරීමක් සිදු නොවුනත් ගෘහස්ථ අවශ්‍යතා සඳහා දැව හෙළීම් සිදු කරයි.

**කනතු**

"කනතු" යනු ගම්මාන තුළ හෝ ගම්මාන අවට ඇති ඛාදනය නිසා නග්නීකරණයට ලක් වූ ආන්තික බිම් වේ. මේවා යේ ඉතා තුනී තෘණ ආවරණයක් දක්නට ලැබේ. ඉරමුසු (Hemidesmus indicus), පොල්පලා (Aerva javanica), ඇත් අඩි (Elephantopus scaber), මොණර කුඩුම්බිය


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(Vernonia cinerea), උදුපියලිය (Desmodium triflorum) ආදී පැලෑටි විශේෂ මෙම බිම්වල නිරීක්ෂණය කළ හැකිය. එය ශාක සන්තතියේ මුල් පියවර වේ. ඇතැම් ප්‍රදේශවල අත්හැර දමන ලද නිස්සාර හේන් බිම් ද කනතු ලෙස හැඳින් වේ. ඒවා "හේන් කනතු" නමි.

### වැට/ වැටිය / අද්දර

මෙම ශාකාවරණ පද්ධති පිහිටා ඇත්තේ ගම්මාන තුළ හෝ වගා බිම් තුළ යි. කුඹුරු, නිවාස, වගාබිම් ආදිය සීමා කරමින් මිනිසා විසින් මෙම පද්ධති නිර්මානය කොට තිබේ. කොහොඹ (Azadirachta indica), මුරුංගා (Moringa oleifera), වැටමාර - ලාඩප්පා (Gliricidia sepium) එරබදු (Erythrina variegate), කොට්ටං (Terminalia catappa), පුවක්, ලේන්තිරි (Areca concinna), වල් මඤ්ඤොක්කා (Manihot glaziovilceara rubbur) ආදී වූ ශාඛ ප්‍රජාවන් මෙහි දක්නට ඇත. සත්ත්ව ආහාර මෙන් ම මිනිසාගේ දෛනික පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර ද මෙහි දක්නට ඇත. වසරේ යම් කාලයක දී මෙම පද්ධති කප්පාදු කෙරේ. නමුත් පූර්ණ ලෙස ඉවත් නොකරයි. රජරට වියළි කලාපයේ වැව් ආශ්‍රිත ව මෙන් සුලබ හා සංකීර්ණ නොවුවත් පහත රට තෙත් කලාපයේ කුඩා වැව් ආශ්‍රිතව ද ශාක / රුක් / ගස් වැටි දක්නට ලැබේ. ඒවා කුඹුක් (Terminalia arjuna) මාර (Albizia lebbek lebbek) මී (Madhuca longifolia) වැනි වෘක්ෂවලින් සහ විවිධ පන් වර්ගවලින් සමන්විත යි. මිනිසා විසින් ස්ථාපිත කොට ඇති මේවායේ අරමුණු වන්නේ වැව අවසාදනය වීම වැළැක්වීම හා වැව් ජලය වාෂ්පීකරණය අවම කිරීම යි.

### ඉවුරු / බඩ

මෙහි ශාක ආවරණය මිදෙල්ල (Barringtonia acutangula), වල් ආත්තා (Annona glabra), දියපර (Dillenia triquetra), බට (Ochlandra stridula), උණ (Bambusa vulgaris), මී (Madhuca longitolia), කුඹුක් (Terminalia arjuna), පුවක් හා පන් වර්ගවලින් සමන්විත වේ. ගං ඉවුරු, ඇල හා දොල පාරවල් දෙපස මෙම සුවිශේෂී වෘක්ෂලතා ආවරණය හඳුනාගත හැක. තීරු ආකාර පිහිටීමක් නිරීක්ෂණය කළ හැකි ය. ඇතැම් ගංගා දෙපස ගිං පොල් (Nypa fruticans) සහ කටු පොල් (Elaeis guineensis) ශාකවල ව්‍යාප්තියක් ද හඳුනාගත හැකි ය. එම ප්‍රදේශ එම ශාකවල ම නම් ගනී.

### දෙනිය / දෙනි

වනාන්තර තුළ පවත්නා තවත් සුවිශේෂී පරිසර පද්ධතියකි "දෙනි". වනාන්තරයෙන් පිටත දී මේවා වී (Oryza sativa) වගා, කොරටු වගා හා බුලත් (Piper betle) වගාව සඳහා සකසා ගෙන ඇත. කඳුවලින් වට වූ තෙතමනය රැඳී පහත් බිමකි. "දෙණිය". එහි ඊට ම ආවේණික වූ ශාක ප්‍රජාවක් පවතී. දෙදියගල වනාන්තරය දෙනි වගාව සම්බන්ධයෙන් වඩා ප්‍රකට ය. එය 1970-80 දක්වා ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ "දෙනි බලපත්‍ර" යටතේ වගා කරන ලද දෙනි වගා බිම් 50 ක් පමණ අදටත් එහි නිරීක්ෂණය කළ හැකි ය. මේවා බොහෝමයක් හඳුන්වන්නේ ඒ දෙනි වගා කළ පුද්ගලයන්ගේ හෝ ඒ දෙනියේ පැවති ප්‍රමුඛ තුරු ආවරණයේ නමිනි. අද වන විට වනාන්තරය තුළ ඇති මේ දෙනිබිම්වල ගෘහස්තකරණය කරන ලද ශාක විශේෂ ද හමු වේ. ඒ ඉහත මානව බලපෑම්වල ජීවමාන සාධක වශයෙනි. ශ්‍රී පාද අඩවියේ මෙවැනි බිම් බොහෝමයක් අනවසර පතල් නිසා හඳුනාගත නොහැකි පරිදි වෙනස් වී ඇත. ශ්‍රී පාද අඩවිය පර්යන්ත වනාන්තරයක් වන ඉඳුරුව රක්ෂිතයේ ඇති දෙනි බිමක "කටු රහිත කොහිල" විශේෂයක් ද හමු වේ. බිනර, (Binara exacum) පන් වර්ග, බඩල්වනස්ස (Lycopodiella cernua), කඳුලැස්ස (Drosera indica), මඩුමහන (Sphaeranthus indicus), කුඹුරු (Caesal pinia bonduc), කී කිරිඳිය (Eclipta prostrata) ආදි විශේෂ දෙනි බිමක දී නිරීක්ෂණය කළ හැක. ගම්මාන තුළට වන විට, භූ රූප විද්‍යාත්මක ව මෙබඳු ලක්ෂණ දරණ බිම් කුඹුරු, කලවිට, ඕ විට, බඩ වැටි බවට පරිවර්තනය වන අතර ම ඊට ම අවේණික වූ ශාක ආවරණයකින් ගැවසී ගනී.

### යාය

එක ම වර්ගයකට අයත් හෝ එක් වර්ගයක් (විශේෂයක්) ප්‍රමුඛ වූ ශාක ප්‍රජාවක් සාපේක්ෂව විශාල භූගෝලීය ප්‍රදේශයක ව්‍යාප්ත ව ඇත්නම් එය "යායක්" නමින් හඳුන්වයි. වනාන්තරයක් තුළ දී නම් බෙරු (Agrostistachys coriacea) ගස්, නෙළු (Strabilathes anceps) පඳුරු යායවල් හඳුනා ගත හැකි ය. ඇතැම් විට කුඹුක් ගස් ද යායකි. ගම්මානයට එන විට කෙත් යායවල් දක්නට ලැබේ. ඒවා මැදින් ගලන දොල පාරවල් ආශ්‍රිත ව මී, කුඹුක්, හෝ රඹුක් (Saccharum arundinaceum), යායවල් නිරීක්ෂනය කළ හැක. මාන සහ ඉළුක් වැනි තෘණ විශේෂ ද යායවල් වශයෙන් හමු වේ.

### පිටිය / පිටි

පහතරට තෙත් කලාපයේ දක්නට ඇත. "පිටි" පරිසර පද්ධති වියළි කලාපයේ දක්නට ඇති "වැව් පිටිවලින්" තරමක් දුරට වෙනස් වේ. මේවා ගං වතුරට යටවන පිටාර තැනිවල පිහිටා තිබේ. වසර පුරා ඝණ තෘණ වැස්මක් මෙහි දක්නට ලැබෙන අතර අතරින් පතර විසුරුණු පඳුරු නිරීක්ෂණය කළ හැකි ය. තෝර (Cassia sophera), ඇත්තෝර (Cassia alata) දියපර (Dillenia suttruticosa), ආදී පඳුරු ශාක ද මී, කොට්ටම්බා, පුවක් වැනි ශාක මදක් සමීපයේ ද ව්‍යාප්ත ව තිබේ. ගැමියන් විසින් ඇති කරන එළ ගවයන්ගේ සහ මී ගවයන්ගේ ප්‍රධාන ගොදුරු බිම් වන්නේ මේවා ය. මේවා වනාන්තරය තුළ මෙන් ම වනාන්තරයෙන් පිටත දී ද හඳුනා ගත හැක. උපයෝජනයේ දී පොදු උපයෝජන රටාවක් පෙන්වයි.

### බුලන

"බුලන" යන්න යෙදී ඇත්තේ වසර පුරා දිය සීරාව රැඳී සාපේක්ෂව පහත් බිමක් හැඳින්වීම සඳහා ය. වියළි කාලයක දී වුව ද "බුලන" නමින් හැඳින් වූ ප්‍රදේශයේ ජල මූලාශ්‍ර සිඳී නොය යි. එහි දක්නට ඇති ශාකාවරණය ද එම පරිසර පද්ධතියට හැඩගැසුණු ඒවා වෙයි. එම නිසා දැඩි වියළි කාලයක දී වුවත් සමස්ත පරිසර භූ දර්ශණයෙන් මෙම "බුලන ප්‍රදේශ" හරිත පැහැයෙන් හඳුනාගත හැක. වියළි


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඍතුවල දී මී ගවයන්, අලින් වැනි ජලය ප්‍රිය කරන සතුන්ගේ ලැගුම් පොලවල් වන්නේ මෙම ස්ථාන / ප්‍රදේශ වේ. මිනිස් අවශ්‍යතා සඳහා මෙම ප්‍රදේශ එළිපෙහෙළි කිරීම සම්මත ආචාර ධර්මයන්ට පටහැනි ක්‍රියාවක් වශයෙන් පිළිගැණුනි.

**පේ**

"පේ" යන්න පෙළ, පේළිය යන අරුතින් උපන්නක් බව පෙනේ. ඇතැම් ග්‍රාම නාම සහ ප්‍රාදේශීය නාමවල උපත විශ්ලේෂණය කර බැලීමෙන් පැහැදිළි වන්නේ එක ම විශේෂයකට අයත් ගස් පෙළක් හෝ ගොනුවක් ඇති ස්ථානයක් හෝ ප්‍රදේශයක් හැඳින් වීමට "පේ" යන්න යෙදී ඇති බව යි. තවත් විශ්ලේෂණ අනුව "පේ" යන්න ව්‍යවහාර වී ඇත්තේ වනාන්තර ප්‍රදේශයක් හැඳින් වීමට යි. "පේ" යන්නට පූර්වයෙන් එම වනාන්තරය කුමන වර්ගයේ එනම් කුමන ශාක ප්‍රමුඛ කොටගත් වනාන්තරයක් ද යන්න විස්තර කෙරේ. නිදසුනක් ලෙස කුරුවිට ප්‍රදේශයේ හල්පේ හල් ශාක ප්‍රමුඛ වී පැවති ප්‍රදේශයක් නැතහොත් හල් කැලයකි. අදටත් එම ප්‍රදේශයේ හල් ශාක බහුල බව ඒ ආශ්‍රිත භූමිය නිරීක්‍ෂණය කිරීමෙන් පැහැදිලි වේ. මේ අයුරින් ම, මීපේ, තල්පේ, බොපේ, දොම්පේ, දොඩම්පේ, ඉඹුල්පේ, කිතුල්පේ, මාදම්පේ, නුපේ, යන ග්‍රාම නාම හා ප්‍රාදේශීය නාම ද යම් ප්‍රමුඛ විශේෂයක් හෝ එක් සුවිශේෂී ශාකයක් පදනම් ව ව්‍යවහාර වී ඇති බව පෙනේ.

**ගෙවතු/ වන ගෙවතු**

පහතරට වනාන්තර සේ ම පහතරට පැරණි ගෙවතු රූපාකාරයෙන් වනාන්තර හා සමාන වේ. වනාන්තරයට සාපේක්‍ෂ ව එහි ශාක හා සත්ත්ව විවිධත්වය අඩු වුවත් ඒක බෝග වගාවකට (Monoculture) වඩා එහි ජෛව විවිධත්වය වැඩි ය. ස්ථිරහවනය සැළකුවහොත්, එහි පැහැදිළි ලෙස ම වියන්, උප වියන්, පඳුරු, බිම් ආදී වශයෙන් ස්ථර තුනක් හෝ හතරක් නිරීක්ෂණය කළ හැකි ය. ගෘහස්තකරණය කරන ලද ශාක විශේෂ මෙන් ම ස්වාභාවිකව වර්ධනය වූ ශාක සන්තතියක් ද මෙම ගෙවතු සතු ය. විශේෂත්වය වන්නේ එම වනගත විශේෂවල වර්ධනයට හා ප්‍රචාරණයට අවස්ථාව හිමිවීම යි. එනිසා සුළු දැව, වනජ හා වෙනත් දෛනික ගෘහ අවශ්‍යතා ඉටු කිරීමට මෙම වන ගෙවතු සමත් ය.

## නිගමනය

විවිධත්වය තුළ පවත්නා සුවිශේෂතාව, උපයෝජනයේ ස්වභාවය සහ භූ අවකාශීය ව්‍යාප්තිය යන නිර්නායක මත පදනම් ව ශ්‍රී ලංකාවේ පහතරට කලාපයේ ශාකාවරණය හඳුනා ගැනීම හා වර්ගීකරණය සිදු කළ හැකි අතර ඊට අවැසි පසුබිම නිර්මාණය කරනු ලැබ ඇත්තේ එම ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාවන් සහ ඔවුන් විසින් පරම්පරානුගත ව පවත්වාගෙන එනු ලබන සාම්ප්‍රදායික දැනුම් පද්ධති මඟිනි. එම සාම්ප්‍රදායික දැනුම් පද්දතිවල මූලයන් ප්‍රජාවයේ චින්තන විධි සහ සාරධර්ම පද්ධති, භාෂාව හා ජීවන ව්‍යාවහාරයන් තුළට කිඳාබැස තිබේ. සාම්ප්‍රදායික දැනුම් පද්ධතිවලින් මූර්තිමත් කරන්නේ මෙම මූලයන්ගෙන් උනා ගලනා සොබාවයි. මේ අනුව නිගමනය කළ හැක්කේ සාම්ප්‍රදායික දැනුම මත ශ්‍රී ලංකාවේ පහතරට ශාකාවරණය හඳුනා ගැනීම සහ වර්ගීකරනය හුදු ශාකාවරණය හඳුනා ගැනීමක් පමණක් නොව ඊට බද්ධ ව පවතින්නා වූ පුළුල් සමාජ සංස්කෘතික වපසරියක් හඳුනා ගැනීමක් ද වන බව යි.

## පරිශීලිත මූලාශ්‍රය


එපිටවත්ත, එස්. සහ ප්‍රේමතිලක, ටී. ආර්. (2005). පරාග විද්‍යාවඃ හෝර්ටන් තැන්න සහ දකුණු ආසියාවේ අතිපුරාණ කෘෂි කාර්මික පරිසරය. කොළඹ ඃ ස්ටැම්ෆර්ඩ් ලේක්.

නන්දාරාම ටී, (1997). උද්භිත නාම ප්‍රදීපිකා, කොළඹ ඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණතිලක දිසානායක සහ දයා අමරසේකර (සංස්කරනය). ඉඳුවර සමාජ පදනම 01, වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ.

සමරකෝන්, එස්., පී ත (2009). හෙළ ෆ්ලෝරා, කොළඹ ඃ ගොඩගේ ඉන්ටර්නැසනල් පබ්ලිකේෂන්.

සිරිසේන, ඩබ්ලිව්. එම්. (2004). "පරිසරවේදය, මානව විද්‍යාව හා සංස්කෘතිය", එම් සෝමතිලක සහ එච් එම්

හේරත් එච්. එම්. ඩී. ආර්. (2004). "දේශීය ඥානය, පිරිස කළමණාකරනය සහ සාම්ප්‍රදායික සාරදර්ම පද්ධතිය".

හේරත් ඩී ආර් (සංස්කරණය). අනුමෝදනා, මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න උපහාර ලිපි සංග්‍රහය, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ .

Anderson, E.N., (1996). Ecologies of the Heart: Emotion, Belife, and the Enviroment. Oxford: Oxford University Press.

Dikshith, R.D.,(1997). Geographycal Thought ( A Contextual history of ideas. New Delhi: Prentice Hall of India Private Limited.

Karunaratne, M.S.M.L., (2009). Establishing forest buffer zones in the rain forests as a forest conservation strategy- A Case Study on Peakeilderness (Samanala Adaviya) Forest Reserve. unpublished BA Thesis. Matara: Department of Geography, University of Ruhuna.

Lovelock,J.,(1995). The Ages of Gaia: A Biography of Our Living Earth.Yew York: Oxford University Press.

Hennink,M et al. (2011). Qualitative Research Methods. New Delhi: SAGE.




© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Martin, L., (1896) "Eskimo Words for Snow" (A Case Study in the Genesis and Decay of an Anthropological Example, American Anthropologist Volume 88, Issue 2, pages 418-423, June 1986, American Anthropogical Association.

Somadeva, R., (2006). Urban Origins in Southern Sri Lanka. Uppsala: Uppsala Universitet.

Forest and Agriculture Organization., (2000), Forest resources of Sri Lanka – country report. http://www.fao.org/docrep/007/ad678e/AD678E02.htm – accessed on 2016.09.23

## උපග්‍රන්ථය

**ප්‍රාථමික දත්ත දායක නාමාවලිය**

- කළ්‍යාණිවතී, කේ.බී., (56) 2016.10.11, නිල්මිණි උයන, පරකඩුව.
- සෝමදාස, එම්. එස්., (60) 2016.10.09, උඩගම්කන්ද, පොහොරබාව, පරකඩුව.
- පියදාස, එම්. එස්., (61) 2016.10.11, උඩගම්කන්ද, පොහොරබාව, පරකඩුව.
- ගුණසේන, එම්.ඩී., (80) 2016.10.11, ඉහළ ගොඩම්පල, පරකඩුව.
- දයාවංශ, පී.එම්., (44) 2017.01.07, දිගන්දල, දෙමුවක, රක්වාන.
- ධර්මසේන, කේ.පී., (47) 2017.01.07, පොල්වත්ත, දුන්කිලවත්ත, මාතලේ.
- ගරුසිංහ, එච්., (58) 2016.09.28, වැලිකැටිය, දෙදියගල, අකුරැස්ස.
- ජයරත්න ඒ.ආර්., (52) 2016.09.28, වැලිකැටිය, මලිදූව, අකුරැස්ස.
- සරත්චන්ද්‍ර, එච්., (51) 2016.09.27, වැලිකැටිය, මලිදූව, අකුරැස්ස.
- ජේන්, එච්. කේ ., (85) 2016.09.27, වැලිකැටිය, මලිදූව, ඇකුරැස්ස.
- දයාරත්න, කේ.කේ.පී., (54) 2016.11.11, දයාවාස, ගුරුළුවාන, ගිලිමලේ.
- සෝමපාල, පී. ආර්., (55) 2016.11.11, දිවියගල, ගුරුළුවාන, ගිලිමලේ.
- ජේම්ස්, පී. එච්., (56) 2016.11.11, ගුරුළුවාන, ගිලිමලේ.
- රොසලින්, පී., (77) 2017.01.03, කුඩව, වැද්දාගල.
- ප්‍රේමවතී, බී.ඒ. (54) 2016.04.13, කළුපේඩිගම, බලංගොඩ.
- ධර්මසිරි, කේ. ඒ. එම්., (58) 2016.04.13, නයිගල, බලංගොඩ.
- කරුණාරත්න, බී. එම්., (55) 2016.04.12, කළුපේඩිගම, බලංගොඩ.
- ගුණරත්න, පී. ටී., (55) 2016.04.12, කොන්ගහමන්කඩ, බලංගොඩ.
- කරුණාවතී, බී., (63) 2016.04.13, වැලිපොත, බලංගොඩ.
- ආයුවර්ධන, යූ. එම්., (48) 2016.04.11, පුහුල්යාය, බලංගොඩ.
- ගුණසේන, යූ., (33) 2016.04.12, ගොඩකුඹුර, බලංගොඩ.
- ගුණදාස, ඩබ්.එම්., (60) 2016.04.12, ගොඩකුඹුර, බලංගොඩ.



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
නවවැනි කලාපය; 2018 දෙසැම්බර්, පිටු 49-59
ISSN 1800-1459 eISSN 2673-1177

© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ග්‍රාමීය-නාගරික සබඳතාවන්ගේ බලපෑම දඹුල්ල නගරය සහ එහි තදාසන්න ප්‍රදේශය ඇසුරින්

## (Impact of the Rural-urban Relationships on Regional Development: Study in Relation to Bambulla City and Adjacent Areas)

හේමචන්ද්‍ර බී.එම්.එම්.එච්.[1*] සහ යාපා එල්.ජී.ඩී.එස්.[2]

[1]භූගෝලවිද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සබරගමුව විශ්වවිද්‍යාලය
[2]භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
*sewwandika.yapa@gmail.com

**සාරසංක්ෂේපය**

විශාල ග්‍රාමීය ජනතාවක් සහ අඩු නාගරික ජනතාවක් සිටින ශ්‍රී ලංකාව වැනි රටකට ප්‍රාදේශීය සංවර්ධනයේ පරතරය අඩු කර ගැනීමෙහි ලා ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ සැලසුම් සකස් කිරීමේ දී ග්‍රාමීය-නාගරික සබඳතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සාර්ථක ප්‍රවේශයකි. ග්‍රාමීය-නාගරික සබඳතා ඇති වීම සඳහා බලපාන සාධක හඳුනා ගැනීම තුළින් ප්‍රාදේශීය සංවර්ධනයට සිදු වන බලපෑම අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වන අතර දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා වර්ග හඳුනා ගැනීම, ග්‍රාමීය-නාගරික සබඳතා ආශ්‍රිත ගැටලු හඳුනා ගැනීම සහ එම සබඳතා වැඩිදියුණු කිරීම උදෙසා පවතින සංවර්ධන විභවතා හඳුනා ගැනීම යන අනු අරමුණු ඔස්සේ අධ්‍යයනය සිදු කරන ලදී. දඹුල්ල නගරයේ සිට විවිධ දුරින් යුක්තව එනම්, කිලෝමීටර් 0-5, 5-10, 10ට වැඩි වශයෙන් කොටස් කර එක් කොටසකින් ග්‍රාමනිළධාරි වසම් 02 ක් වශයෙන් සමස්ත නියැඳිය ලෙස ග්‍රාමනිළධාරි වසම් 06 ක් ද එම වසම් තුළින් එක් ග්‍රාමයක් බැගින් ද අරමුණුගත සසම්භාවී නියැඳිය ඇසුරින් තෝරා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත සහ ද්විතියික දත්ත මූලාශ්‍ර යොදගත් අතර සරල සසම්භාවී නියැඳියට අනුව ප්‍රශ්නාවලි 100 ක් මඟින් සමස්ත නියැඳිය නියෝජනය වන පරිදි තොරතුරු ලබා ගන්නා ලදී. SPSS 21 මෘදුකාංගය ඇසුරින් කයිවර්ග පරික්ෂාව ද, ධාරා සිතියම් සහ ශදුඅත විශ්ලේෂණය ද දත්ත විශ්ලේෂණය සඳහා යොද ගන්නා ලදී. මෙම අධ්‍යයනයේ විශ්ලේෂණයන්ට අනුව 1990 දී පිහිට වූ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය හේතුවෙන් දඹුල්ල නගරයේ වාණිජ කාර්යයන්ගේ සංකේන්ද්‍රණය 58% පමණ දක්නට ලැබේ. නගරයේ කාර්යයමය විවිධත්වය මත පදනම් ව තදසන්න ප්‍රදේශය භෞතික, ආර්ථික, සේවා පහසුකම්, තාක්ෂණික, ප්‍රජාවිද්‍යාත්මක සහ සමාජ වශයෙන් නගරය සමඟ විවිධ සබඳතා පවත්වනු ලබන අතර කයිවර්ග පරික්ෂාව මඟින් ලැබුණු ප්‍රතිඵලවලට අනුව ආර්ථික සබඳතා ප්‍රමුඛ වේ. දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශය අතර පවතින දුර මත සබඳතාවන්ගේ තීව්‍රතාවය වෙනස් වන අතර ග්‍රාමීය-නාගරික සබඳතා සඳහා ප්‍රබල ලෙස බලපාන මාර්ග පද්ධතියේ කාර්යක්ෂමතාව හේතුවෙන් ප්‍රදේශයේ සබඳතාවන්ගේ තීව්‍රතාව දක්නට ලැබේ. ප්‍රදේශයේ දක්නට ලැබෙන ග්‍රාමීය-නාගරික සබඳතා හේතුවෙන් සමාජීය, ආර්ථික මෙන් ම පාරිසරික වශයෙන් ගැටලුකාරී තත්ත්වයන් දක්නට ලැබේ. දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ දක්නට ලැබෙන ග්‍රාමීය නාගරික සබඳතා හේතුවෙන් ප්‍රාදේශීය සංවර්ධනයට ධනාත්මක බලපෑමක් සිදු වී තිබේ. මෙම අධ්‍යයනයෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනා ලෙස දඹුල්ල නගරය තුළ කර්මාන්තශාලාවක් පිහිටුවීම තුළින් නගරයේ පවතින ගැටලුකාරී තත්ත්වයන්ට විසඳුමක් ලබා ගත හැකි අතර තදසන්න ප්‍රදේශය සමඟ පවතින සබඳතා තීව්‍ර වේ. ප්‍රදේශයේ මෙතෙක් හඳුනා ගෙන නොමැති ඓතිහාසික හා ස්වභාවික වටිනාකමකින් යුත් ස්ථාන හඳුනා ගැනීම තුළින් සංචාරක කර්මාන්තය තව දුරටත් දියුණු කළ හැකි වන අතර එය ප්‍රදේශයේ සංවර්ධනයට දයකත්වයක් සපයනු ඇත.

කේන්ද්‍රීය වචනඃ ග්‍රාමීය-නාගරික සබඳතා, ප්‍රාදේශීය සංවර්ධනය, සංවර්ධන විභවතා, ආර්ථික සබඳතා, දඹුල්ල නගරය

Linkages between rural and urban areas can generate income and improve the quality of the lives of people in both rural and urban areas. Current development planning focuses the potential advantages of urban centers in stimulating regional development of a country. Dambulla town plays a vital role in regional development in Sri Lanka. The main objective of this study is to identify the impact of rural urban linkages in regional development in Dambulla town while identifying the nature of rural urban linkages, problems and development potentials are the minor objectives of this study. Simple random sample method was used to collect data from six GN divisions and each two GN divisions belongs to 0-5km, 5-10km and more than 10km from Dambulla town to its adjacent area. Both primary and secondary data were used in this study and the analysis was done by using SPSS 21, Arc GIS 9.1 as well as with an inclusion of SWOT analysis. Findings of this research revealed that 58% of centralization for commercial purposes was due to the Dedicated Economic Centre in Dambulla. The linkages were continued with the town for physical, economic, technical, demographic and social purposes. In response to the result shown in Chi-Square Test, the economy was the main positive linkage in this area and the efficiency of road networks was the key factor behind this. Some problems related to social, economic and environmental have been identified as a result of the continuous process of rural-urban linkages. The positive impacts to the process of regional development are clearly recognized. Further, this study suggests that there is a need to setup a manufacturing industry in Dambulla area to intensify the rural-urban linkages and the importance of identification of both historically valuable places and scenic sights in Dambulla area to uplift the regional tourism industry is also essential.

Keywords: Rural-urban linkages, Regional Development, Development Potentials, Economic Linkages, Dambulla Town

## හැඳින්වීම

විසිවන සියවසේ මැද භාගයේ සහ ඉන්පසුව සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් සංවර්ධන විෂමතාව සහ එහි ප්‍රතිඵල අවබෝධ කර ගනිමින් බොහෝ ජනතාවට සංවර්ධනයේ ප්‍රතිලාභ අත්විඳීමට හැකි විකල්ප ප්‍රවේශයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත. වර්තමානයේ ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා ග්‍රාමීය-නාගරික වශයෙන් පවතින සබඳතාව ප්‍රබල සාධකයක් බවට පත් ව තිබේ. ග්‍රාමීය සහ නාගරික වශයෙන් පවතින බෙදීම යුරෝපයේ කාර්මික විප්ලවය සමඟ ඇති වූ වේගවත් නාගරීකරණයත් සමඟ ව්‍යවහාරයට පැමිණියකි. ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල පවතින ව්‍යුහාත්මක ලක්ෂණ පදනම් කොටගනිමින් එම ප්‍රදේශ එකිනෙකට වෙනස් වූ ප්‍රදේශ ලෙස නිර්වචනය වූ අතර ආයෝජන සහ සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී මෙම ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් සලකා සැලසුම් සකස් කරන ලදී. ග්‍රාමීය ප්‍රදේශවල මූලික ආර්ථික කටයුත්ත කෘෂිකර්මය වන අතර නාගරික ප්‍රදේශවල මූලික ආර්ථික කටයුත්ත වන්නේ කාර්මික නිෂ්පාදනය සහ සේවා සැපයීම යි. නගරයක් යනු වාණිජ, කාර්මික, මූල්‍ය, අධ්‍යාපන, සෞඛ්‍යය, පරිපාලනය සහ නේවාසික යනාදී විවිධ කාර්යයන් සංකේන්ද්‍රණය වූ ජනාවාසයකි. නාගරික ජනාවාසවල ද්විතියික, තෘතියික සහ චාතුර්ථික රැකියාවල නියුතු ජන සංඛ්‍යාව සාපේක්ෂ ව ඉහළ අගයක් ගනී. මේ නිසා ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂ ව විශාල කාර්යයමය විවිධත්වයක් නාගරික ප්‍රදේශවල පවතී (මානවඩු සහ ලියනගේ 2008). එම කාර්යයමය විවිධත්වය හේතු පාදක කරගනිමින් විශාල රැකියා ප්‍රමාණයක් ජනනය වන අතර වෙළඳ කටයුතු හේතුවෙන් ද ග්‍රාමීය ප්‍රදේශවල සිට නගරයට ජනයා විශාල වශයෙන් සංක්‍රමණය වේ.

ග්‍රාමීය-නාගරික සංක්‍රමණ තාවකාලික ව, ස්ථිර ව හෝ දෛනික ව සිදු විය හැකි ය. මෙම සංක්‍රමණ පාදක කරගනිමින් ග්‍රාමීය-නාගරික සබඳතාවන් වර්ධනය වේ. බොහෝ ජනයාගේ ජීවනෝපාය, ආර්ථිකය තුළ මෙම ග්‍රාමීය-නාගරික සබඳතා ප්‍රධාන භූමිකාවක් වේ. සමාජීය, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සහ භූගෝල විද්‍යාත්මක යන අංශයන් මඟින් ග්‍රාමය සහ නගරය විවිධ පුද්ගලයන් සමඟ සම්බන්ධ වේ. Tacoli පවසන ආකාරයට ග්‍රාමීය-නාගරික සබඳතා යනු දේශීය ආර්ථිකයේ සහ ජීවනෝපායේ ප්‍රධාන සංරචකයන් වන අතර සමාජීය, ආර්ථික, සංස්කෘතික විපර්යාසයන් රඳා පවතින්නේ ග්‍රාමීය-නාගරික සබඳතා මත ය (Mushi 2003).

සංවර්ධිත රටවල ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳ ව යුරෝපා රටවල කරන ලද පර්යේෂණවලට අනුව එම රටවල ග්‍රාමීය-නාගරික සබඳතා ඉතා ඉහළ මට්ටමක පවතී. දෙවන ලෝක යුද්ධයෙන් පසුව යුරෝපා කලාපයේ නාගරීකරණය හා කාර්මීකරණය බද්ධ වෙමින් ගමන් කළ අතර එමඟින් කෘෂිකර්මාන්තය නවීකරණය වීම, සේවා වියුක්ත කෘෂිකාර්මික ශ්‍රමිකයන්ගේ ගැටලුවට ප්‍රබල විසඳුමක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානය වන විට යුරෝපයේ නාගරික ප්‍රදේශ හා ඒ ආශ්‍රිත පර්යන්ත ප්‍රදේශ අතර විවිධ හුවමාරු සබඳතා රාශියක් ගොඩ නැගී තිබේ. සංවර්ධිත රටවලට වඩා වෙනස් වූ ග්‍රාමීය-නාගරික සබඳතා සංවර්ධනය වෙමින් පවතින රටවල දක්නට ලැබේ. එම රටවල කෘෂිකර්මාන්තය වාණිජකරණය වුවත් එය යුරෝපා කලාපයේ මෙන් ග්‍රාමීය භූමි පරිභෝගය වෙනස් කිරීමට තරම් දයක වී නොමැත. එයට හේතුව වන්නේ සංවර්ධිත රටවලට සාපේක්ෂ ව සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරික ප්‍රදේශ වර්ධනය වන්නේ ඒවායේ පර්යන්තය වන ග්‍රාමීය ප්‍රදේශ සමඟ බද්ධ වීමකින් තොර ව වීම ය (Mushi 2003). එම රටවල් ග්‍රාමීය ප්‍රදේශවලට වඩා ජාතික සහ ජාත්‍යන්තර ආර්ථිකය සමඟ බද්ධවීම හේතුවෙන් ග්‍රාමීය කෘෂි අංශය සහ නාගරික කාර්මික අංශය අතර සෘණාත්මක සබඳතාවක් වර්ධනය වී පවතී. නාගරික කර්මාන්ත දුරස්ථ පරිබාහිර ප්‍රදේශවලින් ගෙන එනු ලබන අමුද්‍රව්‍ය මත පදනම් වීම හේතුවෙන් නගර තුළ පවතින ලාභදායි ශ්‍රමය නිසා නව රැකියා උත්පාදනයෙන් ග්‍රාමීය අතිරික්ත ශ්‍රමය උරා ගැනීමට නොහැකිවන අතර මේ තුළින් ග්‍රාමීය කෘෂි අංශයේ නවීකරණය ප්‍රමාද කරනු ලැබේ.

සමහර ආසියානු රටවල ප්‍රාදේශීය ආර්ථිකයන් නිවැරදි සහ ශක්තිමත් ග්‍රාමීය-නාගරික සබඳතා නිසා වේගයෙන් වැඩෙන අතර තවත් රටවල දුර්වල ග්‍රාමීය-නාගරික සබඳතා නිසා ප්‍රාදේශීය ආර්ථිකයන් ඉතා පසුගාමී වී ඇත. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය-නාගරික සබඳතාවල පසුබිම සහ පවතින ස්වභාවය පිළිබඳ ව සලකා බැලීමේ දී නිදහසින් පසු කොළඹ වර්ධනයට මූලිකත්වය දුන් රාජ්‍ය ප්‍රතිපත්ති මත වර්තමානය වන විට කොළඹ පුරවර ප්‍රදේශය ශ්‍රී ලංකාවේ හරය බවට පත් වී අනෙකුත් බහුතර ග්‍රාමීය ප්‍රදේශ මන්දගාමී පර්යන්ත ප්‍රදේශ ලෙස පවතී. බස්නාහිර පළාත හැරුණුකොට ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත් කෘෂිකාර්මික පදනම මත වැඩෙන පළාත් වේ. මන්දගාමී පර්යන්තයේ තිබෙන ඌව, සබරගමුව, උතුරුමැද පළාත්වල ප්‍රාදේශීය ආර්ථිකය සඳහා කෘෂිකාර්මික දයකත්වය ඉතා ඉහළ ය. ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳ ව උතුරුමැද පළාතේ තෝරා ගන්නා ලද නාගරික මධ්‍යස්ථාන කිහිපයක සිදු කළ පර්යේෂණයකට අනුව හෙළි වූයේ එම නාගරික මධ්‍යස්ථානවල පර්යන්ත ප්‍රදේශයේ ගොවියාගේ ආර්ථිකය කෙරෙහි ග්‍රාමීය-නාගරික සබඳතා එතරම් වැදගත් නොවන බව යි. එම පළාතේ කුඩා නගර සමඟ සම්බන්ධවනවාට වඩා කොළඹ, කුරුණෑගල වැනි පිටස්තර විශාල නගර සමඟ ධනාත්මක ලෙස සම්බන්ධවීම එයට හේතුව යි (Rathnayake 2003). ශ්‍රී ලංකාවේ දඹුල්ල නගරය යනු, ආර්ථික වශයෙන් වටිනාකමක් සහිත නිෂ්පාදනයන්ගේ ඒකරාශී වීම සිදු වන එක් සංධිස්ථානයකි. එම වටිනාකම පදනම් කර ගනිමින්, තදාසන්න ප්‍රදේශවල ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතුවල නිරත වීම හේතුවෙන් නාගරික වැසියන් ග්‍රාමීය කෘෂිකාර්මික නිෂ්පාදන මත යැපීමත්, ග්‍රාමීය වැසියන් තම ආදායම සඳහා නගරය භාවිතයට ගැනීමත් බහුල ලෙස දක්නට ලැබේ. මෙම අන්තර් සබඳතාව තුළ කෘෂිකාර්මික ද්‍රව්‍ය ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික වෙළඳපොළට ගලා යාම, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල සිදු වන දෛනික හෝ සෘතුමය සංචලතාව,


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තාක්ෂණය හා තොරතුරු ගලා යාම හා මූල්‍යමය ගැලීම් ආදී සංකීර්ණ ක්‍රියාවලීන් රාශියක් පවතී. ඒ අනුව පුද්ගලික අවශ්‍යතා මත ගම හා නගරය සමඟ දෛනික ව සිදු වන අන්තර් සබඳතා අඛණ්ඩ ව පැවතීම එම ප්‍රදේශයේ ගුණක ඵල ඇති කරමින් ප්‍රාදේශීය සංවර්ධනයට දයක වේ. එසේ ලබා දෙන්නා වූ දයකත්වය පදනම් කරගෙන ග්‍රාමීය-නාගරික සබඳතා මඟින් ප්‍රාදේශීය සංවර්ධනයට සිදුවන බලපෑම හඳුනා ගැනීම මෙමඟින් විශේෂත්වයෙහි ලා සලකනු ලැබේ.

## සාහිත්‍ය විමර්ශනය

ගුනර් මිර්ඩාල් දක්වන ආකාරයට සංවර්ධනය යනු මුළු සමාජ ක්‍රමයේ ම ඉහළට එසවීමකි. සංවර්ධනය වූ කලී වෙනස් වීමකට වඩා වැඩිවීමකි. එය වෙනස්වීම නම්, එහි අර්ථයෙන් සමාජයීය, සංස්කෘතික, ආර්ථික වශයෙන් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව ද කෙරෙන වෙනස්වීම විය යුතු බව ඌ තාන්ට් විසින් පෙන්වා දේ. සංවර්ධනය යනු ආර්ථික ජනගහන සාධක පමණක් නොව සමාජීය, සංස්කෘතික, සදාචාර කරුණු ඇතුළත් වෙනස්කම් හා වැඩිවීම පිළිබඳ ක්‍රියාදාමයක් බව යුනෙස්කෝව හා දෙවැනි සංවර්ධන දශකය මඟින් නිර්වචනය කරයි (විතාරණ 2000). ඒ අනුව “සංවර්ධනය” යන යෙදුමට ඉහත සඳහන් කළ ආර්ථික අංශය හා සමාජීය අංශය යන දෙඅංශය ම ඇතුළත් වන අතර, එම අංශයන් හි ඇති වන ප්‍රමාණාත්මක හා ගුණාත්මක දියුණුව සංවර්ධනය පිළිබඳ සංකල්පයේ අන්තර්ගත වේ. ග්‍රාමීය ප්‍රදේශවල මූලික ආර්ථික කටයුත්ත කෘෂිකර්මය වන අතර නාගරික ප්‍රදේශවල මූලික ආර්ථික කටයුත්ත වන්නේ කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සහ සේවා සැපයීම යි. මෙම ප්‍රදේශ දෙක අතර සබඳතාවය ගොඩ නැඟෙන්නේ ග්‍රාමීය ජනතාව නාගරික භාණ්ඩ සහ සේවා මත යැපීමත්, නාගරික ජනතාව ග්‍රාමීය සම්පත් මත යැපීමත් නිසා ය. නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යුහාත්මක ලක්ෂණ අනුව මෙම ප්‍රදේශ එකිනෙකට වෙන් ව හඳුනා ගත්ත ද ඒවා නිරන්තරයෙන් ම එකිනෙකට බද්ධ ව ක්‍රියා කරයි. Jefferson පවසන පරිදි නගරවලට තනිව ම වර්ධනය විය නොහැකි අතර ග්‍රාමීය ප්‍රදේශවල අනුග්‍රහය ඒ සඳහා අවශ්‍ය වේ. Dauglas පවසන්නේ ග්‍රාමීය පුද්ගලයෙකුගේ දෛනික ජීවිතයට ග්‍රාමීය සහ නාගරික යන අවශ්‍යතා දෙකම ඇතුළත් බවයි (Mushi 2003).

ග්‍රාමීය-නාගරික සබඳතාවය සහ සමාජීය-ආර්ථික සංවර්ධනය පිළිබඳ ගුජරාට්හි ග්‍රාමයන් දෙකක් ඇසුරින් (Rural-urban Linkages and Socio-Economic Development: A case study of two villages in Gujarat) සිද්ධි අධ්‍යයනයක් සිදු කර ඇත. වෙනස් වූ ග්‍රාමයන් දෙකක් අතර පවතින ග්‍රාමීය-නාගරික සබඳතාවයේ ස්වභාවය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. කෘෂිකාර්මික නිෂ්පාදන, නිෂ්පාදන සඳහා යොදවන යෙදවුම්, ශ්‍රමය සහ ප්‍රාග්ධනය වැනි අංශයන් අධීක්ෂණය කිරීම සහ ග්‍රාමීය-නාගරික සබඳතාවය සහ සමාජීය-ආර්ථික සංවර්ධන මට්ටම අතර පවතින සබඳතාවය සඳහා බලපාන සාධක හඳුනා ගැනීම යන අනු අරමුණු ඔස්සේ අධ්‍යයනය සිදු කරන ලදී. ලබා ගත් දත්ත සහ තොරතුරු විශ්ලේෂණයන්ට අනුව ඌන සංවර්ධිත ප්‍රදේශවලට සාපේක්ෂ ව සංවර්ධිත ප්‍රදේශවල වාණිජ බෝග වැඩි වශයෙන් යොදා ගන්නා බවත්, කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන අංශයන් හි සේවා නියුක්තිය වැඩි බවත්, ග්‍රාමීය වැසියන්ගේ සාමාන්‍ය ආදායම ඉහළ ගොස් ඇති බවත් සහ මාර්ග, බැංකු, තැපැල් කාර්යාල වැනි මූලික යටිතල පහසුකම්හි සැළකිය යුතු සංවර්ධනයක් දක්නට ලැබෙන බවත් අනාවරණය වූ අතර දුර්වල ග්‍රාමීය-නාගරික සබඳතා සහිත ප්‍රදේශ ඌන සංවර්ධිත ප්‍රදේශ බවට පත් වන බවත් අනාවරණය විය (Pundir and Singh 2001).

Mushi විසින් 2003 දී ග්‍රාමීය-නාගරික සබඳතා තුළින් ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ යුරෝපයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් ආශ්‍රයෙන් (Regional Development through Rural-urban Linkage) පර්යේෂණයක් සිදු කර ඇත. ප්‍රධාන අරමුණ ලෙස බලපෑම් ප්‍රදේශය තුළ ග්‍රාමීය-නාගරික සබඳතා වර්ග හඳුනා ගැනීමත්, අනු අරමුණු වශයෙන් බලපෑම් ප්‍රදේශය තුළ සංවර්ධන මට්ටම් සහ ග්‍රාමීය-නාගරික සබඳතාවයේ ප්‍රමාණය විස්තර කිරීම, ග්‍රාමීය-නාගරික සබඳතාවන්හි ප්‍රබලතාවය සහ දුබලතාවය ඇගයීමට ලක් කිරීම, බලපෑම් ප්‍රදේශයේ නගරය සහ ජනාවාසයන්හි විශේෂ කේන්ද්‍රගතවීම පිළිබඳ විශ්ලේෂණය කිරීම, ග්‍රාමීය-නාගරික ප්‍රදේශවල ජීවනෝපායන් හි භූමිකාව උසස් කිරීම පිළිබඳ තක්සේරුකරණයන් සිදු කිරීම සහ ග්‍රාමීය-නාගරික සබඳතා සහ ජීවනෝපාය උසස් කිරීම උදෙසා ක්‍රියාමාර්ග ක්‍රමවත් ව දක්වීම ඉස්මතු කර පෙන්වනු ලැබේ. සමාජ, ආර්ථික, තාක්ෂණික සහ සේවා පහසුකම් යන අංශ යටතේ ග්‍රාමීය-නාගරික සබඳතා පවතින බවත් ග්‍රාමීය ප්‍රදේශ සහ නාගරික ප්‍රදේශ අතර ප්‍රබල සබඳතාවක් පවතින බවත් සොයා ගන්නා ලදී. Tacoli විසින් 2002 දී ග්‍රාමීය-නාගරික අන්තර් ක්‍රියාවන්ගේ වෙනස්වීම සහ ඔවුන්ගේ ජීවනෝපායට වූ බලපෑම උපසහරානු අප්‍රිකාවේ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රයෙන් (Changing Rural-urban Ineractions in Sub-saharan Africa and their Impact on Livelihoods: A Summary) පර්යේෂණයක් සිදු කර ඇත. මෙම අධ්‍යයනය උදෙසා කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ නාගරික මධ්‍යස්ථාන හා ඒ වටා පිහිටි ප්‍රදේශයන්හි අවකාශීය සබඳතාවය, ආර්ථික ක්‍රියාකාරකම්හි ස්වභාවය වෙනස්වීම සහ ග්‍රාමීය-නාගරික ප්‍රදේශයන්හි ජීවනෝපායන්ගේ විවිධත්වය අරමුණු කරගනු ලැබීය. පිහිටීම, සෞඛ්‍යය, ස්ත්‍රී පුරුෂභාවය, පරම්පරාව සහ ජනවර්ගය යන වැදගත් සාධක මත පදනම් ව ජීවනෝපායන්ගේ සැලකිය යුතු වෙනසක් පවතින බවත් තරුණ පරම්පරාව වැඩි වශයෙන් බහු ක්‍රියාකාරකම් හි නිරත වන බවත් ඒ හේතුවෙන් ග්‍රාමීය-නාගරික සබඳතා තීව්‍ර වන බවත් මෙම අධ්‍යයනය ඇසුරින් සොයා ගන්නා ලදී.

Riley විසින් 2013 දී පුද්ගලයන්ගේ සංචලතාවය, ආහාර භාවිතය සහ ග්‍රාමීය-නාගරික සබඳතාවය අප්‍රිකාවේ Blantyre සහ Malawi නගර ඇසුරු කරගනිමින් (Gendered Mobilities, Food Access and Rural-urban Linkages in Blantyre, Malawi) පර්යේෂණයක් සිදු කර ඇත. ආහාරවල විවිධත්වය, මිල සහ තත්ත්වය සඳහා පුද්ගලයන්ගේ සංචලතාවයේ බලපෑම අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රධාන අරමුණ වන අතර ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ග්‍රාමීය-නාගරික සබඳතාවයේ වැදගත්කම අධ්‍යයනය කිරීම ද තවත් එක් අරමුණකි. මෙම අධ්‍යයනය තුළින් ආර්ථික, දේශපාලනික මෙන් ම සමාජීය වශයෙන් ග්‍රාමීය-නාගරික සබඳතා පවතින බවත්, ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවය උදෙසා අවම බලපෑමක් සහිතව ආහාර මිලදී ගැනීම සඳහා ග්‍රාමීය සහ උප නාගරික ප්‍රදේශයන්හි පුද්ගලයන්ගේ සංචලතාවය වඩා වැදගත් වන බවත් සොයා ගන්නා ලදී.

Jayathilaka and Mahaliyanarachchi විසින් 2007 දී එළවළු සහ පළතුරු පාරිභෝගිකයින්ගේ හැසිරීමේ රටාව මොණරාගල දිස්ත්‍රික්කයේ සතිපොළ ඇසුරින් (Behavioral Pattern of Fruit and Vegetable Consumers in the .POLA. System in Monaragala District in SriLanka) පර්යේෂණයක් සිදු කර ඇත. මෙහිදී ග්‍රාමීය නිෂ්පාදන සහ නාගරික වෙළඳපළ අතර අන්තර් සබඳතාවය, සමාජ ආර්ථික ලක්ෂණ සහ මිලදීගැනීමේ රටාවන් අධ්‍යයනය කරනු ලැබේ. මෙම අධ්‍යයනයට අනුව පාරිභෝගිකයින්ගෙන් 77% ක් පමණ මොණරාගල දිස්ත්‍රික්කයේ සතිපොළෙහි නියත ගැනුම්කරුවන් වන බවත් එයට ප්‍රධානම හේතුව වශයෙන් එළවළු සහ පළතුරුවල නැවුම් බව සහ මිල අඩුවීම බවත් සොයා ගන්නා ලදී. එම සොයා ගැනීම්වලට අනුව ආර්ථික වශයෙන් ග්‍රාමීය-නාගරික සබඳතා වර්ධනය වී ඇති බව අනාවරණය විය. රත්නායක සහ ගොඩගේ විසින් 2001 දී කළුතර දිස්ත්‍රික්කයේ පොළ පිළිබඳ අධ්‍යයනයක් සිදු කර ඇත. පොළෙහි ක්‍රියාකාරිත්වය, පැවැත්ම, වර්ධනය, සැලැස්ම, පරිපාලනය සහ වෙළඳ කටයුතු සිදුවන ආකාරය ආදිය විමර්ශනය කිරීම මෙහි අරමුණ විය. පොළේ පැවැත්ම සහ වර්ධනය උදෙසා ග්‍රාමීය වශයෙන් පවතින අන්තර් සබඳතාවය පිළිබඳ සොයා බැලීම ද මෙහි අනු අරමුණක් වේ. ගැනුම්කරුවන්ගෙන් 37% ක් වෙළඳ වෘත්තියේ ද, 16% ක් කම්කරු වෘත්තියේ ද, 12% ක් ගොවිතැනෙහි ද, 11% ක් ගුරු වෘත්තියේ සහ 24% ක් වෙනත් වෘත්තීන් හි හෝ රැකියාවක් නොමැති පුද්ගලයන් ද වන බව සොයා ගන්නා ලද අතර භාණ්ඩ මිලදී ගැනීම සඳහා පොළ තෝරාගෙන තිබුණේ සමාජයේ මධ්‍යම පන්තියේ සහ පහළ පෙළේ ආදායම් ලබන පුද්ගලයන් පිරිසක් බව මින් අනාවරණය කරන ලදී. ඒ අනුව ග්‍රාමීය පුද්ගලයන් විවිධ අරමුණු උදෙසා නගරය සමඟ සබඳතා පවත්වන බවත්, ග්‍රාමීය-නාගරික සබඳතා පුළුල් ලෙස වර්ධනය වී ඇති බවත් සොයා ගන්නා ලදී.

## පර්යේෂණ ගැටලුව

වර්තමාන ගෝලීය ප්‍රවණතාව තුළ ග්‍රාමීය-නාගරික සබඳතා ප්‍රාදේශීය සංවර්ධනයේ මූලික සාධකයක් ලෙස සැලකීම සහ ගෝලීයකරණය හරහා මෙම ප්‍රදේශ අන්‍යෝන්‍ය වශයෙන් වඩා සමීප කරවන හේතු සාධක ක්‍රියාත්මක කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි. ඒ අනුව තවදුරටත් ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් සලකා ඒ මත ක්‍රියා කිරීම නොව ඒවා අතර පවතින අන්තර් පරායත්තතාව හඳුනාගෙන ඒ මත ක්‍රියා කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා ග්‍රාමීය නාගරික සබඳතාවන්ගේ බලපෑම කෙසේද යන්න හඳුනා ගැනීම මෙහි සුවිශේෂත්වය වේ. ඒ තුළින් ග්‍රාමීය-නාගරික සබඳතා ආශ්‍රිත ගැටලු හඳුනා ගැනීම සහ ග්‍රාමීය-නාගරික සබඳතා වැඩි දියුණු කිරීම සඳහා සංවර්ධන විභවතා හඳුනා ගැනීම දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශය ඇසුරින් අධ්‍යයනය කර ඇත.

## පර්යේෂණ අරමුණු

දඹුල්ල නගරය හා තදසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා ඇති වීම සඳහා බලපාන සාධක හඳුනා ගැනීම තුළින් ප්‍රාදේශීය සංවර්ධනයට සිදු වන බලපෑම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර දඹුල්ල නගරය හා තදසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා වර්ග හඳුනා ගැනීම,දඹුල්ල නගරය හා තදසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා ආශ්‍රිත ව ඇති ගැටලු හඳුනා ගැනීම හා දඹුල්ල නගරය හා තදසන්න ප්‍රදේශය වැඩි දියුණු කිරීම උදෙසා ඇති සංවර්ධන විභවතාවයන් හඳුනා ගැනීම අනු අරමුණ වේ.


## පර්යේෂණයේ වැදගත්කම

ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා ග්‍රාමීය-නාගරික සබඳතාවන්හි බලපෑම පිළිබඳව ලෝකය තුළ බොහෝ අධ්‍යයන සිදු කර ඇතත් ශ්‍රී ලංකාව තුළ ඒ පිළිබඳව අධ්‍යයනයන් හමු වන්නේ ඉතා අල්ප වශයෙන් ය. ප්‍රාදේශීය සංවර්ධන හා සමගාමී ව සංචාරක කර්මාන්තය, පොහොර සහනාධාරයන්ගේ බලපෑම වැනි විවිධ අංශයන් ඔස්සේ අධ්‍යයනයන් සිදු කර ඇතත් ග්‍රාමීය-නාගරික සබඳතාවන්හි බලපෑම සමඟ සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකාව තුළ සිදු කර ඇති පර්යේෂණයන් හමු නොවන තරම් ය. ග්‍රාමීය නිෂ්පාදන සහ නාගරික වෙළඳපොළ ඇසුරු කර ගනිමින් විවිධ අධ්‍යයනයන් සිදු කර ඇතත් ග්‍රාමීය-නාගරික සබඳතාවන් වර්ග, ඒ ආශ්‍රිත ගැටලු අරමුණු කර ගනිමින් කිසිදු පර්යේෂණයක් සිදු කර නොමැති නිසා මෙම අධ්‍යයනය අනෙක් පර්යේෂණයන්ට වඩා වෙනස් වේ. ශ්‍රී ලංකාව තුළ මෑතක දී මෙවැනි අධ්‍යයනයක් සිදු කර නොමැති වීමත්, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ දඹුල්ල නගරය ඇසුරු කර ගනිමින් මෙවැනි පර්යේෂණයක් සිදු කර නොමැති වීමත් මෙම අධ්‍යයනයේ ඇති වැදගත්කමකි.

## පර්යේෂණ ක්‍රමවේදය


මෙම අධ්‍යයනය සඳහා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමනිළධාරි වසම් 56 අතරින් ග්‍රාමනිළධාරි වසම් හයක් තෝරා ගන්නා ලදී. එය දඹුල්ල නගරයේ සිට විවිධ දුරින් යුක්ත ව එනම්, කිලෝමීටර් බින්දුවත් පහත්, පහත් දහයත්, දහයට වැඩි වශයෙන් කොටස් කර එක් කොටසකින් ග්‍රාමනිළධාරි වසම් දෙකක් වශයෙන් සමස්ත නියැදිය ලෙස ග්‍රාමනිළධාරි වසම් හයක් ද එම වසම් තුළින් එක් ග්‍රාමයක් බැගින් ද අරමුණුගත සසම්භාවී නියැදිය ඇසුරින් තෝරා ගන්නා ලදී. එම ග්‍රාමයන් හි පදිංචි පුද්ගලයන් 100 ක් සඳහා සරල සසම්භාවී නියැදියට අනුව ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම තුළින් දත්ත රැස් කර ගන්නා ලදී.


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**රූපසටහන් අංක 1:** තදසන්න ප්‍රදේශයේ ජනයා නගරයට පැමිණීමේ අවශ්‍යතාව

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2014




**සිතියම් අංක 1:** කෘෂි අස්වැන්න අලෙවිය සඳහා තෝරාගන්නා ලද ග්‍රාමයන්හි පුද්ගලයන්ගේ සංචලතාව

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2014

## සාකච්ඡාව

නගරයක කාර්යමය සංකේන්ද්‍රණය එම ප්‍රදේශයේ සංවර්ධනයට මහත් රුකුලක් වේ. දඹුල්ල නගරයේ කාර්යයමය සංකේන්ද්‍රණය වාණිජ කාර්යයන්, නිෂ්පාදන කර්මාන්ත සහ සේවා පහසුකම් යනුවෙන් වර්ග කිරීම තුළින් දඹුල්ල නගරය තුළ පවත්නා කාර්යයන්ගේ සංකේන්ද්‍රණය විවිධ අංශයන් ඔස්සේ හඳුනා ගත හැකි ය. දඹුල්ල නගරය තුළ සිදු කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව එහි කාර්යයමය සංකේන්ද්‍රණයේ විශේෂත්වයක් දක්නට ලැබුණි. වර්ග කරන ලද කොටස් තුනහිම මනා සංකේන්ද්‍රණයක් දක්නට ලැබීම එම විශේෂත්වය යි. ඒ අනුව බලන කල 58% ක් පමණ වෙළඳ හා වාණිජ කාර්යයන්හි සංකේන්ද්‍රණයක් දක්නට ලැබුණි. එහි විවිධ වර්ගයේ වෙළඳ හා වාණිජ කටයුතු අන්තර්ගත වී තිබුණි. එවගේ ම නිෂ්පාදන හා කර්මාන්ත 17% ක් පමණ ද සේවා පහසුකම් 25% ක් පමණ ද දඹුල්ල නගරය තුළ සංකේන්ද්‍රණය වී තිබෙනු දක්නට ලැබුණි.

ප්‍රධාන වශයෙන් ම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය පිහිටා තිබීම හේතුවෙන් ඒ ආශ්‍රිත ව තොග බඩු වෙළඳසැල්, සිල්ලර බඩු වෙළඳසැල් සහ පළතුරු වෙළඳසැල් මෙන් ම එළවළු වෙළඳසැල් ද සැලකිය යුතු ප්‍රමාණයකින් ස්ථාපිත වී ඇත. ඊට අමතර ව ජනයාගේ විවිධ අවශ්‍යතා අනුව රෙදිපිළි, පාවහන්, ගෘහවිදුලි උපකරණ, කෘෂි රසායන ද්‍රව්‍ය, කෘෂි උපකරණ, ස්වර්ණාභරණ, වාහන, පාසැල් ලිපි ද්‍රව්‍ය වැනි විවිධ අවශ්‍යතා ඉටු කරන වෙළඳ හා වාණිජ කටයුතුවල ස්ථානගතවීමක් දඹුල්ල නගරය තුළ දැකගත හැකිවේ. වාණිජමය කාර්යයන්ගේ සංකේන්ද්‍රණය සලකා බැලීමේ දී ඉහළ පෙළේ සේවා සපයනු ලබන Food City, Co-op City මෙන් ම Family Care වැනි කාර්යයන් ද සංකේන්ද්‍රණය වී තිබෙනු දක්නට ලැබේ. ඊට අමතරව ARPICO, DAMRO වැනි ප්‍රදර්ශනාගාර පහක් ද මෙම නගරය තුළ දක්නට ලැබේ. ඒ වගේ ම අවශ්‍ය ගෘහ විදුලි උපකරණ, වාහන මිලදී ගැනීම සඳහා ද ඒවාට අවශ්‍ය අනෙකුත් සේවා සැපයීම සඳහා ද පහසුකම් ස්ථාපිත වී තිබේ. ඒ වගේ ම පාසැල් උපකරණ, කෘෂිකටයුතු සඳහා අවශ්‍ය උපකරණ හා කෘෂිද්‍රව්‍ය, විසිතුරු කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මෙන් ම නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයනු ලබන අලෙවිසැල් ද දඹුල්ල නගරය තුළ සැලකිය යුතු ප්‍රමාණයක් දක්නට ලැබේ. ඒ අනුව බලන කළ වෙළඳ හා වාණිජමය වශයෙන් තදසන්න ප්‍රදේශයේ ජනයා රඳවා තබා ගත හැකි මට්ටමේ වර්ධනයක් දඹුල්ල නගර තුළ දක්නට ලැබෙන බව කාර්යයන්ගේ සංකේන්ද්‍රණය තුළින් වටහා ගත හැකි ය.

දඹුල්ල නගරය වටා ඇති ග්‍රාමීය ප්‍රදේශවල ජනයා විවිධ අවශ්‍යතා එනම්, භාණ්ඩ මිලදී ගැනීම, කෘෂි භාණ්ඩ මිලදී ගැනීම සහ කෘෂි අස්වැන්න අලෙවිය යන වාණිජ කාර්යයන් ආශ්‍රිත කටයුතු සඳහා නගරය සමඟ සම්බන්ධ වීම කැපී පෙනේ. දඹුල්ල නගරය සේවා මධ්‍යස්ථානය ලෙස සලකමින් තදසන්න ප්‍රදේශවල ජනයා 75% ක් පමණ නගරයට පැමිණෙන්නේ කෘෂි අස්වැන්න අලෙවිය සඳහා ය. තදසන්න ප්‍රදේශවල ජනයාගේ ජීවනෝපාය වැඩි වශයෙන් කෘෂිකර්මාන්තය මත රඳා පවතින බැවින් වෙළඳ කටයුතු උදෙසා ජනයා නගරයට පැමිණීම මෙම නගරයේ ප්‍රධාන ලක්ෂණයකි. ඊට අමතර ව බැංකු හා මූල්‍ය කටයුතු සඳහා 70% ක් ද භාණ්ඩ මිලදී ගැනීම සඳහා 50% ක් ද වශයෙන් පුද්ගලයන්ගේ සංචලතාවය විවිධ වශයෙන් ඉහළ මට්ටමක් පෙන්නුම් කෙරේ (රූපසටහන් අංක 1).

ඒ අනුව, කෘෂි අස්වැන්න අලෙවිය සඳහා තදසන්න ප්‍රදේශයේ ජනයා දඹුල්ල නගරයට සංචලනය වීම හා ග්‍රාමීය-නාගරික සබඳතා ඇති වීම අතර සබඳතාවක් පවතින බව කාල්පියර්සන් කයිවර්ග පරීක්ෂාව (p අගය 0.000)




© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තුළින් මොනවට පැහැදිලි වේ. දඹුල්ල නගරය සහ තදාසන්න ප්‍රදේශය කෘෂි අස්වැන්න අලෙවිය සඳහා නගරය සමඟ පවත්වනු ලබන සබඳතාවන්ගේ තීව්‍රතාව, ග්‍රාමීය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. එම වෙනස ප්‍රධාන වශයෙන් ම පාදක වන්නේ පුද්ගලයන්ගේ ජීවනෝපාය සහ මාර්ග පහසුකම් මත ය. කෘෂිකාර්මික ජීවනෝපායක් පවතින පුද්ගලයින් ජීවත්වන කණ්ඩලම, වැවලවැව යන ප්‍රදේශවල පුද්ගලයින් වැඩි වශයෙන් ද වෙනත් රැකියාවල නියුතු පුද්ගලයින් සිටින දඹුලුගම, යාපාගම වැනි ප්‍රදේශවල අඩු වශයෙන් ද සංචලතාවයක් පෙන්නුම් කරයි. නගරයේ සිට පවතින දුර වැඩි වුව ද මාර්ග පහසුකම්වල කාර්යක්ෂමතාව නිසා දුරින් පිහිටි ප්‍රදේශ ද කෘෂි අස්වැන්න අලෙවිය සඳහා වැඩි තීව්‍රතාවක් පෙන්නුම් කරයි (සිතියම් අංක 1).

භාණ්ඩ මිලදී ගැනීම සඳහා පුද්ගලයන්ගේ සංචලතාව පිළිබඳ සලකා බැලීමේදී දඹුල්ල නගරයට ආසන්න ගම් වන දඹුලුගම සහ යාපාගම සිටින පුද්ගලයන් භාණ්ඩ මිලදී ගැනීම සිදු කරනු ලබන්නේ නගරයෙන් ය. එනම්, දඹුලුගම 12% ක් ද යාපාගම 10% ක් ද වශයෙන් භාණ්ඩ මිලදී ගනු ලබන්නේ නගරයෙනි. නමුත් නගරයේ සිට ගමට පවතින දුර වැඩිවන විට පවත්වන සම්බන්ධතාවේ ප්‍රමාණය ද අඩු මට්ටමක් පෙන්නුම් කරයි. කණ්ඩලම, වැවල වැව, දිගම්පතහ ග්‍රාමයන්හි පුද්ගලයන් වැඩි ප්‍රතිශතයක් භාණ්ඩ මිලදී ගනු ලබන්නේ ගමේ වෙළඳසැලෙනි. එම හේතුවෙන් නගරයේ සිට පවතින දුර වැඩිවන විට භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන පුද්ගලයන්ගේ ප්‍රමාණය අඩු බවක් දක්නට ලැබේ. ඒ අනුව 26% ක් වැවලවැව ග්‍රාමයෙන් ද, 3% ක් ඉනාමලුව ග්‍රාමයෙන් ද, 17% ක් කණ්ඩලම ග්‍රාමයෙන් ද භාණ්ඩ මිලදී ගනු ලබන්නේ ගමේ වෙළඳසැලෙනි.

දඹුල්ල නගරයේ කාර්යයමය සංකේන්ද්‍රණය තුළ වැදගත් අංශයක් ලෙස නිෂ්පාදන කර්මාන්ත දැක්විය හැකි ය. නිෂ්පාදන කර්මාන්තයන්ගේ ඒකරාශීවීම සලකා බලන විට වාණිජ හා වෙළඳ කාර්යයන්ගේ සංකේන්ද්‍රණයට වඩා අඩු අගයකින් පවතී. එය ප්‍රමාණාත්මක ව 92 ක් පමණ වන අතර ප්‍රතිශතාත්මක ව 17% කි. මෙහිදී නිෂ්පාදන කර්මාන්තයන් ලෙස මහා පරිමාණයේ කර්මාන්තශාලාවන්ගේ ස්ථානගත වීමක් දක්නට නොලැබුණ ද පුද්ගලයන්ගේ එදිනෙද ජීවිතයන්ට මහත් රුකුලක් වන අත්‍යවශ්‍ය ම අවශ්‍යතාවන්ගේ ඒකරාශී වීමක් දඹුල්ල නගරය තුළ දක්නට ලැබේ. සංචාරක කටයුතු හා වෙළඳ කටයුතු හේතුවෙන් දඹුල්ල නගරය බොහෝ පුද්ගලයන්ගේ සංචලතාවට පාදක වන නගරයක් වීමත් එම පුද්ගලයන්ගේ ආහාර අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය වන පරිදි හෝටල්වල ඒකරාශී වීමක් දක්නට ලැබේ. දඹුල්ල නගරය තුළ 41 ක් පමණ හෝටල් දක්නට ලැබෙන අතර ඒවායින් බොහෝමයක් දිවා රාත්‍රි සේවයන් සපයනු ලැබේ. එය ප්‍රතිශතාත්මක ව 44% ක් පමණ වේ. ඊට සම්ගාමී ව බේකරි නිෂ්පාදන සිදු කරන ස්ථාන 05 ක් ද නගරය තුළ දක්නට ලැබේ. එසේ ම සැලූන් 12, ලී වැඩපළවල් හතක්, මුද්‍රණාල පහක් වශයෙන් විවිධ නිෂ්පාදන කර්මාන්ත නගරය තුළ ස්ථාපිත වී පවතී. ඊට අමතර ව ඇඹරුම්හල්, ජායාරූපගතකරණ ස්ථාන, ඇඳුම් මසන ස්ථාන, ඉන්ධන පිරවුම්හල් වැනි විවිධ කාර්යයන් නගරය තුළ දක්නට ලැබේ. මෙම කාර්යයන්ගේ සංකේන්ද්‍රණය හේතුවෙන් දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ නිෂ්පාදන සබඳතාවන් ද දක්නට ලැබේ. නිෂ්පාදන කාර්යයන් සඳහා ශ්‍රමය ගලා ඒම සිදු වන්නේ ග්‍රාමීය ප්‍රදේශවලිනි. එම නිෂ්පාදන කර්මාන්තයන් හි හිමිකරුවන්, කුලියට වැඩ කරන පුද්ගලයන් සියල්ලන් ම පාහේ ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශවලට ශ්‍රමය සැපයීමට පැමිණෙන පුද්ගලයන් වේ. නගරය තුළ දක්නට ලැබෙන නිෂ්පාදන සහ කර්මාන්තයන්හි සංකේන්ද්‍රණය හේතුවෙන් තදසන්න ප්‍රදේශවල ජනයා රැකියා කටයුතු සඳහා දෛනික ව නගරයට සංචලනය වේ (සිතියම් අංක 2). එම සංචලනය ග්‍රාමීය-නාගරික සබඳතාවන් ඇතිවීමට හේතුවේ යන්න කාල්පියර්සන් කයිවර්ග පරීක්ෂාව තුළින් (p අගය 0.005) ගම්‍යමාන විය.




**සිතියම් අංක 2**: රැකියා කටයුතු සඳහා තෝරා ගන්නා ලද ග්‍රාමයන්හි පුද්ගලයන්ගේ සංචලතාව

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2014

නගරයක් යනු සේවා පහසුකම් සපයනු ලබන ප්‍රධාන ස්ථානය වේ. දඹුල්ල නගරය තුළ ද සැලකිය යුතු ප්‍රමාණයේ සේවාවන් රාශියක් ඒකරාශී වී පවතී. රාජ්‍ය ආයතන මෙන් ම පෞද්ගලික ආයතනවලද මනා ඒකරාශී වීමක් දඹුල්ල නගරය තුළ දක්නට ලැබේ. එය ප්‍රතිශතාත්මක ව දක්වුවහොත් 25% ක් පමණ වේ. අධ්‍යාපනය, සෞඛ්‍යය, පරිපාලනය, සන්නිවේදන සහ විනෝදාත්මක කටයුතු යන සේවාවන්ගේ සංකලනයක් දඹුල්ල නගරය තුළ දැකගත හැකි වේ. දඹුල්ල නගරය තුළ අධ්‍යාපන, පරිපාලන, සෞඛ්‍යය, සංචාරක, ප්‍රවාහන, බැංකු හා මූල්‍ය, විනෝදාත්මක මෙන් ම සන්නිවේදන යන සේවාවන් සැපයීම සඳහා සේවා


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මධ්‍යස්ථාන ස්ථාපිත වී පවතී. අධ්‍යාපන කටයුතු සඳහා රජයේ පාසැල් දෙකක් ද, පෞද්ගලික පාසැලක් ද දඹුල්ල නගරය තුළ ස්ථාපිත වී ඇත. බැංකු හා මූල්‍ය කටයුතු සැලකීමේ දී බැංකු විසිහතරක් ද, ලීසිං හා ෆිනෑන්ස් ආයතන දහයක් ද රක්ෂණ සමාගම් දෙකක් ද පිහිටා ඇත. ඊට අමතර ව පොලීසිය, නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැනි රජයේ ආයතන ද සෞඛ්‍යය පහසුකම් සඳහා පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන, අක්ෂි රසායනාගාර, ලේ මූත්‍රා පරික්ෂණාගාර, රජයේ රෝහල් වැනි බොහෝ සේවා මධ්‍යස්ථාන නගරය තුළ දක්නට ලැබේ. ඊට අමතර ව ට්‍රැවලර් කැෆේ, ඉඩම් වෙන්දේසි ආයතන, නිවාස සැලසුම් සැකසීමේ ආයතන, විදේශ රැකියා ආයතන මෙන් ම ආදයම් බදු උපදේශක ආයතන වැනි විශේෂිත සේවා සපයනු ලබන ආයතන දක්නට ලැබීම ද විශේෂත්වයකි.

දඹුල්ල නගරය තුළ බැංකු 24 ක් පමණ ඒකරාශී වී ඇති බව හඳුනාගත හැකි ය. ලංකා බැංකුව, මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව වැනි රාජ්‍ය මෙන් ම පෞද්ගලික බැංකු රාශියක් ශාඛාවන් කිහිපයකින් යුක්ත ව දඹුල්ල නගරය පුරා ව්‍යාප්ත ව පවතී. වෙළඳපොළ පදනමක් සහිත නගරයක් වීම හේතුවෙන් ජනයාගේ මූල්‍ය කටයුතු පහසු කරවීම උදෙසා මෙලෙස ව්‍යාප්තියක් ඉතා අගනේ ය. නගරයක් තුළ දක්නට ලැබෙන බැංකු, ෆිනෑන්ස් සහ ලීසිං ආයතන, රක්ෂණ සමාගම් හේතුවෙන් තදසන්න ප්‍රදේශය මූල්‍යමය සබඳතා ඇති කරගනු ලබයි. ආදයම් ගලනය, මූල්‍ය කටයුතු හා ප්‍රාග්ධන ගලනය යනාදිය මූල්‍යමය සබඳතා ලෙස වැදගත් වේ. නාගරික මධ්‍යස්ථානවල පිහිටි බැංකු හා වෙනත් මූල්‍ය ආයතන ග්‍රාමීය ජනතාවට අවශ්‍ය ණය ලබා ගැනීමට පහසුකම් සපයන අතර ම ඉතිරිකිරීම සඳහා පොළඹවනු ලබයි. එය පෞද්ගලික මෙන් ම ප්‍රාදේශීය වර්ධනයට ද හේතු වේ. දඹුල්ල නගරය තුළ පෞද්ගලික බැංකු 12 ක් හා රාජ්‍ය බැංකු 12 ක් වශයෙන් සමාන ලෙස ව්‍යාප්ත වී ඇත. ඒ අනුව දඹුල්ල නගරය තුළ සංකේන්ද්‍රණය වී ඇති මූල්‍ය ආයතන හේතුවෙන් නගරය සහ තදසන්න ප්‍රදේශය අතර සබඳතාවක් ඇති කිරීමට හේතු වී ඇත. දඹුල්ල නගරය හා තදසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා ඇතිවීම සහ බැංකු කටයුතු සඳහා නගරයට යාම අතර මූල්‍ය සබඳතා ගොඩනැගී ඇති බව කාල්පියර්සන් කයිවර්ග පරික්ෂාවට අනුව (p අගය 0.044) නිගමනය කළ හැකි ය.


දඹුල්ල නගරය තුළ සේවා පහසුකම්හි සංකේන්ද්‍රණය සලකා බැලීමේදී සෞඛ්‍යය පහසුකම් සඳහා වැඩි නැඹුරුතාවක් දක්වන බව දක්නට ලැබේ. දඹුල්ල නගරය තුළ දිස්ත්‍රික් මූලික රෝහලක් පිහිටා ඇති අතර තදසන්න ප්‍රදේශවල පුද්ගලයන්ගේ සෞඛ්‍යය පහසුකම් සපයා ගැනිම උදෙසා පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන පහක් ද ස්ථාපිත වී පවතී. එවගේ ම බටහිර ඔසුසැල් 11 ක් ද, දේශීය ඔසුසැල් දෙකක් ද නගරය තුළ සංකේන්ද්‍රණය වි පවතී කාල්පියර්සන් කයිවර්ග පරික්ෂාවට අනුව, දඹුල්ල නගරය හා තදසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා ඇතිවීම සහ සෞඛ්‍යය කටයුතු සඳහා නගරයට යාම අතර සබඳතාවක් (p අගය 0.028) පවතින බැව් පැහැදිලි විය. දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු සඳහා පුද්ගලයන්ගේ සංචලතාවය සුවිශේෂී ස්ථානයක් හිමි කර ගනී. එයට හේතුව වන්නේ දඹුල්ල නගරය තුළ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය සේවාවන් සපයනු ලබන මධ්‍යස්ථානයන් කිහිපයක් ස්ථාපිත වීම යි. දඹුල්ල නගරයට ආසන්න ව පිහිටි දඹුලුගම සහ යාපාගම යන ග්‍රාමයන්හි ළමුන් ප්‍රධාන වශයෙන් ම දඹුල්ල ප්‍රාථමික විද්‍යාලය සහ දඹුල්ල ජාතික පාසැල තම අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගනී. නමුත් නගරයෙන් දුරස්වන විට එම ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවා ඇති පාසැල් හේතුවෙන් ළමුන්ගේ දඹුල්ල නගරයට සිදුවන සංචලතාව අඩු වුව ද සංස්කෘතික මධ්‍යස්ථානය, දඹුල්ල කාර්මික විද්‍යාලය සහ ශ්‍රී සුමංගල වෘත්තී පුහුණු මධ්‍යස්ථානය වැනි අධ්‍යාපනික සේවා සපයනු ලබන මධ්‍යස්ථාන මගින් තදසන්න ප්‍රදේශවල ළමුන්ගේ අධ්‍යාපනික තත්ත්වයන් විවිධ අංශයන් ඔස්සේ ඔප් නංවා ගැනීමට පහසුකම් සලසා ඇත. එම හේතුවෙන් තදසන්න ප්‍රදේශවල ළමුන් විවිධ පුහුණු ආයතන මඟින් තමන්ගේ හැකියාවන් පරිපූර්ණ කර ගැනීමට දඹුල්ල නගරය හා සබඳතා පවත්වනු ලබයි. තෝරා ගන්නා ලද නියැදිය සලකා බැලීමේ දී අධ්‍යාපන කටයුතු සඳහා ළමුන් නගරයට පැමිණෙන්නේ ඉතා සුළු ප්‍රමාණයකිනි. එය 25% ක් පමණ වේ. 75% ක් පමණ අධ්‍යාපනය ලබන්නේ ග්‍රාමීය පාසැල් වල ය. සංවර්ධන මට්ටමක් පවතින මෙම ග්‍රාමයන්හි පාසැල් පිහිටා තිබීම හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා ළමුන්ගේ පැමිණීම ඉතාම අඩු ය. නගරයට ආසන්න ව පිහිටා ඇති යාපාගම, දඹුලුගම වැනි ප්‍රදේශවල ළමුන් සියල්ලන් ම පාහේ නාගරික පාසැල්වල අධ්‍යාපනය ලබති. දුර ප්‍රමාණය වැඩිවීමත්, ග්‍රාමීය පාසැල්වල අවශ්‍ය පහසුකම් ස්ථාපිත වී පැවතීමත් හේතුකොට ගෙන ළමුන්ගෙන් වැඩි ප්‍රමාණයක් ග්‍රාමීය පාසැල්වල අධ්‍යාපනය ලබති. ඒ හේතුවෙන් අධ්‍යාපනය සඳහා පුද්ගලයන්ගේ සංචලතාව අඩු මට්ටමක පවතින අතර එය ආසන්න ප්‍රදේශවලට පමණක් සීමා වී පවතී.


සේවා පහසුකම් යටතේ හඳුනා ගත හැකි තවත් එක් ප්‍රධාන පහසුකමක් වන්නේ පරිපාලන කටයුතුවල ස්ථානගත වීම යි. පරිපාලන කටයුතු ස්ථානගතවීම නගරයක අනන්‍යතාව පිළිඹිබු කරන්නකි. දඹුල්ල නගරය තුළද පරිපාලන කටයුතු ආශ්‍රිත පහසුකම් ස්ථාපිත වී පවතී. මහනගර සභාව, ප්‍රදේශිය ලේකම් කාර්යාලය වැනි ආයතන ස්ථාපිතවීම මගින් තදසන්න ප්‍රදේශවල ජනයාගේ අවශ්‍යතා සපුරා ගැනීමට මහඟු දයකත්වයක් සපයනු ලැබේ. පරිපාලන කටයුතු සඳහා දෛනික ව පුද්ගලයන් සංචලනය නොවන අතර අවශ්‍ය වූ අවස්ථාවේ දී සබඳතා ඇති කර ගනු ලබන්නේ දඹුල්ල නගරය සමඟ වේ. එසේ ඇති කර ගනු ලබන සබඳතාව ග්‍රාමීය-නාගරික සබඳතා තීව්‍ර කිරීම කෙරෙහි බලපෑමක් සිදු කරන්නේ ද යන්න පිළිබඳ ව සංඛ්‍යාත්මක ව විශ්ලේෂණය කරන ලදී දඹුල්ල නගරය හා තදසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා ඇති වීම සහ පරිපාලන කටයුතු සඳහා නගරයට යාම අතර සබඳතාවක් තිබේ යන්න කාල්පියර්සන් කයිවර්ග පරික්ෂාව අනුව (p අගය 0.027) සනාථ විය. දෛනික සංචලතාව ද ග්‍රාමීය-නාගරික සබඳතා පෙන්නුම් කරන සාධකයකි. කිසියම්


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රදේශයක දෛනික සංචලතාවට ආර්ථික සහ සමාජීය සේවාවන් ලබා ගැනීමේ හැකියාව, ඉහළ වැටුප්, අධ්‍යාපන අවස්ථා, දුර ප්‍රමාණය, ගමන් වියදම් සහ ගමනේ පහසුව යනාදී කරුණු බලපානු ලබයි. විශේෂයෙන් ම රටක කුඩා හා මධ්‍ය පරිමාණ නාගරික මධ්‍යස්ථානවල මෙම පහසුකම් පවතින්නේ නම් ග්‍රාමීය ජනතාව එම නගර සමඟ පවතින සම්බන්ධය වැඩි වේ. තෝරා ගන්නා ලද ග්‍රාමීය ප්‍රදේශයන් අතරින් සතියක් තුළ දෛනික ව නගරයට පැමිණෙන්නේ දඹුලුගම සහ යාපාගම යන නගරයට ආසන්න ග්‍රාමයන්වල පුද්ගලයන් ය. නගරයේ සිට පවතින දුර වැඩිවන විට දෛනික ව සිදු වන සංචලනයන් ද අඩු බවක් පෙන්නුම් කරයි. එම ප්‍රදේශවල පුද්ගලයන් වැඩි ප්‍රමාණයක් සතියකට වරක් හෝ දෙවරක් නගරයට පැමිණේ. එයට ප්‍රධාන වශයෙන් ම නගරයේ සිට ඇති දුර, ගමන් වියදම සහ ගමන් පහසුව යන කාරණා බලපාන්නට ඇතැයි සිතිය හැක ය. දඹුල්ල නගරය සහ තෝරා ගන්නා ලද ග්‍රාමයන් අතර පවතින දුර සලකා බැලීමේ දී දඹුලුගම සහ යාපාගම යන ග්‍රාමයන් දඹුල්ල නගරයට ඉතා ආසන්න ව කිලෝමීටර් පහට අඩු දුරකින් පිහිටා ඇත. එවගේ ම කණ්ඩලම සහ ඉනාමලුව යන ග්‍රාමයන් නගරයේ සිට යම්තාක් දුරකින් එනම් කිලෝමීටර් පහත් දහයත් අතර ද දිගම්පතහ සහ වැවල වැව යන ග්‍රාමයන් කිලෝමීටර් දහයට වැඩි දුරකින් ද පිහිටා ඇත. නගරයේ සිට පවතින දුර පදනම් කරගෙන පුද්ගලයන්ගේ දෛනික සංචලතාවේ ප්‍රමාණයන් වෙනස් වේ. එවගේ ම දුර සමඟ ගමන් වියදම සහ ගතවන වේලාව යන සාධක කෙරෙහි ද පුද්ගලයන්ගේ අවධානය යොමු වේ. බව දක්නට ලැබේ. ඒ අනුව දුර වැඩිවන විට පුද්ගලයන්ගේ දෛනික සංචලතාව අඩුවන අතර එය සතියකට වරක් හෝ දෙවරක් ලෙස දක්නට ලැබේ.

යාපාගම සහ දඹුලුගම යන ග්‍රාමයන්හි පුද්ගලයන් දෛනික ව නගරයට පැමිණේ. භාණ්ඩ මිලදීගැනීම, අධ්‍යාපනික කටයුතු, රැකියා ආදී සියලු ම කාර්යයන් සඳහා නගරය භාවිත කිරීම එයට හේතුව යි. නමුත් දිගම්පතහ සහ වැවල වැව යන ග්‍රාමයන්හි පුද්ගලයන් සතියකට වරක් පමණ නගරයට පැමිණේ. එයට ප්‍රධාන හේතුව වන්නේ කෘෂි නිෂ්පාදන අලෙවිය සඳහා පුද්ගලයන් සතියකට වරක් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට පැමිණීම යි. ඒ හැරුණුකොට එම ප්‍රදේශවල ජනයා එදිනෙද අවශ්‍යතා සපුරාගන ලබන්නේ ගමේ වෙළඳපොළෙනි. නගරයේ සිට පවතින දුර වැඩිවන විට දෛනික ව පැමිණෙන පුද්ගලයන්ගේ ප්‍රමාණය අඩුවන අතර සුළු පිරිසක් දෛනික ව පැමිණේ. එයට හේතුව එම පුද්ගලයන් රැකියා කටයුතු, අධ්‍යාපනික කටයුතු සඳහා දෛනිකව පැමිණෙන්නන් වීමය. දඹුල්ල නගරය හා තදාසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා ඇතිවීම සහ නගරයට පවතින දුර අතර සබඳතාවක් පවතී යන්න කාල්පියර්සන් කයිවර්ග පරීක්ෂාවට අනුව (p අගය 0.001) සනාථ විය. නගරයේ සිට ග්‍රාමීය ප්‍රදේශ සඳහා ඇති දුර වෙනස් වන විට ග්‍රාමීය-නාගරික සබඳතාවන්ගේ ස්වභාවය ද වෙනස් වේ. එනම් නගරයේ සිට ග්‍රාමීය ප්‍රදේශවලට පවතින දුර අඩුවන විට ග්‍රාමීය - නාගරික සබඳතාවන් වැඩි වන අතර නගරයේ සිට දුර වැඩිවන විට ග්‍රාමීය-නාගරික සබඳතා අඩුවන බව ද දක්නට ලැබේ. ඒ අනුව බලන කළ නගරයේ




**රූපසටහන් අංක 2:** දඹුල්ල නගරය සහ ග්‍රාමයන් අතර පවතින දුර, ගතවන වේලාව සහ ප්‍රවාහන වියදම අතර සම්බන්ධතාව

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2014

මෙම අධ්‍යයනයේ නියැදිය සඳහා තෝරා ගන්නා ලද ග්‍රාමයන් හයහි විවිධ දුර අනුව ප්‍රවාහන වියදම සහ ගතවන වේලාව යන සාධකයන්ගේ සම්බන්ධතාව සලකා බැලීමේ දී මෙම විචල්‍යයන් අතර ධන සම්බන්ධතාවයක් පවතින බව දක්නට ලැබේ (රූපසටහන් අංක 2). මෙහිදී එක් එක් ග්‍රාමය සඳහා නගරයේ සිට පවතින දුර අනුව ප්‍රවාහන වියදම සහ ගතවන වේලාව එකිනෙකට වෙනස් වේ. ඒ අනුව නගරයේ සිට ගමට පවතින දුර වැඩිවන විට ඊට සාපේක්ෂ ව ඒ සඳහා වැය වන ප්‍රවාහන වියදම සහ ගතවන වේලාව වැඩිවන සිට ග්‍රාමීය ප්‍රදේශවලට පවතින දුර සහ ග්‍රාමීය - නාගරික සබඳතාවන් ඇතිවීම අතර ඍණ සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. පුද්ගලයන්ගේ සංචලතාවයේ ස්වභාවය කෙරෙහි ප්‍රබල ව බලපාන තවත් සාධකයක් වන්නේ ඔවුන් නගරයට ගමන් කරන මාධ්‍යය යි. ඔවුන් භාවිත කරන මාධ්‍යය අනුව දෛනික ව, සතියකට වරක් හෝ දෙවරක් ද යන සාධකය රඳා පවතී. යාපාගම සහ දඹුලුගම යන ප්‍රදේශවල පුද්ගලයන් වැඩි වශයෙන් නගරයට පැමිණෙන්නේ පයිනි.


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

එයට හේතුව නගරයට ඉතා ආසන්න ව පිහිටා තිබීම යි. නමුත් වැවල වැව, දිගම්පතහ වැනි ප්‍රදේශවල පුද්ගලයන් වැඩි වශයෙන් බසයෙන් නගරයට පැමිණෙන අතර තවත් කොටසක් පෞද්ගලික වාහන යොද ගනී. නගරයේ සිට පවතින දුර වැඩි වන විට පොදු ප්‍රවාහන පහසුකම් යොද ගැනීමට පෙළඹෙන අතර දෛනික ව සංචලනය වන ප්‍රමාණය ද අඩුවේ. එමඟින් නව ඥාති සබඳතා ඇති වී ජීවිත කාලය පුරා ම අන්තර් භූගෝලීය ප්‍රදේශ හරහා ගමන් කරන අතර මෙය ප්‍රදේශ අතර සබඳතා වර්ධනයට හේතු වේ. මෙ මඟින් නගරයකට පැමිණෙන වාරගණන වැඩි වන අතර එය වෙළඳ හා සේවා කටයුතු පුළුල් වීමට හා පුද්ගල සංචලතාව ඇති වීමට හේතු වේ. තරුණ පුද්ගලයන්ට මෙම සබඳතා හරහා රැකියා සොයා ගැනීමට ද අවස්ථාව ලැබෙන අතර නාගරික අංශයේ රැකියාවක නිරතවීම නව අදහස් සහ ආකල්ප ඇති වීමට හේතු වේ. මෙම හේතු පාදක කර ගනිමින් දඹුල්ල නගරය තුළ සමාජ සබඳතා ගොඩ නැඟී ඇති බව දක්නට ලැබේ. දඹුල්ල නගරය තුළ ප්‍රතිමෝදක කටයුතු සඳහා උද්‍යාන, කාය වර්ධන මධ්‍යස්ථාන, සංස්කෘතික මධ්‍යස්ථාන, කලායතන, සිනමා ශාලා, ක්‍රීඩා සමාජශාලා වැනි විවිධ මධ්‍යස්ථාන පිහිටා ඇති අතර ආගමික කටයුතු සඳහා ඓතිහාසික දඹුලු රජමහා විහාරය පිහිටා ඇත. මෙම හේතු නිසා තදසන්න ප්‍රදේශවල ජනයා නිරන්තරයෙන් නගරය හා සබඳතා පවත්වනු ලබයි. එම හේතු නිසා දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශය තුළ සමාජ සබඳතා දක්නට ලැබේ. දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශය තුළ දක්නට ලැබෙන ග්‍රාමීය නාගරික සබඳතා වර්ග, එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සංවර්ධන අතර සබඳතාවක් පවතින බව කාල්පියර්සන් කයිවර්ග පරික්ෂාවට අනුව (p අගය 0.002) පැහැදිලි විය. ඒ අනුව දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා ධනාත්මක බලපෑමක් සිදු කර ඇති බව දක්නට ලැබේ.

ග්‍රාමීය-නාගරික සබඳතා හේතුකොටගෙන නගරය සහ ග්‍රාමීය ප්‍රදේශ යන අංශ දෙකෙහි ම විවිධ ගැටලුකාරී තත්ත්වයන් උද්ගත විය හැකි ය. සමාජීය වශයෙන් ඇතිවන ගැටලු ලෙස ජනාවාස ගැටලු, ජල සහ විදුලි පහසුකම් හිඟය, ජාතිවාදය සහ පන්ති භේදය, සෞඛ්‍යය ගැටලු, සංස්කෘතික පරිහානිය, සමාජ පරිහානිය එනම්, අපරාධ, මත්ද්‍රව්‍ය, අවි ආයුධ ජාවාරම්, ළමා අපචාර සහ ගණිකා වෘත්තිය යන ගැටලු දැක්විය හැකි ය. පාරිසරික ගැටලු වශයෙන් පරිසර දූෂණය එනම්, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම ආශ්‍රිත ගැටලු සහ රථවාහන තදබදය දැක්විය හැකි ය. ආර්ථිකමය වශයෙන් විරැකියාව, ඇති නැති පරතරය වැඩි වීම සහ කෘෂි නිෂ්පාදන අලෙවියේ දී මුහුණ දීමට සිදු වන ගැටලුකාරී තත්ත්වයන් දැක්විය හැකි ය. මෙම ගැටලුකාරී තත්ත්වයන් වැඩි වශයෙන් දක්නට ලැබෙනුයේ නාගරික ප්‍රදේශවල ය. එයට ප්‍රධාන ම හේතුව කාර්යයන්ගේ සංකේන්ද්‍රණය හේතුකොටගෙන ග්‍රාමීය ජනයා නාගරික ප්‍රදේශවලට දෛනික ව හෝ ඍතුමය වශයෙන් සංක්‍රමණය වීම යි.

නගරය තුළ පවතින ආකර්ෂණීය සාධක, ග්‍රාමීය ප්‍රදේශවලින් නාගරික ප්‍රදේශයට ජනයා තල්ලු කිරීමට හා නාගරික ප්‍රදේශයට ඇද ගැනීමට හේතු වී ඇත. ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකාර්මික අර්ථ ක්‍රමවලින් ලබන ආදායමට වඩා වැඩි ආදායමක් නාගරික ප්‍රදේශයේ සුළු රැකියාවක නිරතවීමෙන් ලබා ගත හැකි වේ යැයි අපේක්ෂා කිරීම නිසා තදසන්න ප්‍රදේශවල ජනයා දඹුල්ල නගරය කරා සංක්‍රමණය වී ඇත. දඹුල්ල රජමහා විහාරය අවට අඩු ආදායම්ලාභී පවුල් දැකගත හැකි අතර ඔවුන් කුඩාරම් නිවාසවල ජීවත් වේ. නගරය කරා සංක්‍රමණය වී ඇති පුද්ගලයන් අඩු ආදායම්ලාභී සහ අඩු අධ්‍යාපන මට්ටමක් සහිත පිරිසක් වීම හේතුවෙන් පරිසර දූෂණය වැනි ගැටලු ද ඇති වී තිබේ. පොලිතීන් වැනි දිරාපත් නොවන අපද්‍රව්‍ය පරිසරයට මුද හැරීම හේතුවෙන් රජමහා විහාරය ආශ්‍රිත ප්‍රදේශය අපවිත්‍ර වී ඇත. තව ද සනීපාරක්ෂක කටයුතු ආශ්‍රිත සේවා නිසි ලෙස සිදු නොවීමෙන් සෞඛ්‍යය මට්ටම ද පහළ වැටී ඇත. එවගේ ම ජනතාව අතර පවතින විවිධ සම්බන්ධතා හේතුවෙන් මේ ජනාවාස ආශ්‍රිත ව අපරාධ, මත්ද්‍රව්‍ය, අවි ආයුධ ජාවාරම්, ළමා අපචාර සහ ගණිකා වෘත්තිය යන සමාජ විරෝධී ක්‍රියා වර්ධනය වීම ද සැලකිය යුතු තත්ත්වයකි.

දඹුල්ල නගරය තුළ ස්ථාපිත වී ඇති ආර්ථික මධ්‍යස්ථානය හේතුවෙන් දිවා රාත්‍රි දෙකෙහි ම ඉතාමත් කාර්යය බහුල බවක් නගරය තුළ දක්නට ලැබේ. එබැවින් ශ්‍රී ලංකාවේ "නොනිදන නගරය" ලෙස දඹුල්ල නගරය හැඳින් වේ. ලංකාවේ විවිධ ප්‍රදේශවලින් පුද්ගලයන් තම කෘෂි නිෂ්පාදන අලෙවිය සහ මිලදී ගැනීම උදෙසා දඹුල්ල නගරයට පැමිණෙන අතර ඒ ආශ්‍රිත ව විවිධ සමාජ විරෝධී ක්‍රියාවන් නිර්මාණය වී පවතී. දඹුල්ල නගරය තුළ මත් උවදුර, මංකොල්ලකෑම්, ගැටකපන්නන් වැනි සමාජ විරෝධී ක්‍රියාවන් මෑතකාලීන ව බහුල වශයෙන් සිදුවෙමින් පවතී. ඒ බව පසුගිය දිනක පැවැත් වූ දඹුල්ල මහනගර සභා රැස්වීමට සහභාගි වූ වගකිව යුතු නිළධාරීන්ගේ අවධානයට ද ලක් වූ කරුණක් බවට පත් විය.

---

සිද්ධි අධ්‍යයනය

"දඹුල්ල නගරය තුළ මත් උවදුර වැඩිවෙලා. මෙය ඉතා භයානක තත්ත්වයක්. මෙම ප්‍රදේශයේ මංකොල්ල රැසක් ද පසුගිය දිනවල සිදු වෙලා තියෙනවා. මෙම නාගරික ප්‍රදේශයේ ශ්‍රමිකයන්ට විවිධ හේතු නිසා රැකියා අහිමි වෙලා. මෙම තත්ත්වය නිසා ඔවුන්ට ජීවත්වීමේ මාර්ගයක් නෑ".

-නාගරික මන්ත්‍රී රූපසිංහ මහතා-

---

දඹුල්ල නාගරික මන්ත්‍රී එච්. එම්. රූපසිංහ මහතා දක්වන ආකාරයට දඹුල්ල නගරය තුළ මත් උවදුර, මංකොල්ලකෑම් ඉහළ යෑමට ප්‍රධාන හේතුව ප්‍රදේශයේ ශ්‍රමිකයන්ට රැකියා අහිමි වීම යි. එමනිසා පුද්ගලයන් ජීවත්වීම සඳහා සමාජ විරෝධී ක්‍රියාවන්ට පෙළඹී සිටී.

දඹුල්ල නගරය ආර්ථික පදනමක් මත නිර්මාණය වූ ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවලින් එකකි. තදසන්න ප්‍රදේශවල



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ජනයා වැඩි වශයෙන් කෘෂිකර්මාන්තයේ නිරත වන අතර තම කෘෂි නිෂ්පාදන අලෙවිය සඳහා දඹුල්ල නගරයට පැමිණේ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක වන අතරමැදි පුද්ගලයන්ගේ ක්‍රියා කලාපය හේතුවෙන් තදසන්න ප්‍රදේශවල ජනයාට අර්ථිකමය වශයෙන් ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වී තිබේ. තදසන්න ප්‍රදේශයේ ජනයාගෙන් වැඩි කොටසක් තම නිෂ්පාදන අලෙවිය සඳහා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට පැමිණේ. එම ප්‍රමාණය 84% ක් පමණ වේ. ඉන් 16% ක් පමණ ගමට පැමිණෙන වෙළෙන්දන්ට විකුණනු ලබයි. එයට හේතු ලෙස දක්වන්නේ ප්‍රවාහන වියදම අධික වීමත්, නිසි ආකාරයේ ලාභයක් ලබා ගත නොහැකිවීමත් නිසා ආර්ථික මධ්‍යස්ථානයට නොගොස් ගමට පැමිණෙන වෙළෙන්දෙකුට නිෂ්පාදන විකුණන බවත් ය. නමුත් ආර්ථික මධ්‍යස්ථානයට නිෂ්පාදන ගෙනයනු ලබන පුද්ගලයන්ගෙන් වැඩි වශයෙන් ලාභ ලබන්නේ අතරමැදි පුද්ගලයන් බව ඔවුන් පෙන්වා දේ. එම හේතුවෙන් වර්තමාන තරුණ පරම්පරාව කෘෂිකර්මාන්තයෙන් බැහැර ව නගරයට රැකියා සොයමින් පැමිණේ. එම හේතුව නිසා රැකියා විරහිත පුද්ගලයන් ප්‍රමාණය වැඩි වන අතර එය ආර්ථික වශයෙන් ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය කරනු ලබයි.

නාගරීකරණයත් සමඟ නාගරික ප්‍රදේශවල නිපදවෙන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ද දිනෙන් දින ඉහළ යන බව පෙනේ. අධික ජන සංඛ්‍යාව, කාර්මීකරණය, නිවාස, කඩසාප්පු හා රෝහල්වලින් පිටකරන අපද්‍රව්‍ය, සංචාරක ව්‍යාපාරය වැනි සාධක නිසා පාරිසරික වශයෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් දඹුල්ල ප්‍රදේශය තුළ දක්නට ලැබේ. මෙහිදී වැදගත් ම කරුණක් වන්නේ දඹුල්ල නගරයෙන් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය නිසා ග්‍රාමීය ප්‍රදේශවල ජනයාට ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවීම යි. දඹුල්ල නගරයෙන් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය සියල්ලම දිගම්පතහ නමැති ග්‍රාමීය ප්‍රදේශයේ ඇති තේක්ක ඉඩමකට දැමීම හේතුවෙන් එම ප්‍රදේශයේ ජනයා ගැටලු සහගත තත්ත්වයකට මුහුණ දී සිටී. ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ම ගැටලුව වන්නේ මෙම අපද්‍රව්‍ය ආහාරයට ගැනීමට පැමිණෙන වල්අලින් ගමට පැමිණ අලාභහානි සිදුකිරීම යි. මෙම අලි මිනිස් ගැටුම නිසා ජීවිත හානි, දේපල හානි සහ වගා හානි වැනි ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දී සිටී.

දඹුල්ල නගරය සහ තදාසන්න ප්‍රදේශයේ සංවර්ධනය වැඩි දියුණු කිරීම උදෙසා පවතින සංවර්ධන විභවතා අධ්‍යයනය කිරීම සඳහා ලබා ගත් තොරතුරු ඇසුරින් “ශදුඅත විශ්ලේෂණය” (SWOT Analysis) මෙහිදී සිදු කරන ලදී. එහිදී ශක්‍යතා, දුර්වලතා, අවස්ථා සහ තර්ජන හඳුනා ගනිමින් ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා පවතින සංවර්ධන විභවතා පිළිබඳ අධ්‍යයනය සිදු කරන ලදී. ඒ අනුව හඳුනාගත් ශක්‍යතා ලෙස, සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂිත ජනසංඛ්‍යාවක් සිටීම, ඉහළ ජනඝනත්වයක් දක්නට ලැබීම, ප්‍රදේශයේ විවිධ කොටස් ජල මූලාශ්‍ර, සොබාදහමේ දර්ශනීය ප්‍රදේශ, ආගමික ස්ථාන වැනි සිත් ඇඳගන්නා සුලු ලක්ෂණ සහිත වීම, ප්‍රදේශය ස්වභාවික හා ඓතිහාසික ස්ථානවලින් සමන්විත වීම, ප්‍රදේශය තුළ විවිධ භූමි පරිහරණ රටා (වී වගාව, කාලීන බෝග වගාව සහ පොල් වගාව ආදී වශයෙන්) දක්නට ලැබීම, ග්‍රාමීය ප්‍රදේශවල හේන් වගාව මගින් වැඩි අස්වැන්නක් ලබා ගැනීම, ඉහළ කෘෂිකාර්මික නිෂ්පාදන සහිත අනෙකුත් වගාවන් දක්නට ලැබීම, ග්‍රාමීය ප්‍රදේශවල වී ගොවිතැන දක්නට ලැබීම, නගරය තුළ සුළු පරිමාණ නිෂ්පාදන කර්මාන්ත පිහිටා තිබීම, ආගමික සහ පුරාවිද්‍යාත්මක පිහිටීම්වලින් යුක්තවීම, කාර්යක්ෂම ලෙස විහිදුණු මාර්ග පද්ධතියක් දක්නට ලැබීම හා ග්‍රාමීය ජනාවාස කෘෂි ආර්ථිකයක් මත යැපීම දැක්විය හැක. ජනසංඛ්‍යාවේ විෂම ව්‍යාප්තිය හේතුවෙන් අන්තර් ප්‍රාදේශීය විෂමතා දක්නට ලැබීම, බොහෝ සම්පත් පුද්ගලයන් විසින් තවම හඳුනාගෙන හෝ ඇගයීමට ලක් කර නොමැතිවීම, ප්‍රදේශය තුළ වනාන්තර පරිහානිය හේතුවෙන් පාරිසරික අසමතුලිතතාවයක් නිර්මාණය වීම, පාරිසරික අසමතුලිතතාවයක් ඇති කිරීම සහ එම වගාවන් හි ව්‍යාප්තිය අඩු මට්ටමක පැවතීම, භූමියේ අඩු ප්‍රමාණයක් වී ගොවිතැන සඳහා යොදා ගැනීම, යටිතල පහසුකම් අඩු වීම හා පුද්ගලයන්ගේ සංචලතාව සීමිතවීම ආදී දෑ හඳුනාගත් දුර්වලතා වේ.

තව ද හඳුනාගත් අවස්ථා ලෙස, අනාගත ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රම බලකාය යොදා ගැනීමේ සම්භාවිතාවක් පැවතීම, අනාගත ජනාවාස සඳහා ජාතික සැලසුම් සකස් කිරීමේ දී අවකාශීය වශයෙන් විහිදුණු මාර්ග ජාලයක් සැකසීමේ හැකියාව පැවතීම, සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වීම, සංචාරක කර්මාන්තය සඳහා ඓතිහාසික වැදගත්කමකින් යුත් ආකර්ෂණීය ස්ථාන පිහිටා තිබීම, වර්තමානයේ දේශීය ආහාර නිෂ්පාදන සඳහා ඉල්ලුම ඉහළ නැංවීම සහ අපනයන වෙළඳපොළ කරා යොමු වීමට විභවතාවක් පැවතීම දැක්විය හැක.

ප්‍රදේශයේ භෞතික රූපාකාරය හේතුවෙන් ජනාවාස තුළ යටිතල පහසුකම්වල විෂම ව්‍යාප්තියක් පැවතීම, සැලසුම් නොකළ මිනිස් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ස්වභාවික විපත් ඇතිවීම, පාලනයකින් තොර ව වනාන්තර එළිකිරීම හේතුවෙන් පාංශු ඛාදනය සහ භූගත ජල මට්ටම අඩුවීම, කලින් කලට පුද්ගලයන්ගේ තදබදය වැඩිවීම සහ නාගරීකරණය සීමාවීම සහ ප්‍රවාහනය සඳහා ගතවන වේලාව ආර්ථික වර්ධනයට බාධා ඇති කිරීම ආදීය ප්‍රදේශයේ සංවර්ධනය වැඩි දියුණු කිරීම උදෙසා පවතින හඳුනාගත් තර්ජන ලෙස පෙන්වාදිය හැකි ය.

## නිගමනය

දඹුල්ල නගරයේ කාර්යයමය විවිධත්වය සලකා බැලීමේ දී වාණිජ හා සේවා පහසුකම්වලට සාපේක්ෂ ව නිෂ්පාදන කර්මාන්තයන්හි අඩු සංකේන්ද්‍රණයක් පෙන්නුම් කෙරේ. දඹුල්ල නගරයේ පිහිටා ඇති ආර්ථික මධ්‍යස්ථානය හේතුවෙන් ඒ ආශ්‍රිත වාණිජ කාර්යයන් රාශියක් ස්ථාපිත වී පවතී. එම හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත සහ සේවා පහසුකම් හි සංකේන්ද්‍රණයට සාපේක්ෂ ව වාණිජ කාර්යයන්ගේ සංකේන්ද්‍රණය ඉහළ අගයක් පෙන්නුම් කරයි. නිෂ්පාදන කර්මාන්තයන් ලෙස මහා පරිමාණයේ කර්මාන්තශාලාවන්ගේ ස්ථානගත වීමක් දක්නට නොලැබුණ ද පුද්ගලයන්ගේ එදිනෙදා ජීවිතයන්ට මහත් රුකුලක් වන


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අත්‍යවශ්‍ය ම අවශ්‍යතාවන්ගේ ඒකරාශී වීමක් දඹුල්ල නගරය තුළ දක්නට ලැබේ. එනම් බැංකු හා මූල්‍ය කටයුතු, කෘෂි අස්වැන්න අලෙවිය, රැකියා කටයුතු, භාණ්ඩ මිලදී ගැනීම, අධ්‍යාපනය, සෞඛ්‍යය සඳහා නගරයට පැමිණේ. නගරයට පැමිණෙන අවශ්‍යතාවය පදනම් කරගෙන විවිධ ග්‍රාමීය නාගරික සබඳතා දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශය ආශ්‍රිත ව දක්නට ලැබේ. ආර්ථික, සේවා පහසුකම්, ප්‍රජාවිද්‍යාත්මක, තාක්ෂණික, සමාජ සබඳතා වශයෙන් ඒවා වර්ග කළ හැකි ය.

දඹුල්ල නගරය තුළ ආර්ථික මධ්‍යස්ථානයේ ස්ථාපිත වීම හේතුකොට ගෙන දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් ආර්ථික සබඳතා දක්නට ලැබේ. දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශය අතර පවතින දුර මත මෙම සබඳතාවන්ගේ තීව්‍රතාව වෙනස් වේ. එනම් නගරයට ඉතා ආසන්නව පිහිටි දඹුලුගම සහ යාපාගම යන ග්‍රාමයන් හි ග්‍රාමීය-නාගරික සබඳතා ඉහළ අගයක් ගනු ලබන අතර නගරයට දුරින් පිහිටි ග්‍රාමයන්හි සබඳතාව අඩු මට්ටමක් පෙන්නුම් කෙරේ. ග්‍රාමීය නාගරික සබඳතා ඇති වීම කෙරෙහි නගරයේ සිට පවතින දුර, ප්‍රවාහන වියදම සහ ගතවන කාලය යන සාධක සෘජුව බලපායි. දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ දක්නට ලැබෙන ග්‍රාමීය-නාගරික සබඳතා හේතුවෙන් සමාජීය, ආර්ථික මෙන් ම පාරිසරික වශයෙන් ගැටලුකාරී තත්ත්වයන් ග්‍රාමීය සහ නාගරික යන අංශ දෙකෙහි ම දක්නට ලැබේ. දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතා හඳුනා ගැනීම තුළින් එම ප්‍රදේශයේ ග්‍රාමීය-නාගරික සබඳතා තීව්‍ර කිරීමේ හැකියාව පවතී. දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ දක්නට ලැබෙන ග්‍රාමීය-නාගරික සබඳතා හේතුවෙන් ප්‍රාදේශීය සංවර්ධනයට ධනාත්මක බලපෑමක් සිදු වී තිබේ.

දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශය අතර පවතින ග්‍රාමීය-නාගරික සබඳතා වැඩිදියුණු කිරීම උදෙසා ඉදිරිපත් කරනු ලබන යෝජනා ලෙස, දඹුල්ල නගරය සහ තදසන්න ප්‍රදේශයේ දක්නට ලැබෙන රැකියා වියුක්ති ගැටලුවට විසඳුමක් ලෙස කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම හා ඒ තුළින් ප්‍රදේශයේ සිදු වන අපරාධවලට විසඳුමක් ලබා ගත හැකි විම, ප්‍රදේශයේ ජීවත් වන අඩු ආදයම්ලාභී පවුල් සඳහා නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ඔවුන්ට ස්ථිර නවාතැනක් සකසා දීම, නගරය තුළ දක්නට ලැබෙන සමාජ විරෝධී ක්‍රියාවන් කෙරෙහි වගකිව යුතු අංශයන්ගේ මැදිහත්විමෙන් අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීම සහ ඒවා නිසි ලෙස ක්‍රියාත්මක කිරීම, ආර්ථික වශයෙන් පවතින ගැටලුකාරී තත්ත්වයන්ට විසඳුමක් ලෙස අතරමැදි පුද්ගලයන්ගේ මැදිහත්භාවය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, නගරයේ සැලසුමකින් තොරව ඉදි වී ඇති කඩ සාප්පු සියල්ල එක් කොට බහු කාර්යය ගොඩනැගිල්ලක් සැකසීම තුළින් නගරයට පැමිණෙන ජනතාවට තමන්ගේ කාර්යයන් පහසුවෙන් සිදු කර ගැනීමට හැකියාවක් ලැබීම හා එය සංචාරකයින්ට ද ආකර්ෂණීය සාධකයක් ලෙස වර්ධනය කළ හැකි විම යනාදිය දැක්විය හැක.

## පරිශීලිත මූලාශ්‍රය


මානවඩු, එල්. සහ ලියනගේ, එන්. (2008). තෙවන ලොව නාගරීකරණය. බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

රත්නායක, බී. සහ ගොඩගේ, ඩී. (2001). කළුතර දිස්ත්‍රික්කයේ පොළ පිළිබඳ අධ්‍යයනය. සිංහල පර්යේෂණ වාර්තා අංක 40. මැයි 2001. අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ 07.

විතාරණ, පි. 2000. සංවර්ධන සංවාද. දෙහිවල: තිරසර ප්‍රකාශක.

Jayathilaka, P.J. and Mahaliyanarachchi, R.P. (2007). Behavioral pattern of fruit and vegetable consumers in the .POLA. (fair) system in Monaragala district in Sri Lanka. The Journal of Agricultural science, Sabaragamuwa university of SriLanka:Belihuloya.

Mushi, N.S. (2003). Regional development through rural-urban linkage.[Abs].Emerald Group Publishing Limited. Available at: http://eldorado.tudortmund.de:8080/handle/2003/2862. [Accessed on 26 August 2014].

Pundir, R.S. and Singh, K.(2001).Rural-urban linkages and socio-economic development: A case study of two villages in Gujarat.[Abs].Emerald Group Publishing Limited.Available at: https://www.irma.ac.in/pdf/randp/978_86717.pdf. [Accessed on 29 August 2014].

Rathnayake, R.M.K. (2003). Rural-urban linkages in regional development: The experiences of North Central Province. Malabe: Piyasiri Printer and Company.

Riley, L. (2013).Gendered mobilities, food access, and rural-urban linkages in Blantyre, Malawi.[Abs].Emerald Group Publishing Limited. Available at: http://papers.ssrn.com/sol3/papers.cfm?abstract_id=2250179. [Accessed on 29 August 2014].

Tacoli, C. (2002).Changing rural-urban interactions in Sub-Saharan Africa and their impact on livelihoods: A summary.[Abs].Emerald Group Publishing Limited. Available at: http://pubs.iied.org/pdfs/9153IIED.pdf. [Accessed on 29 August 2014].



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
නවවැනි කලාපය; 2018 දෙසැම්බර්, පිටු 60-70
ISSN 1800-1459 eISSN 2673-1177

© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# දෘශ්‍ය සන්නිවේදනයේ පාරභෞතිකභාවය හැදෑරීමට හෙජමොනිය හා දෘෂ්ටිවාදය ඇසුරින් විශ්ලේෂණාත්මක සංකල්පීය ප්‍රවේශයක්

## (The Meta-physics of Visual Communication: A Conceptual Approach through the Lenses of Hegemony and Ideology)

ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර[1*]

[1]කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රීපාලි මණ්ඩපය
*priyaravije1629@gmail.com

**සාරසංක්ෂේපය**

දෘශ්‍ය සන්නිවේදනයෙහි අදාළත්වය ඇසේ පෙනීමට (seem) නොව දැක්මට (gaze) ය. දෘශ්‍යවීම හෝ නොවීම යන්න කාලය හා අවකාශය පිළිබඳ ගැටළුවක් පමණි. ඩෙරීඩියානු අර්ථයෙන් ඉඩ පරතර (Space) සහ ප්‍රමාදයන් මගින් (differ and differed) කියවීමක් නොහොත් යළි ලිවීමකට පෙර තත්ත්වයක් පමණි. මෙම ගොඩ නැංවීම්වල පාරභෞතිකභාවය දාර්ශනික තලයක එලෙස ම තිබියදී ඊනියා දෘශ්‍ය යථාර්ථය මාධ්‍ය හෙජමොනියේ දිගුවක් ලෙස ගොඩ නැංවීමේ ප්‍රතිඵල ලාංකේය සමාජය අත්දකිමින් සිටියි. අදහස් (ideas) කාලයක් තිස්සේ අභ්‍යාස වෙමින් දෘෂ්ටිවාදය (ideology) ලෙස සමාජය තුළ හෙජමොනික ආධිපත්‍යයක් දරා සිටින්නේ යම් සේක් ද, ඒ අයුරින් ම ජනමාධ්‍ය මගින් එය අවශෝෂණය කර ගනිමින්, නඩත්තු කරමින් හා තව දුරටත් විවිධ සංදර්භයන් යටතේ ගොඩ නඟමින් හෝ පෝෂණය කරමින සිටියි. එම භූමිකාව දෛනික ජීවිතය තීරණාත්මක කර තිබේ. පශ්චාත් නූතන සමාජ සංදර්භයක එක්සත් ජනපදවාසියාගේ විකාරරූපි ජනප්‍රියවාදී ජීවිතය කෙරෙහි සමීප නිරීක්ෂණ අධ්‍යයනයක් සිදු කළ ජීන් බොද්‍රිලාද් මාධ්‍ය ප්‍රතිරූප, වසඟය, සයිබර් තාක්ෂණය මගින් මෙම යුගය නිෂ්පාදන මාදිලියෙන් (Mode of Production) විනෝදය හා දැනුම නිෂ්පාදනය කරන නිෂ්පාදන කේතයකට (Code of production) විතැන්වීම අර්ථ ගන්වන ලදී. පශ්චාත් යුද ලාංකේය සමාජය කෙරෙහි මෙම සමීප නිරීක්ෂණයන්හි වලංගු හෝ අවලංගුභාවය කෙරෙහි මෙහිදී සැකෙවින් අවධානය යොමු කෙරෙයි. එනම් ලාංකේය අවවර්ධිත සමාජ සත්තාව නොතකා නොහැරෙයි. එහෙත් ඒ සඳහා වන න්‍යායාත්මක දොරටුවක් විවර කර ගනු පිණිස හෙජමොනිය, දෘෂ්ටිවාදය පිළිබඳ සැකෙවින් සංකල්පීය විග්‍රයක් මෙන් ම එම කරුණු ලාංකේය තත්ත්වයන් මත අතිපිහිත වන ස්වරූපය කෙරෙහි අවධානය යොමු කෙරෙයි.

කේන්ද්‍රීය වචනඃ දෘෂ්ටිවාදය, හෙජමොනිය, දෘශ්‍ය සන්නිවේදනය, අන්තෝනියෝ ග්‍රාම්ස්චි, ලුවී අල්තුෂර්, නෝම් චොම්ස්කි, පාරභෞතිකභාවය

The visual communication.s relevance is not about seemed of eyes but gaze. Seemor not seem isa matter of time and space. In Derridian sense, it is a precondition of a text before we written or read it. While the meta-physics of these constructions are confined to philosophical sphere,the Sri Lankan society experiences the results of theso-called visual reality that is produced through the media hegemony.Similar to the ways in which ideas are developed into a hegomonized ideology in a certain society, the media not only absorbs and maintains but alsoconstructs and feeds that hegomonized ideologyin different contexts. This process has become decisive in day today life. In a study of absurd and populist life in the United States in a post-modern context, Jean Baudrillardhas pointed out the prominent role that media images and seduction plays. In particular, cyber technology has replaced its mode of production of the contemporary era to code of production in which it produces entertainment and knowledge. The focus of this study is to explain the relevance or the irrelevance of this analysis in post war Sri Lankan society. Although, the social contexts these analysis are based on are different, they are based on Europe and the United States, whereasSri Lanka in particular represents an underdeveloped social reality, these analyses are relevant to this study as the narratives overlap despite the difference. Further, the study will analyze the concepts of hegemony and ideology to open up a new theoretical and conceptual gate and to explain the similarities of visual communication in different social contexts.

Keywords: Visual Communication, Hegemony, Ideology, The Meta-physics, Jean Baudrillard, Social Reality, Social Contexts

## හැඳින්වීම

දෘශ්‍ය සන්නිවේදනය මගින් පෙනීම (seem) නොව දැක්ම (gaze) කේන්ද්‍රීයව වර නැඟෙයි. එහිදී කෙනෙකුගේ දැක්ම ව්‍යුහගත කෙරෙන දැනුම, අත්දැකීම්, අවබෝධය මතුපිට තලය වනවිට එහි අධෝ ව්‍යුහය දෘෂ්ටිවාදී සමාජ සැකසුමට සමපාතී ය. සම්භව්‍ය මාක්ස්වාදී අර්ථයෙන් ආර්ථිකය අධෝ ව්‍යුහය වන විට ඒ මත සංස්කෘතිය උපරිව්‍යුහයක් ලෙස ගොඩ නැඟීම ද, සංශෝධන සහිතව මේ හා සමාන ය. ඒ අනුව ඇසේ සෞඛ්‍ය සම්පන්නභාවය, පෙනීමට ලක්වන වස්තුව පවත්නා දුර හා කෝණය, අඳුර හා ආලෝකය, කාලය හා අවකාශය යන මූලධාර්මික හේතු සමාන වන්නේ නම් කෙනෙකුගෙන් කෙනෙකුට පෙනීම සමාන විය හැකි වුව ද, දැක්ම එසේ විය නොහැකි ය. දෘශ්‍ය සන්නිවේදනයට උපදේශන වලංගු නොවේ. ඒ පිළිබඳ ලිඛිත උපදේශන ග්‍රන්ථ පවා ඊට සාක්ෂි දරයි. “මෙය

උපදෙස් පමණක් හෝ ගල්ගස්වන ලද නීතිමය රීති ආඥාවක් නොවේ. හුදෙක් අලංකාරිකයක් ලෙස පමණක් සැලකුව ද, දෘශ්‍ය සන්නිවේදනය යනු ඓතිහාසික හා සංස්කෘතික සංදර්භයෙන් ව්‍යුත්පන්න කොටසකි. මේ අනුව එහි අරුත් විශ්වීය හෝ සදාතනික නැත. නමුත් එහි ක්‍රියාවලිය ව්‍යුහගත වෙමින් හා අනුවර්තනය වෙමින් පවතී" (Hilligoss & Howard,2002). මේ අනුව අවසන් අරුත් නොමැති වූ ද, රූප කේන්ද්‍රීය වුව ද, තමා කෙරෙහි තම අභිමතය පරිදි සන්නිවේදන ක්‍රියාවලියකට පදනම වූ හෙජමොනික හා දෘෂ්ටිවාදය කෙරෙහි අවධානය යොමු විය යුතු ය.

ග්‍රාම්ස්චි, අල්තුෂර් වැන්නන්ගේ හෙජමොනිය හා දෘෂ්ටිවාදය පිළිබඳ සංකල්පීය අර්ථ දැක්වීම් ලාංකේය යථාර්ථය තුළ අභ්‍යාස වීම මෙහි ලා ජනමාධ්‍ය, ඉතා තීරණාත්මක උපකරණයක් ලෙස භාවිත වනු දැකිය හැකි ය. 'පුවත්' යනු හුදෙක් සංසිද්ධි වාර්තාකරණයක් නොව 'නිර්මාණාත්මක' ගොඩ නැංවීමකි. එකී ගොඩ නැංවීමේදී ඊට ඇතුළත් කර ගන්නා මෙන් ම එයින් පිටමං කරන්නේ කුමක් ද, යන්න තුළ පවත්නා පරතරය කියවීම මගින් මේ මොහොතේ දෘෂ්ටිවාදය බලපවත් වනු ලබන ස්වරූපය අධ්‍යයනය කළ හැකි ය. අනෙක් අතට ශ්‍රාවකයා/ප්‍රේක්ෂකයා/පාඨකයා එකී පුවත තම දෘෂ්ටිවාදී මනසේ දිගුවක් ලෙස කියවීම ද, මෙහි ලා නොතකා හළ යුතු නැත. මන්දයත් ප්‍රේක්ෂක/ශ්‍රාවක/පාඨක කැමැත්ත යනු ද, සමාජයීය ගොඩ නැංවීමක් වන බැවිනි. මෙම ලිපියේ නෝම් චොම්ස්කි විසින් අමෙරිකානු සමාජයට අදාළ ව 'කැමැත්ත ගොඩ නැංවීම' පිළිබඳ කෙරෙන අවධාරණය කිරීම් එය මනාව පැහැදිලි ය. එය ලාංකේය සමාජය තුළ ද, විවිධ අඩුවැඩිකම් හා යම් යම් සුවිශේෂ තත්ත්වයන් මත සිදු විය හැකි සුළු වෙනස්කමක් සහිත ව එකී යාන්ත්‍රණයේ ස්වරූපයෙන් ම අත්දැකිය හැකිවීම මෙහි දී සැකෙවින් සාකච්ඡාවට ලක් කෙරෙයි. ජීන් බෞඩ්‍රිලාද්, මාර්ෂල් මැක්ලුහාන් වැන්නන්ගේ සංකල්ප තත්කාලීන ජනමාධ්‍ය ක්ෂේත්‍රය කෙරෙන් නිරූපනය වන අයුරුත්, ජාත්‍යන්තර ලෝකය තුළ, විශේෂයෙන් ම අමෙරිකා එක්සත් ජනපදය විසින් ලෝකය මත ස්වකීය ආධිපත්‍ය තහවුරු කිරීම සිදු කරන්නේ යම්සේක් ද, එහි ම දිගුවක් හෝ ඌනිත හරස්කඩක් ලෙස ලාංකේය සමාජය තුළ එය ම වෙනස් ගතිකයන් සහිත ව අභ්‍යාස වීම හඳුනා ගත හැකි ය.

## සාහිත්‍ය විමර්ශනය

අන්තෝනියෝ ග්‍රාම්ස්චි, ලුවී අල්තුෂර්, අර්නස්ටෝ ලක්ලාව්, ෂන්තාල් මූෆ්, නොම් චොම්ස්කි, මාර්ෂල් මැක්ලුහන්, වැනි චින්තකයින්, විද්වතුන් ආදීන් විසින් විරචිත මූලික සංකල්ප මෙන් ම එකී සංකල්ප යළි අර්ථ දැක්වීම් කෙරෙහි මෙහි ලා අප විසින් සැලකිල්ල යොමු කළ යුතු ය.

'හෙජමොනිය' (hegemony) යන සංකල්පය ද වචනය ද සිංහල භාෂිත සංදර්භයක වරනැඟුනේ මෑත ඉතිහාසයේදීය. 90 දශකයේ අග භාගයේදී කොළඹ කේන්ද්‍රීය සංස්කෘතික කුඩා කණ්ඩායම් දේශපාලනයේ කතිකාමය මැදිහත්වීමෙන් එය සිදු විය. පසු කාලීන ව විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ඇතුළත් ව පොදුවේ ලාංකීය ඇකඩමියාව හා නව වාමාංශික දේශපාලන ව්‍යාපාරයන්හි අධ්‍යයන කව තුළ 'හෙජමොනිය' දේශපාලන සංකල්පයක් ලෙස සාකච්ඡාවට බඳුන් විය. එහි අර්ථය 90 දශකයට එහා ලාංකේය සමාජයේ සමාජීය - සංස්කෘතික - දේශපාලනික අවකාශය තුළ හෙජමොනික ලක්ෂණ හැඳිනිය නොහැකි බව නොවේ. පවත්නා න්‍යායික හා භෞතික සීමාවන් විසින් එකී ලක්ෂණ හුදු සම්ප්‍රදායික කරුණු කාරණා ලෙස හෝ ඒ වන විට අධිනිශ්චය වී පැවති දැනුමේ අර්ථගැන් වීමට ලඝු කිරීම හේතුවෙන් නිවරදි හා වඩා ඵලදායි අයුරින් බුද්ධිමය කතිකාවට එය එකතු වී නොතිබීමය. මෑත කාලීනව Hegemony යන වචනයට සිංහලෙන් "සාමස්තිකාධිපත්‍යය" යන වචනය භාවිතා කිරීමට ඇතැම් දේශීය උගත්තු යෝජනා කරති.

"ධනේශ්වර සමාජයේ පංති ආධිපත්‍යය පවත්වාගෙන යාමට ආධාර වන තීරණාත්මක සාධකයක් වශයෙන් මතවාදී සාමස්තිකාධිපත්‍යය (Hegemony) න්‍යාය ග්‍රාම්ස්චි සැලකීය (වීරසිංහ, 2011). අපගේ ප්‍රස්තුතයට අදාළ ව කරුණු දැක්වීමට Hegemony යන යුරෝපීය සංකල්පය හා වචනය "හෙජමොනිය" ලෙසින් ම මින් ඉදිරියට භාවිත කරන වග පමණක් මෙලෙස හැඳින්වීමේ දී උපුටා දක්වීමට අදහස් කෙරිණි.

අර්නස්ටෝ ලක්ලාව් හා ශන්තාල් මූෆ් පෙන්වාදෙන පරිදි "හෙජමොනිය" පිළිබඳ ග්‍රාම්ස්චියානු සංකල්පය ලෙනින්ගේ හෙජමොනිය පිළිබඳ සංකල්පයෙන් වෙනස් වන ප්‍රධාන සාධකයක් නම් ලෙනින්ගේ දේශපාලන නායකත්වයට ග්‍රාම්ස්චි විසින් සදාචාරමය හා බුද්ධිමය නායකත්වය ද එකතු කිරීම ය. ලෙනින් විසින් "හෙජමොනිය" නමැති සංකල්පය ඓතිහාසික නීතින් පිළිබඳ අනිවාර්යතාවාදී නියමයන් සමග සමපාත කිරීමට උත්සාහ දැරීම නිසා එය ලෙනින්ගේ දේශපාලන අධිපතිවාදී ස්ථාවරයක් බවට පත් විය (Torfin,1999).

මේ අනුව සමාජයෙන් වියුක්ත වූ බුද්ධිමය හෝ සදාචාරමය මැදිහත්වීම් වෙනුවට මිනිසුන්ගේ ඓන්ද්‍රිය දෘෂ්ටින් සංවිධානය කරනු ලබන බුද්ධිමය මැදිහත්වීමක් ග්‍රාම්ස්චි අපේක්ෂා කළේ ය.

තතු කෙසේ වෙතත් ග්‍රාම්ස්චි අදහස් කරන ලද්දේ ප්‍රංශයේ ජැකොබියන්වරුන් විසින් සිදු කළ කාර්යභාරය වැන්නකි. ප්‍රංශ විප්ලවයේදී ජැකොබියන්වරුන් විසින් කරන ලද්දේ ධනපති පංතියේ බුද්ධිමය හා සදාචාරමය නායකත්වය යටතේ ප්‍රංශ ජාතිය සංවිධානය කිරීමකි (Gramsci,2007). ඒ අනුව හෙජමොනිය පිළිබඳ ග්‍රාම්ස්චියානු සූත්‍රගත කිරීමේ ප්‍රජාතාන්ත්‍රික මානය පවතින්නේ ලෙනින්ට වෙනස්ව හෙජමොනික භාවිතය විසින් ම සමාජ ඒජන්තයින්ගේ අනන්‍යතාව ගොඩනැඟීම පරිවර්තනයට ලක්වීම පෙන්-වාදුන් නිසායගග්‍රාම්ස්චිගේ "සාමූහික අභිමතය" (Collective Will) සංකල්පය ඔස්සේ මෙම කාරණය වඩාත් පැහැදිලි කර තිබේ. මිනිසුන් අතර දෘෂ්ටිවාදීව ගොඩනංවනු ලබන සාමූහික අභිමතය දේශපාලන බලවේගයක් ලෙස මූර්තිමත්වීම"නූතන කුමාරයා" නම් අලංකාරිකයක් ලෙස පෙන්වා දීමට ග්‍රාම්ස්චි කල්පනා කර ඇත.ඒ අනුව "නූතන



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කුමාරයා'' (දේශපාලන පක්ෂය/බලවේගය) විසින් සමාජයේ බුද්ධිමය හා සදාචාරමය ප්‍රතිසංස්කරණයන් දියත් කරනවා යනු නව ලෝක දැක්මක් වටා ජනයා අතර දෘෂ්ටිවාදීමය එක්සත්භාවයක් ගොඩ නැංවීමයි. කෙනෙකුට එරෙහිව තව කෙනෙකු ලෙස සමස්තයක් ගොඩ නැංවීමයි.මෙහි දී පංතිය ස්වකීය ආර්ථික අභිලාෂයන් ඉක්මවා ගොස් සෙසු විවිධ පංතීන් හා කණ්ඩායම් අතර පොදු දේශපාලන අරමුණ, විශ්වාසයන් හා භාවිතයන් බෙදා ගැනීම යි. එය ප්‍රංශයේ ජැකොබියන්වරයෙකු ගේ භූමිකාව භාර ගැනීමකට සමාන බව ග්‍රාම්ස්චිගේ පිළිගැනීම ය. එසේ නමුත් මෙයින් අදහස් කරනු ලබන්නේ හුදෙක් උපරි ව්‍යුහයේ පමණක් සිදු කෙරෙන පරිවර්තනයක් නොවේ. සැබවින් ම ග්‍රාම්ස්චියානු හෙජමොනික න්‍යාය උපරි ව්‍යුහය/අධෝ ව්‍යුහය යන ගතානුගතික වර්ග කිරීම ඉක්මවා යන මෙන් ම සංස්කෘතික ප්‍රතිසංස්කරණය අවශ්‍යයෙන් ම ආර්ථික ප්‍රතිසංස්කරණයන් සමග ද සම්බන්ධ විය යුතු බව ග්‍රාම්ස්චිගේ විශ්වාසය යි.

ශන්තාල් මූෆ් පෙන්වා දෙන පරිදි ග්‍රාම්ස්චිට අනුව හෙජමො-නික විය හැක්කේ මූලධාර්මික පංතියකට (Fundermental Class) පමණි. මන්දයත් හෙජමොනිය සදාචාරමය හා දේශපාලනික වන අතර ම එය ආර්ථික ද වන බැවිනි (Mouffe 1979).

ග්‍රාම්ස්චියානු හෙජමොනික න්‍යායේ රැඩිකල් මානය වන ව්‍යුහයන්, උපරිව්‍යුහයන් ඉක්මවායාමේ තත්ත්වය මනාව පැහැදිලි කර ඇත්තේ ඓතිහාසික හවුල (Historical bloc) සංකල්පය ඔස්සේ ය.එහෙත් ඒ පිළිබඳ දිගින් දිගටම කරුණු විභාග කිරීම අපගේ ප්‍රස්තුතයට අදාළ නොවන බැවින් මෙම ''සාමූහික අභිමතය'' යන්නෙහි දේශපාලන-සංස්කෘතික-සමාජීය මානය පමණක් අවධානයට ලක් කළ මනා ය.

රැඩිකල් දේශපාලන වෙනසක් වෙනුවෙන් ග්‍රාම්ස්චි විසින් මෙලෙස පවත්නා සමාජ ක්‍රමයට එරෙහිව මැදහත්වීමක් යෝජනා කරන විට ම මේසා ම සාමූහික ව ගොඩනංවන ලද කැමැත්තකින් පවත්නා ක්‍රමය පාලකයින් මෙන් ම සමාජ බලවේග විසින් පවත්වාගෙන යන බව ද අප පිළිගත යුතු ය.වෙනත් අයුරකින් කිවහොත් දේශපාලනික ව ජනඅනුමැතිය ගොඩනැංවීම හෝ පවත්නා ජන-අනුමැතිය ඒ අයුරින් ම පවත්වාගෙන යාමත් හෙජමො-නික ක්‍රියාදාමයකි.එනම් කැමැත්තෙන් යටත්වීම හෙවත් අනුමැතිය අභ්‍යාස කිරීම හෙජමොනිය යි.ඒ නිසා ම ප්‍රතිහෙජමොනික දෘෂ්ටිවාදයක් පෝෂණය කිරීම හෝ ඒ වෙනුවෙන් අරගල කිරීමට ප්‍රථමයෙන් පවත්නා පාලන ක්‍රමය හෝ සමාජ ක්‍රමය ඒ අයුරින් ම පවත්වාගෙන යාමට බලපවත්වන හෙජමොනික යථාර්ථය අර්ථ දක්වා ගැනීම කළ යුතු ය.ඒ අනුව ග්‍රාම්ස්චියානු න්‍යායික දැනුම පදනම් කොටගෙන මාධ්‍ය භූමිකාව ඔස්සේ ලාංකේය සහවාදයක් හඳුනා ගැනීමට මෙහිදී හැකියාව ලැබෙනු ඇත. ඉතාලියට සාපේක්ෂව වරනහන ලද මෙම න්‍යාය ලාංකේය උදාහරණවලට දැක්වන සම්බන්ධය වෙන ම පරීක්ෂා කළ හැකිය. සුමිත් චාමින්දට අනුව සම්ප්‍රදායික මාක්ස්වාදී ඉගැන්වීම් තුළ වූ ''දෘෂ්ටිවාදය යනු ව්‍යාජ විඥානයකි'' යන්නට වෙනස්ව ග්‍රාම්ස්චිගේ දෘෂ්ටිවාදය පිළිබඳ න්‍යාය වටහා ගැනීමේ යතුර ඇත්තේ දෘෂ්ටිවාදය හා අදහස් එකිනෙකින් වෙන් කිරීම තුළයි (චාමින්ද, 2003). දෘෂ්ටිවාදය වනාහී ව්‍යාජ විඥානයක් නොවන බවත්, එය මායාවක් හෝ රැවටීමක් නොවන බවත්, කෙටියෙන් ම කිවහොත් ග්‍රාම්ස්චි විසින් දෘෂ්ටිවාදය යයි සලකන ලද්දේ මිනිසුන් සිතන පතන හා කතා කරන ආකාරය නොව ඔවුන්ගේ ඇත්ත ජීවිතය බැව් මෙහිදී පැහැදිලි කරන ලදී. Gramsci immediately places himself on the entirely different ground from those viewing ideology as false consciousness or as a system of ideas (Mouffe,1979).ග්‍රාම්ස්චිට වෙනස් සංදර්භයක දෘෂ්ටිවාදය ව්‍යාජ විඥානයක් ලෙස සැලකීම යළි පිහිටුවන්නට සිදුවීම පිළිබඳ මූෆ්ගේ අදහස උපුටා දක්වමින් චාමින්ද මෙසේ ලියයි.

''ව්‍යාජ විඥානය යයි කියන විට ම යම් තැනක අව්‍යාජ විඥානයක් තිබෙන බව පිළිගන්නට සිදු වේ.(එනම් දෙවන ජාත්‍යන්තරයේ මාක්ස්වාදීන් විශ්වාස කළ පරිදි කම්කරුවාට කම්කරු පංති විඥානයක් තිබීම.)නමුත්, ග්‍රාම්ස්චිගේ කාලයේ සමාජවාදීන් මෙසේ ව්‍යාජ විඥානයක් යයි හඳුනාගත් ජර්මානු සහ ඉතාලි ජාතිවාදය ග්‍රාම්ස්චි ඉදිරියේ පෙනී සිටියේ ව්‍යාජයක් ලෙස නොවේ. සමාජ විප්ලවය සිදුවේ යයි ලෙනින් පවා අවසාන මොහොතේදී විශ්වාස කළ ජර්මනිය නාසිවාදයේ ග්‍රහණයට ලක් විය. ඉතාලි සමාජවාදයේ බලාපොරොත්තුව ෆැසිස්ට් ව්‍යාපාරය විසින් විනාශ කර දමන ලදී. 'අවන්ත'පුවත්පතේ හිටපු කතුවරයා ග්‍රාම්ස්චි ෆැසිස්ට් සිරගෙයක සිර කළේය. (මෙම භෞතික අත්දැකීම්වලින් වෙන්කරගන්නා ග්‍රාම්ස්චි වනාහී නිකම් සාහිත්‍ය කතාවක වීරයෙක් පමණි.) එහෙයින්, ඉතාලි/ජර්මානු ජාතිවාදය හුදු අදහසක්, ව්‍යාජ-මනසක් හෝ මායාවක් යයි කිව නොහැකිය. එය භෞතික බලවේගයකි. ''ඉතිහාසයේ නීති'' වලට විරුද්ධව යමින් ඉතාලි කම්කරුවා, කම්කරුවෙකු නොවී ඉතාලි ජාතිකයෙකු බවට පත්විය. මෙම ඉතාලි ජාතිකයා පැවති කම්කරු ව්‍යාපාරයට එරෙහිව ආයුධ අතට ගත්තේය. මේ අනුව ''ඉතාලි ජාතිය'' නම් අදහස දැන් හුදෙක් අදහසක් පමණක් නොවේ. එය දෘෂ්ටිවාදයකි'' (චාමින්ද, 2003).

මේ අනුව ග්‍රාම්ස්චිට අනුව අදහස් සංකල්පීය වුවත් දෘෂ්ටිවාදය භෞතිකවීම ලාංකික සුවිශේෂත්වයන්ට ද එකසේ අදාළ කර ගත හැකි ය. එනම් අපගේ අවධානය යොමු විය යුත්තේ කම්කරුවාවීම පසෙකලා ජාතික රාජ්‍යයක් ලෙස නිදහස ලබන විට වුව''ලාංකික ජාතිය'' නොවී හුදු ''සිංහල'' වීම, එතැනිනුදු නොනැවතී ''බෞද්ධාගම'' ආගමක් හෝ දර්ශනයක් නොවී ''සිංහල-බෞද්ධ'' සාරයක් බිහිවීම කෙරෙහි ය. පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය හැසිරීම පිළිබඳ විමසීමේදී ජර්මනියේ කම්කරුවා, කම්කරුවෙකු නොවී ''නාසිවාදියෙකු'' වී යුදෙව්වන් සමූල ඝාතනය කිරීමට පෙළඹීම, ඉතාලියේදී කම්කරුවා, කම්කරුවෙකු නොවී ඉතාලි ජාතිකයෙකු බවට පත්වී කම්කරුවන්ට එරෙහිව අවි අතට ගැනීමට පෙළඹීම මෙන් ම ලාංකිකයා, කම්කරුවෙකු හෝ ලාංකිකයෙකු නොවී සිංහල-බෞද්ධයෙකු වී දෙමළ ජනයාට එරෙහිව අවි අමෝරා ගැනීම සන්දර්භ වෙනස් වූ එකම ක්‍රියාදාමයකි.


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

යුද කාලීනව මෙන් ම ඊට පෙරාතුව ද කාලාන්තරයක් තිස්සේ මෙම සතුරා නිර්මාණය කළ බවත්, යුද කාලයේදී එකී සතුරා මුහුණට මුහුණ හමු වූ බවත් පැහැදිලිය. එහෙත් යුද්ධ කාල වකවානුවේ මෙන් ම ඊට පෙර සිට "ද්‍රවිඩ ජාතිකයා" සතුරාවීම යන කාරණය වඩාත් අර්ථ ගැන්වීමට හැකි පරිදි පසු කලෙක "මුස්ලිම් ජාතිකයා" සතුරා බවට පත්වීම පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ අත්දැකිය හැකි විය. ඒ අනුව ද්‍රවිඩ ජාතිකයා සතුරා කළ ස්වරූපය ම වෙනස් නවීන උපාය උපක්‍රම හෝ තාක්ෂණය ඔස්සේ "මුස්ලිම් ජාතිකයා" කෙරෙහි ආදේශවීම දැකිය හැකිය. මෙම දෘෂ්ටිවාදය ගොඩ නැඟීමට ජනමාධ්‍යය විසින් ඉටුකරනු ලැබූ මෙහෙවර තීරණාත්මක ය.මෙම අර්ථයෙන් මෙම යුගයේ හෙජමොනිය හා දෘෂ්ටිවාදය ගොඩනැංවීමෙහි ලා හා නඩත්තු කිරීමෙහි ලා ප්‍රමුඛයා වන්නේ ජනමාධ්‍යයි. ඊට කැමැත්තෙන් අවනතවීම හෝ එය යථාර්ථයක් ලෙස භාරගැනීම තුළ "මාධ්‍ය හෙජමොනිය" කෙරෙහි වන පශ්චාත් යුද ලාංකේය බැඳියාව මෙන් ම එය අද්‍යතන දෘෂ්ටිවාදයේ මුහුණුවර බවට නිතැතින් ම පත්ව තිබේ.

### ලුවී අල්තූෂර් (1918-1990) දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ

පශ්චාත් මාක්ස්වාදී චින්තකයෙකු ලෙස සැලකෙන ලුවී අල්තූෂර් ලියූ Lenin and Philosopyand Other Essays (1970) කෘතියේ සඳහන් කරන පරිදි "දෘෂ්ටිවාදී හා දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ" විසින් දෘෂ්ටිවාදී නිෂ්පාදනයේ තත්ත්වයන් ප්‍රතිනිෂ්පාදනය කරයි (Althusser, 1970). අල්තූෂර් විසින් දෘෂ්ටිවාදය නියෝජනය කරන මාදිලි කිහිපයක් හඳුනා ගන්නා අතර ඒවා පහත පරිදි සාරාංශ ගත කළ හැකි ය.

- ආගමික දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණ: පන්සල්/පල්ලි/දේවස්ථාන ආදී ආගමික ආයතන.
- අධ්‍යාපන දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණ: රජයේ හා පුද්ගලික පාසල් පද්ධතිය.
- පවුල්මය දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණ: මව-පියා-සහෝදර-සහෝදරියන්ගෙන් සැදුම්ලත් පවුල.
- නෛතික දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණ: නීතිය, පිළිවෙළ හා එය ආරක්ෂා කරන පොලීසිය, බන්ධනාගාර ඇතුළු රාජ්‍ය මර්දන ආයතන.
- දේශපාලනමය දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණය: දේශපාලන පක්ෂ, බලපෑම් කණ්ඩායම් ඇතුළු සම්ප්‍රදායික දේශපාලන ආයතන.
- වෘත්තීය සංගම් දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණය: වෘත්තීය සමිති.
- සන්නිවේදන දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණය: පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනී ආදිය.
- සංස්කෘතික දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණය: සාහිත්‍යය, කලා ශිල්ප, ක්‍රීඩා ආදිය.

පවත්නා හෙජමොනික සමාජ සබඳතා ඒ අයුරින් ම පවත්වාගෙන යාමට හෝ නව හෙජමොනික අවකාශයක් ගොඩනඟා ගැනීමට සෘජුව සම්බන්ධ වී ඇති දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණ දෙකක් බැලූ බැල්මට හඳුනාගත හැකිය.ඒ සන්නිවේදන දෘෂ්ටිවාදී රාජ්‍ය යන්ත්‍රණ හා සංස්කෘතික දෘෂ්ටිවාදී යන්ත්‍රණය සෙසු අවස්ථාවන් දුරස්ථ යයි පෙනුනද, පශ්චාත් මාක්ස්වාදී දෘෂ්ටි කෝණයකින් සලකා බලන්නේ නම් ඒ කිසිවක් ද්විතීයික නොවන තරමට එකිනෙක හා අතිපිහිතවී පවතියි. නිදසුනක් ලෙස පළමු කාරණය හෙවත් ආගමික දෘෂ්ටිවාදී කාරණය අදාළ කරගත හැකිය. ආගම දහම තුළින් සිදු කරනු ලබන්නේ පුද්ගලයා ශික්ෂණය කරන්නා වූත්, සමාජානුයෝජනය කරනු ලබන්නාවූත් ක්‍රියාවලියක් යයි එකහෙළාම පැවසිය හැකි වුවත් එසේ ශික්ෂණය කරනු ලබන ක්‍රියාවලිය තුළ සිදුවන්නේ ද පවත්නා සමාජ ක්‍රමය ප්‍රශ්න කිරීමකින් තොරව ඒ අයුරින් ම පවත්වාගෙන යාම සඳහා අවැසි කොන්දේසි සපුරාලීමය. වෙනත් විදිහකට කියන්නේ නම් සමකාලීන සමාජ තත්ත්වය හා සමාජ සබඳතා සමග අනන්‍යවූ හෙජමොනිය ප්‍රතිනිෂ්පාදනය කිරීම ය. පවුල, අධ්‍යාපනය ඇතුළු අන් සෑම කරුණක් ම මීට එක සේ අදාළ ය. ඒ අනුව පුවත්පත් වාර්තා කිරීම්, රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය කිරීම්, පුවත් හෝ වැඩසටහන් ඉදිරිපත් කිරීම් පමණක් නොව ඒවා ග්‍රාහකයින් විසින් ලබා ගැනීමට කැමැත්තෙන් පෙළඹීම ම හෙජමොනික තත්වාරෝපිතයක ප්‍රකාශනයකි. ඒ අනුව යුදමය වාර්තා කිරීම්වලදී ආරක්ෂක අංශ සාමාජිකයින් දිවිපිදීමත්, එල්.ටී.ටී.ඊ සාමාජිකයින් "ත්‍රස්තවාදීන් කිරීම" මෙන් ම ඔවුන් මැරුම්කෑම ආදිය ආලංකාරික භාෂාවකින් ඔපමට්ටම් වුව ද, එකී අතිශයෝක්තීන් අතිශය සාමාන්‍යකරණය කොට භාර ගැනීම මෙම දේශපාලන-සමාජ ක්‍රියාදාමයේ කදිම ප්‍රතිඵලයකි.

අදහස් ලෝකයේදී සවිඥානක ව බෙදාහදා ගත හැකි දේ දෘෂ්ටිවාදී තලයේදී ව්‍යවහාරිකව ව්‍යුහගත වී ඇති බැවින් අවිඥානක විය හැකිය. නිදසුනක් ලෙස කෙනෙකුට ධනේශ්වර විරෝධී අදහස් තිබිය හැකිය. එසේ වුව ද ව්‍යවහාරික ජීවිතය හා සමාජ සම්බන්ධතා තුළ ඔහු/ඇය උග්‍ර ධනවාදියෙකු වීමේ හැකියාව තිබේ. පුද්ගලිකත්වයෙන් ඒවායේ පැවැත්මෙහි කොන්දේසිවලට දක්වන පරිකල්පනීය සම්බන්ධයෙහි නියෝජනයක් ලෙස දෘෂ්ටිවාදය සැලකිය හැකි බව අල්තූෂර් පෙන්වා දෙන්නේ ඒ නිසා ය (Ibid,1970). යුදමය වකවානුව තුළ මෙන් ම පශ්චාත් යුද කාලීනව ද, යුද අපරාධ හා මානව හිමිකම් කඩවීම් පිළිබඳ ජනමාධ්‍ය තුළ කතිකාවක් ගොඩනොනැගෙන්නේ ද, මිනිසුන් ඒ පිළිබඳ ප්‍රශ්න නොකරන්නේ ද අදහස් ලෝකයක් තුළ එකී කාරණා කෙරෙහි සවිඥානක වුව ද, ව්‍යවහාරිකත්වය හෙවත් දෘෂ්ටිවාදී පැවත්ම තුළ අවිඥානකව එකී තත්ත්වය බාර ගැනීමට සූදානම් නිසා ය. "ආගමික දෘෂ්ටිවාදය, ආචාර ධර්මීය දෘෂ්ටිවාදය, දේශපාලන දෘෂ්ටිවාදය වශයෙන් අපට එය පොදුවේ හැඳින්විය හැකිය. බොහෝ වෙලාවට එය පොදුවේ ලෝක දෘෂ්ටිය යි. සත්‍යය වශයෙන් ම උපකල්පනය කරමින් සිටින ආකාරයට මෙම දෘෂ්ටිවාදයෙන් එකක අප සැබෑ ලෙස ජීවත් නොවේ.


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(නිදසුනක් ලෙස දෙවියන් විශ්වාස කිරීම, රාජකාරිය, සාධාරණත්වය...ආදී වශයෙනි.) විවේචනාත්මක දෘෂ්ටියකින් යුතුව සාකච්ඡා කරමින්, ප්‍රාථමික සමාජයේ මිථ්‍යාවන් පිළිබඳ මානව වංශවේදාත්මක පිරික්සුම් පරීක්ෂා කරමින් අප එකී ඒ දෘෂ්ටිවාදයට ඇතුළුවීම සිදු වේ. මේ ලෝක දෘෂ්ටිය පවා දැඩිව දෘෂ්ටිවාදීය. ඒ කෙසේ ද යත්, යථාර්ථය ප්‍රාදේශීයකරණය කරන්න හැකියාවක් නොමැත" (Ibid,1970).

1845 වර්ෂය වන විට පශ්චාත්-හෙගලියානු දර්ශනවාදය විවේචනය කරනු පිණිස මාක්ස් හා ඒංගල්ස් විසින් ලියනු ලැබූ "ජර්මානු දෘෂ්ටිවාදය" කෘතිය මගින් නිෂ්පාදනය මාදිලිය හා නිෂ්පාදනය සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස දෘෂ්ටිවාදය තහවුරු වන අයුරු පෙන්වා දෙයි. සම්භාව්‍ය මාක්ස්වාදය තුළ දෘෂ්ටිවාදී රාජ්‍ය මර්දන උපකරණ ලෙස හඳුනාගනු ලබන පොලීසිය, නීතිය, අධිකරණ පද්ධතිය, බන්ධනාගාර ආදිය වෙනුවට එකී ආයතන ද ඇතුළත්ව රාජ්‍ය දෘෂ්ටිවාදී උපකරණ ලෙස පශ්චාත් මාක්ස්වාදීන් විසින් හඳුනාගනු ලබන අප ඉහතින් දැක්වූ මර්දනමය බව සහවා දියත්කෙරෙන මර්දනයෙන් යුතු පවුල, පාසල ආදි දේ මගින් කෙරෙන බලපෑම අතිශය සාමාන්‍යකරණය වී අවිඥානක ව පවතී.

### හෙජමොනිය, දෘෂ්ටිවාදය හා ජනමාධ්‍ය

ව්‍යවහාරයේ පවත්නා සාමාන්‍ය දැනුම හෙවත් "පොදු පිළිගැනීම" යන්නෙන් දැක්වෙන අවබෝධය ස්වභාවික යයි බොහෝ දෙනෙකු විශ්වාස කරයි. එසේ වුව එය ද දේශපාලනික මැදිහත්වීමක් මගින් ගොඩනංවන ලද දෙයකි. වෝල්ටර් ලිෆ්මාන් (1889-1974), 1920 දශකය තරම් ඈත යුගයේදී අනුමැතිය නිෂ්පාදනය කිරීම පිළිබඳ විධිමත්ව පෙන්වාදෙන ලදී. ජනප්‍රිය ආණ්ඩුවල ප්‍රචාරණ ව්‍යාපෘති විධිමත් ඉන්ද්‍රියක් ලෙස පෙනී සිටින බවත්, එය නොනැවතී විදග්ධ හා වැදගත් අංගයක් ලෙස වර්ධනය වන බවත් හෙතෙම අවධාරණය කරන ලදී (Lipmann,1932).

ලිෆ්මාන්ව උපුටා දක්වමින් මෙන් ම ඔහුගේ ඉගැන්වීම් වඩාත් අර්ථ ගන්වමින් සංවර්ධන කරන ලද්දේ නෝම් චොම්ස්කි විසිනි. එඩ්වර්ඩ් එස්. හර්මන් සහ නෝම් චොම්ස්කි විසින රචිත Manufacturing Consent;The political Economy of the Mass Media (1988) කෘතියෙන් ප්‍රචාරණයක මාදිලි කිහිපයක් පිළිබඳ පෙන්වාදී තිබේ. ප්‍රචාරණ මාදිලියක් නාභිගත වී ඇත්තේ ධනයෙහි හා බලයෙහි විෂමතාවන් සහ ජන මාධ්‍යයේ කැමැත්ත හා තෝරාගැනීම් මත පදනම් වූ විවිධ තලයන් කෙරෙහි ය. මුදල් හා බලය විසින් ප්‍රවෘත්ති පෙරා දක්වයි. ඒ කෙසේ ද යන්න වග තේමාවන් කිහිපයක් ආශ්‍රයෙන් චොම්ස්කි පැහැදිලි කරයි. ඔහු ඒවා පෙරහනය හෙවත් ෆිල්ටර ලෙස හඳුන්වයි.

#### 01. ප්‍රමාණය: හිමිකාරිත්වය හා ජනමාධ්‍යයේ ලාභ සංස්ථාපනය

ප්‍රමාණාත්මකව මහා පරිමාණයේ ආයෝජනයන්ට සරිලන ජනතාව අතරට යාමේ ශක්‍යතාවක් හිමි මාධ්‍ය හිමිකාරිත්වයේ සීමා අදාළ වූයේ සියවසකට හෝ ඊටත් පෙර වුව ද, අද වන විට එහි බලපෑම වැඩිවී ඇති බව චොම්ස්කි පෙන්වා දෙයි (Chomsky,1988). ඒ වන විට අමෙරිකා එක්සත් ජනපදය තුළ පැවති මාධ්‍ය ආයතන හා ඒවායේ හිමිකාරිත්වය මෙන් ම ලාභය අරමුණුකොටගත් ප්‍රවෘත්ති නිෂ්පාදනය පිළිබඳ මෙහි උදාහරණ සහිත ව සාකච්ඡා කෙරෙයි.

#### 02. වෙළඳ දැන්වීම්කරණය: ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා දීම

මාධ්‍යට වෙළඳ දැන්වීම් ලබා ගැනීමේ කාර්යය, වෙළඳ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියකට සමාන ය. වෙළඳාම තුළ ඇත්තේ ලාභ ලබා ගැනීමේ අරමුණ මිස අන් කිසිවක් නොවේ. එවක NBC-TV ප්‍රධානියා වූ ග්‍රාන්ට් ටින්කර් උපුටා දක්වමින් චොම්ස්කි පැහැදිලි කරනුයේ "ටෙලිවිෂනය" යනු වෙළඳ දැන්වීම්කරණ මාධ්‍යයක් බවයි. එය අසාර්ථක වන්නේ නම් වැඩසටහන් වෙනස්වනු ඇති බව ඔහු අවධාරණය කරයි (Ibid,1988:16).

#### 03. ප්‍රවෘත්ති මූලාශ්‍ර

ප්‍රවෘත්ති මූලාශ්‍ර තුළ පවත්නා දේශපාලනික හා ආර්ථික කොන්දේසි පිළිබඳ මෙහි ලා දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරෙයි. විශේෂයෙන් ම එක්සත් ජනපද ගුවන් හමුදාවන්හි ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රවෘත්ති මූලාශ්‍ර සම්පාදනය කිරීම කෙරෙහි දක්වන විශේෂ සැලකිල්ල මෙහි ලා කරුණු සහිත ව විමසුමට ලක්කර ඇත.

#### 04. නිෂේධ ප්‍රහාර සහ බලධාරියෝ

Flak and The Enforcers යනුවෙන් චොම්ස්කි විසින් පැහැදිලි කරන මෙම තත්ත්වය ප්‍රවෘත්ති හා තොරතුරු පෙරීමට ලක්වන අනෙක් අවස්ථාවයි. Flak යන්න පිළිබඳ ඍජු ශබ්දකෝෂාර්ථයක් සිංහලට වරනැඟිය නොහැකි වුව ද, එහි අර්ථය වනුයේ ඍජු /නිෂේධ ප්‍රහාර, එසේත් නැතිනම් ප්‍රතිචාරයි. ඒ සඳහා බල මුළුගැන්වීම යි. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ 7 වන සංස්කරණයේ මෙසේ දැක්වෙයි. noun(U)1.guns on the ground that are shooting at enemy aircraft;bullets from these guns.(Oxford Adwanced Learners Dictionary-585). සමාජයේ කෙතරම් ආධිපත්‍යධාරී තත්ත්වයක පැවතුණ ද , මාධ්‍ය ආයතනවලට මෙලෙස පහළින් එකවර සංවිධානාත්මක ව එල්ලවිය හැකි ප්‍රහාර තීරණාත්මක ය. ප්‍රවෘත්ති හෝ තොරතුරු නිෂ්පාදනයේදී මාධ්‍ය ආයතනවලට එවැනි ආකාරයේ ප්‍රතිචාර ලිපි, ටෙලිග්‍රෑම්, දුරකථන, පෙත්සම්, අධිකරණ නියෝග, ආදිය මෙන් ම තර්ජන හා විවිධාකාරයේ දිඩුවම්වල ස්වරූපයෙන් පැමිණිය හැකි බව චොම්ස්කි පෙන්වා දෙයි. අද වන විට මෙම තත්ත්වය ජාතික හා ජාත්‍යන්තර ගිවිසුම්, උද්ඝෝෂණ, උපවාස, පැහැර ගැනීම් ආදිය දක්වා ම දිගු කළ හැකි ය. විශේෂයෙන් ම රූපවාහිනී මාධ්‍ය වෙළඳ දැන්වීම් මත රඳා පවතින බව හා සංවිධානාත්මක ලෙස වෙළඳ දැන්වීම් හා පාරිභෝගික භාණ්ඩ වර්ජනය කිරීමට බල මුළුගැන්වීම මගින් බලපෑම් එල්ල කළ හැකි බව මෙහි ලා නිදසුන් සහිත ව සාකච්ඡා කර ඇත. නිදසුනක් ලෙස මැකාති යුගයේදී මෙම තත්ත්වය දක්නට ලැබුණු බව චොම්ස්කි


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පැහැදිලි කරයි. මේ හේතුව නිසා නිෂේධ ප්‍රහාරාත්මක යන්ත්‍ර නිරන්තරයෙන් ජනමාධ්‍යට ප්‍රහාර එල්ලකරන බවත්, ඒ නිසා ම ජනමාධ්‍ය ඔවුන්ට නිරන්තරයෙන් සත්කාර දක්වන බවත් කිව හැකිය (Ibid,1988:28).

### 05. පාලන යන්ත්‍රණයක් ලෙස කොමියුනිස්ට් විරෝධය

සෝවියට් දේශය, චීනය හා කියුබාව තුළ ප්‍රතිපත්තියක් ලෙස බටහිර දෘෂ්ටිවාදයට එරෙහිව කටයුතු කිරීමට සමගාමීව එහි ම යම් යම් ඒකාධිපති ලක්ෂණ ආදිය දඩමීමා කරගනිමින් සූක්ෂම ලෙස කොමියුනිස්ට් විරෝධයක් සාමාන්‍ය දෘෂ්ටිවාදය බවට පත්කර ඇති අයුරු මෙම පෙරහන්කඩයෙන් සාකච්ඡා කර තිබේ. පුද්ගල නිදහස, පුද්ගලවාදය අධිනිශ්චය කිරීම ම අනෙක් පසින් මාධ්‍ය තුළ තොරතුරු හා අනුමැතිය නිෂ්පාදනය කිරීමට ඉවහල් වන ආකාරය මෙමගින් පෙන්වා දෙයි.

අද වන විට සෝවියට් දේශයේ කොමියුනිස්ට් ක්‍රමයක් දක්නට නොමැති අතර චීනය හා කියුබාව තුළ දක්නට ඇති තත්ත්වය ද කොමියුනිස්ට්වාදය හා ලෝක තත්ත්වයන් මෙන් ම න්‍යායන් ගැඹුරින් අධ්‍යයනය කළ යුතු මට්ටමක පවතී. කෙසේ වෙතත් චොම්ස්කිගේ මෙම අර්ථ දැක්වීම් ලාංකේය සුවිශේෂ තත්ත්වයන් තුළ අඩුවැඩි වශයෙන් ඒ ආකාරයට ම දක්නට ලැබෙයි. මුල් පෙරහන්කඩ 4 ම ශ්‍රී ලංකාවට ආවේණික ලෙස යම් යම් ආයතන, මැදිහත්වීමේ ස්වරූප, ඌන-සංවර්ධනයේ ගතිකයන්, ඒජන්මතමය භූමිකාවන් ආදී ආකෘතිමය හා අන්තර්ගතමය වෙනස්කම් සහිත ව අත්දැකිය හැකි බව කිව හැකි ය.

## පර්යේෂණ ගැටලුව

දෘශ්‍ය සන්නිවේදනය යනු හුදෙක් තොරතුරක් සම්ප්‍රේක්ෂණය කිරීමක් පමණක් නොව දේශපාලනික වුවමනාවක් සහිත ව ඇතැම් විට පාරභෞතිකභාවී මැදිහත්වීමකි. එසේ වන්නේ කොහොම ද?

## පර්යේෂණ අරමුණ

පොදුවේ සන්නිවේදනයේත්, මෙම පර්යේෂණ ලිපියට අදාළ ව දෘශ්‍ය සන්නිවේදනයේත් පාරභෞතිකභාවය හැදෑරීමට හෙජමොනිය හා දෘෂ්ටිවාදය යන සංකල්පයන් භාවිතා කළ හැකි බව පෙන්වා දීම.

## පර්යේෂණයේ වැදගත්කම

නූතන යුගයේ ආරම්භයේ සිට තොරතුරු හුවමාරුව, සම්ප්‍රේක්ෂණය 'සන්නිවේදනය' ලෙස හඳුනාගත් අතර ඒ සඳහා යොදා ගත් මෙවලම් 'මාධ්‍ය' බවටත්, ඉක්බිතිව 'ජනමාධ්‍ය' බවටත් පත් විය. මුද්‍රිත මාධ්‍ය හෝ විද්‍යුත් මාධ්‍ය කෙරෙන් ප්‍රකාශයට හෝ විකාශයට පත් කෙරෙන තොරතුරු පිළිගැනීමට ජනයා පුරුදුවී සිටිති. ඒ බොහෝ දේ නිවරදි තොරතුරු ලෙසත්, තමාට ප්‍රයෝජනවත් දේ ලෙසත් නිරන්තරයෙන් ඇදහීමට ලක් වෙයි. එහෙත් මෙම තොරතුරු සෑම විට ම සත්‍ය තොරතුරු නොවන බවටත්, ඒ පිටුපස දේශපාලන බලාධිකාරියක් ක්‍රියාත්මක වන බවත් අවධානයට ගත යුතුය. දේශීය වශයෙන් මෙන් ම ජාත්‍යන්තර වශයෙන් ද, මෙකී ක්‍රියාකාරිත්වයේ සාම්‍යත්වයක් දැකිය හැකිය. එහෙත් ඒ ඒ රටවලට ආවේණික සුළු සුවිශේෂත්වයන් ද පවත්නා බව හඳුනා ගනිමින් දේශපාලන විෂය ක්ෂේත්‍රය තුළ වැඩි අවධානයට ලක් ව ඇති හෙජමොනිය, දෘෂ්ටිවාදය වැනි සංකල්ප ඇසුරින් ඇසට පෙනෙන සන්නිවේදන ක්‍රියාවලිය කෙතරම් පාරභෞතික විය හැකිදැයි වටහා ගැනීම යුග අවශ්‍යතාවකි. එය විෂය ක්ෂේත්‍රයට පමණක් නොව පුද්ගලික හා සමාජීය ජීවිතයට පවා අතිශය වැදගත් ය.

## පර්යේෂණ ක්‍රමවේදය

සන්නිවේදනය හෝ දේශපාලන ක්ෂේත්‍රයට අදාළ ව පොත පත හා දත්ත බහුල වුව ද, දේශපාලන සන්නිවේදනයට හෝ සෘජුව මෙම ප්‍රස්තුතයට ආමන්ත්‍රණය කෙරෙන ලියවිලි ඉතාමත් අල්ප ය. එබැවින් තොරතුරු එකතු කිරීමේ දී අන්තෝනියෝ ග්‍රාම්ස්චි, ලුවී අල්තුෂර්, නෝම් චොම්ස්කි, අර්නස්ටෝ ලක්ලාව්, ශන්තාල් මූෆ් වැන්නන්ගේ න්‍යායික සංකල්ප ඇතුළත් කෘති ප්‍රාථමික දත්ත ලෙසත්, එකී කෘති අරබයා ලියැවුණු අර්ථ විවරණ සහිත ලියවිලි සහ සිංහල පරිවර්තන ද්විතීයික දත්ත ලෙසත්, තවත් විටෙක යුදමය පසුබිම ආශ්‍රිතව ලියැවුණු කෘති මෙන් ම සමකාලීන මාධ්‍ය අත්දැකීම් නිරීක්ෂණ ක්‍රමවේදාත්මක නැඹුරුවකින් විශ්ලේෂණයට ලක් කිරීමටත් අපේක්ෂා කෙරිණි. ප්‍රස්තුතයට අදාළ ව කරුණු පෙළ ගැස්වීමේ දී මාක්ස්වාදී හා පශ්චාත් මාක්ස්වාදී න්‍යායික හා සංකල්පීය පසුබිමක සාකච්ඡා කෙරුණු බවත්, මෙය හුදෙක් න්‍යායික සංකල්ප ද්විත්වයක් සාමාන්‍යකරණය කිරීමෙහි ලා භාවිතාවක් බැවින් ලිඛිත සාහිත්‍යමය තොරතුරු මත පදනම් ව ප්‍රායෝගික තත්ත්වය සලකා බැලීමට දරූ උත්සාහයකි.

## සාකච්ඡාව

ලාංකේය පුවත්පත් අයිතිය හා පාලනය පිළිබඳ, ගාමිණී විජේතුංග විසින් කළ නිබන්ධනයේ ආරම්භයේ සිට ම මුද්‍රිත මාධ්‍ය හිමිකාරිත්වය හා දේශපාලන සන්නිවේදනය සිදු වූ අයුරු දක්වෙයි. "ලාංකික පුවත්පත් වෙළඳ ව්‍යාපාරයක් ලෙස වර්ධනය වූයේ ඉතා ම හෙමින් ය. මීට බලපෑ එක් ප්‍රධාන හේතුවක් ලෙස හැඳින් විය හැක්කේ මතවාදී ප්‍රචාරයත්, අලෙවියත් යන අරමුණු දෙකම එකවර ක්‍රියාත්මකවීමත්, අලෙවියෙන් ම පමණක් පුවත්පත් පවත්වාගෙන යෑමට පෙළඹීමත් ය. දෙවෙනි කරුණ 'සරසවි සඳරැස' (1880), 'ලක්මිණි පහන' (1862), 'සිංහල බෞද්ධයා' (1906), 'සිංහල ජාතිය' (1910) ආදී මුල් යුගයේ බිහි වූ බොහොමයක් පුවත්පත් පිටුපස තිබූ බලවේගය වූයේ අලුතින් බිහිවෙමින් ආ නව ධනපති පංතිය වූ අතර, ඔවුන් පුවත්පත් තුළින් ම තම දේශපාලන අනන්‍යතාව ලබා ගැනීමට දරූ උත්සාහය යි. මේ වාණිජ ප්‍රභූ පංතියේ බහුතරය වෙළෙඳුන්, කොන්ත්‍රාත්කරුවන්, ඉඩම් හිමි වැවිලිකරුවෝ වූහ. ඔවුන් පුවත්පත් ආරම්භ කළේ හුදු අලෙවියට වඩා සමාජ දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීමට ය" (විජේතුංග, 2003). වත්මන්හි ලාංකේය පුවත්පත් කර්මාන්තය තුළ අත්දැකිය හැකි ක්ෂණිකව ආරම්භ වී ක්ෂණිකව වෙළඳපොළෙන් තුරන් වී යන පුවත්පත් කෙරෙහි අවධානය යොමු කරන විට ගම්‍ය වන්නේ ද, මෙකී


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

යථාර්ථයම ය.

කෙසේ වෙතත්, මේවන විට කොමියුනිස්ට් ක්‍රමය ලාංකේය සමාජ-දේශපාලනික අවකාශය තුළ ආධිපත්‍යධාරී නොවේ. එය හෙජමොනික හා දෘෂ්ටිවාදීමය කතිකාව තුළ හෝ තේමාවක් ද නොවේ. ඒ වෙනුවට "අධිරාජ්‍ය විරෝධය සමග මුසු වූ සිංහල ජාතිකවාදය" අධිනිශ්චය වී තිබේ. එහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ ජාතිවාදයට එරෙහිව මත පළකරන්නන් "දේශද්‍රෝහීන්" ලෙස නාමකරණය වීම ය. ඒ අනුව "දේශද්‍රෝහීන්" පැහැර ගැනීම, ඝාතනය කිරීම නිහඬ අනුමැතියකට ලක් වී ඇත.දශක ගණනාවක සිට මේ තත්ත්වය අත්දැකිය හැකි අයුරු මානව හිමිකම් ක්‍රියාකාරිණියක හා නිදහස් මාධ්‍යවේදිනියක වන සීතා රංජනී පෙන්වා දෙයි.

"1981 සිට 2009 මාර්තු මාසය දක්වා වන කාලය තුළ මාධ්‍යවේදීන්/ මාධ්‍ය සේවකයින් හෝ කලා සංස්කෘතික ක්‍රියාකාරීන් 114 දෙනෙකු ඝාතනයට ලක් ව තිබේ" (රංජනී, 2011). 2000 දශකයේ මැද භාගයේ සිට 2015 දක්වා කාලය තුළ නීතිය හෝ සදාචාරමය පදනම නොසලකා මිනිසුන් ඝාතනය කිරීමත්, ඒ සඳහා ආරක්ෂක අංශ පවා යොදාගැනීමත් විසින් හඟවනු ලබන්නේ ඛේදවාචකයක තරමය. රාවය කර්තෘ කේ.ඩබ්ලිව් ජනරංජන මෙසේ පවසයි. "යුද්ධය සමගින් කෙරුණු අනෙක් සියලුම ජඩකම්, මනුෂ්‍යත්වයට එරෙහි ක්‍රියා, දූෂණ වංචා සියල්ල යටපත් කිරීමටත්, ඒවා ගැන ප්‍රශ්න නොකිරීමට තරම් ජනතාවට ඒවා ගැටළුවක් නොවන තැනට ජන මානසිකත්වය ගොඩනැංවීමට රෙජිමයට හැකිවුණේ මේ ජනමාධ්‍ය මගින්. අතිශය මිනිස් සංහාරයකට පසුව යුද්ධය ජයග්‍රහණය කිරීමෙන් පසු තවදුරටත් මෙම යාන්ත්‍රණය මෙහෙයවීමට වෙනත් සාධක හොයා ගන්න මේ අයට බැරිවුණා" (ජනරංජන, 2015-11-25).

මේ අනුව චොම්ස්කි විසින් 90 දශකයේ අග භාගයේ දී එක්සත් ජනපද දෘෂ්ටිවාදය, සංදර්භයට ගෙන "කොමියුන-ිස්ට් විරෝධය" පෙරහන්කඩයක් ලෙස හැසිරෙන ආකාරය විමසුමට භාජනය කිරීම මේ මොහොතේ ලාංකේය සුවිශේෂත්වය තුළ "දේශද්‍රෝහී විරෝධය" මෙන් ම එය මර්දනය කිරීමට යොදා ගන්නා ඕනෑම ක්‍රියාවක් සමාජය විසින් ඉවසන තත්ත්වයකට පත්වීම සමග අනන්‍යවන බව කිව හැකි ය.

මේ මොහොතේ ජනතාවගේ සාමාන්‍ය දැනුම හෙවත් "පොදුජන ව්‍යවහාරය" යනු මෙලෙස ජනමාධ්‍ය විසින් ගොඩනංවනු ලබන දෙයකි. එය අතීතයේ සිට ම ඒ ආකාරයෙන් යම් බලඅධිකාරියක ප්‍රතිඵලයක් ලෙස ගොඩනංවනු ලැබූ දෙයක් වන මුත් එහිදී තීරණාත්මක වී ඇත්තේ වෙනයම් සාධක බැව් පැහැදිලිය. වෙනත් ලෙසකින් කිවහොත්, ජනමාධ්‍ය නොතිබුණු ප්‍රාථමික සමාජවල ප්‍රජාමූල නායකයින්, ඇදහිලි හා විශ්වාස, සම්ප්‍රදාය ආදිය කෙරෙන් එය බලපැවැත්වෙන්නට ඇති බව අනුමාන කළ හැකිය. එහෙත් නූතන යුගය තුළ මෙන් ම විශේෂයෙන් ම පශ්චාත් නූතන යුගය තුළ ජනමාධ්‍යයේ භූමිකාව ඉතාමත් තීරණාත්මක වී තිබේ.

**යුද්ධය, ජනමාධ්‍ය ගොඩනැංවීම් සහ දෘශ්‍ය සන්නිවේදනයේ පාරභෞතිකභාවය**

ලංකාවේ පැවති සිවිල් යුද්ධය උතුරට ඛේදවාචකයක් (catastrophe) වනවිට දකුණට ප්‍රමෝදයක් (ecstasy) විය. විටෙන් විට උතුරේ යුද්ධයට යන දකුණේ දිළිඳු තරුණයින් මළ මිනී ලෙස හෝ අත පය අහිමි ආබාධිත පිරිසක් ලෙස ගම රට එනවිට මෙම ප්‍රමෝදය, සාංකාවක් (anxiety) බවට විතැන්වූ බව සැබෑය. එහෙත් ඒ ඉතාමත් තාවකාලිකව ය. මන්දයත් මරණය, දිවිපිදීමක් හා අතපය අහිමිවීම, ඇස්-ඉස්-මස්-ලේ දන්දීමක් ලෙසත්, එය පුණ්‍ය කටයුත්තක් ලෙසත් සමාජය තුළ කතිකාමය අධිපතිත්වයක් නිර්මාණය වී තිබිණි. එය මුළුමනින් ම පාහේ මාධ්‍ය හෙජමොනික ගොඩනැංවීමක් වුව ද, ඒ තුළ ජනජීවිතය පහසු කරනු ලැබිණි. යුද්ධය යනුවෙන් භෞතිකයක් (Physics) පැවති අතර ඒ සම්බන්ධයෙන් මනසින් ගොඩනඟන ලද සංකල්ප ගොන්නක් ද, එනම් පාරභෞතිකයක් ද, (meta-Physics) පැවතිණි. භෞතිකයට ජීවිත හානි, දේපළ හානි, උන්හිටි තැන් අහිමිවීම්, සරණාගතයින්, මානව හිමිකම්, දුක, කඳුළු, වේදනාව සම්බන්ධවන විට පාරභෞතිකයට සම්බන්ධවූයේ සතුරු මරණ සංඛ්‍යාව, අත්පත් කර ගත් බිම් ප්‍රදේශයේ ප්‍රමාණය, වීරත්වය, දේශප්‍රේමීත්වය, අතීත ශ්‍රී විභූතිය වැනි දේය. අප රූපවාහිනී මාධ්‍ය මගින් (දෘෂ්‍ය සන්නිවේදනය) අත්දුටුවේ මෙම පාරභෞතිකත්වය යි. එය ඒ ආකාරයෙන් අත්දකින්නට ජනසමාජයක් ලෙස අපව පුරුදු පුහුණු කරනු ලැබූවේ තත්කාලීන දෘෂ්ටිවාදය යි. "රූපවාහිනිය ජනමාධ-්‍යයක් ලෙස පරිහරණය කිරීමේදී එහි ඇති දේශපාලනික අනතුර වන්නේ එහි පවත්නා යථාර්ථ ආවරණය යි (reality effect). රූප පෙට්ටියෙන් දකින දේ විශ්වාස කිරීමට මිනිස්සු පෙළඹී සිටිති. ඉන් ජනිත කරන ප්‍රදර්ශන ශක්‍යතාව යනු තවත් අතකින් සංචලනයේ (mobilize) ශක්‍යතාව පිළිඹිබුවීම යි. අදහස්වලට, රූපවලට ජීවය දෙන්න මෙන් ම විවිධ ආන්තික කණ්ඩායම් කුලප්පු කිරීමට ද, එයට හැකිය. දේශපාලනික හා සදාචාරාත්මක අර්ථවලින් ප්‍රේරණය වූ එදිනෙදා සාමාන්‍ය සංසිද්ධි සහ සරල පුවත්වලට 'බැඳ දමා තිබෙන බල්ලන් ලිහා දමන්නට' හැකිය. මෙවැනි පුවත් මගින් ජාතික ආලයත්, දේශානුරාගයත්, අනෙකා නොරිස්සනසුළු බවත් ජනිත කෙරෙයි." (ලියනගේ, 2014).

ලෝකයේ බොහෝ රටවල යුදමය වාතාවරණයකදී තොරතුරු හා ප්‍රවෘත්ති පාලනය කිරීම, වාරණයට ලක්කිරීම, මර්දනය කිරීම හෝ ව්‍යාජයන් මවා පෑම සිදු වී තිබේ. ඒ හෙජමොනිය පවත්වාගෙන යාමට, යුදමය වාසි අත්පත් කර ගැනීමට හෝ යුද්ධය සාධාරණීයකරණය කර ගැනීමට ය. ඇතැම් විට තවත් රටවල් ස්වකීය ආධිපත්‍යය හා දෘෂ්ටිවාදය ලෝකය තුළ තහවුරු කර ගැනීමට යුදමය තත්ත්වයක් නිර්මාණය කර ගැනීමට කටයුතු කරන බව ද, අසත්‍යයක් නොවේ. අමෙරිකා එක්සත් ජනපදය විසින් 90/91 කාලයේ ඉරාකය ආක්‍රමණය කරන ලද අවස්ථාව ඊට නිදසුනක් ලෙස පෙන්වාදිය හැකිය. 1990 අගෝස්තු මාසයේ එක්සත් ජනපදය විසින් කුවේට් දේශයට හමුදා පිටත් කර යැවීමට සතියකට පෙරාතුව එවක බැග්ඩැඩ්


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නුවර අමෙරිකානු තානාපති ධූරය දැරූ ඒප්‍රිල් ගැස්පි (April Gaspie) ඉරාකයේ ඒකාධිපති පාලනය මෙහෙය වූ සදාම් හුසේන්ට මෙසේ පවසා තිබේ."ඉරාක හමුදා කුවෙටය ආක්‍රමණය කළහොත් අමෙරිකාව එය සලකනු ලබන්නේ අරාබි රටවල් දෙකක් අතර ඇතිවන ප්‍රශ්නයක් ලෙසයි" (ෆාරුක්, 2007). මෙම ප්‍රකාශයෙන් උද්දාමයට පත් ව සදාම් විසින් කුවෙටය ආක්‍රමණය කරන ලද අතර එයින් පසුව දැවැන්ත හමුදා ශක්තියක් යොදා අමෙරිකාව විසින් ඉරාක හමුදාවන්ට ප්‍රහාර එල්ල කොට හමුදා පරාජයෙන් නොනැවතී ආර්ථික වශයෙන් ද ඉරාකය දුර්වල කර දමන ලදී. පසුව අමෙරිකානු ජනාධිපති ජෝර්ජ් ඩබ්. බුෂ්(ජ්‍යෙෂ්ඨ) "දැන් යුද්ධය අවසානයි. මැද පෙරදිගකලාපයේ ඊශ්‍රායලයේ ආරක්ෂාව තහවුරු වී තිබේ. බාධාවකින් තොරව තෙල් සම්පත් ගලා එයි." (එම, 2007:148). යනුවෙන් ප්‍රකාශ කිරීමෙන් අමෙරිකාවේ අරමුණ වී තිබුණේ කුමක් ද යන්න පිළිබඳ තහවුරු කර ගත හැකිය. එහෙත් අපගේ ප්‍රස්තුතයට ප්‍රවේශයක් සලසා ගනු පිණිස වැදගත් වනුයේ අමෙරිකාවේ නව යටත් විජිතවාදී අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස යුද්ධය දඩමීමා කරගනු ලැබුවේ කෙසේ ද, යන්න විමසා බැලීම නොව එවැනි අවස්ථාවක මාධ්‍ය භූමිකාව කෙබඳු ද යන්න කෙරෙහි අවධානය යොමු කිරීම ය. "ඉරාකයේ මිනිසුන්, ගැහැනුන් හා ළමයින් සාමූහිකව මරාදැමීමේ ක්‍රියාවලිය ලඝු කොට පෙන්වීම සඳහා අමෙරිකා එක්සත් ජනපදයේ මාධ්‍ය බරපතළ උත්සාහයක් දරනු ලැබේ. බුෂ් පරිපාලනය සහ අමෙරිකන් අධිරාජ්‍ය වෙනුවෙන් පෙනී සිටින අනෙකුත් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක-එනම් ඩිමොක්‍රොටික් පක්ෂය හා රිපබ්ලිකන් පක්ෂය ඇතුළු බලවේග සමග මාධ්‍ය ආයතන ද, දැවැන්ත පරිමාණයෙන් මනුෂ්‍යත්වයට එරෙහිව එරෙහිව සිදු කෙරෙන අපරාධවලට සහයෝගය දක්වමින් කටයුතු කරයි. එම අපරාධ කෙතරම් බරපතළද යත් , අමෙරිකාව පාලනය කරනු ලබන ප්‍රභූ පන්තිය විසින් විනාශ කර දැමිය යුතු බවට තීරණය කර තිබෙන පැනමාවේ මොරීගා, සර්බියාවේ මිලෝසොවික් සිට සදාම් හුසෙන් දක්වා වූ පාලකයින් විසින් සිදු කරන ලද අපරාධ, අමෙරිකාව විසින් සිදු කළ අපරාධ හා සන්සන්දනය කිරීමේ දී නොවැදගත් සේ පෙනී යයි" (එම, 2007:152-153).

ලොව ප්‍රජාතන්ත්‍රවාදයේ මුර බල්ලා ලෙසින් පෙනී සිටින මෙන් ම ලොව පුරා රටවල මාධ්‍ය නිදහස හා මානව හිමිකම් කඩවීම් පිළිබඳ තම අවධානය යොමු වී ඇති බවට කාලයෙන් කාලයට රාජ්‍ය දෙපාර්තමේන්තුව හරහා නිවේදන නිකුත් කරන එක්සත් ජනපදය ලෝකයට වසන් කරන කරුණු කාරණා සුළුපටු නොවන බව මෙයින් පැහැදිලි ය.

"එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ඉරාකයට විරුද්ධව ආර්ථික සම්බාධක පැනවීම, 500, 000 ට අධික ළමුන් සංඛ්‍යාවක් මිය යෑමට හේතු විය. ස්වකීය දේශපාලන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස අමෙරිකා එක්සත් ජනපදයේ හිටපු රාජ්‍ය ලේකම් මැඩලීන් ඕල්බ්‍රයිට් (Madeline Albright) එම ක්‍රියාව අනුමත කළාය. ඒ අවස්ථාවේදී බටහිර ජනමාධ්‍යය කළේ කුමක් ද? හුදෙක් ඉරාක ජාතිකයින් වීම හේතුකොට ගෙන දූෂණයට ලක් කර, වධහිංසා පමුණුවා මරාදමන ලද ඉරාක ගැහැනුන්ගේ සහ පිරිමින්ගේ දර්ශන ඇතුළත් ඡායාරූපවලට සිදුවූයේ කුමක් ද? අමෙරිකා එක්සත් ජනපද හමුදා තහනම් කරන ලද නාපාම් බෝම්බ යොදා ගනිමින් නෝම්බි අල්ලමින් සිටි ඉරාක මිනිසුන්, ගැහැනුන් සහ ළමයින් අවිචාරවත් ලෙස මරාදමමින් ෆලූජා නගරයේ මිනිස් සංහාරයක් සිදු කළ අවස්ථාවේ දී බටහිර මාධ්‍ය ආයතන සිටියේ කොහේ ද? ඉරාකයේ සිට මිනී පෙට්ටි තුළ බහා ආපසු අමෙරිකාවට ඒමට සිදුවූ අවාසනාවන්ත යුද භටයන් පිළිබඳ වාර්තා සහ ඡායාරූපවලට සිදුවූයේ කුමක් ද? ඔවුන්ගේ ආදරවන්තයින්ට මුහුණ දීමට සිදු වූ ඉරණම කවරේ ද? අහිතකර ප්‍රතික්‍රියා ඇතිවේය යන බිය නිසා රජයන් විසින් මෙවැනි අප්‍රසන්න සිදුවීම් හුවා දැක්වීමට ඉඩදෙන්නේ නැත" (එම, 2007:157).

මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ යුදමය වාතාවරණය ආශ්‍රිත ජනමාධ්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් සලකා බැලුව ද, වැඩි වෙනසක් දක්නට නොලැබේ. එහෙත් මෙහිදී උතුරේ සටන් බිමේදී මිය ගිය දකුණේ සිංහල හමුදා සොල්දාදුවන් පිළිබඳ වීරාභිදාන, උපහාර උළෙලවල්, සොල්දාදුවන්ගේ මව්-පියවරුන්ට වන්දි ආධාර සමග සම්මාන මෙන් ම බුදු දහම තුළ සකලවිධ හිංසාවන් ප්‍රතික්ෂේප කර තිබුණ ද, බෞද්ධ භික්ෂූවරුන්ගේ හා ආගමික ප්‍රජා නායකයින්ගේ රණකාමී ධර්මදේශනා හා ප්‍රශස්ති ආදීය හිඟ නොවීය. ජනමාධ්‍ය තුළ මෙවැනි බොහෝ ව්‍යාපෘතිවලට ප්‍රමුඛ පෙළේ ඉඩකඩක් ලබා දීම නිසා ඇතැම්විට සොල්දාදුවෙකුගේ මරණයක් වුව සමාජයේ යුද්ධය කෙරෙහි ධෛර්යය වැඩි කිරීමට හේතුවුවා විනා අධෛර්යමත් කිරීමට හේතු නොවිණි. වෙනත් අයුරකින් කිවහොත් ජනමාධ්‍ය වාර්තා, සාහිත්‍යය, චිත්‍රපට, ගීත, ආදී සකලවිධ සංස්කෘතිකාංග මිලිටරීකරණය විය. එය කාලයක් තිස්සේ සිංහල-බෞද්ධ දෘෂ්ටිවාදය සමග මුසුවී පැවති හරපද්ධතීන් සමග අනන්‍ය විය. යුදකාලීන ව මේ අයුරින් මෙන් ම පශ්චාත් යුද කාලීනව ද එහි ම දිගුවක් ලෙස ජනමාධ්‍ය ක්‍රියා කළ ආකාරය මෙහි ලා අවධානයට ලක් විය යුතු ය.

"දකුණේ ජනමාධ්‍යවේදීන්ට යුද බිමට යාමට අවස්ථාව ලැබුණේ රජයේ හමුදා ඒකක (embedded) සමඟිනි. රූපවාහිනී ප්‍රවෘත්ති දර්ශනවල ශ්‍රී ලංකාවේ ජාතික ධජය, සොල්දාදුවන්, තමන්ගේ ජයග්‍රහණ පිළිබඳව කරන උදම් ඇනීම්, එල්.ටී.ටී.ඊ සාමාජිකයින්ගේ සිරුරු අනිවාර්යයෙන් අන්තර්ගත විය. යුද බිමේ සිට වාර්තාකරුවන් කළ වාර්තාවල "අපේ වීරයෝ" , "අපි" යන වචන නිතර අන්තර්ගත විය. බොහෝ විට වාර්තාකරුවන් හමුදා සොල්දාදුවන්ගේ නිල ඇඳුම්වලින් සැරසී සිටිනු දක්නට ලැබිණි. යුද බිමේ වාර්තා කිරීම්වල ගොතන ලද කතා (Fabricated Stories) තෝරාගත් සංස්කරණය (Selective editing) කරුණු වැරදි ආකාරයට නියෝජනය කිරීම සහ වාර්තා කිරීම (misrepresentation of facts) නිතර දක්නට ලැබුණු බව පර්යේෂණයට සහභාගී වූ මාධ්‍ය විචාරකයෝ පැවසූහ" (වීරසිංහ, 2013).

මෙවැනි වීරාභිවාදන මෙන් ම සත්‍ය විකෘති කිරීම්, තොරතුරු තමන්ගේ යුදමය වාසි අත්පත් කරගැනීම වෙනුවෙන් භාවිතා කිරීම ගැටුම්කාරී තත්ත්වයක් තුළ සැමදාමත් සිදු වී තිබේ. නිදසුනක් ලෙස මැක් නෙයර් එක්සත් ජනපද දේශපාලන


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සන්නිවේදනයට අදාළව 1960 ගණන් වන විට ප්‍රවෘත්ති සෙවීමේ තාක්ෂණය මෙන් ම යුද ගැටුම් සජීවී ලෙස විකාශය කිරීමේ හැකියාවත්, එහි ප්‍රයෝජ්‍යතාවත් පිළිබඳ නිසි තක්සේරුවක සිටි බව පෙන්වාදෙයි (Nair 1995). වීඩියෝ දර්ශන මාධ්‍ය ආයතනයට ලැබීමට දිනයක හෝ දෙකක ප්‍රමාදයක් තිබුණ ද, ඇතැම්විට ඒවා සජීවී ලෙස (අභවා) විකාශය කර ඇත. සත්‍ය විකෘති කිරීම් මෙන් ම තොරතුරුහරණය හෙවත් තොරතුරු නොතකා හැරීම මෙන් ම ව්‍යාජ තොරතුරු නිෂ්පාදනය කිරීම ද, මෙහි ලා සුවිශේෂී වැදගත්කමක් දක්වන බව කිව යුතු නොවේ. ඊට කදිම නිදසුනක් නේයර් එකතු කර තිබේ.

"සත්‍යවශයෙන් ම වියට්නාම් යුද්ධයේ සිට තොරතුරු විකෘතිකරණය (Disinformation) යුද මහජන සබඳතා ආකෘතියක් ලෙස බොහෝ ගැටුම්වලදී බලපෑම් කර තිබේ. 1984 දී නිකරගුවාවේ සැන්ඩිනිස්ටා පාලනයට එරෙහිව එක්සත් ජනපදයේ මහජන මතය දල්වාලීම සඳහා සෝවියට් මිග් ප්‍රහාරක යානා නිකරගුවාවට අපනයනය කළ බවට රේගන් පරිපාලනය විසින් අනතුරු ඇඟවීමක් කරන ලදී.(සැබවින්ම එවැන්නක් සිදුනොවිණි.) එහෙත් එක්සත් ජනපදය මෙන් ම තවත් රටවල් ගණනාවක් තුළ මෙම මිග් කතා ප්‍රවෘත්තිය සත්‍යයක් ලෙස ජනමාධ්‍යය විසින් වාර්තා කෙරිණි. 1986 දී ට්‍රිපොලි නගරයට බෝම්බ හෙළීමේ සිදුවීමද එවැනිය. බර්ලින්හි එක්සත් ජනපද සේවකයන්ට ත්‍රස්ත බෝම්බ ප්‍රහාරයක් එල්ලවීම පිළිබඳ සිරියාවට චෝදනා එල්ලවී තිබිය දී වුවද, ට්‍රිපොලි නගරයට මෙම බොම්බ හෙළීම සිදු කරන ලදී" (Ibid:202).

මැක් නේයර් විසින් දේශපාලන සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට අදාළ ව කරන ලද මෙම අර්ථගැන්වීම් එක්සත් ජනපදය විසින් 2වන ලෝක යුද්ධයට කළ මැදිහත්වීම්, ඉරාකය ආක්‍රමණය කිරීම, වියට්නාම් යුද්ධය, සීතල යුද්ධය ආදී බොහෝ යුදමය අත්දැකීම් සමග සාකච්ඡාවට ලක්කර තිබේ. එහෙත් එහිදී ඔහු විශේෂයෙන් ම වියට්නාම් යුද්ධය යනු ප්‍රථම ටෙලිවිෂන් යුද්ධය ලෙස හඳුනා ගැනීමක් සිදුකර තිබේ. යුද්ධය සජීවී රූපවාහිනී අත්දැකීමක් බවට පත්වීමේ ආරම්භය එය විය හැකි වුව ද, මේවන විට යුද්ධද ඇතුළු සියලුම ගැටුම් මහපොළොවෙන් විතැන්වූ "මාධ්‍ය යුද්ධ" බවට විතැන්වී තිබේ. ගල්ෆ් යුද්ධයට අදාළව 1995 දී ජීන් බෞඩ්‍රිලාද් විසින් රචනා 3 ක් අන්තර්ගත කොට ලියා නිමකරන ලද The Gulf war did not take place (1991) කෘතියෙන් "ගල්ෆ් යුද්ධය යනුවෙන් දෙයක් සිදු වී නෑ" යයි තර්ක කළේය.

බෞඩ්‍රිලාද් එයින් පෙන්වා දී තිබුණේ යුද්ධයේදී අමෙරිකානු මාධ්‍යය කෙතරම් තීරණාත්මක භූමිකාවක් ඉටුකර තිබුණේ ද යත් පුවත් මැවීම් හා ජනමාධ්‍ය නිරූපණ මිස මහ පොළොවේ සැබෑවටම යුද්ධයක් නොපැවති තරමට එය ජනතාවගෙන් ඈත් කර තිබුණු බව යි. බෞඩ්‍රිලාද් ඉහත ප්‍රකාශයෙන් අවධාරණය කරනු ලැබ ඇත්තේ ගල්ෆ් යුද්ධය, එක් පාර්ශවයකට ඇඩිව පක්ෂපාතී බව යයි ඩැනියෙල් පිප්ස්ගේ අදහසයි. "යුද්ධය, එය එක් පාර්ශවයකට ඇඩිව පක්ෂපාතියි. ඒ නිසා එය පැවති යුද්ධයක් ලෙස ස්ථානගත කිරීම අපහසුයි. අමෙරිකානුවන් මළ සිරුරුවලට බයයි. ඒ නිසා බුෂ් තොරණක් ගැහුවා. එය උසස් ලෙස ජයග්‍රහණය කළ බව පෙන්වා දුන්නා. එය අතිනාටකමය දැක්මක්. අමෙරිකානු දැක්මට අනුව "මෙයින් අනතුරු සිදුවූයේ නැත." සියලුම දේ දිගහැරුණේ පෙර සැලසුම්ගත කරන ලද ආකාරයටම ය. 1991 ගල්ෆ් යුද්ධයේ සිදු වීම ඥතිත්වයක් දක්වන්නේ නම් ඒ පරිගණකයෙන් ලබන ලිංගික ශෘංගාරයට යි" (Pips,1996).

මාර්ෂල් මැක්ලුහාන්ගේ සුප්‍රසිද්ධ න්‍යාය වන "මාධ්‍ය යනු පණිවිඩය වේ" (medium is the massage-1964) යන්නට එරෙහිව බෞඩ්‍රිලාද්ගේ තර්කය වනුයේ "මේ මොහොතේ මාධ්‍ය යනු පණිවිඩය නොවේය" යන්න ය. එය මොඩලය යි. "මාධ්‍ය මොඩලය බවට පරිවර්තනය කොට (ප්‍රවෘත්ති මෙන්) විරෝධ සංකේතනයේ ආයුෂ අඩුකර ඇත. ස්වකීය ප්‍රතිනිෂ්පාදනයේ කාර්යයක් ලෙස හැර කැරලිකාර ක්‍රියා තවදුරටත් නිෂ්පාදනය වුවක් නොවේ (හෝකින්ස් සහ ජෙව්ටෙක්, 2015).

'මාධ්‍යයේ මළවුන් සඳහා පූජාවන් පැවැත්වීම' යන්නෙන් බෞඩ්‍රිලාද් අදහස් කරනු ලබන්නේ මාධ්‍ය පිළිබඳ න්‍යායක් නොමැති කාරණය යි. එහි කිසිම සත්‍යතාවක් නොමැති බවට තර්ක කරන හෙතෙම මාධ්‍යයට වඩ වඩාත් ළංවීම තුළින් සිදු වන්නේ එහි යථාව වඩ වඩාත් අඩුවීමට ලක්වන බවයි. රූපවාහිනයට විශේෂිතව හෙතෙම මෙසේ පවස යි.

"රූපවාහිනිය නොනවත්වාම විකාශනය වේ. නිරන්තරයෙන් නාලිකාවෙන් නාලිකාවට මාරුවීම එහි මෝහනය යි. කිසිවෙක් එයට වසඟ නොවන අතර විනෝදයක් ද නැත. එය හුදු කාර්යයක් පමණි. නියම පාපන්දු තරගයක්, රූපවාහිනයෙන් විකාශනය කෙරෙන තරගයක් සමග සසඳන්න. නියම තරගය උණුසුම්, හැඟුම්බර, වගේ ම රංගනීය යි. දෙවැන්න හසුරුවන සහ පාලනය කරන ලද්දකි. එය ඉදිරියට සහ පසුපසට යළි ධාවනය වීම මෙන් ම සමීප රූපවල සමෝධානයකි. රූපවාහිනයේ මඳ ආලෝකය තව දුරටත් ප්‍රතිරූපයක් නොවේ. එය මිථ්‍යාව හා ෆැන්ටසිය සංලකලනය වූ සිනමාවේ පරිකල්පනය මෙන් නොවේ. 'ටෙලි-අවකාශය' තුළ ස්ථාවර වූ තත්ත්වයක් නොමැත. කතිකාව මෙන් නොව ඩිජිටල් ලෝකයට ධ්‍රැවයක් නැත. තිබෙනුයේ දත්ත පිරිසැකසීම පමණි. සෑම පුද්ගලයෙක් ම තමන්ගේම වූ පර්යන්තයකි. රූපවාහිනිය සන්නිවේදනය නොකරයි. ඉලෙක්ට්‍රොනික අසංවේදිත්වයේ සම්බන්ධතාවක් පමණි. රූපවාහිනය එය සමගම කතා බහක යෙදෙයි. අප අනුබද්ධව ඇත්තේ මානව-යන්ත්‍ර පරිපථයක් ලෙසය" (එම :134-135).

මෙම මාධ්‍ය භූමිකාව කෙතරම් තීරණාත්මක හා පහත් තත්ත්වයකට ඇද වැටී ද යන්නට යම් මතුපිට තක්සේරුවක් කර ගැනීමට The Washington Post සහ The Newyork Times යන පුවත්පත්වලට එක්තරා ආකාරයක ස්වයං විවේචනයක යෙදීම සඳහා බලකරනු ලැබීම සිහිපත් කිරීම ප්‍රමාණවත් ය. ශ්‍රී ලංකාවේ පැවති යුදමය වාතාවරණය හා බැඳුණු තත්ත්වය මීට බොහෝ සෙයින් වෙනස් නොවිණි. වෙනසක් පැවතියේ නම් ඒ අමෙරිකානු සමාජය විසින් එරට මාධ්‍ය ආයතන කෙරෙහි පශ්චාත් යුද කාලීනව දැක් වූ යම්


© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

යම් විරෝධතා හේතුවෙන් ඒ පිළිබඳ නැවත හැරී බැලීමට මාධ්‍ය ආයතනවලට සිදුවීම වෙනුවට ලංකාවේ පශ්චාත් යුද කාලීන සමාජය එවැනි බලපෑමක් හෝ නොකොට සියල්ල සාධාරණීකරණය කර භාර ගැනීම ය.

යුද්ධ ජයග්‍රහණයේ නාමයෙන් ඕනෑම සත්‍ය විකෘති කිරීමක්, මර්දනයක් ඉවසා සිටීම ය. එහෙත් එසේ වී ඇත්තේ මන්ද යන කාරණයට පිළිතුරු ගොනු කිරීමේ දී අපගේ ප්‍රස්තුතයේ ඉලක්කය සපුරා ගැනීමට හැකිවෙනු ඇත. එනම් ලාංකේය දෘෂ්ටිවාදයේ සුවිශේෂත්වයන් එහිදී හඳුනා ගැනීමට ලැබෙනු ඇති අතර අනෙක් අතට යුද්ධ කාලීන ක්‍රියාදාමයේ ම දිගුවක් ලෙස ජනමාධ්‍යය තවදුරටක් හෙජමොනිය හා දෘෂ්ටිවාදය නඩත්තු කිරීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යනු ලබයි. “ලංකාවේ ජනමාධ්‍යවේදීන් වෘත්තීයභාවයක් පෙන්නුම් කිරීමට සමත් වී නැත. ජනමාධ්‍යවේදීන්ගේ සංකල්ප දැනුම තිබෙන්නේ දිළිඳු තත්ත්වයකය. වෘත්තීය අභිමානයක් ඇත්තේ ම නැති තරම් ය. සෘජු හා අනියම් ලෙස අයථා ලාභ ලැබීම සුලබ ලක්ෂණයක්ව පවතී. ජනමාධ්‍ය හිමිකරුවෝ අන්තර්ගතයට ඇඟිලි ගසනවා පමණක් නොව අන්තර්ගතය අවසාන වශයෙන් තීන්දු කරන්නන් ලෙස ද ක්‍රියා කරති. සංලේඛ්‍ය නිදහස (Editorial Independence) ගැන ජනමාධ්‍යවේදීන්ට බලවත් හැඟීමක් ඇත්තේ ම නැති තරම් ය. බලයේ සිටින ආණ්ඩු කරන වැරදි හෙළිදරව් කරන හෝ පෙන්වා දෙන ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම වෙනුවට අනුගමනය කරමින් සිටිනුයේ පාලකයාගේ අසන්තෝෂයට හේතු නොවන වර්ගවාදයට, ආගම්වාදයට, හෝ මිථ්‍යා විශ්වාසයන්ට බර තබා ක්‍රියාකරන ප්‍රතිපත්තියකි” (අයිවන්, 2015).

මේ අනුව ආගම්වාදය, වර්ගවාදය කෙරෙහි බර තැබීම සිදු වන්නේ හිමිකරුවන්ගේ ඕනෑ එපාකම් මත පමණක් නොව එය පහසුවෙන් අලෙවි කළ හැකි භාණ්ඩයක් වන නිසා බව අමතක නොකළ යුතු ය. ‘පහසුවෙන් අලෙවි කළ හැකි’ යන්නෙහි අරුත ප්‍රශ්න කිරීමකින් තොරව කැමැත්තෙන් බාර ගැනීමට ජනයා සැදී පැහැදී සිටින බවකි. ඒ නිසාම ඒ තුළ පවත්නා හෙජමොනික අවකාශයත්, දෘෂ්ටිවාදි සැකැස්මත් නොතකා නොහළ යුතු ය.

## නිගමනය

විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් දෛනික ජීවිතයේ අත්දකින සියල්ල හුදෙක් දකීම (seem) මත පදනම්වූ තොරතුරු විඳ ගැනීමක් පමණක් නොව සන්නිවේදකයාගේ මෙන් ම ග්‍රාහකයාගේ ද, දැක්මට (gaze) අනුව පෙළගස්වන ලද රූපමය හා සංඥාර්ථමය ප්‍රකාශනයකි. එය පාලන තන්ත්‍රයේ හෙජමොනිය ගොඩනැංවීමට හෝ නඩත්තු කිරීමටත්, එය විසින් අභ්‍යාස කරන ලද තත්කාලීන සමාජීය දෘෂ්ටිවාදය තහවුරු කිරීමටත් භාවිත කෙරෙයි. ඒ අර්ථයෙන් ජනමාධ්‍ය මගින් හුදෙක් තොරතුරු වාර්තා කිරීමක් පමණක් සිදු නොවන අතර තොරතුරු නිෂ්පාදනයක් හෝ ප්‍රතිනිෂ්පාදනයක් සිදු වෙයි. එහිදී ප්‍රාථමික භාණ්ඩ නිෂ්පාදනයකදී මෙන් ම යම් යම් අමුද්‍රව්‍ය එකතු කිරීමත්, යම් යම් අමුද්‍රව්‍ය බැහැර කිරීමත්, ප්‍රාග්ධනය හෝ වෙළඳපළ තර්කණයත්, හිමිකාරිත්වයේ අභිලාෂයන් ආදී ඕනෑම හේතු සාධකයක් අඩු වැඩි වශයෙන් බලපැවැත්විය හැකිය. ඒ අනුව තොරතුරු විකෘති කිරීම් මෙන් ම තොරතුරු හරණයන්, මවාපෑම් ආදී වශයෙන් නානාවිධ එල අත්විඳිය හැකිය. මේ ක්‍රමක් සිදු වුව ද, අවසාන අර්ථයෙන් දෘෂ්‍ය සන්නිවේදනය යනු සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සිදුවන හුදු තොරතුරු හුවමාරුවක් පමණක් නොව ‘පාරභෞතික සන්නිවේදන ක්‍රියාවලියක්’ බැව් නිගමනය කළ හැකිය. මන් ද යත් ඊට සමාජ යථාර්ථයේ සම්බන්ධයක් පැවතිය හැකි තරමට ම නොපැවතිය හැකි අවධානමක් ද, පවතින බැවිනි.

## පරිශීලිත මූලාශ්‍රය


අයිවන්, වික්ටර්. (2015). අයාලේ යන ජනමාධ්‍ය, මහරගම : රාවය ප්‍රකාශකයෝ.

චාමින්ද, සුමිත් (2003). පශ්චාත් මාක්ස්වාදයට හැඳින්වීමක්- දෘෂ්ටිවාදය හා කතිකා විශ්ලේෂණය, ඕ කණ්ඩායමේ අභ්‍යන්තර අධ්‍යයන කවයට ඉදිරිපත් කළ පත්‍රිකාව, පිටු 24 (අමුද්‍රිතයි).

ජනරංජන, කේ. ඩබ්ලිව් (2015-11-25) පෙ.ව 11.45, රාවය කාර්යාලය, මහරගම.

රංජනී, සීතා (2011). අදහස් ඝාතනයේ ගොදුරු, කොළඹ : නිදහස් මාධ්‍ය ව්‍යාපාරය.

ලියනගේ සෞම්‍ය (2014-11-16). අරුම පුදුම රූප පෙට්ටිය- පියරේ බෝදියූ, රාවය. 16 පිට.

විජේතුංග, ගාමිණී. (2003). ශ්‍රී ලංකාවේ පුවත්පත් අයිතිය හා දේශපාලන සන්නිවේදය, නුගේගොඩ : සරසවි ප්‍රකාශකයෝ.

වීරසිංහ ටියුඩර් 2011:130, මාක්ස්වාදී හා නව මාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

වීරසිංහ, ප්‍රදීප්. (2013). ජනමාධ්‍යවේදය: න්‍යාය, භාවිතය සහ ගැටලු, කොළඹ : ස්ටැම්ෆර්ඩ්ලේක් ප්‍රකාශන.

හෝකින්ස්, ක්‍රිස් සහ ජෙව්ටෙක් ෂොරාන්, (2015) ෂොන් බෞද්‍රිලාද් රූපමය නියමුවක් Introducing Baudrillard:A Grapic Guide, සිංහල පරිවර්තනය-උදිත අලහකෝන්) ගම්පහ, Nine Publishing.

ෆාරුක්, ලතීෆ්. (2007). ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ සැබෑ මුහුණුවර (War On Terrorism;The Untold Truths) සිංහල පරිවර්තනය - කේ.ඒ.එන්. පෙරේරා, මහරගම : රාවය ප්‍රකාශන.

Althusser, Louis (1971).Lenin and Philosopy and Other Essays: Tra Andy Bluden, Ideology and Ideological State Apparatuses, Monthly Review Press.



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Edward, S. Herman and Chomsky, Noam (1988). Manufacturing Consent: The Political Economy of the Mass Media, New York City : Pantheon Books.

Gramsci, Antonio (2007). Prison notes, London: Elec Book.

Hilligoss Susan Howard Tharon (2002). Visual Communication; A writer.s Guide,Longman Publishers, London.

Hornby,A.S (2005) Oxford Advanced Learner's Dictionary Of Current English(seventh edition) Oxford University press.

Laclau Ernesto and Mouffe Chantal (1985), Hegemony and Socialist Strategy, London: VERSO.

Lane J, Richard (2000). Jean Baudrillard, Routledge, 11 New Fetter Lane, London.

Lippmann, Walter (1932). Interpretation, The Macmillan Company,London.

McNair, Brian (1995). An Introduction To Political Communication(Third Edition), London and New York:Routledge.

Pips, Daniel (1996). The Gulf War Did Not Take Place By Jean Baudrillard,Middle East Forum (Retrived April 25, 2015 From http://www.danielpipes.org/696/the-gulf-war-did-not-take-place).

Torfin, Jacob (1999). New Reflections On the Revolution OF Our Time,London:Verso.

Weerasinghe, Pradeep N. and Rao, S. (2011). Covering Terrorism in South Asian Journalism: Journal Of Journalism Practices, 5:4, 414-428:Rutledge.



© 2018 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
## නවවැනි කලාපය - 2018 දෙසැම්බර්


ස්වභාව සෞන්දර්ය පිළිබඳ ආදි බෞද්ධ ප්‍රතිපදාව 01-09
රාජකීය පණ්ඩිත මැටිබැඹියේ ධම්මසිරි හිමි

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ගී පද රචනාවලින් මතු වන ශබ්ද'ර්ථ රස නිෂ්පත්තිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: තෝරා ගත් ගීත නිර්මාණ කිහිපයක් ඇසුරින් 10-16
ආර්.ඒ.ඩී. ප්‍රියංකා වීරසේකර

මාතෘකාවක් සොයන වචන අනුතුන්දාහක් : ජාතිකවාදී ගැටලුව දෙස යථාර්ථවාදි ව ප්‍රවේශ වීම - ආරියවංශ අබේසේකර 17-22
චම්පා එස්. ද සිල්වා

ශ්‍රී ලංකේය ජන ගායන ක්ෂේත්‍රයෙහි ඇතුළත් නෙළුම් ගායන ශෛලිය පිළිබඳ මානව වංශ සංගීත විද්‍යාත්මක විමර්ශනයක් 23-31
ඉරංගා සමින්දනී වීරක්කොඩි

බටහිර තරණය කෘතිය තුළින් චීන සාම්ප්‍රදායික දර්ශනවාද නිරූපණය කෙරෙන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් 32-36
ඩී.එස්.වයි. දසනායක

පහතරට තෙත් කලාපය ඇසුරෙන් සාම්ප්‍රදායික දැනුම පදනම් ව ශ්‍රී ලංකාවේ ශාකාවරණය හඳුනා ගැනීම සහ වර්ගීකරණය 37-48
එම්.එස්.එම්.එල්. කරුණාරත්න

ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ග්‍රාමීය-නාගරික සබඳතාවන්ගේ බලපෑම දඹුල්ල නගරය සහ එහි තදාසන්න ප්‍රදේශය ඇසුරින් 49-59
බී.එම්.එම්.එච්. හේමචන්ද්‍ර සහ එල්.ජී.ඩී.එස්. යාපා

දෘශ්‍යසන්නිවේදනයේ පාරභෞතිකභාවය හැදෑරීමට හෙජමොනිය හා දෘෂ්ටිවාදය ඇසුරින් විශ්ලේෂණාත්මක සංකල්පීය ප්‍රවේශයක් 60-70
ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර



ISSN 1800-1459
e ISSN 2673-1177